ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම
2021–2030



නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම

2021–2030

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021–2030

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2021

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම භරහා තැටිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

ප්‍රකාශය

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපෑල - info@uda.gov.lk
දුරකථන අංක - + 94112 873 637
ප්‍රකාශනය 2021

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021–2030, I වන කොටස, II වන කොටස සහ III කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, SWOT විශ්ලේෂණය සහ සැලැස්මය. දෙවන කොටස 2021–2030 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් හා ගොඩනැගිලි නියමතා සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. III කොටස කලාප සීමා මායිම් බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021–2030 සකස් කර ඇත්තේ සබරගමුව පළාත් කාර්යාලය සැලසුම් අංශය විසිනි.

අධීක්ෂණය

වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා ***සභාපති, නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී එන්. පී. කේ. රණවීර ***අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී එච්. ඒ. දයානන්ද ***අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ,*** නගර නිර්මාණ ශිල්පී එම්. පී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අ.,*** නීතිඥ සී . ජයවර්ධන - ***උපදේශක (නීති) - නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න - ***අධ්‍යක්ෂ(උපායමාර්ගික සැලසුම්) නා.සං.අ.***

සැලසුම් කණ්ඩායම

නගර නිර්මාණ ශිල්පී තුෂානි ද අල්විස් ***අධ්‍යක්ෂ, සබරගමුව පළාත, නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී ඩී. පී. ආර්. කේ. ගුණතිලක ***නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), සබරගමුව පළාත, නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී ඩී. ඒ. ඩී. අතුකෝරල ***නියෝජ්‍ය අධ්‍යක්ෂ(පරිපාලන), සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** නගර නිර්මාණ ශිල්පී එච්. එම්.පී. එච්. මැණිකේ ***සභකාර අධ්‍යක්ෂ (නගර සැලසුම්), සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** න.නි.ශි. යූ. පී. ඩී. උදේශිකා ***නගර නිර්මාණ ශිල්පී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** කේ. එම්. අයි. සමන් රූපසිංහ ***සැලසුම් නිලධාරී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** එච්. කේ. නීලිකා ***සැලසුම් නිලධාරී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** කේ. එස්. මහේෂ් පීනදාස ***සැලසුම් සහකාර, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** එම්. එන්. ගුණවර්ධන ***සැලසුම් ශිල්පී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.,*** ඩබ්ලිව්. එම්. ඩබ්ලිව්. ***මැණිකේ සැලසුම් ශිල්පී, සබරගමුව පළාත් කාර්යාලය, නා.සං.අ.***

සහය කණ්ඩායම්

උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ. (අධීක්ෂණය, නියාමනය සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ. (PORS, භූ දර්ශන කළමනාකරණ සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ. (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම සහ තාක්ෂණික සහාය සැපයීම)
පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අ. (නව තාක්ෂණික ක්‍රම භඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්ම)

පිටු සැකසුම්

මූනියැක් ආයතනය

ප්‍රණාමය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021-2030) සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ උපායමාර්ගික සැලසුම් අංශයේ මූලික අධීක්ෂණය යටතේ සිදුවිය. "වලව නිම්නයේ කෘෂි ආර්ථික නිපැයුම් කේන්ද්‍රස්ථානය" දැක්ම තුළින් නගරයේ කෘෂිකාර්මික අනන්‍යතාවය ඉස්මතු කරන පරිද්දෙන් නිරසාර කෘෂිකර්මාන්තය හා අගය එක් කරන නිෂ්පාදන ක්‍රියාවලියක් තුළින් ගුණාත්මක ප්‍රමිතිසහගත නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් සහිත සංවර්ධිත ආකර්ෂණීය නගරයක් බවට ඇඹිලිපිටිය නගරය පත් කිරීම මෙම සැලැස්මේ අරමුණයි. ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021-2030 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුව සකස් කර ඇති අතර අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම "ප්‍රතිපත්ති ප්‍රකාශයට ද අනුකූල වේ.

මෙහිදී 1982 අංක 04 දරණ පණත මඟින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021-2030 සඳහා අනුමැතිය ලබාදීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමන්ටත් මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදුන් නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු පිළිබඳ ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමන්ටත්, රන්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ටත්, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ටත්, ඇඹිලිපිටිය නගර සභාවේ ගරු සභාපතිතුමන් වන ලලින් ගමගේ මහතා ඇතුළු මහජන නියෝජිතයින් සියලුදෙනාටද, ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් වන සුරන්න වීරසිංහ මහතා ඇතුළු මහජන නියෝජිතයන් සියලු දෙනාටත් අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමු.

මෙම සැලැස්ම සාර්ථකව නිමා කිරීම සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා වෙත අපේ ස්තුතිය පුදකොට සිටිමු. තවද, මෙම නගර සැලැස්ම සඳහා තොරතුරු සහ අදහස් ලබාගැනීමේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇඹිලිපිටිය නගර සභාව හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව ඇතුළු රාජ්‍ය ආයතන රැසක් නම සම්පත් දායකත්වය ලබාදෙන ලද බැවින් ප්‍රාදේශීය ලේකම්තුමන්, නගර සභා ලේකම් තුමියන්, ප්‍රාදේශීය සභා ලේකම් තුමියන් ඇතුළු අදාළ ආයතනයන්හි කටයුතු කරන කාර්ය මණ්ඩලයන්ට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021-2030) සකස් කිරීම සඳහා ධෛර්යය හා මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා මහතාට, අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පි එන්.පී.කේ.රණවීර මහතාට, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පි එච්.ඒ් දයානන්ද මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) නගර නිර්මාණ ශිල්පි එම්.පී.රණතුංග මහතාට, නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතීඥ සී. ජයවර්ධන මහත්මියට, උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පි ප්‍රියානි නවරත්න මහත්මියට හා සබරගමුව පළාත් අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පි නූෂානි ද අල්විස් මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

එමෙන්ම, මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ආරම්භයේ සිට මනා මාර්ගෝපදේශකත්වයක් හා නායකත්ව-යක් සපයමින් නවමු මුහුණුවරකින් මෙම සැලැස්ම ඉදිරිපත් කිරීමට කටයුතු කළ නාගරික සංවර්ධන අධිකාරිය නිටපු සභාපති වරලත් නගර නිර්මාණ ශිල්පී සහ වරලත් වාස්තු විද්‍යාඥ ආචාර්ය ජගත් මුණසිංහ මැතිතුමාට සහ නිටපු අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු එස්.එස්.පී. රත්නායක මැතිතුමන්ට විශේෂ ස්තුතිය පළකර සිටින්නෙමු. එම කාලසීමාව තුළ මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්යය හා මගපෙන්වීම ලබාදුන් නිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී කේ.ඒ්.ඩී. චන්ද්‍රදාස (2017), නිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග (2018-2019) සහ සබරගමුව පළාත් අධ්‍යක්ෂතුමන්ලා ලෙස සේවය කරන ලද නගර නිර්මාණ ශිල්පී සිසිර එම්. දිසානායක සහ නගර නිර්මාණ ශිල්පී අනුර මැදවල මහත්වරුන් වෙත ද අපගේ ස්තුතිය පුදකර සිටිමු.

මෙම සැලැස්මේ කටයුතු සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ පර්යේෂණ සහ සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර මහතාටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මියටත්, පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පී ඩී.කේ.ර්. කළුපහන මහත්මියටත් අදාළ අංශයන්හි සියළුම නිලධාරීන්ටත්, රන්නපුර කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සියලුම සේවක මහත්ම මහත්මීන්ටත් අපගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන්, ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030) සකස් කිරීමේදී මූලික දත්ත රැස් කිරීමේ අදියරෙහි සිට ගැසට් පත්‍රයෙහි පළකිරීම දක්වා සියලු අදියරයන් වලදී ඍජුව සහ වක්‍රව සහයෝගය ලබාදුන් රාජ්‍ය ආයතන, අර්ධ රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන, විවධ සම්පන්දායකයන් හා නාගරික ප්‍රජාව වෙත හදපිරි ප්‍රණාමය පළකර සිටින්නෙමු.

ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



1978 වී අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටවනු ලැබූ අතර එමඟින් ප්‍රකාශිත නාගරික බල ප්‍රදේශ තුල විධිමත් සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා සක්‍රීය දායකත්වයක් මේ මොහොත වන විට ද සපයනු ලබයි.

රටේ සංවර්ධන ක්‍රියාවලියට ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම සමාන දායකත්වයක් සැපයෙන ආකාරයට භෞතික අවකාශය කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතයට ගැනීම මූලික කරගනිමින් පුළුල් සංවර්ධන සැලසුම් සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීමට කටයුතු යොදා ඇත.

ඇඹිලිපිටිය නගරය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. ඒ අනුව ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය හා ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් කොටසක් අයත් ප්‍රදේශය, ඇඹිලිපිටිය සැලසුම් ප්‍රදේශය වශයෙන් කෘෂිකාර්මික, වාණිජ, කර්මාන්ත හා සංචාරක වශයෙන් නවදුරටත් සේවා සපයන නගරයක් බවට පත් කිරීමට විභවනාවයක් පවතී. ඒ අවට ප්‍රදේශය සතු ස්වාභාවික පරිසර පද්ධතිය හා සංචාරකමය වටිනාකම් සහිත ස්ථාන පිහිටා නිබීම මෙම විභවනාවය නවදුරටත් ඉහළ නංවයි. මෙම සංවර්ධන සැලසුම් මඟින් අපේක්ෂා කරන්නේ ඇඹිලිපිටිය ප්‍රදේශයේ පවතින එම විභවනාවය ප්‍රයෝජනයට ගෙන නගරය සංවර්ධනය කිරීමයි.

අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය යථාර්තයක් බවට පත් කරනු වස් නව ප්‍රතිනාගරීකරණ වැඩසටහන් සහිතව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවන්ගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් සමඟ විශිෂ්ඨ නාක්ෂණික ක්‍රමවේදයක් හා නවෝත්පාදන ප්‍රවේශයක්ද මේ සඳහා ලැබී ඇත.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්යය සාර්ථක කර ගැනීමට උපකාර කල නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. නවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය තුලින් ඇඹිලිපිටිය සංවර්ධන සැලසුම් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෙරවදන



නූතන නිරසාර සංවර්ධන අභිමතාර්ථ සපුරා ගැනීමේ ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතුව විශාල වගකීමක් පැවරී ඇත. ඒ අනුව ගරු විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද නාගරික සංවර්ධන බල ප්‍රදේශ සඳහා අංක 1982 අංක 04 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8අ (1)) අනුව සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත.

මෙලෙස සකස් කරනු ලබන සංවර්ධන සැලසුම් තුලින් සෞභාග්‍යයේ දැක්මෙහි ඇතුලත් මූලික අපේක්ෂාවන් වන ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක්, ගුණගරුක සමාජයක් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩනැඟීම මූලික වශයෙන් අපේක්ෂා කරයි. නවද නාගරික ජනනාවගේ ආර්ථික ස්ථායිනාව ඇති කරමින් විධිමත් ප්‍රතිනාගරීකරණ සැලැස්මක් ඔස්සේ නාගරික ප්‍රදේශ සංවර්ධනය හා නියාමනය යන පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට මෙම සංවර්ධන සැලසුම් මහත් පිටුවහලක් වනු ඇති බවට විශ්වාස කරමි.

එබැවින් මෙම සැලැස්ම පිලියෙල කිරීමේදී ඉතා වගකීමෙන් නම කාර්යභාරය ඉටු කරන ලද සැලසුම් කණ්ඩායමට හා නන් අයුරින් සහයෝගය දැක් වූ සැමට හෘදයාංගම කෘතඥතාවය පිරිනමන අතර සෞභාග්‍යයේ දැක්මේ අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා ඔබ සැමගේ දායකත්වය ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමි.

ආචාර්ය නාලක ගොඩහේවා (පා.ම)
නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ,
අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය



දශක හතරක් පුරාවට ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන සැලසුම් සකස් කිරීමටත් එම සැලසුම් බලාන්මක කිරීමටත් බලය හිමි ප්‍රධානතම ආයතනය නාගරික සංවර්ධන අධිකාරිය වේ.

නාගරික සංවර්ධන සැලසුම් තුලින් ප්‍රශස්ථ, ඵලදායි හා කාර්යක්ෂම භූමි පරිහරණ රටාවක් මෙන්ම පරිසරය ගුණාත්මක ලෙස කළමනාකරණය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරනු ලබයි. ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුළින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහ පැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය යන පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා මෙම සංවර්ධන සැලසුම් සකස් කරනු ලබයි.

1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ II කොටස 8අ(1) පරිදි අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම වර්තමාන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය සතු මෙවලම් හා ක්‍රමෝපායන් තුලින් සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මතු වූ අභියෝගයන්ට ඉනා සාර්ථකව මුහුණ දෙමින් ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන ඇඹිලිපිටිය නගර සභා සීමාව හා ඇඹිලිපිටිය ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයෙන් කොටසක් අයත් ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සදහා වන සංවර්ධන සැලැස්ම 2021–2030 වසර දක්වා බලාන්මක වන ලෙස පිළියෙල කර ඇත.

එබැවින් මෙම සැලැස්ම සාර්ථකව නිම කිරීම සදහා ඇප කැප වී කටයුතු කල නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම් හා නොයෙක් අයුරින් සහාය දැක්වූ සැමට මාගේ හෘදයාංගම ස්තුතිය පුදකරන අතරම මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී සියලු පාර්ශවයන්ගෙන් ලද සක්‍රීය දායකත්වය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සදහා ද ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

වරලන් වස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

ගරු සභාපති තුමාගේ පෙරවදන - ඇඹිලිපිටිය නගර සභාව



ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා පුරෝගාමී මෙහෙවරක් සිදුකරන නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කර ඇති නගර සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය නව නාක්ෂණය හා දැනුම මුසුකරමින් නැවුම් ක්‍රමවේදයකට ආරම්භ කර ඇති අතර නිරන්තරයෙන් ජනතාවට ජීවන්වීමට හිතකර සංවර්ධිත නගර නිර්මාණය කිරීම වෙනුවෙන් පෙළ ගැසී සිටී.

මෙහිදී විශේෂයෙන් සබරගමුව පළාත් නාගරික ධුරාවලියට අනුව දෙවන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන ඇති ඇඹිලිපිටිය නගරයේ නගර සභා බල ප්‍රදේශය ඇතුලත් වර්ග කිලෝමීටර් 50ක බල ප්‍රදේශයද ඇතුළත් නාගරික බල ප්‍රදේශය සඳහා මෙම නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙන ඇති කාලෝචිත අවශ්‍යතා සඳහා ඉතා වටිනා පිළිතුරකි.

කෘෂිකාර්මික අනන්‍යතාවයක් පවතින ඇඹිලිපිටිය නගරයේ එදිනෙදා ජනජීවිතය, නාගරික සංවර්ධන ප්‍රවණතා පිළිබඳ මනා අවබෝධයකින් යුක්තව සංවර්ධන කාර්යයන් සිදුවීමට පවතින බාධා මැඩ පැවැත්වීම සඳහා මෙම සැලැස්ම තුළින් විසදුම් ලබාදී ඇත. වර්තමාන භූමි භාවිතයන්ට අමතරව වැඩිවන ජනගහන වර්ධනයට සාපේක්ෂව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා අහිතකර මිනිස් ක්‍රියාකාරකම් වැලැක්වීම සඳහා අදාළ නීතිමය පියවර ඇතුළත් භූමි භාවිත සැලැස්මක් හා නව සංවර්ධන උපායමාර්ග හඳුන්වාදී ඇත.

වර්ෂ 2021–2030 කාලපරිච්ඡේදය සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස්කිරීමේදී, සබරගමුව පළාත් නාගරික සංවර්ධන කාර්යාලයේ අදාළ නගර නිර්මාණ ශිල්පී කාර්යය මණ්ඩලය මෙම ප්‍රදේශයේ පරිපාලන ආයතන සමග මනා සම්බන්ධතාවක් පවත්වාගනිමින් නගරයේ යතා තත්ත්වය මැනවින් අවබෝධ කරගනිමින් නගරයේ පවතින සාමාජීය, ආර්ථික, පාරිසරික හා භෞතික යනාදී සියලු අංශ තුළ පවතින ගැටළු හා ඒවාට විසදුම් ලබාදීමටත්, නගරයේ පවතින සම්පත් හඳුනාගනිමින් නගරයේ සංවර්ධනය පාරිසරික සුරක්ෂිතභාවය සමග සමබරව ඉදිරියට ගෙන යාමට මහත් පරිශ්‍රමයක් යොදවා පැවනීම ප්‍රසංශනීය තත්ත්වයකි.

නගර මධ්‍යයේ වාණිජ ව්‍යාප්තිය සමඟ සංසරණ ජනතාවට අවශ්‍ය යටිතල පහසුකම් හා විශේෂිත ආකර්ශනයක් ලබාදීමට මෙන්ම ඉදිරියේදී ඇතිවිය හැකි රථවාහන තදබදය, රථවාහන නැවතුම් ස්ථාන හිඟය ආදී සියලු කඩිනම් අවශ්‍යතා සඳහා විශේෂන ව්‍යාපෘති හඳුනාගෙන ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඇඹිලිපිටිය නගරය සංවර්ධනය කිරීම සඳහා ලබාගෙන ඇති මෙම උත්සාහය අනගිභවනීය ජනතාවාදී ක්‍රියාදාමයක් වන අතර මෙම සංවර්ධන ක්‍රියාවලිය තුළින් අපේක්ෂිත ප්‍රතඵල අත්කරගැනීම වෙනුවෙන්, ඇඹිලිපිටිය නාගරික ජනතාව නියෝජනය කරමින් ක්‍රියා කිරීමට මා ඇතුළු ඇඹිලිපිටිය නගර සභාවේ සියලු මහජන නියෝජිතයින් කැප වී සිටින අතර පැවරෙන සියළු වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටු කිරීමට බලාපොරොතු වෙමි.

ලලින් ගමගේ
සභාපති
ඇඹිලිපිටිය නගර සභාව

ගරු සභාපති තුමාගේ පෙරවදන - ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව



නගර සංවර්ධන ක්‍රියාදාමයේ වශකිවයුතු ප්‍රධාන ආයතනයක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කර ඇති නගර සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළින් ජන ජීවිතයේ අභිවෘද්ධිය උදෙසා නගරයේ භෞතික සංවර්ධනය සිදුකිරීමට ක්‍රියා කරමින් සිටි.

මෙම නගර සංවර්ධන කාර්යය භාරයේ පියවරක් වශයෙන් සබරගමුව පළාතේ ප්‍රධාන පෙළ නගරයක් වන ඇඹිලිපිටිය නගරය සඳහා නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම නාගරික ජනතාවට හිමි වී ඇති ඉතා වැදගත් අවස්ථාවකි. ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයට අමතරව ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් උඩවලව, තුංකම, පදලංගල ආදී නගර මධ්‍යස්ථාන ඇතුළත් නාගරික බල ප්‍රදේශය තුළ සංවර්ධන කාර්යයන් සිදු කිරීම තුළින් ප්‍රතිලාභ අත් පත් කර ගැනීම සඳහා විශේෂ උපායමාර්ග හදුනාගෙන රට අදාළ පියවර ගෙන ඇත.

දැනටමත් සංචාරක ආකර්ෂණය අතින් ඉහල ස්ථානයක් නිර්මිකරගෙන ඇති උඩවලව සංචාරක කලාපය, නවද කෘෂිකර්මාන්තය ප්‍රමුඛ කරගත් කෙසෙල් ඇතුළු අගය එක්කල නිෂ්පාදන වගාකළ හැකි කෘෂිකාර්මික භූමිය; නගරයේ පවතින වටිනා සම්පත් ලෙස හදුනාගෙන ඇති අතර එම සම්පත් විධිමත්ව යොදවමින් නගරාශ්‍රිත හම්බන්තොට වරාය, මන්නල ගුවන්තොටුපොළ, දක්ෂිණ අධිවේගී මාර්ගය වැනි අවස්තාවන් භාවිතා කරමින් නගරයේ ජන ජීවිතය නගාසිටුවීම මෙන්ම ඒ තුළින් නාගරික ආර්ථිකය ජය ගැනීමට අදාළ විශේෂ සංවර්ධන ව්‍යාපෘති හදුන්වාදී පැවතීම නාගරයේ සංවර්ධනයට මහත් පිටුවහලකි.

මෙම සංවර්ධන කාර්යයභාරය සිදුකිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව ඇතුළු අනෙකුත් ප්‍රාදේශීය පරිපාලන ආයතන සමග ඒකාබද්ධ වී ක්‍රියාකිරීම තුළින් නගරයේ ඉදිරි අත්‍යවශ්‍යතා මැනවින් අවබෝධ කරගෙන නාගරික ජනතාවට හා සංසරණ ජනතාවට ආකර්ශණීය, ජීවත්වීමට සුදුසු පරිසර හිතකාමී නගයක් නිර්මාණය කිරීමට ගෙන ඇති උත්සාහය අගය කළ යුතුය.

ඇඹිලිපිටිය නාගරික ජනතාවගේ බලාපොරොත්තු මල්ඵල ගන්වමින් හෙට දවස සුබදායක කිරීම සඳහා වශකිවයුතු මහජන නියෝජිතයන් වශයෙන් මා ඇතුළු අනෙකුත් මහජන නියෝජිතයන් සියලුදෙනා මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාන්මක කිරීමට අදාළ වශකීම් ඉටුකිරීම වෙනුවෙන් නොපිරිහෙලා සහයෝගය ලබාදීමට අපේක්ෂා කරමි.

සුරන්න වීරසිංහ
සභාපති
ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව

පූර්විකාව

ඇඹිලිපිටිය නගරයේ පවතින සංවර්ධන ප්‍රවණතා හේතුවෙන් ඉස්මතුවන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය මතු වී ඇත. ඒ අනුව නගරයේ පවතින ආර්ථික, සාමාජීය, භෞතික හා පාරිසරික තත්ත්වය විශ්ලේෂණය කරමින් නිරසාර නගර නිර්මාණය කිරීමේ අරමුණ වෙත ලඟාවීම ඉලක්කගතව ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම සකස් කොට ඇත. ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම 2021–2030, I, II සහ III ලෙස කොටස් තුනකින් සමන්විත වන අතර, I වන කොටස සංවර්ධන සැලැස්මේ පසුබිම, පසුබිම් අධ්‍යනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශ.දු.අ.න. විභ්ලේෂණය, සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වන අතර II වන කොටස 2021–2030 කාල සීමාව සඳහා සැලසුම් සීමාවට අදාළ භෞතික සංවර්ධන උපායමාර්ග හා නියමනා වලින් සමන්විත වේ. III වන කොටස කලාපිකරණ මායිම් වලට අදාළ බණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

පළමුවන කොටස – සැලැස්මේ 1 වන පරිච්ඡේදය සංවර්ධන සැලැස්මේ අර්ථය, එහි නෛතික සන්දර්භය, සැලැස්මේ පාර්ශ්වකරුවන්, විෂය පථය සහ සැලසුම් ක්‍රියාවලිය විස්තර කෙරේ. පිලිවෙලින් 2 වන සහ 3 වන පරිච්ඡේදයන් සැලසුම් ප්‍රදේශය, ප්‍රදේශයේ ඉතිහාසය, සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම සහ සැලැස්මේ අවශ්‍යතාවය විස්තරාත්මකව දක්වා ඇත. 4 වන පරිච්ඡේදයේ දැක්ම, අරමුණු සහ උපායමාර්ගික සැලසුම් වලින් සමන්විත වන අතර 5 වන පරිච්ඡේදයේ එක් එක් පරමාර්ථයන් සඳහා වන මූලික ශ.දු.අ.න. විශ්ලේෂණය පිළිබඳ විස්තරාත්මක විස්තරයක් ඇතුළත් වේ. එමෙන්ම සැලැස්මේ 6 වන පරිච්ඡේදයේ සංකල්පීය සැලැස්ම සහ යෝජිත ඉඩම් පරිහරණ සංවර්ධන සැලැස්ම විස්තර කෙරේ. ඒ යටතේ සංවර්ධන සැලැස්මේ ප්‍රධාන උපායමාර්ග සැලසුම් වන භෞතික හා සාමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග, නිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග හා ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග ලෙස සවිස්තරව දක්වා ඇත.

දෙවන කොටස – 7 වන පරිච්ඡේදය මඟින් සංවර්ධන කලාප සහ කලාප සඳහා පොදු නියමනා දක්වා ඇති අතර 8 වන පරිච්ඡේදයේ හදුනාගත් කලාප සහ කලාපිකරණ නියාමනා සහ කර්මාන්ත කලාප සංවර්ධන නියාමන සැලැස්ම හා නියමනා විස්තර කර ඇත. 9 වන පරිච්ඡේදයේ යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත සීමාවන් ඇතුළත් වේ.

මේ අනුව, මෙම අධිකාරියේ සහ ශ්‍රී ලංකා රජයේ අරමුණ වන්නේ 2021–2030 ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමයි.

ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි(සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2020 සැප්තැම්බර් 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,

17 හා 18 මහල,

"සුහුරුපාය",

සුහුනිපුර පාර,

බත්තරමුල්ල.

2021 ඔක්තෝම්බර් **15** **වන දින.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2236/18 - 2021 ජූලි මස 13 වැනි අඟහරුවාදා - 2021.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

රජයේ නිවේදන

ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 **"ඊ"** වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2020 සැප්තැම්බර් 24 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

මහින්ද රාජපක්ෂ (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 අප්‍රේල් මස 15 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 මහල,
"සුහුරුපාය",
සුහුනිපුර පාර,
බත්තරමුල්ල.

07-570/1

ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල

1A - G 34645 - 60 (2021/07)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ප්‍රදේශයේ කොටසක් අන්තර්ගත වන්නා වූ, ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2021ක් වූ අප්‍රේල් මස 15 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා විසින්, උක්ත පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

මහින්ද රාජපක්ෂ (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2021 ජූලි මස 12 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 සහ 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

07-570/2

ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලතල ප්‍රකාරව ඇඹිලිපිටිය නගර සභාව සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසකින් සමන්විත වන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 අප්‍රේල් මස 15 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2021 ජූලි මස 12 වැනි දින,

07-570/3

පටුන

ප්‍රණාමය III
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන V
ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ පෙරවදන VI
ගරු සභාපතිතුමාගේ පෙරවදන – නාගරික සංවර්ධන අධිකාරිය VII
ගරු සභාපතිතුමාගේ පෙරවදන – ඇඹිලිපිටිය නගර සභාව VIII
ගරු සභාපතිතුමාගේ පෙරවදන – ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව IX
පූර්විකාව X
අමාත්‍යතුමාගේ අනුමැතිය XI
ගැසට් නිවේදනය XII
පටුන XIV

I වන කොටස – දත්ත විශ්ලේෂණය සහ සැලැස්ම XIX

පරිච්ඡේදය 01 – සංවර්ධන සැලැස්මේ පසුබිම 1

1.1. හැදින්වීම 2
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශ්වකරුවන් 2
1.3. විෂය පථය 4
1.4. සැලසුම් ක්‍රියාවලිය 5

පරිච්ඡේදය 02 – මූලික අධ්‍යයනය 9

2.1. අධ්‍යන ප්‍රදේශය 10
2.2. සැලසුම් සන්දර්භය හා අවස්ථා සන්දර්භය
(Planning and Situation context) 19

2.2.1. නගරයේ ඓතිහාසික පසුබිම 19
2.2.2. ජානික භෞතික සැලැස්ම 20
2.2.3. ඇඹිලිපිටිය නගරයට අදාළව පෙර සකස් කරන ලද සංවර්ධන සැලසුම් 22

2.3. සැලසුම් සීමාව නිර්ණය කිරීම 22

2.3.1. භූගෝලීය පිහිටීම (Geographical Boundary) 22
2.3.2. ක්‍රියාකාරින්වමය පිහිටීම (Functional Boundary) 24
2.3.3. පරිපාලන සීමාව (Administrative Boundary) 25

පරිච්ඡේදය 03 – සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව 29

පරිච්ඡේදය 04 – සංවර්ධන සැලසුම් රාමුව 39

4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම 40
4.2. දැක්මේ ප්‍රකාශනය 41
4.3. අරමුණු 41
4.4. පරමාර්ථ 42

පරිච්ඡේදය 05 – ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය 45

5.1. සාරාංශගත ශ.දු.අ.න. විශ්ලේෂණය 46
5.2. විස්තරාත්මක ශ.දු.අ.න. විශ්ලේෂණය 52

5.2.1. පළමු අරමුණට අදාළ ශ.දු.අ.න. විශ්ලේෂණය 52
5.2.2. දෙවන අරමුණට අදාළ ශ.දු.අ.න. විශ්ලේෂණය 66
5.2.3. නෙවන අරමුණට අදාළ ශ.දු .අ.න විශ්ලේෂණය 77

පරිච්ඡේදය 06 – සංවර්ධන සැලැස්ම 87

6.1. හැදින්වීම 88
6.2. සංකල්පිත සැලැස්ම 88
6.3. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 2030 91
6.4. භෞතික හා සාමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග 95

6.4.1. සාමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග 96

6.4.1.1. නේවාසික පහසුකම් 96
6.4.1.2. සෞඛ්‍ය පහසුකම් 97
6.4.1.3. අධ්‍යාපනික පහසුකම් 98

6.4.2. භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග 99

6.4.2.1. යෝජිත නගර මධ්‍යය සංවර්ධන සැලැස්ම 2030 99
6.4.2.2. යෝජිත ප්‍රවාහන සැලැස්ම 2030 104
6.4.2.3. යෝජිත ජල සැපයුම් සැලැස්ම 2030 113
6.4.2.4. යෝජිත විදුලි සැපයුම් සැලැස්ම 2030 116
6.4.2.5. යෝජිත අප ජලය හා මළාප්‍රවාහ කළමනාකරණ සැලැස්ම 2030 118
6.4.2.6. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 2030 121

6.5. ආර්ථික සංවර්ධන උපායමාර්ග 125

6.5.1. යෝජිත කෘෂි ආර්ථික සැලැස්ම 2030 125
6.5.2. යෝජිත කර්මාන්ත සැලැස්ම 2030 129
6.5.3. යෝජිත සංචාරක සේවා සැලැස්ම 2030 133

6.6. නිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග 137

6.6.1. යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම 2030 137
6.6.2. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම 2030 140
6.6.3 යෝජිත භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 2030 144

6.7. ක්‍රියාන්මක කිරීමේ උපායමාර්ග 147

6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති. 147
6.7.2. වගකිවයුතු ආයතනික රාමුව 200

II කොටස – භෞතික සංවර්ධන උපායමාර්ග සහ නියමනා 203

පරිච්ඡේදය 07 – සංවර්ධන කලාප සහ පොදු කලාපිකරණ නියමනා 205

7.1. හැදින්වීම 206
7.2 සංවර්ධන කලාප 206

7.2.1 කලාපිකරණ සැලැස්ම 2021 - 2030 207

7.3 කලාප සංගුණකය 208

7.3.1. කලාප සංගුණකය නිර්ණය කිරීම 208
7.3.2. කලාප සඳහා අදාළ කලාප සංගුණකය (2021–2030) 212

7.4. සැලසුම් ප්‍රදේශය සඳහා වූ පොදු කලාපිකරණ නියමනා 213

පරිච්ඡේදය 08 – කලාපිකරණ නියමනා 215

8.1. වාණිජ කලාපය I 216

8.1.1. වාණිජ කලාපය I සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 216

8.2. වාණිජ කලාපය II 218

8.2.1 වාණිජ කලාපය II සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 218

8.3. ආයතනික කලාපය 219

8.3.1. ආයතනික කලාපය සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 219

8.4. සංචාරක සේවා කලාපය 221

8.4.1. සංචාරක සේවා කලාපය සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 221

8.5. කෘෂි සේවා කලාපය 223

8.5.1. කෘෂි සේවා කලාපය සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 223

8.6. කර්මාන්ත කලාපය 226

8.6.1. කර්මාන්ත කලාපය සඳහා අදාළ කලාපිකරණ නියමනා 226

8.7. මිශ්‍ර නේවාසික කලාපය I 227

8.7.1. මිශ්‍ර නේවාසික කලාපය I සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 227

8.8. මිශ්‍ර නේවාසික කලාපය II 229

8.8.1. මිශ්‍ර නේවාසික කලාපය II සඳහා අදාළ කලාපිකරණ නියමනා සහ අනුමත භාවිතයන් 229

8.9. හරිත සංරක්ෂණ කලාපය 231

8.9.1. හරිත සංරක්ෂණ කලාපය සඳහා අදාළ කලාපිකරණ නියමනා හා අනුමත භාවිතයන් 231
8.9.2 සංරක්ෂිත ප්‍රදේශ සඳහා අදාළ මාර්ගෝපදේශ හා කොන්දේසි 233

8.9.2.1. හරිත සංරක්ෂණ කලාපය සඳහා වූ මාර්ගෝපදේශ 233
8.9.2.2 හරිත සංරක්ෂණ කලාපය තුළ අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටතේ කරනු ලබන කොන්දේසි 235

8.10. සංවර්ධන නියාමන සැලැස්ම හා නියමනා 237

8.10.1. හැඳින්වීම 237
8.10.2. යෝජිත කර්මාන්ත කලාප නියාමන සැලැස්ම 237

8.10.2.1 යෝජිත කර්මාන්ත කලාපය අදියර I 239
8.10.2.2 යෝජිත කර්මාන්ත කලාපය අදියර II 240
8.10.2.3 යෝජිත නේවාසික ප්‍රදේශය 241

8.10.3. කර්මාන්ත කලාපයේ සංවර්ධන කටයුතු සඳහා වන පොදු නියමනා 242

පරිච්ඡේදය 09 – යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමාව හා රක්ෂිත සීමාවන් 247

9.1. යෝජිත මාර්ග හා ගොඩනැගිලි සීමා 248

9.1.1. මාර්ග සංවර්ධන අධිකාරියට හා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග 248
9.1.2. ඇඹිලිපිටිය නගර සභාවට අයත් මාර්ග 248
9.1.3. ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග 260
9.1.4. ඉහත නම් සඳහන් නොමැති මාර්ග හා මාර්ග රක්ෂිත සීමාවන් 260
9.1.5. යෝජිත මාර්ග හා මාර්ග රක්ෂිත සීමාවන් 261

9.2. ජල මූලාශ්‍ර ආශ්‍රිත රක්ෂිත සීමාවන් 262
9.3. කැණීම් සඳහා රක්ෂිත අවශ්‍යතා 263

සිනියම් ලැයිස්තුව 264
වගු ලැයිස්තුව 265
රූප සටහන් ලැයිස්තුව 266

උපලේඛන

උපලේඛනය 01

"අ" පෝරමය – අවසරලත් ගෙබිම් අනුපාතයන් 210
"ආ" පෝරමය – මීටර් 3 සහ 4.5 මාර්ග සඳහා මහල් ප්‍රමාණයන් 211
"ඉ" පෝරමය – විවෘත අවකාශයන් 211

උපලේඛනය 02 –හරිත සංරක්ෂණ කලාපයට අදාළ උපලේඛනය 236
උපලේඛනය 03 – කර්මාන්ත වර්ගීකරණය 244

III කොටස – ඇමුණුම් 269

ඇමුණුම් 01 : සිනියම් 270
ඇමුණුම් 02 : වගු 286
ඇමුණුම් 03 : රූප සටහන් 297
ඇමුණුම් 04 : ප්‍රස්ථාර 299
ඇමුණුම් 05 : ගැලීම් සටහන් 302
ඇමුණුම් 06 : පාර්ශ්වකරුවන්ගේ අදහස් ආශ්‍රිත පරිසණක වචන විශ්ලේෂණය (Word Cloud Analysis) 306
ඇමුණුම් 07 : කලාප සංගුණකය ගණනය කිරීම 309
ඇමුණුම් 08 : කලාප මායිම් 323
ඇමුණුම් 09 : කලාප භාවිනයන් (Zoning Metrix) 375

කෙටි යෙදුම් 379
පරිශීලින මූලාශ්‍ර 380



I කොටස

දත්ත විශ්ලේෂණය හා සැලැස්ම

පරිච්ඡේදය 01



සංවර්ධන සැලැස්මේ පසුබිම

01 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මේ පසුබිම

හැදින්වීම

සංවර්ධන සැලැස්මේ පාර්ශ්වකරුවන්

1.1. හැදින්වීම

නාගරික සංවර්ධන අධිකාරියේ විෂය පථය තුළට ඇතුළත් ප්‍රධානතම කාර්යය භාරයක් වන නාගරික සංවර්ධන ප්‍රදේශ හඳුනාගැනීම, එම ප්‍රදේශ නාගරික බල ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කිරීම හා එවැනි ප්‍රකාශිත බල ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් පිළියෙළ කර ක්‍රියාවට නැංවීම යන ක්‍රියාදාමයට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම නගරයක් වන ඇඹිලිපිටිය නගරයන්, උඩවලව, තුංකම හා පදලංගල යන කුඩා නගර තුනන් ඇතුළත් කර සමස්ථ ඇඹිලිපිටිය නාගරික බලප්‍රදේශය සඳහා මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කර ඇත.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ වර්ෂ 1986 ජනවාරි මස 21 දින අංක 385/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් නාගරික බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරන ලද ප්‍රදේශය විසල් හම්බන්නොට සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාන්මක කිරීමට අදාළව වර්ෂ 2009 ජුනි මස 11 වන දින අංක 1605/41 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාස 21කින් සමන්විත වර්ග කිලෝමීටර් 150 ක භූමී ප්‍රදේශයක් නාගරික බල ප්‍රදේශය ලෙස පුළුල් කර ප්‍රකාශයට පත්කර ඇත.

ඇඹිලිපිටිය නගරයේ ආර්ථික,සාමාජීය,භෞතික හා පාරිසරික පසුබිම පිළිබඳ පුළුල් අධ්‍යයනයන් සිදුකිරීම තුළින්; ඉහත සඳහන් අංශ වල පවතින ප්‍රශ්න සඳහා විසදුම් ලබාදීමෙන් ළඟාකර ගන්නා භෞතික හා සාමාජීය සංවර්ධනය තුළින් නගරයේ හා ඒ අවට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමන්, නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීමන් අරමුණු කරගනිමින් වර්ෂ 2021–2030 යන කාලය සඳහා සැලසුම් සහගත නගරයක් වශයෙන් ඇඹිලිපිටිය නගරයේ සංවර්ධන කටයුතු ක්‍රියාන්මක විය යුතු මාර්ගෝපදේශයක් වශයෙන් මෙම සංවර්ධන සැලැස්ම, 1982 අංක 4 දරණ පනතේ 8 "අ" වගන්තිය මඟින් පවරා ඇති බලතල වලට අනුගතව පිළියෙළ කර ඇත. මෙහි මූලික අධ්‍යයනයන් වර්ෂ 2017 මාර්තු මස සිට ආරම්භ කර ක්‍රියාන්මක කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී විධිමත්ව සියලු දත්ත ඒකරාශී කිරීම, විශ්ලේෂණය කිරීම මෙන්ම නාගරික මහජනතාව ඇතුළු සියලු පාර්ශවයන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගනු ලැබූ අතර ඒ අනුව නිර්මාණය කරන ලද දැක්මකට අනුව පිළියෙළ කරන ලද සංවර්ධන සැලැස්මේ සියලු සංවර්ධන යෝජනා සංක්ෂිප්තව හා විස්තරාත්මකව මෙම වාර්තාව තුළ අන්තර්ගත කර ඇත.

1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශ්වකරුවන්

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ කටයුතු සාක්ෂාත් කර ගැනීම සඳහා නගරයේ පරිපාලන කටයුතු වලට මැදිහත්ව ක්‍රියා කරන රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන, විවිධ අංශ නියෝජනය කරන සංවිධාන, ව්‍යාපෘති ආයතන වලින් ලැබුණු සහයෝගය හා සංවර්ධන යෝජනා මහඟු පිටුවහලක් වූ අතර ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට හා අනෙකුත් සහය දැක්වූ අංශ වලට අමතරව අනෙකුත් ආයතන හා සංවිධාන 33ක් නම දායකත්වය ලබා දී ඇත.

ප්‍රධාන උපදේශන ආයතන (Main Consultancy Agencies)

1. *ඇඹිලිපිටිය නගර සභාව*
2. *ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව*

අනෙකුත් උපදේශන ආයතන (Other Consultancy Agencies)

1. ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව
2. මහවැලි අධිකාරිය –ඇඹිලිපිටිය
3. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – ඇඹිලිපිටිය
4. මාර්ග සංවර්ධන අධිකාරිය – ඇඹිලිපිටිය
5. ලංකා විදුලිබල මණ්ඩලය – ඇඹිලිපිටිය
6. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය – ඇඹිලිපිටිය
7. ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය – රන්නපුර
8. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය – ඇඹිලිපිටිය
9. සබරගමුව මාර්ගස්ථ හා මඟී ප්‍රවාහන අධිකාරිය
10. ඇඹිලිපිටිය/ කුට්ටිගල/ උඩවලව පොලිස් ස්ථාන
11. නැපැල් දෙපාර්තමේන්තුව – ඇඹිලිපිටිය
12. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය – ඇඹිලිපිටිය
13. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය – ඇඹිලිපිටිය
14. කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය – ඇඹිලිපිටිය
15. විධායක ඉංජිනේරු කාර්යාලය– කුට්ටිගල
16. කර්මාන්ත උද්‍යානය – ඇඹිලිපිටිය
17. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව – උඩවලව
18. ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය– ඇඹිලිපිටිය
19. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – රන්නපුර
20. කර්මාන්ත අමාත්‍යාංශය – සබරගමුව පළාත් සභාව
21. මධ්‍යම පරිසර අධිකාරිය – රන්නපුර
22. නිවාස සංවර්ධන අධිකාරිය – රන්නපුර
23. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය – සබරගමුව පළාත් සභාව
24. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව – රන්නපුර
25. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව . රන්නපුර
26. වාරිමාර්ග දෙපාර්තමේන්තුව – රන්නපුර
27. පුරා විද්‍යා දෙපාර්තමේන්තුව – රන්නපුර
28. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ දෙපාර්තමේන්තුව– සබරගමුව පළාත් සභාව
29. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය – රන්නපුර

අනෙකුත් පාර්ෂවකරුවන් (Other Stakeholder Groups)

1. ඇඹිලිපිටිය වෙළඳ සංගමය
2. ඇඹිලිපිටිය ගොවිජන සංගමය

නාගරික සංවර්ධන අධිකාරියේ, සබරගමුව පළාත් කාර්යාලයේ සැලසුම් කණ්ඩායම විසින් මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

1.3. විෂය පථය

රන්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි ඇඹිලිපිටිය නගරය, කලාපීය වශයෙන් සබරගමුව පළාත, දකුණු පළාත හා ඌව පළාත අතර අන්තර් සබඳතා පහසුවෙන් ඇතිකර ගැනීමට පහසුවන මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිතව ඇත. මෙම නගරයේ භෞතික පිහිටීම නිසාවෙන් විසල් හම්බන්තොට වැනි කලාපීය මට්ටමේ සංවර්ධනයන් තුළින් ජාතික මට්ටමේ වැදගත්කමක් ඇති හම්බන්තොට ජාත්‍යන්තර වරාය, මන්නල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ආදී සේවා මධ්‍යස්ථාන තුළින් වැඩි වරප්‍රසාද ලබාගැනීමේ ඉඩ ප්‍රස්ථාව සලසාගෙන ඇත.

ජාතික භෞතික සැලැස්ම තුළින් ඇඹිලිපිටිය නගරය සබරගමුව පළාතේ දෙවන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන ඇති අතර ජාතික වශයෙන් පවතින සංවර්ධන සැලසුම් ක්‍රියාදාමයන් තුළ දකුණු පළාත සමඟ ඒකාබද්ධ කරමින් දක්ෂිණ ආර්ථික සංවර්ධන කොරිඩෝවට මෙම නගරය ඇතුළත් කර ඇත (ඇමුණුම් සිතියම් අංක 1.2). මෙම සියලු දායකත්වයන් සැලකීමේදී කඩිනම් සංවර්ධනයකට වැඩි ප්‍රවේශයක් පැවතියද ඒ සඳහා ජාතික මට්ටමේ කඩිනම් සංවර්ධන අවශ්‍යතාවයක් හඳුනාගෙන නොපවතින අතර කලාපීය මට්ටමේ සංවර්ධනයක් සඳහා ඇඹිලිපිටිය නගරය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළින් ඇඹිලිපිටිය සම්පූර්ණ නාගරික බල ප්‍රදේශයම ආවරණය කර ඇති අතර, සමස්ථ සැලැස්ම තුළින් වර්ෂ 2030 වනවිට කලාපීය සම්පත් ඵලදායිව භාවිතා කරමින් ආර්ථිකමය වශයෙන් ස්ථාවර, පරිසර හිතකාමී වටපිටාවක් සහිත භෞතිකව සංවර්ධිත වූ සෞඛ්‍යමත් හා යහගුණැති සමාජ වටපිටාවක් සහිත සුන්දර නගරයක් ඇතිකිරීම අපේක්ෂා කෙරේ.

1.4. සැලසුම් ක්‍රියාවලිය

මූලික අධ්‍යයනය (Background Studies)

විෂය පථය (Scoping)

ගැටළු හා විභවතා හඳුනාගැනීම
(Problems and Potentials)

දැක්ම, අභිමතාර්ථ හා අරමුණු සැකසීම
(Vision, Goals & Objectives)

සවිස්තරාත්මක දත්ත විශ්ලේෂණය
(Detail Analysis)

සැලසුම් උපායමාර්ග සැකසීම (Strategies Formulation)

නියමතා සැකසීම (Regulations)

ව්‍යාපෘති හඳුනාගැනීම හා එම ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රදේශ හඳුනාගැනීම
(Identification, Establishment, Evaluation and Testing)

ලේඛනගත කිරීම, මහජන ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කිරීම
(Documentation and Public Consultations

සංශෝධනය හා ප්‍රකාශයට පත් කිරීම
(Amendments & Publishing)

රූප සටහන 1.1 : *සැලසුම් ක්‍රියාවලිය*
මූලාශ්‍රය : *සැලසුම් කණ්ඩායම - සබරගමුව පළාත් කාර්යාලය, 2017*

01 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මේ පසුබිම

සැලසුම් ක්‍රියාවලිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම ආරම්භයේ සිට අවසානය දක්වා පියවරයන් කිහිපයක් යටතේ සැලසුම් කටයුතු සිදුකර ඇත. එම සැලසුම් ක්‍රියාවලිය රූප සටහන් අංක 1.1 මඟින් සංක්ෂිනව දක්වා ඇත.

මෙම නගර සංවර්ධන සැලැස්මේ මූලික අදියර ලෙස සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රදේශය පිළිබඳ පුළුල් අධ්‍යනයක් සිදු කරන ලදි. ඒ අනුව නාගරික බල ප්‍රදේශය පිළිබඳ ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික ආදී සියලු පැතිකඩයන් පිළිබඳ ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යයනය තුළින් සමස්ථ ප්‍රදේශය පිළිබඳ පුර්ණ විග්‍රහයක් කර ඇත.

ප්‍රාථමික හා ද්විතියික දත්ත අධ්‍යයනයට අමතරව මෙම ප්‍රදේශයට අදාළව සිදුකර ඇති ජානික හා භෞතික සැලැස්ම, සබරගමුව කලාපීය ව්‍යුහ සැලැස්ම, පළාත් පාලන ආයතන හා වෙනත් ආයතන විසින් පිළියෙළ කරන ලද සැලසුම් අධ්‍යයනය කිරීම තුළින් මෙම ප්‍රදේශයට අදාළ සංවර්ධන කාර්යයන් පිළිබඳ කරුණු නවදුරටත් රැස් කර ගෙන ඇත.

ඉහත සඳහන් පියවරයන් මඟින් රැස්කරගත් සියලු ප්‍රාථමික හා ද්විතියික දත්ත විශ්ලේෂණය තුළින් හා සංවර්ධන කාර්යයන් තුළින් මෙම ප්‍රදේශයට අදාළ නව සංවර්ධන විභවනා හා නගරයේ සංවර්ධනය සඳහා බාධා වශයෙන් පවතින ගැටළු හඳුනාගැනීම සිදුකර ඇත.

එමෙන්ම නගරය පිළිබඳ මූලික අධ්‍යයනය තුළින් හඳුනාගත් ගැටළු විභවනා වලට අමතරව නාගරික පරිපාලන ආයතන, විවිධ පර්ෂද කණ්ඩායම් සමඟ සිදුකරනු ලබන සාකච්ඡා වැඩසටහන් මඟින් ඔවුන්ගේ අන්දැකීම් හා පළපුරුද්ද ආශ්‍රිත කරුණු සාකච්ඡා කිරීම හරහා නගර සංවර්ධනයට පවතින අවශ්‍යතාවය හඳුනාගැනිමද මෙම සංවර්ධන සැලැස්මේ එක් සුවිශේෂී අංගයක් විය. (ඇමුණුම 06)

මනුපිටින් ගැටළු ලෙස කැපී පෙනෙන්නා වූ නගරයේ පවතින සියලුම ගැටළු බිම් මට්ටමින් සලකා බැලීමේදී සංවර්ධන සැලැස්ම තුළින්ම විසදුම් සෙවිය යුතුද යන්න මෙහිදී අධ්‍යයනය කර ඇත. එහිදී හඳුනාගත් ගැටළු එකින් එක ගෙන බැලීමේදී අනෙකුත් ගැටළු අතරින් විශේෂ වීම (Significant), ඒවායේ සන්දර්භය (context), අනෙක් ගැටළු හා සැසඳු විට එහි බලපෑමේ ප්‍රමාණාත්මකභාවය (magnitude) පිළිබඳ කරුණු විශ්ලේෂණය තුළින් ගැටළු පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර ඇත.

සංවර්ධන සැලැස්මේ පසුබිම සකස් කරගැනීම සඳහා නාගරික ප්‍රදේශයට අදාළව පාරිසරික සංවේදීනා අධ්‍යයනය (Sensitivity Analysis), ශ.දු.අ.න. විශ්ලේෂණයන් (SWOT Analysis), විභවනා අධ්‍යයනය (Potential Analysis), Livability Analysis, සංවර්ධන ප්‍රවණතාවය (Development Pressure) හඳුනාගැනීම ආදී දත්ත විශ්ලේෂණයන් නවදුරටත් සිදු කර ඇත.

ඉහත සිදුකරන ලද සියලු පියවරයන් තුළදී එක්රැස් කරගත් දත්ත හා සියලු තොරතුරු අනුව නගරයේ සංවර්ධන ගමන්මඟ වෙන ලඟාවීමේ මූලික අඩිනාලම වශයෙන් වර්ෂ 2030 වන විට ඇඹිලිපිටිය නගරය සංවර්ධනය විය යුතු ආකාරයට අදාළ "දැක්මක්" (Vision), අරමුණු (Goals) හා පරමාර්ථ (Objectives) ගොඩනගාගෙන ඇත.

සංවර්ධන සැලැස්මේ අරමුණු ඉටුකරගැනීම සඳහා උපායමාර්ග(Strategies) ඇතුළත් කර ඇත. මෙහිදී භූමිය හා ගොඩනැගිලි සංවර්ධන උපායමාර්ග, සාමාජීය හා භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග හා නිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග වශයෙන් ප්‍රධාන උපායමාර්ග හතරක් යටතේ සංවර්ධන සැලසුම් උපායන් සකස්කර ඇත.

මෙම සංවර්ධන උපායමාර්ගයන් යටතේ ප්‍රධාන සංවර්ධන සැලසුම් කිහිපයක් සිදුකර ඇත. එම සැලසුම් යෝජිත භූමි භාවිතයන්, නාගරික සේවා සංවර්ධනය, කුඩා නගර සංවර්ධනය, ප්‍රවාහනය, අගය එක්කරන කර්මාන්ත සංවර්ධනය, කෘෂි කර්මාන්තය ආශ්‍රිත ක්‍රියාකාරකම් සංවර්ධනය හා පොදු එළිමහන් විනෝද කටයුතු යනාදී වශයෙන් අංශ කිහිපයක් යටතේ සංවර්ධන සැලසුම් සකස් කිරීම සඳහා හඳුනාගෙන ඇත. මීට අමතරව හඳුනාගත් විශේෂ කලාප සඳහා සංවර්ධන නියාමන සැලසුම් සකස් කර ඇත.

මෙම සියලු සැලසුම් ඇතුළත්වන පරිදි සංවර්ධන සැලැස්ම නිමා කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතන වල අනුමැතිය හා මහජන අදහස් විමසීම සඳහා දින 60ක කාලයක් නැබීමෙන් අනතුරුව එක්කරන ලද සංශෝධනය සිදුකර නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටු අනුමැතිය ඇනිව විෂයභාර අමාත්‍යවරයා විසින් අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත්කර ඇත.


පරිච්ඡේදය 02



මූලික අධ්‍යයනය

2.1. අධ්‍යයන ප්‍රදේශය

සබරගමුව පළාතේ,රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටියාවූ ඇඹිලිපිටිය නගරය; පැල්මඩුල්ල – නෝනගම (A18) මාර්ගයේ 55 වෙනි කිලෝමීටරය ආසන්නයේ දී ඇඹිලිපිටිය – මොරකැටිය (B549)මාර්ගයත්, ඇඹිලිපිටිය – මිද්දෙණිය (B486) මාර්ගයත් හා ඇඹිලිපිටිය – පනාමුර (B18) මාර්ගයත් සම්බන්ධ වන මංසන්ධි ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් ස්ථාපිනව ඇත. (රූප සටහන් අංක. 2.1)




රූප සටහන 2.1 : *ඇඹිලිපිටිය අධ්‍යයන ප්‍රදේශය*
මූලාශ්‍රය : *google earth map*

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම සඳහා පාදක කරගනු ලැබූ අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින භෞතික, ආර්ථික, පාරිසරික හා සාමාජීය පැතිකඩයන් වෙත අවධානය යොමුකරමින් අධ්‍යයන ප්‍රදේශය පිළිබඳ නත්න්ව විශ්ලේෂණයක් සිදුකර ඇත.

අධ්‍යයන ප්‍රදේශයේ සාමාජීය පැතිකඩ පිළිබඳ පුළුල් අධ්‍යයනයක් සිදුකිරීම තුළින් කලාපයේ ජනගහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම් යනාදී සාමාජීය යටිතල පහසුකම් හා එකී ක්ෂේත්‍රයන් තුළ පවතින ප්‍රවර්ධනයන් හඳුනාගෙන ඇත. ජනගහනය පිළිබඳ අධ්‍යයනයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සමස්ථ ජනගහනය 185,470 (2016)ක් වශයෙන් හා (සම්පත් පැනිකඩ ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය) එම ජනගහනයෙන් 56.9 %ක ජනගහනයක් ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ ජීවත් වන බවට වාර්තා වන අතර 2030දී මෙම අධ්‍යයන ප්‍රදේශය සඳහා අපේක්ෂිත ජනගහනය 230,000 ක් බවට පුරෝකථනය කර ඇති අතර ඉන් 125,045ක් එනම් 54.3%ක ජනගහනයක් (රූප සටහන් අංක 2.2) ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ ජීවත් වන බවට පුරෝකථනය කර ඇත.

ජනගහනය




රූප සටහන 2.2 : *ජනගහනය*
මූලාශ්‍රය : *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

ජනගහන ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනයේදී ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ජන ඝණත්වය වර්ග කිලෝමීටර් එකකට පුද්ගලයන් 484ක් වන අතර එය නාගරික බල ප්‍රදේශය තුළ වර්ග කිලෝමීටරයට පුද්ගලයන් 660ක් වශයෙන් වැඩි ජන ජනඝනත්ව(ඇමුණුම සිනියම් අංක 1.5) අගයක් පෙන්නුම් කරන අතර ජනගහන වර්ධන වේගය 1.3කි

මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ ජනවාර්ගික පදනම අනුව වැඩිම ප්‍රතිශතයක් වශයෙන් 99.9 %ක සිංහල ජනගහනයක් වාර්තා වන අතර ආගම අනුව 99.8%ක වැඩිම බෞද්ධ ජනගහනයක් වාර්තා වේ. වයස් කාණ්ඩ අනුව ජනගහන ව්‍යාප්තිය තුළ 46.6%ක වැඩිම අගය වශයෙන් අවුරුදු 20-50 න් අතර වයස් කාණ්ඩය යටතේ වාර්තා වන අතර 30.3%ක ජනගහනයක් අවුරුදු 0-20 න් අතර වයස් කාණ්ඩය යටතේද අඩුම ප්‍රතිශතය වන 23.1%ක ජනගහනය අවරුදු 50 ට වැඩි වයස් කාණ්ඩය යටතේ වාර්තා වී ඇත. මෙම ජනගහන දත්තයන්ට අනුව වැඩ කරන වයසේ ජනගහනය වශයෙන් සැලකිල්ලට ගතහැකි වයස අවුරුදු 20-50න් අතර 46.6%ක් නරමී වැඩි ප්‍රතිශතයක ජනගහනයක් අධ්‍යයන ප්‍රදේශ තුළ ජීවන්වීම සංවර්ධන කාර්යයයන් සඳහා දායකත්වය ලබාගත හැකි වඩා වැදගත් ප්‍රබලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත(රූප සටහන් අංක 2.3) .

වයස් කාණ්ඩ අනුව ජනගහනය



රූප සටහන 2.3 : *වයස් කාණ්ඩ අනුව ජනගහනය*
මූලාශ්‍රය : *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

02 වන පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

නවද අධ්‍යයන ප්‍රදේශයේ ජනනාවගේ අවශ්‍යතා සපුරාලීමට පවතින සාමාජීය යටිතල පහසුකම් ව්‍යාප්තිය පිළිබඳ විශේෂ අවධානයක් මෙම සංවර්ධන සැලසුම් කාර්යය ආරම්භයේදී සිදුකරනු ලැබූ අතර එහිදී සාමාජීය යටිතල පහසුකම් වශයෙන් වැදගත්වන ඇඹිලිපිටිය කලාපයේ අධ්‍යාපන අවශ්‍යතා සපුරාගැනීමට මූලික වන පාසල් 50 ක් මෙම අධ්‍යයන ප්‍රදේශයේ අධ්‍යාපන කලාපය තුළ ස්ථාපිතව පවති. එම පාසල් 50 අතර 1 ඒබී පාසල් 6 ක්,1 සි පාසල් 9 ක් අර්ධ රාජ්‍ය පාසලක් දෙවන කාණ්ඩයේ පාසල් 24ක් හා තුන්වන කාණ්ඩයේ පාසල් 10 කින් වර්ගීකරණය වී ඇත. පහසුකම් අතින් උසස් මට්ටමේ පවතින 1 ඒබී පාසල් 6න් පාසල් 5 ක්ම නාගරික බල ප්‍රදේශය තුළ පිහිටා ඇත (අධ්‍යාපන කලාප කාර්යාලය, 2016). මෙම පාසල් වලට අමතර අධ්‍යාපනික පුහුණු ආයතන හා නාක්ෂණික පුහුණු ආයතන 8ක් මෙම නගරය ආශ්‍රිතව පිහිටා ඇත.

පසුගිය වසර තුළ (2016) ඇඹිලිපිටිය කලාපයේ අධ්‍යාපනික මට්ටම පිළිබඳ අධ්‍යයනයේදී හඳුනාගත හැකි ලක්ෂණය වන්නේ අ.පො.ස. සාමාන්‍ය පෙළ අධ්‍යාපන මට්ටමින් පසු උසස් අධ්‍යාපනය සඳහා යොමු නොවන ප්‍රමාණය 46.6%ක (අමුණුම් ප්‍රස්තාර අංක 4.1) තරම් වැඩි මට්ටමක පැවතීමය.


එමෙන්ම රන්නපුර දිස්ත්‍රික්කයේ අනෙක් අධ්‍යාපන කලාප හා සංසන්දනයේදී රන්නපුර අධ්‍යාපන කලාපය හැරුණුවිට වැඩි සිසු ජනගහනයක් ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය තුළින් වාර්තා වේ.(ඇමුණුම් ප්‍රස්තාර අංක 4.2)

කලාපයේ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ දත්ත විශ්ලේෂණය තුළින් දැනට පවතින සෞඛ්‍ය පහසුකම් පිළිබඳ හඳුනාගත හැකි වන අතර එහිදී බෝවන හා බෝනොවන රෝග සම්බන්ධයෙන් විශේෂ බලපෑමක් පසුගිය වසර කිහිපය තුළින් වාර්තා වී නොමැත.

2016 වසර තුළ වාර්තා වූ වසංගත රෝගීන් ප්‍රමාණය 454ක් වූ අතර ඉන් 254ක් එනම් 56% ක් ඩෙංගු රෝගීන් වූවන් එම රෝගී තත්ත්වය 2016 වසර තුළ මුළු රටටම බලපෑම් කළ රෝගී තත්ත්වයක් වූ බැවින් ඇඹිලිපිටිය කලාපයට පමණක් වූ බලපෑමක් වශයෙන් සැලකිය නොහැක *(සමීපන් පැනිකඩ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2016)*. ඇඹිලිපිටිය දිස්ත්‍රික් මූලික රෝහල ප්‍රමුඛ වූ ප්‍රාදේශීය රෝහලක්, පෞද්ගලික රෝහල් 4ක් හා ආයුර්වේද රෝහලක් තුළින් සෞඛ්‍ය සේවා සැපයීම සිදු වන අතර මෙම සියලු රෝහල් ඇඹිලිපිටිය නාගර්ක බල ප්‍රදේශය තුළ පිහිටා නිබීම විශේෂ කරුණකි *(ඇමුණුම් සිනියම් අංක 1.6)*.

මෙම අධ්‍යයන ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය අධ්‍යයනය තුළින් නගරයේ ආර්ථික පදනම හා ශ්‍රම බලකාය පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් සිදුකර ඇත. අධ්‍යයන ප්‍රදේශයේ සමස්ථ ශ්‍රම බලකාය 99,765ක් වශයෙන්ද ඉන් 52,284ක ශ්‍රම බලකායක් ආර්ථිකමය වශයෙන් සක්‍රිය දායකත්වයක් සපයන බවට වාර්තා වේ. ආර්ථිකමය වශයෙන් අක්‍රිය ශ්‍රම බලකාය 47,481කි. එමෙන්ම සේවා නියුක්ති අගය 48,461ක් හා සේවා වියුක්තිය 3803ක් වශයෙන් වාර්තා වේ (ජන සංඛ්‍යා හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව). ඒ අනුව සේවා නියුක්තියට සාපේක්ෂව සේවා වියුක්ති අගය ඉතා අඩු අගයක් ගැනීම නගරයේ ආර්ථික වර්ධනයට හේතුවන ප්‍රබලනාවයක් වශයෙන් හඳුනාගෙන ඇත (රූප සටහන් අංක 2.4).

ශ්‍රම බලකාය ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය




රූප සටහන 2.4 : *ශ්‍රම බලකාය ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*
මූලාශ්‍රය : *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

නගරයේ ආර්ථික පදනම කෘෂි කර්මාන්නය ,කර්මාන්න, නොග හා සිල්ලර වෙළෙඳාම,මෝටර් රථ හා අමතර කොටස් අලෙවිය, සංචාරක කර්මාන්නය හා ඛණිජ ද්‍රව්‍ය යනාදිය තුළින් ගොඩනැගී ඇති අතර ආර්ථිකයට ප්‍රධානතම හා සක්‍රියතම දායකත්වය සපයනු ලබන්නේ කෘෂි කර්මාන්නය තුලිනි.

උඩවලව බහුකාර්යය යෝජනා ක්‍රමය (වර්ෂ 1963) සමඟ බිහිවන ගොවි ජනපද මූලික කරගනිමින් වර්ධනය වූ කෘෂිකාර්මික කටයුතු වල වර්ධනයක් මේවන විටත් පෙන්නුම් කරමින් පවතී. ප්‍රධානතම කෘෂි බෝගය වශයෙන් වී වගාවන් රට අමතරව එළවළු, කෙසෙල්,පළතුරු, උක්, රටකජු සහ බඩ ඉරිඟු වැනි වගාවන් මෙම අධ්‍යයන කලාපය තුළ වගා කරනු ලබයි. උඩවලව ප්‍රධාන කෘෂිකාර්මික කලාපය මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ වලව විශේෂ බල ප්‍රදේශය වශයෙන් නම්කර ඇති අතර එම බල ප්‍රදේශය අනු කලාප 6ක් යටතට නම්කර ඇත. එම කලාප අතුරින් චන්ද්‍රිකා වැව කලාපයට මෙම අධ්‍යයන ප්‍රදේශය අයත් වේ.

පසුගිය වර්ෂ 2015 – 2016 අතර කාලය තුළ යල කන්නයේ තුළ මෙට්‍රික් ටොන් 11,378 ක වී නිෂ්පාදනයක් හා මහ කන්නයේ තුළ මෙට්‍රික් ටොන් 9,935ක වී නිෂ්පාදනයක් මෙම කලාපය තුළ සිදුකර ඇති අතර යල, මහ කන්න දෙක තුළදී උඩවලව කලාපයේ සමස්ථ වී නිෂ්පාදනයට චන්ද්‍රිකා වැව කලාපයෙන් සැපයූ වී නිෂ්පාදනය14.6 %ක ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේ ඇති ප්‍රධාන වී නිෂ්පාදන කලාප 27 අතුරින් උඩවලව කලාපය, වී නිෂ්පාදනය තුළින් 15 වන ස්ථානයේ (ඇමුණුම් ප්‍රස්තාර අංක 4.3) පසුවන අතර උඩවලව කලාපයේ වාර්ෂික සමස්ථ වී නිෂ්පාදනය 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ අධ්‍යයනය කිරීමේදී සමස්ථ නිෂ්පාදනයේ අගය ක්‍රම ක්‍රමයෙන් වැඩි වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම්කර ඇත (රූප සටහන් අංක 2.5).


උඩවලව කලාපයේ වී නිෂ්පාදනය (මහ / යල කන්න)



රූප සටහන 2.5 : *උඩවලව කලාපයේ වී නිෂ්පාදනය (මහ / යල කන්න)*
මූලාශ්‍රය : *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2015*


වී නිෂ්පාදනයට අමතරව ඇඹිලිපිටිය නගරය තුළ ප්‍රධාන වශයෙන් කෙසෙල් හා අතුරුබෝග වගාවන් සිදුකරනු ලබයි. පසුගිය 2016 වසර තුළ වී වගාව හැරුණු විට වැඩිපුර භූමි ප්‍රමාණයක් යොදාගෙන ඇත්තේ කෙසෙල් වගාව සඳහා ය. එනම් හෙක්ටයාර් 2121.6(සමස්ථ වගා බිම් වලින් 16%)ක් කෙසෙල් වගාව සඳහා ද ,අනිරේක බෝග සඳහා හෙක්ටයාර් 1587(සමස්ථ වගා බිම් වලින් 12%) ක භූමි ප්‍රමාණයක්ද වශයෙන් භාවිතා කර ඇත (රූප සටහන් අංක 2.6).

වී හැර අනෙකුත් බෝග වගා සඳහා භූමි පරිහරණය (ඇ.ප්‍රා.ලේ.කො.)




රූප සටහන 2.6 : *වී හැර අනෙකුත් බෝග වගා සඳහා භූමි පරිහරණය (ඇ.ප්‍රා.ලේ.කො.)*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2016*

ඇඹිලිපිටිය නගරයේ ආර්ථිකය (රූප සටහන් අංක 2.7) කෘෂි කර්මාන්තය ප්‍රමුඛ කරගනිමින් ගොඩනැගීම කෙරෙහි කලාපයේ කෘෂිකාර්මික බෝග වගාව, කෘෂි නිෂ්පාදන හා කෘෂිකාර්මික සේවා පදනම් කරගත් වෙළඳපොළ දායක වී ඇත. නගරයේ දැනට පවතින කෘෂිකාර්මික වෙළඳපොළ තුළ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන බීජ වර්ගවල සිට අවසාන අස්වැන්න නෙලීම හා විකිණීම දක්වා සියලු කටයුතු සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ, කෘෂිකාර්මික වාහන, පොහොර වර්ග, කෘෂි රසායන ද්‍රව්‍ය, එකතුකිරීම් මධ්‍යස්ථාන ආදී සියලු සේවාවන් අන්තර්ගතවී ඇත.



රූප සටහන 2.7 : *ඇඹිලිපිටිය නගරයේ ආර්ථික පදනම*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, 2016*

නගරවාසීන්ට අමතර දකුණු හා උඟව පළාතේ නොයෙක් ප්‍රදේශ වල ජනතාව කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම හා සේවා පහසුකම් සලසා ගැනීම සඳහා ඇඹිලිපිටිය නගරයට පැමිණෙනු ලැබේ. මෙම අධ්‍යයන ප්‍රදේශයේ සේවා ක්ෂේත්‍ර වර්ගීකරණයට (රූප සටහන් අංක 2.8). අනුව වැඩිම ප්‍රතිශතයක් එනම් 27%ක් නියැලී සිටින්නේ කෘෂිකර්මික ක්ෂේත්‍රයේය.



රූප සටහන 2.8 : *රැකියා වර්ගීකරණය - ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*
මූලාශ්‍රය : *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*


02 වන පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

කෘෂිකර්මික ක්ෂේත්‍රයට අමතරව කර්මාන්ත ක්ෂේත්‍රය තුළින්ද කලාපීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා දායකත්වයක් සපයනු ලබයි. අධ්‍යයන ප්‍රදේශය තුළ විශාල පරිමාණයේ කර්මාන්තයක්, මධ්‍යම පරිමාණයේ කර්මාන්ත 35ක්, කුඩා පරිමාණයේ කර්මාන්ත 297 ක්, සාම්ප්‍රදායික කර්මාන්ත 562 ක් හා ස්වයං රැකියා 1505ක් ඇතුළු කර්මාන්ත 2400 ක් ස්ථාපිත වී ඇත. එම කර්මාන්ත තුළින් කර්මාන්ත 917ක්ම නාගරික බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. මෙම කර්මාන්ත වලට අමතරව අක්කර 50ක භූමී ප්‍රදේශයකින් සමන්විත කර්මාන්ත උද්‍යානයක් කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ස්ථාපනය කර ඇත. මේවන විට අක්කර 25 ක ප්‍රදේශයක් පළමු අදියර යටතේ කර්මාන්ත සඳහා භාවිතා කරමින් පවතී.

නිෂ්පාදන කර්මාන්ත වලට අමතරව මෙම ප්‍රදේශය තුළ කැපී පෙනෙන කර්මාන්තයක් ලෙසින් සංචාරක කර්මාන්තය හඳුනාගත හැකි අතර සබරගමුව පළාතේ ප්‍රධාන සංචාරක කලාප හත (ඇමුණුම් සිතියම් අංක 1.12) අතුරින් උඩවලව සංචාරක කලාපයට ඇඹිලිපිටිය නගරය හා ඒ ආශ්‍රිත සංචාරක ප්‍රදේශය අයත් වේ. මෙම කලාපයේ සංචාරක ආකර්ශණීය ප්‍රදේශ ලෙස උඩවලව ජලාශය, උඩවලව ජාතික වනෝද්‍යානය, සංඛපාල විහාරය,මඩුවන්වල වළව්ව, චන්ද්‍රකා වැව, ලියන්ගස්නොට අමුණ, උඩවලව ඇත් අතුරු සෙවණ ආදී ස්ථාන දැකබලා ගත හැකිවේ. මෙම සංචාරක ප්‍රදේශ අතරින් විදෙස් සංචාරකයන්ගේ ආකර්ෂණය දිනාගෙන ඇති උඩවලව ජාතික වනෝද්‍යානයට 2015 වසරේ ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ පැමිණි විදේශීය සංචාරකයින් සංඛ්‍යාව 44,032ක් වන අතර පැමිණි දේශීය සංචාරකයින් සංඛ්‍යාව 52,530 කි. අමතරව 2014 ජනවාරි සිට ජූලි දක්වා කාලය තුළ ඇත් අතුරු සෙවණ නැරඹීම සඳහා දේශීය සංචාරකයින් 76,248 ක ප්‍රමාණයක් ද විදේශීය සංචාරකයින් 12,119 ක ප්‍රමාණයක් ද පැමිණ ඇත (රූප සටහන් අංක 2.9).

සංචාරක පැමිණීම (ජනවාරි - ජූලි 2015)



රූප සටහන 2.9 : *2015 ජනවාරි-ජූලි අතර කාලය තුළ උඩවලව වනෝද්‍යානය හා ඇත් අතුරු සෙවණට පැමිණි සංචාරකයින්*
මූලාශ්‍රය : *සබරගමු පළාත් සංචාරක අමාත්‍යාංශය, 2017*

මෙම අධ්‍යයන ප්‍රදේශය තුළ ඩොනමයිට් කළු ගල්, වැලි, ගොඩ වැලි, කෙඔලින් හා මැණික් වැනි ඛණිජ වර්ග බොහොමයක් පිහිටා නිබෙන අතර පසුගිය වසර (2016) සඳහා මෙවැනි ඛණිජ කැණීම් බලපත්‍ර 120ක් පමණ භූ විද්‍යා සමීක්ෂණ හා පනල් කාර්යාංශය විසින් නිකුත් කර ඇත (ඇමුණුම් වගුඅංක 2.1). ඒ අනුව වාණිජමය වටිනාකමක් සහිත ඛණිජ සම්පත් භාවිතය විධිමත්ව කළමනාකරණයකට ලක්කිරීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කරගැනීමේ අවස්ථාව උදාවේ.

එමෙන්ම අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින භෞතික සම්පත් අධ්‍යයනය තුළින් යටිතල පහසුකම් වල ව්‍යාප්තිය හා අනාගත ඉල්ලුමට සරිලන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය වියයුතු ආකාරය පිළිබඳ හඳුනාගෙන ඇත. ඒ අනුව ඇඹිලිපිටිය නගරයේ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ සැලකීමේදී මහාමාර්ග, ජලය, විදුලිය, ප්‍රවාහනය ආදී අංශ කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත.

ඇඹිලිපිටිය නගරය තුළ ප්‍රධාන මාර්ග ජාලය පැල්මඩුල්ල – නෝනගම (A18) මාර්ගයන්, ඇඹිලිපිටිය – මොරකැටිය (B549) මාර්ගය, ඇඹිලිපිටිය – මිද්දෙණිය (B486) මාර්ගයන් හා ඇඹිලිපිටිය – පනාමුර (B18) මාර්ගයන් එක්ව සැකසී ඇත. නගරය තුළ ව්‍යාප්තව පවතින මාර්ග ජාලය තුළින් දකුණු පළාතේ හා උඹව පළාතේ බොහෝ ප්‍රදේශ වෙත පහසුවෙන් සම්බන්ධ විය හැකි අතර මෙහි විශේෂත්වය වන්නේ සබරගමුව පළාත් සිමාවේ පිහිටි නගරයක් වන බැවින් උඹව හා දකුණු පළාතට ළඟාවීම සඳහා පවතින දුර ප්‍රමාණය අවම වීමයි. ඇඹිලිපිටිය සිට රත්නපුර නගරයට දුර කිලෝමීටර් 79ක් පමණ වන අතර, ඇඹිලිපිටිය සිට උඹව පළාතේ නගරයක් වන සෙවණගල නගරයට ඇත්තේ කිලෝමීටර් 12.8 ක් හා දකුණු පළාතේ නගරයක් වන සූරියවැවට පවතිනුයේ කිලෝමීටර් 21.7 ක් වැනි අවම දුර සීමාවකි.

නගරයේ බොහෝ ස්ථාන වල ප්‍රධාන මාර්ග දෙපස රේඛීය සංවර්ධනයක් (ඇමුණුම් සිතියම් අංක 1.8) දක්නට ලැබෙන අතර නගර මධ්‍යයේ පවතින ප්‍රධාන මාර්ග පද්ධතිය හා නගර අභ්‍යන්තරයේ පවතින අතුරු මාර්ග පද්ධතිය ගුණාත්මක භාවයෙන් ඉතා අඩු තත්ත්වයක පවතින බවට හඳුනාගෙන ඇත.

ඇඹිලිපිටිය නගරයේ කේන්ද්‍රගත පිහිටීම තුළින් ලැබෙන ප්‍රතිලාභයක් ලෙස දිවයිනේ බොහෝ ප්‍රදේශ සඳහා ප්‍රවාහන පහසුකම් ඇඹිලිපිටිය නගරය තුළ සිට ක්‍රියාත්මක වීම හඳුනාගෙන ඇත. බස්රථ ධාවනය දුර පළාත් සඳහා දිනකට ගමන්වාර 626ක් හා ළඟ ප්‍රදේශ සඳහා දිනකට ගමන්වාර 771 ක්‍රියාත්මක වේ.

මෙම නගරයේ විදුලි අවශ්‍යතාවය සපුරාලීම සඳහා මුළු නගරයම ආවරණය වන පරිදි ට්‍රාන්ස්ෆෝමර් ස්ථානගතකර රැහැන් ගත කර ඇත.මෙයට අමතරව අධ්‍යන ප්‍රදේශය තුළ පිහිටා ඇති ACE POWER පෞද්ගලික දැවිතෙල් බලාගාරය තුළින් ජානික විදුලි පද්ධතියට මෙගා වොට් 100(MW)ක ධාරිතාවයක්ද උඩවලව ජලවිදුලි බලාගාරය තුළින් මෙගා වොට් 6 (MW) ධාරිතාවයක්ද කලාපීය විදුලි අවශ්‍යතා සඳහා ලබාදේ.

මෙම ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාව 68.6%ක් සපුරාලනුයේ ජානික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ප්‍රජා ජල ව්‍යාපෘතිය මඟිනි. ඊට අමතරව ළිං හා වෙනත් ජල මූලාශ්‍ර තුළින් ද පානීය ජල අවශ්‍යතාවය සපුරා ගනු ලබන අතර පානීය ජලය සැපයීමේ ප්‍රධානතම ජල මූලාශ්‍රය ලෙස ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැව භාවිතා කරනු ලබයි.

නගරය තුළ කසළ කළමනාකරණ කටයුතු ඇඹිලිපිටිය නගර සභාව හා ප්‍රාදේශීය සභාව විසින් වෙන් වෙන්ව සිදුකරමින් පවතින අතර නගරය තුළ මළ ප්‍රවාහය හා අප ජල බැහැර වීම සඳහා විධිමත් නල හා කාණු පද්ධතියක් ස්ථාපිත වී නොමැත.

මෙම අධ්‍යයන ප්‍රදේශයේ පවත්නා පාරිසරික තත්ත්වයන් සැලකීමේදී හඳුනාගත හැකි ප්‍රධානතම ලක්ෂණය වනුයේ ප්‍රදේශයම ආවරණය කරනු ලබන වැව් හා වාරි ඇළ පද්ධතිය මෙන්ම නගරය හා ඉන් පිටත පිහිටි කුඹුරු වගාව හා අනෙකුත් එළවළු, පළතුරු වගාවන් සඳහා භාවිතයට ගැනෙන බිම් ප්‍රදේශ වලින් සමන්විත වීමයි. ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ 35% ක භූමී ප්‍රදේශයක් කෘෂිකාර්මික කටයුතු සඳහා දැනට භාවිතයට ගෙන ඇත.

කෘෂිකාර්මික කලාපයක කේන්ද්‍රස්ථානය වශයෙන් පිහිටා ඇති ඇඹිලිපිටිය නගරය හා ඒ අවට ප්‍රදේශය වගා බිම් වලින් යුත් වටපිටාවක් සහිතව නිර්මාණය වී ඇත. උඩවලව ජලාශයේ සිට ජලය රැගෙන එන උඩවලව දකුණු ඇළ හා ඊට සම්බන්ධ කුඩා වාරි ඇළවල් 70කට අධික ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය සැපයීම සඳහා ඉදිකර ඇත.

02 වන පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

අධ්‍යයන ප්‍රදේශය

උඩවලව ජලාශය ඇතුළු කුඩා වැව් 16ක් මෙන්ම හුලංදා ඔයත්, වලව ගඟත් මෙම ප්‍රදේශයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජල අවශ්‍යතාවය සපුරාලනු ලැබේ (ඇමුණුම් සිතියම් අංක 1.9). කෘෂිකාර්මික භූමි භාවිතය සමඟ කුඹුරු හා වැව් ආශ්‍රිත ප්‍රදේශ සංවේදී ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇත.

නගරය තුළ ජනතාවට එළිමහන් විනෝද හා ක්‍රීඩා කටයුතු සඳහා නගර මධ්‍යය ප්‍රදේශය, චන්ද්‍රිකා වැව ආශ්‍රිත ප්‍රදේශය, නව නගරය ළමා උද්‍යානය, මහවැලි ක්‍රීඩා භූමිය, යෝධගම ක්‍රීඩා භූමිය හඳුනාගෙන ඇති අතර ග්‍රාමීය වශයෙන් කුඩා ප්‍රමාණයේ ක්‍රීඩා භූමි හා පාසල් ක්‍රීඩා භූමි හඳුනාගෙන ඇත.

ඇඹිලිපිටිය නගරය වියළි හා තෙත් කලාපය අතර පිහිටි අතරමැදි කලාපයට අයත්ව පිහිටා ඇති අතර සෑම වර්ෂයකම ජූනි මස අග සිට නොවැම්බර් මස මුල් කාලය තුළ වියළි කාලගුණික තත්ත්වයක් පවතී. එමෙන්ම සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 26.8ක හා වර්ෂාපතනය මිලිමීටර් 1423ක් ලෙස කාලගුණික දත්ත අනුව හඳුනාගෙන ඇත (ඇමුණුම් ප්‍රස්තාර අංක 4.4).

ඇඹිලිපිටිය නගරයේ අධ්‍යයන ප්‍රදේශයේ වර්තමාන ඉඩම් වටිනාකම නීරණය වීමේදී නගරයේ භෞතික පිහිටීම හා අපරවයුහ පහසුකම් ව්‍යාප්තිය හා වර්තමාන භූමි භාවිතය පාදක වී ඇත. ඒ අනුව නගර මධ්‍යයේ පිහිටි වාණිජ භාවිත පවතින ඉල්ලුම වැඩි ඉඩමක පර්චසයක මිල රුපියල් 500,000–1,000,000අතර පවතී. නගර මධ්‍යය ප්‍රදේශයෙන් මදක් ඈතට ප්‍රධාන මාර්ග දෙපස ඉඩම් වටිනාකම පර්චසයක මිල රුපියල් 200,000 – 400,000 ක් අතර පවතින අතර ග්‍රාමීය ප්‍රදේශ වන්නට ඉඩම් වටිනාකම අඩුවී ඇත.

මහවැලි බල ප්‍රදේශ අනුරින් වලව බල ප්‍රදේශයට අයත් ඇඹිලිපිටිය නගරය වලව කලාපයේ විශේෂ සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව මහවැලි බල ප්‍රදේශයක් ලෙස කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙමින් පවතී. මානර සිට මන්නල දක්වා දීර්ඝ කෙරෙන දක්ෂිණ අධිවේගී මාර්ගය ඇඹිලිපිටිය නගරය අභ්‍යන්තරයෙන් ගමන් ගන්නා අතර මෙම ව්‍යාපෘතිය මේවන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

2.2. සැලසුම් සන්දර්භය හා අවස්ථා සන්දර්භය (Planning and situation context)

2.2.1. නගරයේ ඓතිහාසික පසුබිම

ඇඹිලිපිටිය නගරයේ ඓනිහාසික පසුබිම ක්‍රි.පූ. 2 වන හා 3 වන සියවස් දක්වා දිවයන ඉනිහාසයක් දක්වා ව්‍යාප්තව ඇත. ඇඹිලිපිටිය යන නම ඉනිහාසයට එක්ව ඇත්තේ කාවන්නිස්ස රජ සමයේදීය. මෙම ප්‍රදේශයේ ඉදිකර ඇති කාවන්නිස්ස වැව සෑදීමට මුල්වී කටයුතු කර ඇති වීර වාහල නම් ඇමතිවරයෙකු එම වැව ඉදිකර අවසානයේ විවෘත කිරීම සඳහා රජුට කළ ආරාධනයෙන් පසුව රජුට නොදන්වා වැව ඉඳිකිරීම සම්බන්ධයෙන් උරන වූ රජතුමා වැව ඉදිකරන ලද ඇමති වරයාගේ හිස ගසා දැමීමට අනකර ඇත. එසේ ඇමති බිලිවූ පිටිය "බිලිපිටිය" යන්න පසුව "ඇඹිලිපිටිය" නම් වූ බවට ජනප්‍රවාදයේ පවතී.

ඓනිහාසික විකාශනයට අනුව ඇඹිලිපිටිය නගරය රන්නපුර දිස්ත්‍රික්කයේ කොලොන්න කෝරලේ පිහිටි ප්‍රධාන නගරයක් වශයෙන් ඉංග්‍රීසි පාලන සමයේ දිසා පාලන ක්‍රමය යටතේ පාලනය වී ඇත. මෙම ප්‍රදේශය පාලනය කරනු ලැබූ අවසන් දිසා පාලකයා ලෙස කටයුතු කරනු ලැබ ඇත්තේ මඩුවන්වෙල දිසාවේ නම් ඉනා සුප්‍රසිද්ධියට පත් දිසා පාලකයෙකු විසිණි. ඔහු මෙම ප්‍රදේශය පාලනය සඳහා පදිංචිව සිටි නිවස ක්‍රි.ව.1700 දී පමණ II විමලධර්මසූර්ය රජ දවස ඉදිකර ඇති බවට සඳහන් වේ. එම මඩුවන්වෙල වලව්ව (රූප සටහන් අංක 2.10), ඇඹිලිපිටිය නගරයට ආසන්නව කොලොන්න නගරය තුළ පිහිටා ඇත. මෙය වර්තමානයේදී ඓනිහාසික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමක් උසුලන ගෘහයක් ලෙසින් පුරාදාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සංරක්ෂණය කර පවතින අතර මෙම ස්ථානය දෙස් විදෙස් සංචාරකයන් නිරන්තරයෙන් පැමිනෙණ ස්ථානයක් බවටද පත්ව ඇත (Wijesinghe, 2016).



රූප සටහන 2.10 : *මඩුවන්වෙල වලව්ව*
මූලාශ්‍රය : *https://bit.ly/2RUqxOT (2017)*

දිසා පාලන ක්‍රමයෙන් අනතුරුව වර්ෂ 1986 දක්වා සංවර්ධන සභාවක් ලෙසින් පැවති ඇඹිලිපිටිය නගරය 1986 වර්ෂයේ 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයන් සමඟ ප්‍රාදේශීය සභාවක් වශයෙන්ද වර්ෂ 2002 දී නගර සභාවක් වශයෙන් ද ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත.

ගම් උදාව සමඟ ඇඹිලිපිටිය නගරයේ නව නගරය,යෝධගම ග්‍රාම නිලධාරී වසම් ඇතුළත්ව හිගුර ආර, උඩගම, කුඹුගොඩ ආර, හල්මිල්ල කැවිය , තුංකම,පල්ලේගම, කලගෙඩි ආර හා හිගුර ආර ග්‍රාමනිලධාරී වසම් වල, (නෝනගම, මොරකැවිය, ඕද්දෙණිය හා පනාමුර මාර්ග) ප්‍රධාන මාර්ග ආශ්‍රිත ප්‍රදේශ වලින් සමන්විත ප්‍රදේශය වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික බල ප්‍රදේශයක් ලෙස වර්ෂ 1986 ජනවාරී මස 21 දිනැති හා අංක 385/8 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නගර සංවර්ධන සැලැස්ම සඳහා පාදක කරගන් අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ග්‍රාම නිලධාරී වසම් 40කින් සමන්විත සමස්ථ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම සැලකිල්ලට ගෙන ඇත. එම අධ්‍යයන ප්‍රදේශය තුළ ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශයට වන්නට පිහිටි ග්‍රාම නිලධාරී කොට්ඨාස 8කින් හා කොට්ඨාස දෙකක කොටස් වලින් සැදුම්ලන් ප්‍රදේශය ඇඹිලිපිටිය නගරසභා බල ප්‍රදේශය වශයෙන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉතිරි ප්‍රදේශය ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වශයෙන්ද පාලනය වේ.

සංවර්ධන සැලැස්ම සඳහා පාදක කරගනු ලැබූ උඩවලව හංදියේ සිට පදලංගල දක්වා වන සමස්ථ ඇඹිලිපිටිය නගරසභා බල ප්‍රදේශයම හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත්ව පිහිටි ග්‍රාම නිලධාරී වසම් 21කින් සමන්විත ප්‍රදේශය1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික බල ප්‍රදේශයක් ලෙස වර්ෂ 2009 ජුනි මස 11 දිනැති හා අංක 1605/41දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත්කර ඇත.


2.2.2. ජාතික භෞතික සැලැස්ම

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2050 සඳහා පිළියෙල කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළින් ආර්ථික සංවර්ධන කොරිඩෝ හතරක් නම්කර ඇති අතර එහි දක්ෂිණ ආර්ථික සංවර්ධන කොරිඩෝවට ඇඹිලිපිටිය නගරය ඇතුළත් කර ඇත (ඇමුණුම් සිතියම අංක. 1.2).

වර්ෂ 2030 සඳහා පිළියෙල කරන ලද ජාතික භෞතික සැලැස්ම තුළින් ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන සුවිසල් නගර 5 ක් හඳුනාගෙන පැවති අතර (ඇමුණුම් සිතියම් අංක 1.1). ඒ අතරින් ප්‍රධාන නගර තුනකින් සමන්විත සුවිසල් දකුණු කලාපීය සැලැස්ම සඳහා හම්බන්නොට, ඇඹිලිපිටිය හා මොණරාගල ප්‍රධාන නගර අයත්වේ. (රූප සටහන් අංක 2.11)

ජාතික වශයෙන් වැදගත්කමක් දී ඇති හම්බන්නොට සුවිසල් නගරයට ආසන්නව ඇඹිලිපිටිය නගරය පිහිටීම තුළින් එම කලාපයේ ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති හා යෝජිත මහා මාර්ග, අධිවේගී මාර්ග ආදී ව්‍යාපෘති තුළින්ද ඇඹිලිපිටිය නගරයේ ඉදිරි සංවර්ධනයට ඉඩ ප්‍රස්තාවන් සැලසී ඇත.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කරන ලද සබරගමුව පළාත් කලාපීය සැලැස්මේ යෝජිත නගර ධූරාවලියට අනුව ඇඹිලිපිටිය නගරය දෙවන පෙල නගරයක් ලෙස පෙන්වා දී ඇත. (ඇමුණුම් සිතියම් අංක1.4) ඒ අනුව සබරගමුව පළාතේ පළමු පෙල නගරය වන රත්නපුර නගරය හැරුණු විට අනෙක් නගරය වන කෑගල්ල දිස්ත්‍රික්කයටද නගර ධූරාවලියේ හිමිව පවතින ස්ථානයම ඇඹිලිපිටිය නගරයට හිමිව පැවතීම සුවිශේෂී වේ.



රූප සටහන 2.11 : *ජාතික භෞතික සැලැස්ම (සුවිසල් නගර)*
මූලාශ්‍රය : *ජාතික භෞතික සැලැස්ම 2030*

2.2.3. ඇඹිලිපිටිය නගරයට අදාළව පෙර සකස් කරන ලද සංවර්ධන සැලසුම්

වර්ෂ 2009 දී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ඇඹිලිපිටිය නගරයේ නගරසභා බල ප්‍රදේශයද ඇතුළත්ව ග්‍රාම නිලධාරී වසම් දොළහකින් සමන්විත ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කර ඇති නමුත් එය ක්‍රියාන්මක වී නොමැත.

එම සංවර්ධන සැලැස්මේ දැක්ම "සෞභාග්‍යවත් නගරයක් හා සශ්‍රීක වටපිටාවක්" ලෙස ඇතුළත් කර ඇත. කලාපීය සැලැස්ම, යටිතල පහසුකම් හා චන්ද්‍රිකා වැව රක්ෂිත ප්‍රදේශ සඳහා සකස් කරන ලද සැලසුම් මෙහි අන්තර්ගත වී ඇත.

නගරයේ පවතින නව සංවර්ධන ප්‍රවණතාවන්ට අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2030 සඳහා සකස් කරන ලද සැලැස්මේ අන්තර්ගත ප්‍රදේශය ප්‍රමාණවත් නොවීම හා සකස් කරන ලද සැලසුම් වල පවතින අඩුපාඩු මත මෙම සැලැස්ම ක්‍රියාන්මක වී නොමැත.

02 වන පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

සැලසුම් සන්දර්භය හා අවස්ථා සන්දර්භය

ඇඹිලිපිටිය නගරයට අදාළව පෙර සකස් කරන ලද සංවර්ධන සැලසුම්

සැලසුම් සීමාව නිර්ණය කිරීම

භූගෝලීය පිහිටීම


2.3. සැලසුම් සීමාව නිර්ණය කිරීම

ඇඹිලිපිටිය නගරය සඳහා සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේදී ප්‍රධාන වශයෙන් නගරයේ භූගෝලීය පිහිටීම (Geographical Boundary), ක්‍රියාකාරීත්වමය පිහිටීම (Functional Boundary), හා පරිපාලනමය නගර සීමාවන් (Administrative Boundary) මෙන්ම පවත්නා නාගරික බලප්‍රදේශ සීමාව ද සැලකිල්ලට ගෙන ඇත.

2.3.1. භූගෝලීය පිහිටීම (Geographical Boundary)

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි මෙම අධ්‍යයන ප්‍රදේශය (ඇඹිලිපිටිය ප්‍රා.ලේ.කොා.) උතුරු අක්ෂාංශ 6° 20′ 38″ අතරද, නැගෙනහිර දේශාංශ 80° 50′ 56″ අතරද වන පරිදි පිහිටා ඇත. ප්‍රදේශයේ භූ විෂමනාවය පිළිබඳව සැලකීමේදී මුහුදු මට්ටමේ සිට මීටර් 60–100න් පමණ උසකින් වලවේ ගංඟා නිම්නයේ පිහිටි මෙම නගරයේ බොහෝ ප්‍රදේශ තැනිතලා ස්වරූපයක් පෙන්නුම් කළද තැනින් තැන මද රැළි සහිත භූ විෂමතා ලක්ෂණද පෙන්නුම් කරයි (සිනියම් අංක 2.1).

විශේෂයෙන්ම නාගරික කේන්ද්‍රයද ඇතුළත්ව නැගෙනහිර හා දකුණු අර්ධයන් තුළ දක්නට ලැබෙන මෙම තැනිතලා භූ ලක්ෂණ නගරයේ උතුරු හා බටහිර අර්ධයන්ට වන්නට මද රැළි සහිත භූ විෂමතා ලක්ෂණ දක්වා ක්‍රමයෙන් වෙනස් වූ ස්වරූපයක් පෙන්නුම් කරයි. එමෙන්ම ප්‍රදේශයේ ස්වභාවික ජලවහන රටාව වලවේ ගංඟාව පෝෂණය කරමින් රේඛීය ජලවහන රටාවක් ලෙසින් නිර්මාණය වී නිබීම දැකගත හැකිවේ. මෙම භූ විෂමතා ලක්ෂණයන් නගරයේ භෞතික සංවර්ධනයට මහත් පිටු වහලක්ව පවතින අතර, ගංවතුර, නාය යෑම් වැනි ස්වභාවික ආපදාවන් ඉතා අවම ප්‍රදේශයක් ලෙසද හඳුනාගෙන ඇත.



භූගෝලීය පිහිටීම
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4
කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අප්‍රේල් 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)


සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 2.1 : ඇඹිලිපිටිය නගරයේ භූගෝලීය පිහිටීම

2.3.2. ක්‍රියාකාරිත්වමය පිහිටීම (Functional Boundary)

සබරගමුව පළාත් මායිමේ පිහිටා ඇති ඇඹිලිපිටිය නගරයේ ක්‍රියාකාරීත්වමය පිහිටීම (Functional boundary) පිළිබඳ සලකා බැලීමේදී හඳුනාගත හැකි විශේෂ ලක්ෂණය වනුයේ ඇඹිලිපිටිය නගරය පිහිටා ඇති රත්නපුර දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශ හා පවතින සබඩතාවයන්ට වඩා දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කය සමඟ පවතින සබඩතා ඉස්මතු වීමයි. ගම් උදාව වැඩසටහන හා මහවැලි ව්‍යාපාරය යටතේ ගොවි ජනපද ආරම්භ කිරීමේදී දකුණු පළාතේ වැඩි පිරිසක් ඇඹිලිපිටිය නගරය හා ආශ්‍රිත ප්‍රදේශවල පදිංචි කර ඇත. ඒ අනුව නගරයේ ජනතාවගේ ජනවහර සංස්කෘතිය ආදිය මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකලාපය තුළින්ද දකුණු පළාතට ආවේණික ලක්ෂණ වැඩි වශයෙන් පෙන්නුම් කරයි.

එමෙන්ම එදිනෙදා අවශ්‍යතා සපුරාගැනීම සඳහා අවට ප්‍රදේශ තුළින් පැමිණෙන පුද්ගලයන්ගෙන් 70%ක් පමණ පැමිණෙන්නේ උඟව හා දකුණු පළාතේ ආසන්න නගර හා ගම්මාන (රූප සටහන් අංක 2.12) වලිනි (ඇමුණුම් රූප සටහන් අංක 3.1). නාගරික සංවර්ධන ප්‍රවණතා විශ්ලේෂණය තුළින් ද ඉස්මතු වන ලක්ෂණයක් වන්නේ ඇඹිලිපිටිය නගරයේ සංවර්ධනය දකුණු දෙසට ව්‍යාප්ත වන බවයි.



රූප සටහන 2.12 : *ඇඹිලිපිටිය නගරය හා පවතින සබඩතා (nearness centrality)*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2017*

2.3.3. පරිපාලන සීමාව (Administrative Boundary)


සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික් මායිමට වන්නට පිහිටා ඇති ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උඹව හා දකුණු පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයටත් හම්බන්තොට දිස්ත්‍රික්කයටත් මායිම්ව පිහිටා ඇත. නවද පරිපාලන දිස්ත්‍රික්කය රත්නපුර දිස්ත්‍රික්කය වන අතර ඇ. ප්‍රා. ලේ. කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 40 කින් සමන්විත වේ. ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇඹිලිපිටිය නගර සභාව හා ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන දෙක යටතේ පාලනය වේ. (සිනියම් අංක 2.2)

එමෙන්ම විසල් හම්බන්තොට නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ වර්ෂ 2009 ජුනි 11 දින ප්‍රකාශයට පත් කරන ලද නාගරික බල ප්‍රදේශය තුළට මෙම අධ්‍යයන ප්‍රදේශයට අයත් සමස්ථ ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශයන්, ප්‍රාදේශීය සභාවට අයත් උඩවලව නගරයෙන් කොටසක් හා තුංකම, පදලංගල යන කුඩා නගරද ඇතුළත් ග්‍රාම නිලධාරී වසම් 21 කින් සමන්විත වර්ග කිලෝමීටර් 150ක භූමි ප්‍රදේශයක් පවතී. එම නාගරික භූමි ප්‍රදේශය තුළ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ විධි විධාන අනුව සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි ක්‍රියාත්මක කරනු ලබයි.


ඉහත සඳහන් කරුණු අධ්‍යයනයෙන් නාගරික බල ප්‍රදේශය සඳහා සමස්ථ ඇඹිලිපිටිය නගරසභා බල ප්‍රදේශයම ඇතුළත් වීමත්, ක්‍රියාකාරීත්වය අතින් නගරයේ සංවර්ධනයට බෙහෙවින් වැදගත්වන උඩවලව, තුංකම, හා පදලංගල යන කුඩා නගරද එම බල ප්‍රදේශය තුළට ඇතුළත්ව පැවතීමත් අනෙකුත් ප්‍රධාන නගර අතර පවතින සබඳතාවයන් සැලකිල්ලට ගනිමින් පවතින නාගරික බල ප්‍රදේශය ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්මේ සැලසුම් ප්‍රදේශය ලෙස ඇතුළත් කර ඇත.

ඇඹිලිපිටිය නගරයට අමතරව උඩවලව, තුංකම හා පදලංගල යන කුඩා නගරද ඇතුළත් ග්‍රාම නිලධාරී වසම් 19ක් හා ග්‍රාම නිලධාරී වසම් 2ක කොටස් ඇතුළු ග්‍රාම නිලධාරී වසම් 21කින් සමන්විත වර්ග කිලෝ මීටර් 150 ක භූමි ප්‍රදේශයක් මෙම සැලසුම් ප්‍රදේශයට අයත් වේ.

උඩවලව හංදියේ සිට ඇරඹෙන නාගරික බල ප්‍රදේශය පදලංගල නගරය දක්වා ව්‍යාප්තව පවතින අතර නැගෙනහිර දිශාවෙන් වලවේ ගඟ සීමාව වී ඇත. (සිනියම් අංක 2.3)



සිතියම 2.2 : *ඇඹිලිපිටිය නගරයේ පරිපාලන සීමාවන්*



සිතියම 2.3 : ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

පරිච්ඡේදය 03



සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

03 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය තුළදී සැලසුම් සකස් කිරීමේ අවශ්‍යතාවය; ඒ සඳහා පාදක කරගනු ලබන සැලසුම් ප්‍රදේශයේ පවතින ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික යන සෑම අංශයක් පිළිබඳවම සිදුකරන ලද පුළුල් අධ්‍යයනයකින් අනතුරුව අධ්‍යන ප්‍රදේශයේ පවතින ගැටළු හා සංවර්ධන විභාවනාවයන් අනුව හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම ප්‍රදේශයට ආවේණික සංවර්ධනයට බාධා පැමිණ පවතින ප්‍රධාන ගැටළු 4ක් හඳුනාගෙන ඇත.

1. වියළි කාලගුණික තත්ත්වයන් පවතින වසරේ ජුනි මස සිට – නොවැම්බර් මාසය අතර කාලය තුළ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍යවන ජල සැපයුම ප්‍රමාණවත් නොවීම.
2. ඇඹිලිපිටිය කර්මාන්ත උද්‍යානය ඇතුළු මහා පරිමාණයේ කර්මාන්ත සක්‍රිය තත්ත්වයක පවත්වාගෙන යෑමට නොහැකි වීම.
3. ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයට අපේක්ෂිත අරමුණු වෙත ළඟා වීමට නොහැකි වීම.
4. අනවසර ඉදකිරීම්, කටයුතු ඇතුළු පරිසරයට අහිතකර මිනිස් ක්‍රියාකාරකම් තුළින් පාරිසරික සමබරතාව බිඳවැටීම .

1. *වියළි කාලගුණික තත්ත්වයන් පවතින වසරේ ජුනි මස සිට - නොවැම්බර් මාසය අතර කාලය තුළ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ජල සැපයුම ප්‍රමාණවත් නොවීම.*

යටත් විජිත පාලන යුගයෙන් පසු 1957 වර්ෂයේ චන්ද්‍රිකා වැව ඉදිකිරීමත් සමඟ වලව ගංඟා නිම්න සංවර්ධනය ආරම්භ වන අතර වර්ෂ 1963 වනවිට උඩවලව සංවර්ධන ව්‍යාපෘතිය (ලංකාවේ දෙවන බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය) යටතේද සංවර්ධනය වන ඇඹිලිපිටිය නගරය ඇතුළු විශාල භූමී ප්‍රදේශයක් වලව විශේෂ බල ප්‍රදේශය ලෙස නම් කර ඇත. එමෙන්ම 1986 වර්ෂයේ ඇරඹෙන ගම් උදාව වැඩසටහන තුළින්ද කලාපයේ කෘෂිකර්මික ක්ෂේත්‍රයට නවෝදයක් එක්කර දී ඇත. මෙම වලව කලාපීය කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය සපයනු ලබන ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙස උඩවලව ජලාශය හඳුනාගත හැකි අතර උඩවලව දකුණු ඇළෙන් හා හුලංදා ඔයෙන් පෝෂණය වන චන්ද්‍රිකා වැවද එම කාර්යයට දායකත්වයක් සලසයි.

ඒ අනුව ඇඹිලිපිටිය කලාපයටම ජලය සැපයෙන උඩවලව ප්‍රධාන ජලාශය තුළ පවතින ජල මට්ටම වාර්ෂිකව එක සමාන මට්ටමක නොපැවතීම හේතුවෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා ප්‍රමාණවත් අඛණ්ඩ ජල සැපයුමක් පවත්වාගෙන යෑම අසීරු වී ඇත.

විශේෂයෙන් ජුනි මාසයේ අග සිට නොවැම්බර් මාසයේ මුල දක්වා කාලය තුළ වියළි කාලගුණික තත්ත්වයන් මත උඩවලව ජලාශයේ සාමාන්‍ය ජල ධාරිතාවය වන අක්කර අඩි 217,000 ක ජල පරිමාණය ජුනි –නොවැම්බර් අතර කාලය තුළ අක්කර අඩි 35,000 දක්වා වූ අඩු ජල මට්ටමකට පත් වේ. මෙම තත්ත්වය මත වාරි ඇළ පද්ධතියට ජලය නිකුත් කිරීමට නොහැකි වීම හේතුවෙන් කලාපයේ ප්‍රධාන ආර්ථික ප්‍රබවය වන කෘෂිකාර්මික කටයුතු වලට බාධා පැමිණේ.

මෙම ගැටළුව වාර්ෂිකව බලපාන ගැටළුවක් බවට පත්ව ඇති අතර එම කාලසීමාවන් වලදී සමස්ථ කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයම වගා කිරීමට නොහැකි වී ඇත. ඒ අනුව වාර්ෂික අස්වැන්නද ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාමට නොහැකි වීමෙන් ගොවි ජනතාව පීඩාවට පත් වේ. මෙම ජල ගැටලුව සඳහා පහසුවෙන් විසඳුම් සෙවිය නොහැකි අතර රට බලපාන ප්‍රධාන මූල හේතුව ලෙස පවතින වැව් හා ඇළ පද්ධතිය ප්‍රතිසංස්කරණය නොවීමත් නිසි ජල කළමනාකරණයක් නොමැතිවීමත් හඳුනාගෙන ඇත (ඇමුණුම් ගැලීම් සටහන් අංක 5.1).

2. *ඇඹිලිපිටිය කර්මාන්ත උද්‍යානය ඇතුළු නගරයේ පවතින මධ්‍ය පරිමාණයේ කර්මාන්ත සක්‍රිය නත්ත්වයක පවත්වාගෙන යෑමට නොහැකි වීම.*

ඇඹිලිපිටිය හිඟුර ප්‍රදේශයේ කර්මාන්ත අමාත්‍යාංශය විසින් ස්ථාපිත කර ඇති කර්මාන්ත උද්‍යානය ආරම්භ කර ඇත්තේ 2007 වර්ෂයේදී ය. එහි මුළු භූමි ප්‍රමාණය අක්කර 50 ක් වුවත් පළමු අදියර යටතේ ක්‍රියාන්මක වූ අක්කර 25ක කර්මාන්ත උද්‍යානය තුළද අක්කර හතරක භූමි ප්‍රදේශයක් ආයෝජනයකින් තොරව හිස්ව පවතී. මෙම කර්මාන්ත උද්‍යානය තුළ දැනට කර්මාන්ත හතරක් ස්ථාපිත වී ඇති අතර එම කර්මාන්ත තුළ කොහු කෙදි හා රබර් නිෂ්පාදන නිපදවීම, කොන්ක්‍රීට් කණු නිපදවීම, විජලිත පොල් හා පිරිසිදු පොල් තෙල් නිපදවීම හා නිරුවානා ගල් කුඩු නිපදවීම සිදු කරයි. කෘෂිකාර්මික අමුද්‍රව්‍ය පහසුවෙන් ලබාගෙන සිදුකළ හැකි නිෂ්පාදන කර්මාන්ත මෙම කලාපය තුළ ස්ථාපිත කිරීමේ අවකාශ ඇතත් 2007 වසරේ සිට 2017 දක්වා වසර 10 ක කාලසීමාව තුළ එවැනි කර්මාන්ත ස්ථානගත වීමේ ප්‍රවණතාවයක් සිදු වී නොමැත. මෙම නත්ත්වය කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිතව පවතින උග්‍ර ගැටළුවක් වශයෙන් හඳුනාගෙන ඇත.

මෙම කර්මාන්ත උද්‍යානයට අමතරව මහා පරිමාණයේ කර්මාන්ත දෙකක් වශයෙන් දීර්ඝ කලක් පවත්වාගෙන ගිය ඇඹිලිපිටිය කඩදාසි කම්හල හා මොරකැටිය වී ගබඩා සංකීර්ණය වසර ගණනාවක සිට වැසිගොස් පැවතීම කලාපීය කර්මාන්ත ක්ෂේත්‍රය බිඳවැටීමට හේතුසාධක වී ඇත.
ඇඹිලිපිටිය කඩදාසි කම්හල තුළ දිනකට කඩදාසි මෙට්ට්‍රික් ටොන් 50 ක් නිපදවීමට ගන්නා පල්ප මෙට්ට්‍රික් ටොන් 35ක් නිපදවීමේ හැකියාව සහිතව 1977 වසරේ ආරම්භ කර ඇත. සේවකයන් 1500 ක් සමඟ වසර 26ක් ක්‍රියාන්මකව පැවත 2003 වර්ෂයේදී නිෂ්පාදනය අනරමඟ නවතා දමා ඇත (Vidanapathirana, 2017), (Perera, 2017).




රූප සටහන 3.1 : *ඇඹිලිපිටිය කඩදාසි කම්හල*
මූලාශ්‍රය : *https://bit.ly/2EogDSR, https://bit.ly/2UzDM9v (2017)*

කඩදාසි කම්හලට අමතරව 1970 වර්ෂයේදී ආරම්භ වී ඇති මොරකැටිය වී ගබඩා සංකීර්ණය ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය අනුග්‍රහය ඇතිව ඉදිකර ඇති අතර මෙය ක්‍රියාන්මක මට්ටමේ පැවත ඇත්තේ වසර 10ක් පමණ කෙටි කාලයකි. මෙම සංකීර්ණය තුළ දවසේ පැය 24 පුරා වී නැම්බිම ,වේලිම , කෙවිම හා ගබඩා කිරීම යන කාර්යන් සිදු කර ඇති අතර සේවකයන් 1000 ක් පමණ මෙම කර්මාන්තය තුළ සේවයෙහි නිරත වී ඇත. මේ ආකාරයට මහා පරිමාණයේ කර්මාන්ත වැසි යාම ඇඹිලිපිටිය ප්‍රදේශයේ කර්මාන්ත ක්ෂේත්‍රය අඩාල වී පැවතීමට විශේෂයෙන් හේතු සාධක වී ඇත. එමෙන්ම මෙම කර්මාන්ත වැසි යාමත් සමඟ 1000 කට පමණ පිරිසකට රැකියා අහිමිවී යාමද විශාල ගැටළුවක් බවට පත්ව ඇත (රටට එපා වූ මහා වී ගබඩාව , 2016), (Jayasekara , 2016).

03 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක
අවශ්‍යතාවය



රූප සටහන 3.2 : *මොරකැටිය වී ගබඩා සංකීර්ණය*
මූලාශ්‍රය : *Local News, 2016*

මේ ආකාරයට කර්මාන්ත ක්ෂේත්‍රයේ කඩාවැටීමක් සිදුවීමට හේතු සාධක විය හැකි කරුණු විශ්ලේෂණය (ඇමුණුම් ගැලීම් සටහන් අංක 5.2) කිරීම තුළින් ඒ සඳහා බලපෑ ඇති ප්‍රධාන හේතු වශයෙන් කලාපීය අමුද්‍රව්‍ය භාවිතා නොකිරීම, එවැනි භාවිතයන් සිදු කලද නවීන තාක්ෂණික ක්‍රම හා මුසු නොවීම, අඟය එක්කරන නිෂ්පාදන සඳහා යොමු නොවීම මූලික හේතු ලෙස සොයාගෙන ඇත.

මෙම නන්න්වය කලාපයේ ආර්ථික ශක්තිය හීන වීම, සේවා වියුක්ති මට්ටම ඉහළ යාම හා කලාපයේ කෘෂි නිෂ්පාදන සඳහා වන වෙළඳපොළ බිඳවැටීම යනාදී කරුණු කිහිපයක් කෙරෙහි සෘජු බලපෑම් එල්ලකර ඇත.

3. *ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයට අපේක්ෂිත අරමුණු වෙත ළඟා වීමට නොහැකි වීම.*

කෘෂිකාර්මික කලාපයක කේන්ද්‍රස්ථානය වශයෙන් සංවර්ධනය වන ඇඹිලිපිටිය නගරයේ හා අවට ගොවි ජනතාවට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කිරීම සඳහා පහසුකම් සැපයීම මූලික අරමුණු කරගනිමින් ස්ථාපිත කර ඇති ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය වර්ෂ 2003 දී ආරම්භ කර ඇත. මෙම ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඇති අතර එහිදී කලාපීය බෝග වගාවන් පිළිබඳවද දත්ත රැස්කිරීමක් සිදුකර ඇත.

එහිදී හිඟුර ආර, උඩගම, තුංකම හා හිඟුර ප්‍රදේශ ආශ්‍රිත සිදුකරන ලද අධ්‍යයනයන් තුළින් වගාකල භූමී ප්‍රමාණයට අනුව අපේක්ෂිත වී අස්වැන්න වශයෙන් මෙට්‍රික් ටොන් 4212 ක්ද,කෙසෙල් මෙට්‍රික් ටොන් 1650ක්ද එළවළු මෙට්‍රික් ටොන් 1560ක් යනාදී වශයෙන් නිෂ්පාදන දත්ත රැස්කර ඇතත් එම ප්‍රදේශ ආශ්‍රිතව මසකට නිෂ්පාදනය කරන කෙසෙල් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 200 කට වැඩි ප්‍රමාණයක් වන අතර ආර්ථික මධ්‍යස්ථානයට ලැබෙනුයේ ඉන් 40%න් 50%න් අතර ප්‍රතිශතයකි. එමෙන්ම එළවළු නිෂ්පාදනය මසකට මෙට්‍රික් ටොන් 260ක් පමණ වුවද එයින් ආර්ථික මධ්‍යස්ථානය වෙත ලැබෙනුයේ 23%- 26% ත් අතර අඩු ප්‍රතිශතයකි. මෙම නන්න්වය ආර්ථික මධ්‍යස්ථානය ආරම්භයේදී නිබු අපේක්ෂිත ඉලක්කයන් වෙත ළඟා වීම අසීරු වීමට බලපෑ ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත.

2003 වසරේ සිට වසර 3ක් පමණ කාලසීමාවක් තරම් සාර්ථකව මෙම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වී ඇති නමුත් එනැන් සිට මේ දක්වා වසර 11ක පමණ කාලයක් එහි ක්‍රියාකාරීන්වය අඩපනව පැවතීම කලාපීය සංවර්ධනයට පවතින එක් ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇත. මෙම ආර්ථික මධ්‍යස්ථානය ප්‍රධාන ගොඩනැගිල්ල ඇතුළු කඩ කාමර 46කින් සමන්විතව ඉදිකර ඇතත් එම කඩ කාමර අතුරින් කෘෂි නිෂ්පාදන සඳහා භාවිතා කරනුයේ කඩ කාමර 12ක් පමණ වන අතර කඩ කාමර 5ක් මේ වන විටත් වසා දමා ඇත.





රූප සටහන 3.3 : *ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය*
මූලාශ්‍රය : *ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය (2017)*

ආර්ථික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වය අඩපණවීම කෙරෙනි බලපාන ලද කරුණු සම්බන්ධයෙන් සිදුකරන ලද මූල හේතු විශ්ලේෂණය (Root Cause Analysis) මඟින් මෙම ආර්ථික මධ්‍යස්ථානයට අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට නොහැකි ප්‍රධාන හේතුවක් ලෙස අනරමැදි වෙළෙන්දන් විසින් කලාපීය කෘෂි නිෂ්පාදන මිලදී ගැනීම බවට හඳුනාගෙන ඇත (ඇමුණුම් ගැලීම් සටහන් අංක 5.3).

4. *අනවසර ඉදකිරීම්, කටයුතු ඇතුළු පරිසරයට අහිතකර මිනිස් ක්‍රියාකාරකම් නිසින් පාරිසරික සමබරතාව බිඳවැටීම.*

ඉහතින් හඳුනාගත් ප්‍රධාන ගැටළු තුනට අමතරව මෙම ප්‍රදේශයේ පවතින සම්පත් අවභාවිතය නිසින් සිදුවන පාරිසරික හානි කිහිපයක් හඳුනාගෙන ඇත. මිනිස් ක්‍රියාකාරකම් මත පරිසරයට සිදුවන හානි දීර්ඝ කාලීනව ක්‍රියාත්මක වීමට ඉඩ හැරීමෙන් පාරිසරික සමබරතාවය බිඳවැටී යයි. එහිදී ප්‍රධාන ගැටළු වශයෙන් ජල මූලාශ්‍ර ආශ්‍රිත රක්ෂිත වල අනවසරව සිදුකරනු ලබන ඛණිජ ද්‍රව්‍ය කැණීම් හා වලවේ ගඟ ආශ්‍රිත ඉඩම්වල ගොඩ වැලි හැරීම ආදී ක්‍රියාවන් වර්ධනය වීමෙන් පරිසර පද්ධතියට හානි සිදුවීමට පවතින ඉඩකඩ වැඩිවිය හැක.



වන්දිකා වැව රක්ෂිතය අභ්‍යන්තර පවතින ඉඳිකිරීම්

0 0.1 0.2 0.4 0.6 0.8 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අප්‍රේල් 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 3.1 : *වන්දිකා වැව රක්ෂිතය අභ්‍යන්තර පවතින ඉඳිකිරීම්*

නගරයේ හදවත බඳු චන්ද්‍රිකා වැව ප්‍රදේශයේ ජල අවශ්‍යතාවයෙන් 90%ක් සපුරාලනු ලබන අතර මෙම වැව් රක්ෂිතය තුළ අනවසර ඉදිකිරීම් සිදුකිරීම, ජල මූලාශ්‍රය තුළට හා ජල පෝෂක ප්‍රදේශය තුළට අපද්‍රව්‍ය මුදා හැරීම ආදී අහිතකර ක්‍රියාකාරකම් තුළින් මෙම වැවේ සුරක්ෂිතභාවය අනතුරුදායක තත්ත්වයකට පත්ව ඇත. වර්තමාන තත්ත්වය අනුව චන්ද්‍රිකා වැව් ඉවුරේ සිට මීටර් 100 ක් වශයෙන් සැලකෙන වැව් රක්ෂිත සීමාව තුළ පමණක් අනවසර ඉදිකිරීම් 400ක් පමණ ඇතුළත්ව ඇති බවට අනාවරණය වී ඇත.



රූප සටහන 3.4 : *චන්ද්‍රිකා වැව රක්ෂිතය ආශ්‍රිත අනවසර ඉදිකිරීම්*
මූලාශ්‍රය : *google map*


එමෙන්ම ඇඹිලිපිටිය සිට සූරියවැව දෙසට මොරකැටිය මාර්ගය ඔස්සේ කිලෝමීටර් දෙකක් පමණ ගමන් කළ පසු හමුවන, එම මාර්ගයට දකුණු පසින් සමාන්තරව ඉදිකර ඇති ඇළ මාර්ගය හා එහි රක්ෂිත ප්‍රදේශය තුළ රේඛීයව අනවසර ඉදිකිරීම් සිදුකර ඇත.

නවද පාර්සරික ගැටළුවක් වශයෙන් නගර මධ්‍යයේ සිට ගලායන D 26 ඇළ මාර්ගයට නගරයේ බොහෝ වාණිජ ස්ථාන තුළින් එක්කරන අපද්‍රව්‍ය හේතුවෙන් එම ඇළ අපවිත්‍ර වී ඇති ආකාරයත්, එම අපද්‍රව්‍ය කුඹුරු වලට ගලායාමෙන් ගොවියෝ පීඩාවට පත්වන බවටත් නිරන්තර ලැබෙන මහජන පැමිණිලි තුළින් හඳුනාගෙන ඇත.

මෙම කලාපය තුළ පවතින බහිජ සම්පත් කැණීම් කටයුතු සඳහා පසුගිය වසර තුළ (2016) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය 100 ඉක්මවා ඇත. මෙම සම්පත් භාවිතය තුළින් ආර්ථික වාසි ලබාගන්නා අතර, ඉන් ඔබ්බට බලපානු ලබන කොන්දේසි, පාරිසරික සුරක්ෂිතභාවය පිළිබඳ නොසිතා, කටයුතු කරන අවස්ථාද හඳුනාගෙන ඇත. විශේෂයෙන් ගොඩවැලි කැපීම, බොරළු පස් කැපීම, කැණීම් කටයුතු වලින් පසුව විශාල භූමි ප්‍රදේශයක මහා පරිමාණයේ වලවල් සැකසී නිබීමද දැකගත හැකි වේ.

03 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

මෙවැනි පරිසරයට හානි පමුණුවන මිනිස් ක්‍රියාකාරකම් දීර්ඝකාලීනව සිදුකිරීමට ඉඩ හැරීම තුළින් එම ප්‍රදේශයේ පාරිසරික සමතුලිතතාවය බිඳවැටීමට හේතු සාධක වන අතරම එය නිරසාර සංවර්ධනයක් කරා ගමන්කිරීමට ඇති ප්‍රබල ගැටළුවක් වේ.



රූප සටහන 3.5 : *වලවේ ගඟ ආශ්‍රිත ගොඩ වැලි හෑරීම*
මූලාශ්‍රය : *google map (2017)*



රූප සටහන 3.6 : *නගරය තුළ සිදුවන බඹිජ කැණීම්*
ඡායාරූප : *නා.සං.අධි. (2018)*



රූප සටහන 3.7 : *බඹිජ කැණීම් වලින් පසුව පැඬිරි වගාවට යොමුවීම*
ඡායාරූප : *නා.සං.අධි. (2018)*

ඉහත ඡායාරූප මඟින් පෙන්වාදී ඇත්තේ ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ බහිඃජ වර්ග ලබාගැනීම සඳහා සිදුකරන ලද කැණීම් කටයුතු වලින් ඇති වූ විශාල පරිමාණයේ වලවල් හා එවන් ස්ථාන යථා තත්ත්වයට පත්කිරීමේ උපායමාර්ගයක් ලෙසින් රොන්මඩ පුරවා වසන ලද වලවල් භාවිතා කරමින් පැඟිරි වගාව සිදුකර ඇති ආකාරයයි. කැණීම් කටයුතු වලින් පසුව පැඟිරි වගාවට යොමු වීමෙන් කැණීම් කටයුතු මඟින් සිදුවන පරිසර හානිය අවම කරගැනීමේ හැකියාව පවතී (ඇමුණුම් ගැලීම් සටහන් අංක 5.4).

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමේදී මෙම ප්‍රදේශය තුළ මනුවෙමින් පවතින ගැටළු වලට අමතරව පවතින සංවර්ධන විභවනාද හඳුනා ගැනීමක් සිදුකර ඇත. විශේෂයෙන් සබරගමුව පළාතේ නාගරික ධුරාවලියට අනුව දෙවන පෙළ නගරයක් බවට පත්ව තිබෙන ඇඹිලිපිටිය නගරය සබරගමුව පළාතේ දකුණු මායිමට ආසන්නව පිහිටීම හා නවත් පළාත් මායිම් දෙකකට යාබදව පිහිටා තිබීම තුළින් නගරයේ සංවර්ධනය නව මානකට ගෙනයාමට උපකාරී වී ඇත.

එමෙන්ම සංවර්ධන ක්‍රියාදාමය තුළ දකුණු පළාත සමඟ පවතින සම්බන්ධතා මඟින් ඇඹිලිපිටිය නගරයේ දිර්ඝකාලීන සංවර්ධන ක්‍රියාදාමයකට වැදගත් වන අතර එමඟින් නිසි ප්‍රතිඵල ලබා නොගැනීම ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත. තවද විසල් හම්බන්තොට ව්‍යාපෘතිය ඇතුළු දක්ෂිණ සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් ඇඹිලිපිටිය නගරය සඳහා වන නව සංවර්ධන අවස්ථා හඳුනාගෙන ඇත. එමෙන්ම විසල් හම්බන්තොට ව්‍යාපෘතියේ ආර්ථික සේවා මධ්‍යස්ථානයක් වශයෙන්ද ඇඹිලිපිටිය නගරය හඳුනාගෙන ඇත.

කොළඹ දකුණ යා කරමින් ඉදිකර ඇති දක්ෂිණ අධිවේගී මාර්ගය මානර සිට මත්නල දක්වා දීර්ඝ කෙරෙන අතර එම අධිවේගී මාර්ගය ඇඹිලිපිටිය නගරයේ පදලංගල ප්‍රදේශය හරහා ගමන් ගනී. එම අධිවේගී මාර්ගයේ ආසන්නතම අන්තර හුවමාරුව වන "වැවිය" ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කි.මී. 14ක් තරම් නගරයට ආසන්න දුරකින් පිහිටා ඇත. ඒ අනුව වාණිජ හා කෘෂිකාර්මික කටයුතු පහසුකර ගැනීමට දක්ෂිණ අධිවේගී මාර්ගය භාවිතා කරමින් කොළඹ හා දකුණු පළාත වෙත පහසුවෙන් ළඟාවීමට හැකියාව පැවතීම සංවර්ධන අවස්ථාවක් වශයෙන් හඳුනාගෙන ඇත.

මීට අමතරව ඇඹිලිපිටිය නගරයේ සිට කි.මී.43ක දුරකින් පිහිටි මත්නල ගුවන්තොටුපොළ හා කි.මී. 57ක දුරකින් පිහිටි හම්බන්තොට වරාය හේතුවෙන් අවම ප්‍රවාහන පිරිවැයක් යටතේ කෘෂි නිෂ්පාදන අපනයනය කිරීමටත්, කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමටත්, උඩවලව ප්‍රදේශයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා එම ප්‍රදේශය වෙත පහසුවෙන් ළඟාවීමට ආදී අවස්ථා සලසා ගැනීමට භාවිතා කළ හැකිවේ.

උඩවලව බහුකාර්යය යෝජනා ක්‍රමය යටතේ හා ගම් උදාව වැඩසටහන යටතේ කෘෂිකාර්මික නගරයක් වශයෙන් ස්ථාපිත වී ඇති ඇඹිලිපිටිය නගරය උඩවලව ජලාශය මුලික කරගත් කුඩා හා මධ්‍ය පරිමාණයේ වැව් හා ඇළ පද්ධතිය තුළින් වලව කාලාපිය කෘෂි කර්මාන්තය සඳහා අවශ්‍ය ජලය ලබාදේ. මෙම වාරි පද්ධතිය වලව කලාපය ආශ්‍රිතව සිදුවන කෘෂි කර්මාන්තය ආශ්‍රිත නව නිෂ්පාදන ඇති කිරීම සඳහා පවතින විභවනාවයක් ලෙස හඳුනාගෙන ඇත.


එමෙන්ම දකුණු පළාත් සංවර්ධන වැඩසටහන සඳහා යෝජනා කර ඇති අක්කර 15,000ක කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතවද අක්කර 1500ක භූමී ප්‍රමාණයක් වෙන්කර ඇත. කෘෂි කර්මාන්තය ආශ්‍රිත අමුද්‍රව්‍ය යොදාගනිමින් නව කර්මාන්ත ඇති කිරීමට මෙන්ම හම්බන්තොට වරාය හා මත්නල ගුවන්තොටුපොළ ආශ්‍රිතයෙන් එම නිෂ්පාදන රටපුරා බෙදාහැරීමට මෙන්ම අපනයන කිරීමේ කටයුතු සඳහා ද පහසුකම් සලසා ගත හැකිය. මීට අමතරව මෙම කර්මාන්ත ව්‍යාපෘතිය තුළින් ප්‍රදේශයේ ජනතාවට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සැපයීමේ අවස්ථාව උදා වේ.

03 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

ඇඹිලිපිටිය නගරයේ පිහිටීම අනුව, දකුණු හා උඩව පළාත් වලට අයත්ව පිහිටි උප නගර වන සෙවණගල, සූරියවැව, මිද්දෙණිය, අඟුණුකොලපලැස්ස, කටුවන, දෙබොක්ක හා නෝනගම ආදී ප්‍රදේශ තුළ නගරවාසින් කෘෂිකාර්මික, වාණිජ හා මුල්‍ය සේවාවන් සඳහා ඇඹිලිපිටිය නගරයට පැමිණේ. එම සංසරණ ජනගහනය ඇඹිලිපිටිය නගරය වාණිජ හා සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය වීමට පවතින අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

කෘෂිකාර්මික නගරයක් ලෙස සංවර්ධනය වී ඇති ඇඹිලිපිටිය නගරය තුළ පවතින ප්‍රධාන ගැටළු කෘෂි කර්මාන්තය ආශ්‍රිතව ගොඩනැගී ඇත.මේ අනුව කෘෂි කර්මාන්තය විධිමත් කරමින් කලාපීය ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම අපේක්ෂා කරමින් නව සංවර්ධන අවස්ථා හඳුනාගෙන ඇත. ඒ තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කරමින් ජීවත්වීමට හිතකර වටපිටාවක් සහිත ආකර්ශණීය නගරයක් සකස්කිරීමට අදාළව හඳුනාගත් ප්‍රධාන ගැටළු සඳහා විසඳුම් සෙවීමට අපේක්ෂිතය. නවද හඳුනාගත් සංවර්ධන අවස්ථා ඵලදායිව භාවිතා කරමින් වර්ෂ 2030 වනවිට ඇඹිලිපිටිය නගරය සංවර්ධිත නගරයක් බවට පත්කිරීමට අදාළව මෙම අධ්‍යනයන් සිදුකර ඇත.


පරිච්ඡේදය 04



සංවර්ධන සැලසුම් රාමුව

4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම

"වලව නිම්නයේ කෘෂි ආර්ථික නිපැයුම් කේන්ද්‍රය"
"Agro economic product navel of Walawa Valley"



රූප සටහන 4.1 : *ඇඹිලිපිටිය නගරය වසර 2030 සඳහා වූ සංකල්පමය දැක්ම*
මූලාශ්‍රය : *සැලසුම් කණ්ඩායම - සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

4.2. දැක්මේ ප්‍රකාශනය

නගර සංවර්ධන දැක්මෙහි විස්තරාත්මක ප්‍රකාශනය තුළින් ප්‍රකාශිත වන්නේ "නගරයේ කෘෂිකාර්මික අනන්‍යතාවය ඉස්මතු කරන පරිද්දෙන් නිරසාර කෘෂි කර්මාන්තය හා අගය එක් කරන නිෂ්පාදන ක්‍රියාවලියක් තුළින් ගුණාත්මක ප්‍රමිති සහගත නිෂ්පාදන කේන්ද්‍රස්ථානයක් සහිත සංවර්ධන ආකර්ශණීය නගරයක් ඇතිකිරීම" යන්නයි.

වලව නිම්නය යන්නෙන් නගරයේ පවතින කෘෂිකාර්මික අනන්‍යතාවය ඉස්මතු කර ඇති අතර කෘෂි ආර්ථික නිපැයුම් කේන්ද්‍රය තුළින් කෘෂි කර්මාන්තය මූලික කරගත් නිෂ්පාදන ප්‍රමුඛ ආර්ථිකයක් යන්න විස්තර වේ. වලව නිම්නය යන්න නගර සංවර්ධන දැක්ම තුළට එකතු කිරීම තුළින් නගරයේ පවතින කෘෂි කර්මාන්තය හා ඒ ආශ්‍රිත වාරි පද්ධතිය, සංචාරකමය ආකර්ශණීය ස්ථාන, නාගරික ස්වභාව සෞන්දර්ය හා පාරිසරික සම්පත් ආරක්ෂා කරමින් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ සමඟම එකී අනන්‍යතාවය පවත්වාගනිමින් නගරයේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම සඳහා මෙම නගරයේ පවතින කෘෂිකාර්මික නිෂ්පාදන යොදාගනිමින් අගය එක්කරන නිෂ්පාදන ඇතිකිරීමේ කෘෂිනිෂ්පාදන කෙන්ද්‍රස්ථානයක් බවට පත්කරමින් වර්ෂ 2030 වන විට සංවර්ධිත නගරයක් වෙන ළඟා වීම නගර සංවර්ධන දැක්ම තුළින් අපේක්ෂා කෙරේ.

4.3. අරමුණු (Goals)

වර්ෂ 2021–2030 ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්මේ දැක්ම වෙත ළඟාවීම සඳහා ප්‍රධාන අභිමතාර්ථ තුනක් ගොඩනගා ඇත.

අරමුණ 01 — වර්ෂ 2030 වනවිට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය බවට ඇඹිලිපිටිය නගරය පත්කිරීම.

අරමුණ 02 — වර්ෂ 2030 වන විට වලව කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදන අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුකරලීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම

අරමුණ 03 — වර්ෂ 2030 වනවිට පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් වාසයට හා සංචාරයට හිතකර ආකර්ෂණීය නගරයක් බිහිකිරීම.

4.4. පරමාර්ථ

අරමුණ 01

පරමාර්ථ

වර්ෂ 2030 වනවිට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය බවට ඇඹිලිපිටිය නගරය පත්කිරීම.

1. ඇඹිලිපිටිය නගර මධ්‍ය ප්‍රදේශයේ දැනට පවතින සමස්ථ නාගරික බල ප්‍රදේශයෙන් 0.3 % ක් තරම් වන වාණිජ ඉඩම් භාවිතය වර්ෂ 2030 වනවිට 1% ක් දක්වා වර්ධනය කිරීම.
2. ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය කෘෂිකාර්මික නිෂ්පාදන එකතුකිරීම හා සම්බන්ධ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පත්කිරීම.
3. වර්ෂ 2030 දී ඇඹිලිපිටිය නගරයේ සමස්ථ ඉඩම් ඉල්ලුම සපුරාලීම සඳහා දැනට පවතින සංවර්ධන කටයුතු සඳහා භාවිතයට ගත හැකි ඉඩම් හෙක්. 8187.7ක ප්‍රමාණය තුළ සිදුවන අවිධිමත් ඉඩම් භාවිත රටාව නිසි සැලැස්මකට අනුව කළමනාකරණයට ලක් කිරීම.

අරමුණ 02

පරමාර්ථ

වර්ෂ 2030 වන විට වලව කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදන අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුකරලීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම

1. වලව කලාපීය කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා වන ජල ඉල්ලුම අඛණ්ඩව සැපයීම තුළින් දැනට භාවිතයට ගැනෙන හෙක්ටයාර් 22,924.7ක කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණයට අමතරව ජලය නොමැතිකම හේතුවෙන් වගා නොකරන කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර් 1825.8ක ප්‍රමාණයක් වගා කටයුතු සඳහා යොදාගැනීමෙන් කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදනය 8% කින් ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැපයීම.
2. කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතයට ගැනෙන නවීන තාක්ෂණික ක්‍රමෝපායන් හා කාබනික පොහොර භාවිතය සඳහා යොමු කරවීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
3. කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදන අමුද්‍රව්‍ය වශයෙන් යොදාගනිමින් ක්‍රියාත්මක වන කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා හිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශයේ කර්මාන්ත කලාපයක් ස්ථාපනය කිරීම හා කෘෂිකාර්මික නිෂ්පාදන වලට අගය එක්කරන ක්‍රියාවලියක් ඇතිකිරීම තුළින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 30,000 ක් අලුතින් උත්පාදනය කිරීමට පහසුකම් සැලසීම.

අරමුණ 03

පරමාර්ථ

වර්ෂ 2030 වනවිට පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් වාසයට හා සංචාරයට හිතකර ආකර්ෂණීය නගරයක් බිහිකිරීම.

1. ඇඹිලිපිටිය නගරයේ අනන්‍යතාවය ආරක්ෂා වන සංවර්ධනයක් තුළින් වර්ෂ 2030දී සැමට සොදුරු පරිසරයක් සහිත නගරයක් නිර්මාණය කිරීම.

2. වර්ෂ 2030දී 125,045ක් වන අපේක්ෂිත ජනගහනයට අවශ්‍ය භෞතික හා සාමාජීය යටිතල පහසුකම් නේවාසික අවශ්‍යතාවලට ගැලපෙන පරිදි ඇඹිලිපිටිය නගරය ඇතුළු උඩවලව, නුංකම හා පදලංගල යන කුඩා නගර දක්වාද ව්‍යාප්ත කිරීම.

3. දෛනිකව නගර මධ්‍යයෙන් සේවා ලබාගැනීම සඳහා පැමිණේ යැයි අපේක්ෂිත 117,000ක පමණ සංක්‍රමණික ජනගහනයට තම සේවා අවශ්‍යතා සපුරාගැනීම පහසුකරලිම උදෙසා ප්‍රධාන නගර මධ්‍යයේ පවතින අවහිරතාවයන් මග හරිමින් එම ප්‍රදේශය ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීම.

4. උඩවලව සංචාරක කලාපයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා අවශ්‍ය නේවාසික හා අනෙකුත් සේවා පහසුකම් සැපයීම තුළින් එම කලාපයට පැමිණෙන වාර්ෂික සංචාරකයින් සංඛ්‍යාව වර්ෂ2030 වනවිට 25% කින් ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැලසීම.

පරිච්ඡේදය 05



ශක්තීන්, දුර්වලතා, අවස්ථා සහ තර්ජන විශ්ලේෂණය (SWOT විශ්ලේෂණය)

5.1. සාරාංශගත ශ.ද.අ.හ. (SWOT) විශ්ලේෂණය

අරමුණ 01 *වර්ෂ 2030 වනවිට රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය බවට ඇඹිලිපිටිය නගරය පත්කිරීම.*

ශ

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරන ලද සබරගමුව පළාත් කලාපීය භෞතික සැලැස්ම (2030) තුළ ඇඹිලිපිටිය නගරය දෙවන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන තිබීම.
- විසල් හම්බන්තොට සංවර්ධන සැලැස්මේ ආර්ථික මධ්‍යස්ථානයක් වශයෙන් ඇඹිලිපිටිය නගරය හඳුනාගෙන පැවතීම.
- කලාපීය කෘෂි නිෂ්පාදනයන් ඉලක්ක කරගනිමින් ඇඹිලිපිටිය නගරය තුළ ස්ථාපිත කර ඇති විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය.
- ඇඹිලිපිටිය, උඩවලව,තුංකම හා කුට්ටිගල යන ප්‍රදේශ ආවරණය වන පරිදි ස්ථාපිතව පවතින මහජන පොළවල්.
- ඇඹිලිපිටිය නගරය තුළ ක්‍රියාන්මක වන රාජ්‍ය හා පෞද්ගලික බැංකු 17 කින් හා මුල්‍ය ආයතන 25 කින් සමන්විත සමස්ථ මුල්‍ය ආයතන ජාලය.
- නගරය තුළ දැනට ස්ථාපිතව පවතින කෘෂිකාර්මික නිෂ්පාදනයන්ට අදාළ බීජ වර්ග, පොහොර, හා කෘෂි රසායන ද්‍රව්‍ය කෘෂිකාර්මික වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා මෙන්ම මෝටර් රථ හා අමතර කොටස් අලෙවිය සඳහා ඇති සේවා මධ්‍යස්ථාන ජාලයන් කෘෂිකාර්මික නිෂ්පාදන හා ආහාර අලෙවිය සඳහා පවතින අලෙවි මධ්‍යස්ථාන හා බොජුන්හල් වලින් සමන්විතව ඇති නාගරික වෙළඳපොළ.
- සමස්ත නාගරික බල ප්‍රදේශයෙන් 70% කට ආසන්න භූමී ප්‍රදේශයක් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතුව පැවතීම.

ද

- ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේදී අපේක්ෂිත කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රමාණයන් එක්රැස් නොවීම හේතුවෙන් එහි ක්‍රියාකාරිත්වය දුර්වල මට්ටමක පැවතීම.
- නගර මධ්‍යයේ පවතින රථවාහන තදබදය හා අතුරු මාර්ග සංවර්ධනය වී නොතිබීම.
- ඇඹිලිපිටිය නගරය රත්නපුර දිස්ත්‍රික්කයේ දකුණු කෙලවර සීමාවේ පිහිටා තිබීම.

අ

- දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය තුළ අක්කර 1500ක භූමී ප්‍රදේශයක් වෙන් කර පැවතීම.
- ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 57ක වැනි ආසන්න දුරකින් හම්බන්තොට වරායද කිලෝමීටර් 44ක් වැනි දුරකින් මත්තල ගුවන්තොටුපොළද පිහිටා තිබීම; මැඟි හා භාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීමට ඇති අවස්ථාවක් වීම.
- කොළඹ සිට මාතර දක්වා දැනට ඉදිකර ඇති දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට මත්තල දක්වා දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියට අනුව ඇඹිලිපිටිය නගරයට ආසන්නතම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය (බරවකුඹුක අන්තර් හුවමාරු මධ්‍යස්ථානය) ඇඹිලිපිටිය නගරයේ සිට කිලොමීටර් 14ක් තරම් ආසන්න දුරකින් පිහිටා තිබීම.
- සංචාරක ආකර්ෂණය අතින් සුවිශේෂිතාවයක් හිමි වී ඇති සබරගමුව පළාත නුළ පළාත් සංචාරක අමාත්‍යාංශය විසින් නම්කර ඇති ප්‍රධාන සංචාරක කලාප හතක් පවතින අතර එම සංචාරක කලාප අතුරින් ඇඹිලිපිටිය නගරය උඩවලව සංචාරක කලාපයට ඇතුළත්ව පැවතීම.
- රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ නගරය රත්නපුර නගරය වාර්ෂිකව ගංවතුර ආපදාවන්ට ලක්වීම.

ආ

- නගරය අවට ව්‍යාප්තව ඇති කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන.
- රත්නපුර දිස්ත්‍රික්කයේ අග නගරය වන රත්නපුර නගරයේ වාණිජ කේන්ද්‍රස්ථානය වශයෙන් පවතින රත්නපුර පැරණි නගරය වාර්ෂිකව ගංවතුර තර්ජනයට ලක්වුවද එහි වාණිජ කටයුතු එලෙසම ක්‍රියාත්මක වීම.

අරමුණ 02

වර්ෂ 2030 වන විට වලව කලාපිය කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුකරලීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

අ

- රටේ කෘෂි කර්මාන්තය ඹා බලශක්තිය නිෂ්පාදනය අරමුණු කරගනිමින් ක්‍රියාත්මක කෙරුණු කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ ප්‍රකාශිත වලව විශේෂ බල ප්‍රදේශය තුළ ස්ථාපිත කරන ලද ගොවි ජනපද වලට සේවා සැපයීම සඳහා වන නාගරික මධ්‍යස්ථාන වශයෙන් ඇඹිලිපිටිය ඹා අඟුණුකොළපලැස්ස නගර සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.
- කෘෂිකාර්මික බෝග වගාවන් සඳහා හිතකර වූ දේශගුණයකින් සහ සාරවත් පාංශු සංඝටකයන්ගෙන් යුක්ත වීම.
- දැනට මෙම කලාපය තුළ වගා කෙරෙන කෘෂිකාර්මික නිෂ්පාදන අගය එකතු කිරීමේ ක්‍රියාවලියකට යොදාගත හැකි වීම.
- සමස්ථ කෘෂිකාර්මික බිම් ආවරණය කරමින් ඉදිකර ඇති වාරි ඇළවල් පද්ධතිය.
- මුහුදු මට්ටමේ සිට මීටර් 60 -100ක පමණ උසකින් වලව ගංගා නිම්නයේ පිහිටි මෙම නගරයේ බොහෝ ප්‍රදේශ තැනිතලා භූමී ලක්ෂණ වලින් යුක්ත වීම.
- කෘෂිකාර්මික නිෂ්පාදන අභිමුඛ කර්මාන්ත ස්ථාපිත කළහැකි මට්ටමේ කර්මාන්ත කලාපයක් නාගරික බල ප්‍රදේශය තුළ ස්ථාපිතව පැවතීම.
- නාගරික ඉඩම් ඹාවිතයෙන් 35%ක් ගොඩ ඹා මඩ ගොවිතැන් සඳහා යොදාගැනීම.
- බලශක්ති උත්පාදනය සඳහා දායක වන උඩවලව ජල විදුලි බලාගාරය ඹා හිඟුර තාප බලාගාරය ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව ස්ථාපිතව පැවතීම.
- වර්ෂ 2030 සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇති සබරගමුව කලාපීය භෞතික සැලැස්ම තුළ ඇඹිලිපිටිය ප්‍රදේශය කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස නම්කර පැවතීම.

ඇ

- කලානුරූපීව සිදුවන දේශගුණික වෙනස්වීම් වලට අනුව ගොවීන් විසින්, වගාකරන බෝගවර්ග වෙනස් කිරීමට පෙළඹෙන බැවින් ඉලක්කගත නිෂ්පාදන සඳහා අවශ්‍යකරන කෘෂි නිෂ්පාදන නොලැබී යාම.
- වර්තමානය වන විට නාගරික කෘෂිකාර්මික ඉඩම්වල වගා කටයුතු අත්හැරීමට ඹා ඹාවිතය වෙනස් කිරීමට ලක්කිරීම.
- කෘෂිකාර්මික බිම් ආවරණය වන පරිදි ස්ථාපිතව ඇති මාර්ග පද්ධතියෙන් 90.6 %ක මාර්ග ප්‍රමාණයක් සංවර්ධනය කළ යුතු මට්ටමක පැවතීම.
- කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇඹිලිපිටිය කර්මාන්ත පුරයේ පළමු අදියර තුළ කර්මාන්ත ස්ථාපිත වීම ප්‍රශස්ත මට්ටමක නොපැවතීම ඹා දෙවන අදියර මෙතෙක් ආරම්භ වී නොතිබීම.
- මහා පරිමාණයේ නිෂ්පාදන කර්මාන්තයක් ලෙසින් ඇරඹී ඇඹිලිපිටිය කඩදාසි කම්හල ඹා මොරකැටිය වී ගබඩාව සංකීර්ණය මේ වනවිට වැසීගොස් පැවතීම.

අ

- දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව අක්කර 1500ක භූමී ප්‍රමාණයක් වෙන් කර පැවතීම.
- ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 57ක වැනි ආසන්න දුරකින් හම්බන්තොට වරායද කිලෝමීටර් 44ක් වැනි ආසන්න දුරකින් මත්තල ගුවන්තොටුපොළද පිහිටා තිබීම මඟි හා ඝාණ්ඩ ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීමට ඇති අවස්ථාවක් වීම.
- කොළඹ සිට මාතර දක්වා ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට මත්තල දක්වා දීර්ඝ කිරීම මඟින් ඇඹිලිපිටිය නගරයට ආසන්න අන්තර් භුවමාරු මධ්‍යස්ථානයක් බරවතුඹුක ප්‍රදේශයේ ස්ථාපිත වීම. (ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 14ක දුරින්).

ත

- අතරමැදි වෙළෙන්දන්ගේ මැදිහත්වීම හේතුවෙන් සමස්ත නිෂ්පාදනයෙන් වැඩි කොටසක් පිටතට ගලා යාම.
- වියළි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් නියං සහිත දේශගුණික තත්ත්වයක් ඇතිවිය හැකි වීම.

අරමුණ 03 *වර්ෂ 2030 වනවිට පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් වාසයට හා සංචාරයට හිතකර ආකර්ෂණීය නගරයක් බිහිකිරීම.*

ශක්‍යතා

- ඇඹිලිපිටිය නගරය වලව ගඟට මායිම්ව පිහිටා තිබීමත් උඩවලව ජලාශයේ සිට ජලය රැගෙන යන ඇළ මාර්ග පද්ධතිය හා එයින් පෝෂණය වන වන්දිකා වැවද ඇතුළුව කුඩා වැව් පද්ධතියක් නගරය පුරාවට විසිර පැවතීමත් හේතුවෙන් නගරයට සෞන්දර්යාත්මක මෙන්ම සෞම්‍ය වටපිටාවක් හිමිව තිබීම.
- මුහුදු මට්ටමේ සිට මීටර් 60ත් -100ත් අතර උස පරාසයක වලවේ ගංඟා නිම්නයේ පිහිටි මෙම නගරයේ බොහෝ ප්‍රදේශ තැනිතලා ස්වරූපයක් පෙන්නුම් කිරීම.
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2030 සඳහා පිළියෙළ කර ඇති සංචාරක සංවර්ධන ප්‍රදේශ සැලැස්ම තුළ ඇඹිලිපිටිය නගරය පරිසර හිතකාමී සංචාරක කලාපයක් (eco tourism) ලෙස නම් කර පැවතීම.
- උඩවලව හා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව දේශීය හා විදේශීය සංචාරකයින්ට සේවා සැපයීමේ සංචාරක හෝටල් හා ලැගුම් හල් ස්ථාපිතවීමේ ඉහළ ප්‍රවණතාවයක් පැවතීම.
- රත්නපුර දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ හා සැසඳීමේදී ඇඹිලිපිටිය නගරය ස්වභාවික ආපදාවන් අවම ප්‍රදේශයක් ලෙස පිහිටා තිබීම.

දුර්වලතා

- ඍතූන් අනුව සිදුවන දේශගුණික වෙනස්වීම් මත ජුනි -නොවැම්බර් දක්වා කාලය තුළ ජල පෝෂක ප්‍රදේශ හිඳීයාම හේතුවෙන් පරිසර උෂ්ණත්වය ඉහළ යාම.
- ඉඩම් හිමිකම් නිරවුල් නොවීම
- වැව් හා ඇළ මාර්ග ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශවල අනවසර ඉඳිකිරීම් පැවතීම.
- ප්‍රධාන මාර්ග ආශ්‍රිතව සිදුවන රේඛීය සංවර්ධනය.

අ

- ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 44ක් වැනි දුරකින් මන්තල ගුවන්තොටුපොළ පිහිටා තිබීම, මඟි ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීමට ඇති අවස්ථාවක් වීම.
- කොළඹ සිට මානර දක්වා ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය මන්තල දක්වා දීර්ඝ කිරීම නිසින් ඇඹිලිපිටිය නගරයට ආසන්නතම අන්තර් ඝුවමාරු මධ්‍යස්ථානයක් බරවකුඹුක ප්‍රදේශයේ ස්ථාපිතව පැවතීම.
- සංචාරක ආකර්ෂණය අතින් සුවිශේෂිතාවයක් හිමි වී ඇති සබරගමුව පළාත් සංචාරක අමාත්‍යාංශය නම්කර ඇති ප්‍රධාන සංචාරක කලාප හතක් වන අතර එම සංචාරක කලාප අතුරින් උඩවලව සංචාරක කලාපයට ඇඹිලිපිටිය නගරය අයත් වීම.
- දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව අක්කර 1500ක භූමී ප්‍රමාණයක් වෙන් කර පැවතීම නිසින් විභිවන සෘජු හා වක්‍ර රැකියා අවස්ථා.

ත

- වියළි කාලගුණික තත්ත්වයන් හමුවේ නියං තත්ත්වයක් ඇතිවිය හැකි වීම.

5.2. විස්තරාත්මක ශ.දු.අ.ත. විශ්ලේෂණය

අරමුණ 01

වර්ෂ 2030 වනවිට රන්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය බවට ඇඹිලිපිටිය නගරය පත්කිරීම.


ශක්තීන් | අරමුණ 01

1. *ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කරන ලද සබරගමුව පළාත් කලාපීය භෞතික සැලැස්ම (2030) තුළ ඇඹිලිපිටිය නගරය දෙවන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන තිබීම.*


මෙම සැලැස්ම තුළ සබරගමුව පළාත් නාගරික ධුරාවලියට අනුව සබරගමුව පළාතේ පළමු පෙළ නගරය වන රන්නපුර නගරය හැරුණු විට කෑගල්ල දිස්ත්‍රික්කයේ අග නගරය වන කෑගල්ල නගරය සඳහා නගර ධුරාවලියේ හිමිව පවතින ස්ථානයම ඇඹිලිපිටිය නගරයටද හිමිව පැවතීම සුවිශේෂීතාවයක් වේ. ඒ අනුව ඇඹිලිපිටිය නගරය මේවන විටත් සබරගමුව පළාත තුළ ප්‍රධාන නගර මධ්‍යස්ථානයක් බවට පත්ව තිබීම නගර සංවර්ධන සැලැස්මේ පළමු අරමුණ ඉටුකරගැනීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත. (රූප සටහන් අංක 5.1)

2. *විසල් හම්බන්තොට සංවර්ධන සැලැස්මේ ආර්ථික මධ්‍යස්ථානයක් වශයෙන් ඇඹිලිපිටිය නගරය හඳුනාගෙන පැවතීම.*

විසල් හම්බන්තොට (Grater Hambanthota) සංවර්ධන සැලැස්ම තුළ ප්‍රධාන සේවා මධ්‍යස්ථාන 6ක් (සිතියම් අංක 5.1) නම්කර ඇති අතර ඇඹිලිපිටිය නගරය හා එහි ආර්ථික මධ්‍යස්ථානය ලෙස නම්කර ඇත. ඒ අනුව එවන් සුවිසල් කලාපීය මට්ටමේ සංවර්ධන සැලැස්මක් තුළ ඇඹිලිපිටිය නගරය ආර්ථික මධ්‍යස්ථානයක් වශයෙන් නම්කර පැවතීම තුළින් පැහැදිලි වනුයේ නගරයේ සංවර්ධන ප්‍රවණතා සමඟ ආර්ථික හා වාණිජ අංශයෙන් ඉදිරි සංවර්ධනයක් කරා ළඟා වීමට අවස්ථාව පැවතීමයි.



රූප සටහන 5.1 : *සබරගමුව පළාත් වපුෂ සැලැස්ම*



විසල් හම්බන්තොට ව්‍යාපෘතියේ සේවා මධ්‍යස්ථාන

0 3,150 6,300 12,600 18,900 25,200 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය

අප්‍රේල් 2017

මූලාශ්‍රය: ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම්:
සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

මූලාශ්‍රය : *ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*

සිතියම 5.1 : *විසල් හම්බන්තොට ව්‍යාපෘතිය සඳහා යෝජිත සේවා මධ්‍යස්ථාන*

3. *කෘෂි නිෂ්පාදන අරමුණු කරගෙන ඇඹිලිපිටිය නව නගරයේ මිද්දෙණිය ප්‍රධාන මාර්ගයට යාබදව ස්ථාපිත කර ඇති ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය.*

2003 වර්ෂයේ ආරම්භ කර ඇති මෙම ආර්ථික මධ්‍යස්ථානය කඩ කාමර 45කින්, ආපන ශාලාවකින් හා වර්ග මීටර් 1500ක් පමණ වන විවෘත ගොඩනැගිල්ලකින් සමන්විත වේ. මෙම කඩ කාමර මේ වන විට කෘෂි නිෂ්පාදන අලෙවිය හා වෙනත් වෙළඳ අවශ්‍යතා සඳහා භාවිතයට ගෙන ඇත. ඇඹිලිපිටිය නගරය අවට කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන, නොග ගබඩා හා පොදු වෙළඳපොළ ස්ථාපිතව පැවතුනද එම සියලු මධ්‍යස්ථාන අතරින් මෙම කලාපය තුළ දැනට ස්ථාපිතව පවතින ප්‍රධානතම ආර්ථික මධ්‍යස්ථානය වශයෙන් ඇඹිලිපිටිය විශේෂ ආර්ථික මධ්‍යස්ථානය හැඳින්විය හැකිය. ඒ අනුව මෙම ආර්ථික මධ්‍යස්ථානය විධිමත් කළමනාකරණයක් යටතේ නගරයේ ඉදිරි සංවර්ධන කාර්යයන් සඳහා යොදාගත හැකිවීම සංවර්ධන සැලැස්මේ අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.




රූප සටහන 5.2 : *ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය*
මූලාශ්‍රය : *google earth map (2017) / ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය (2016)*

4. *ඇඹිලිපිටිය, උඩවලව,නුංකම හා කුට්ටිගල යන ප්‍රදේශ ආවරණය වන පරිදි ස්ථාපිතව පවතින මහජන පොළවල්.*

ඇඹිලිපිටිය, උඩවලව,නුංකම, හා කුට්ටිගල යන ප්‍රදේශ වල පවතින මෙම මහජන පොළවල් කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථාන වශයෙන් නොග හා සිල්ලර වෙළඳ කටයුතු සඳහා භාවිතා කරන අතර ඇඹිලිපිටිය නවනගරයේ මිද්දෙණිය ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටන පරිදි නගරයේ ප්‍රධානතම මහජන පොළ ස්ථාපිත කර ඇත. එම භූමිය අක්කර 2 යි පර්චස් 35කින් සමන්විත අතර එය මහජන පොළ ඇතුළු ස්ථිර කඩ කාමර 16 බැගින් ඇතුළත් ගොඩනැගිලි හතරකින් යුක්ත වේ. මෙම මහජන පොළ තුළ වෙළෙන්දන් 950 ත් 1000 ත් අතර සංඛ්‍යාවක් වෙළඳාම් සිදු කරනු ලබන අතර මහජන පොළ නොමැති දිනයන්හිදී වෙනත් පොදු අවශ්‍යතා සඳහාද භාවිතයට ගැනීමේ හැකියාව පවතී.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සංවර්ධන ව්‍යාපෘතිය නිමකර ඇති අතර මේවන විට මහජන පොළ කටයුතු ඇඹිලිපිටිය නගර සභාවේ කළමනාකාරීත්වය යටතේ පවත්වාගෙනු යනු ලබයි. ඊට අමතරව උඩවලව, නුංකම හා කුට්ටිගල නගරයන්හි පවතින මහජන පොළවල් හා මොරකැටිය කෙසෙල් පොළ ද එම ප්‍රදේශ ආශ්‍රිතව සිදුකෙරෙන කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.



රූප සටහන 5.3 : *ඇඹිලිපිටිය මහජන පොළ හරස් පැතිකඩ*

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය


විස්තරාත්මක SWOT විශ්ලේෂණය





රූප සටහන 5.4 : *ඇඹිලිපිටිය මහජන පොළ*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය (2017)*


ඒ අනුව නගරයේ ආර්ථික සංවර්ධනය උදෙසා කෘෂිකාර්මික අමුද්‍රව්‍ය මිලදී ගැනීම් හා වෙළඳාම් කටයුතු සඳහා භාවිනයට යොදාගත හැකි සම්පත් ලෙස මෙම ස්ථාන හඳුනාගෙන ඇත.



රූප සටහන 5.5 : *ඇඹිලිපිටිය නගරයේ පවතින මහජන පොළවල්*
මූලාශ්‍රය : *Google earth map (2017)*

5. *ඇඹිලිපිටිය නගරය තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය හා පෞද්ගලික බැංකු 17 කින් හා මුල්‍ය ආයතන 25කින් සමන්විත සමස්ථ මුල්‍ය ආයතන ජාලය.*

මෙම මුල්‍ය ආයතන අතුරින් දෙක තුනක් හැරුණු විට අනෙක් සියලුම මුල්‍ය ආයතන නෝනගම ප්‍රධාන මාර්ගය හා මිද්දෙණිය ප්‍රධාන මාර්ගය දෙපස ව්‍යාප්ත වී පවතින බැවින් ඒවායේ සේවාවන් ලබාගැනීම ඉතා පහසු වී ඇත. වලව කලාපය තුළ බැංකු හා මුල්‍ය ක්ෂේත්‍රයේ ආයතන 42ක් ස්ථාපිතව පවතින එකම නගරය ඇඹිලිපිටිය වන අතර අවට නගර හා ගම්වාසින්ද නම මුල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ඇඹිලිපිටිය නගරයට පැමිණීම සිදුකරයි. මේ අනුව ඇඹිලිපිටිය නගරය දැනටමත් වාණිජ හා මුල්‍ය ක්ෂේත්‍රය තුළ සුවිශේෂී වර්ධනයක් අත්කරගෙන පැවතීම නගරයේ ඉදිරි සංවර්ධන කාර්යයන් සිදුකිරීමට පවතින විශේෂ ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත (ඇමුණුම් වගු අංක 2.9).



රූප සටහන 5.6 : *ඇඹිලිපිටිය නගරයේ මූල්‍ය ආයතන ව්‍යාප්තිය*
මූලාශ්‍රය: google earth map, 2017

6. *කෘෂිකර්මාන්තය ආශ්‍රිත සියළු නිෂ්පාදන, භාණ්ඩ හා අනෙකුත් සියලු වෙළඳ නිෂ්පාදන වලින් සමන්විත නාගරික වාණිජ ව්‍යාප්තිය*


නගරය තුළ දැනට ස්ථාපිතව පවතින කෘෂිකාර්මික නිෂ්පාදන කාණ්ඩයට අයත් බීජ වර්ග, පොහොර, හා කෘෂි රසායන ද්‍රව්‍ය, කෘෂිකාර්මික වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා මෙන්ම මෝටර් රථ හා අමතර කොටස් අලෙවිය සඳහා ඇති සේවා මධ්‍යස්ථාන ජාලය හා ආහාර ද්‍රව්‍ය අලෙවිය සඳහා අවශ්‍ය අලෙවි මධ්‍යස්ථාන හා බොජුන්හල් වලින් සමන්විත වෙළඳපොළක් නගරය තුළ සැකසී ඇත. (රූප සටහන් අංක 5.7)

මෙම සියලු සේවාවන් නගර මධ්‍යය ප්‍රදේශයට අයත් නවනගරය, පල්ලේගම හා යෝධගම යන ප්‍රදේශ තුළ ස්ථාපිතව පවතින බැවින් සේවාදායකයන්ට නම කාර්යයන් ඉටුකර ගැනීමේ පහසුව සැලසී ඇත. වලව කලාපයේ පවතින ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය වශයෙන් ස්ථාපිතව ඇති මෙම නගරයේ නගර මධ්‍යයට දෙනිකව විවිධ සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන සංඛ්‍යාව 30,000 – 60,000න් අතර අගයක් ගනී. ගොඩකවෙල,පල්ලෙබැද්ද, සංඛපාල, උඩවලව, කොලොන්න,කෑල්ල, සෙවණගල, මිද්දෙණිය, සූර්යවැව හා රිදියගම යන ප්‍රදේශ වලින් කෘෂිකාර්මික සේවාවන් ලබාගැනීම සඳහා පැමිණීම හඳුනාගෙන ඇත.

විශේෂයෙන් කොලොන්න, සෙවණගල, මිද්දෙණිය, සූර්යවැව හා රිදියගම යන ප්‍රදේශ වලින් කෘෂිකාර්මික සේවාවන් ලබාගැනීම සඳහා ඇඹිලිපිටිය නගරය තුළට පැමිණෙනුයේ කෘෂි කර්මාන්තය ආශ්‍රිත සියළු අවශ්‍යතා ඉටුකර ගැනීමට ඇති පහසුව නිසාවෙනි. උදාහරණයක් වශයෙන් කෘෂිකාර්මික බෝග අලෙවි කිරීමට ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානයට පැමිණෙන්නෙකුට අවශ්‍ය මූල්‍ය කටයුතු සඳහා මූල්‍ය ආයතන රාශියක් නගරය තුළ ස්ථාපිතව ඇති අතර රට අමතරව බීජ වර්ග, පොහොර හා අනෙකුත් රසායනික ද්‍රව්‍යද අවශ්‍යතාවය පරිදි මිලදී ගැනීමේ පහසුකම් මෙම නගරය තුළ ස්ථාපනය වී ඇත.එමෙන්ම කෘෂිකාර්මික සේවා සඳහා අවශ්‍ය වාහන යන්ත්‍රෝපකරණ,මෝටර් රථ හා අමතර කොටස් මිලදී ගැනීමට ඇති හැකියාවත්; කෘෂි නිෂ්පාදන හා ආහාර ද්‍රව්‍ය හා එදිනෙදා අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමට මෙන්ම පරිපාලන කටයුතු, සෞඛ්‍ය, අධ්‍යාපනික හා මූල්‍යම අවශ්‍යතා රැසක් සපුරාගත හැකි පරිදි එම මධ්‍යස්ථාන නගරය තුළ ස්ථාපිතව පැවතීම, නගරය වාණිජ මධ්‍යස්ථානයක් බවට පත්කිරීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය



රූප සටහන 5.7 : *නගරයේ පවතින වෙළඳ භාවිතයන් 2016*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ - ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

7. *සමස්ත නාගරික බල ප්‍රදේශයන් 70% කට පමණ ආසන්න භූමී ප්‍රදේශයක් මහවැලි අධිකාරිය සතුව පැවතීම.*

සමස්ත නාගරික බල ප්‍රදේශයන් 70% කට පමණ ආසන්න භූමී ප්‍රදේශයක් මහවැලි අධිකාරිය සතුව පවතින අතර එම ඉඩම් භාවිතය අනුව කෘෂිකාර්මික 47%ක්, නේවාසික 51%ක්, වාණිජ 0.3%ක් හා වෙනත් 1.79 %ක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව ඉදිරි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් පවරාගැනීම් වලදී ඉඩම්වල නිමිකාරිත්වය එක ආයතනයක් සතුවීම තුළින් එම කාර්යය පහසු වනු ඇත. නවද නව ආයෝජකයන් සඳහා පහසුවෙන් ඉඩම් ලබාගැනීමට හැකියාවද මෙමඟින් සැලසේ. මෙම නන්න්වය සංවර්ධන කාර්යයන් පහසු කරලීම සඳහා පවතින ශක්නියක් වශයෙන් හඳුනාගෙන ඇත.

දුර්වලතා | අරමුණ 01

1. *ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය මෙම නගරයට පවතින ශක්තියක් වුවද වර්තමානය වන විට අපේක්ෂිත කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රමාණයන් එක්රැස් නොවීම හේතුවෙන් එහි ක්‍රියාකාරිත්වය දුර්වල තත්ත්වයක පවතින බව හඳුනාගෙන ඇත.*

ආර්ථික මධ්‍යස්ථානය ආරම්භයේදී සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව නිඟුර ආර, උඩගම, තුංකම හා නිඟුර ප්‍රදේශ ආශ්‍රිත සිදුකරන ලද සමීක්ෂණ තුළින් එක් වගා කන්නයකදී ලබාගත හැකි වී අස්වැන්න මෙට්‍රික් ටොන් 3372ක් ද ,කෙසෙල් මෙට්‍රික් ටොන් 1290ක් හා එළවළු මෙට්‍රික් ටෝන් 1560ක ප්‍රමාණයක් ලෙස නොරතුරු රැස්කර පැවතුනද ඉහත සඳහන් කළ ප්‍රදේශ අතරින් මසකට ලැබෙනුයේ කෙසෙල් මෙට්‍රික් ටොන් 200 ක් නරම් ප්‍රමාණයකි. ඒ අතුරින් ආර්ථික මධ්‍යස්ථානය වෙත ලැබෙනුයේ ඉන් 40% න් 50% න් අතර අඩු ප්‍රතිශතයකි. එළවළු නිෂ්පාදනය මසකට මෙට්‍රික් ටොන් 260ක් පමණ වන අතර ඉන් ආර්ථික මධ්‍යස්ථානයට ලැබෙනුයේ 23%- 26% න් අතර අඩු ප්‍රතිශතයකි.

බෝගය	*ප්‍රමාණය*
කෙසෙල්	*මෙ.ටො. 80-100*
එළවළු	*මෙ.ටො. 60-70*
පළතුරු	*මෙ.ටො. 10-15*

වගුව 5.1 : *ආර්ථික මධ්‍යස්ථානයේ මාසිකව එකතුවන නිෂ්පාදනයන්*
මූලාශ්‍රය : *ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය, 2016*

ඒ අනුව මේ වන විට ආර්ථික මධ්‍යස්ථානය අපේක්ෂිත අරමුණු වෙත ළඟාවිය නොහැකි මට්ටමකට පත්ව ඇත. එමෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවිය සඳහා ඉදිකර ඇති කඩ කාමර 46න් 14ක් කෘෂිකාර්මික නිෂ්පාදන සඳහාද 5ක් භාවිනයකින් නොරවද අනෙක් කඩ කාමර වෙනත් භාවිනයන් සඳහාද භාවිනාකරන නත්ත්වයකට වර්තමානය වනවිට පත්ව පැවතීම දුර්වලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත.

2. *නගර මධ්‍යයේ පවතින රථවාහන තදබදය හා අතුරු මාර්ග සංවර්ධනය වී නොතිබීම නගරයේ ඉදිරි සංවර්ධන කටයුතු සඳහා බාධා ගෙනදිය හැකි ගැටළුවක් බවට හඳුනාගෙන ඇත.*

ඇඹිලිපිටිය නගරය තුළ සතියේ වැඩකරන දින වලදී ඇතිවන රථවාහන තදබදය ගැන සලකා බැලීමේදී නෝනගම මාර්ගයේ, අනෙකුත් ප්‍රධාන මාර්ග වලට සාපේක්ෂව වැඩි රථවාහන තදබදයක් හඳුනාගෙන ඇත. (රූප සටහන් අංක 5.8).


දවසේ කාල වේලාවන් සැලකූ විට පෙරවරු කාලයේ නගරයට ඇතුළු වන වාහන ප්‍රමාණය වැඩිවීමක් දැකගත හැකි වේ. නගරයේ පොදු ප්‍රවාහන කටයුතු සඳහා පවතින ඉඩකඩ හා පහසුකම් ප්‍රමාණවත් නොවීමද ගැටළුකාරී තත්ත්වයක් වී ඇත.

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT විශ්ලේෂණය

විශේෂයෙන් ඇඹිලිපිටිය ප්‍රධාන බස් නැවතුම්පොළ තුළ බස් රථ හැසිරවීමට හා දුර සේවා බස්රථ නතර කිරීමට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නැත. රථවාහන තදබදය ට අමතරව නගරයේ පවතින බොහොමයක් මාර්ග අලුත්වැඩියා කිරීමේ නත්න්වයක පැවතීමත් ග්‍රාමීය හා කෘෂිකාර්මික ප්‍රදේශ ආශ්‍රිත පවතින මාර්ගවලින් 90%ක පමණ මාර්ග ප්‍රමාණයක් නඩත්තු කළ යුතු නත්න්වයක පැවතීමත් හඳුනාගෙන ඇත.


රථවාහන තදබදය - ඇඹිලිපිටිය නගරය (2017)



රූප සටහන 5.8 : *රථවාහන සමීක්ෂණය - ඇඹිලිපිටිය නගරය 2017*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය*

3. *ඇඹිලිපිටිය නගරය රත්නපුර දිස්ත්‍රික්කයේ දකුණු කෙලවර සීමාවේ පිහිටා තිබීම.*

දැනට වාණිජ කේන්ද්‍රස්ථානය ලෙස ස්ථාපිනව පවතින රත්නපුර දිස්ත්‍රික්කයේ අග නගරය වන රත්නපුර නගරයේ සිට කිලෝමීටර් 78.9 නරම් දුරකින් එම දිස්ත්‍රික්කයේම දක්ෂිණ මායිමට වන්නට ඇඹිලිපිටිය නගරය පිහිටා තිබීම, මෙම නගරය රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානයක් බවට පත් කිරීමට පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත. (සිතියම් අංක 5.2)



රත්නපුර හා ඇඹිලිපිටිය නගරයේ පිහිටීම

0 2.75 5.5 11 16.5 22 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අප්‍රේල් 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 5.2 : *රත්නපුර හා ඇඹිලිපිටිය නගරයේ පිහිටීම*

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

අවස්ථා | අරමුණ 01

1. *කර්මාන්ත කලාපයක් සඳහා ඇඹිලිපිටිය නගරයෙන් වෙන්කර ඇති අක්කර 1500ක භූමි ප්‍රදේශය*

ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත හිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශ තුළින් අක්කර 1500ක භූමි ප්‍රදේශයක්, කර්මාන්ත කලාපයක සඳහා හඳුනාගෙන පවතින අතර එම කර්මාන්ත කලාපය දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාන්මක කිරීමට යෝජිත අක්කර 15,000ක කර්මාන්ත කලාප ව්‍යාපෘතියට අයත්ව ඇත (ඇමුණුම් සිතියම් අංක 1.11). මෙම ව්‍යාපෘතිය මඟින් කර්මාන්ත 2400ක් හා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 400,000 ක් ඇති කිරීමට යෝජිතව පවතින අතර එමඟින් ඇඹිලිපිටිය කලාපය තුළටද කර්මාන්ත 200ක් ස්ථාපිත කිරීමටත් හා සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 30,000ක් පමණ උත්පාදනය කිරීමටත් අපේක්ෂා කෙරේ

ඒ අනුව මෙම කර්මාන්ත කලාපය සඳහා අගය එක්කරන නිෂ්පාදන ඇතිකිරීමේ කර්මාන්ත ඇතුළත් කරමින් කලාපයට ආවේණික කෘෂිබෝග ආශ්‍රිත ප්‍රමිති අනුකූල නිෂ්පාදන ඇතිකරීමට හැකියාව ලැබේ. නවද එම නිෂ්පාදන වලින් යම් ප්‍රමාණයක් නාගරික වෙළඳපොළට සැපයීම තුළින් කෘෂි හා වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිත කරගැනීමට පවතින සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

නවද නව රැකියා අවස්ථා ඇතිවීමත් සමඟ පැමිණෙන ශ්‍රමිකයින්ට අවශ්‍ය සේවා සැපයීම සඳහා එම කලාපය ආශ්‍රිතවම වාණිජ මධ්‍යස්ථාන(Agglomeration centers) හා නේවාසික කලාප බිහිවීම, ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය වීම හා කර්මාන්ත ආශ්‍රිත නිෂ්පාදන යොදාගනිමින් කලාපීය වෙළඳපොළ දියුණු කිරීම ආදී වාණිජමය වශයෙන් බොහෝ අවස්ථාවන් ලබාගැනීම සඳහා මෙම කර්මාන්ත කලාපය ස්ථාපිත වීම සංවර්ධන අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

2. *නාගරික වාණිජ කටයුතු වඩා පහසුකරගැනීමට ඉවහල් වන මත්තල ගුවන්තොටුපොළ හා හම්බන්තොට වරායේ පිහිටීම*

ඇඹිලිපිටිය නගරය රන්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ සේවා මධ්‍යස්ථානය වශයෙන් සංවර්ධනය කිරීමේදී ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 57ක වැනි ආසන්න දුරකින් හම්බන්තොට වරායද කිලෝමීටර් 44ක් වැනි දුරකින් මත්තල ගුවන්තොටුපොළත් පිහිටා නිබීම (ඇමුණුම් රූපසටහන් අංක 3.2) නගරයේ වාණිජ කටයුතු සඳහා අවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනයට මෙන්ම ආනයනය හා අපනයන කටයුතු වලදී දැරීමට සිදුවන ප්‍රවාහන වියදම් අවම කරගැනීමටත්, ආයෝජකයින් ළඟාකර ගැනීමටත් අවශ්‍ය සේවා ඉටුකර ගැනීමට පවතින සුවිශේෂී අවස්ථාවක් වශයෙන් හඳුනාගෙන ඇත.

3. *කොළඹ සිට මාතර දක්වා දැනට ඉදිකර ඇති දක්ෂිණ අධිවේගී මාර්ගය මාතර සිට මත්තල දක්වා දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියට අනුව ඇඹිලිපිටිය නගරයට ආසන්නතම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය (බරවකුඹුක අන්තර් හුවමාරු මධ්‍යස්ථානය) ඇඹිලිපිටිය නගරයේ සිට කිලොමීටර් 14ක් තරම් ආසන්න දුරකින් පිහිටා තිබීම*

කොළඹ සිට මානර දක්වා ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය මත්තල දක්වා දීර්ඝ කිරීම තුළින් අධිවේගී මාර්ගය ඇඹිලිපිටිය නගරයට ආසන්නයෙන් ගමන් ගන්නා අතර ආසන්නතම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය වන "බරවකුඹුක" ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කි.මී.14ක් වැනි ආසන්න දුරකින් පිහිටා නිබීම (ඇමුණුම් රූපසටහන් අංක 3.2) වාණිජ හා මුල්‍ය ක්ෂේත්‍රයේ කටයුතු සඳහා අවශ්‍ය සේවා ළඟාකර ගැනීමට පහසුවකි. මෙමඟින් ආයෝජකයන් ළඟාකර ගැනීමත්, කොළඹ වැනි ප්‍රධාන පෙළේ වාණිජ නගර සමඟ සබඩතා පැවැත්වීමට හා මත්තල සිට භාණ්ඩ ප්‍රවාහනය ආදී ප්‍රතිලාභ බොහොමයක් ලබාගත හැකි බැවින් මෙම අධිවේගී මාර්ගය ඇඹිලිපිටිය නගරයේ වාණිජමය සංවර්ධන කාර්යයන් සඳහා වන අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

4. *නාගරික වාණිජ හා ආර්ථික ක්‍රියාකාරකම් සඳහා දායක කරගත හැකි උඩවලව සංචාරක කලාපය*

සංචාරක ආකර්ෂණය අතින් සුවිශේෂිනාවයක් හිමි වී ඇති සබරගමුව පළාත තුළ පළාත් සංචාරක අමාත්‍යාංශය විසින් පිළියෙළ කර ඇති ප්‍රධාන සංචාරක කලාප හතකින් සමන්විත සංචාරක සැලැස්මේ (ඇමුණුම් සිතියම් අංක 1.11) ඇතුළත් සංචාරක කලාප අතුරින් උඩවලව සංචාරක කලාපයට ඇඹිලිපිටිය නගරය අයත්ව ඇත. උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජ මහා විහාරය, උඩවලව ජලාශය, චන්ද්‍රිකා වැව, මඩුවන්වෙල වලව්ව, ලියන්ගස්තොට වේල්ල, පනාමුර ඇන්ගාල ආදී සංචාරක ආකර්ශණීයත්වයෙන් ඉහළ ස්ථාන මෙම කලාපය තුළ පිහිටා නිබීමෙන් නගරයට ආර්ථිකමය වශයෙන් බොහෝ වාසි සැලසී ඇත.

උඩවලව සංචාරක කලාපය තුළට ඇදී එන දේශීය හා විදේශීය සංචාරකයින් නවාතැන් හා ආහාර ඇතුළු විවිධ සේවා අවශ්‍යතා සපුරාගැනීම සඳහා ඇඹිලිපිටිය නගරයට පැමිණේ. නගරයට පවතින මෙම සංචාරක ආකර්ෂණය නගරය වාණිජමය වශයෙන් සංවර්ධනය කිරීමට පවතින විශේෂ අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

5. *රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම නගරය වන රත්නපුර නගරය වාර්ෂික ආපදා තත්ත්වයනගෙන් පීඩාවට පත්වීම.*

විශේෂයෙන් රත්නපුර වාණිජ නගරය වාර්ෂික ගංවතුර අවධානමට පත්වීමක් හඳුනාගෙන ඇති අතර ආපදා රහිත වාණිජ භාවිතයන් සඳහා පවතින ඉඩකඩම් රත්නපුර නගරය තුළ ප්‍රමාණවත්ව නොනිබීම තුළින් ස්වභාවික විපත් අවම ඇඹිලිපිටිය නගරය මෙම දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ මධ්‍යස්ථානය වශයෙන් සංවර්ධනය කිරීමට පවතින අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත (ඇමුණුම් රූප සටහන් අංක 3.3).

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය


තර්ජන | අරමුණ 01

1. *නගරය අවට ව්‍යාප්තව ඇති කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන.*

නාගරික බල ප්‍රදේශ සීමාවෙන් පිටත ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ පොදු වෙළඳ මධ්‍යස්ථාන 7ක්ද නොග ගබඩා 7ක්ද හඳුනාගෙන ඇත. විශේෂයෙන් ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත ව්‍යාප්තව ඇති මෙම කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන හේතුවෙන් වලව කලාපීය කෘෂි නිෂ්පාදන ඇඹිලිපිටිය නගරය තුළට ගලා ඒම සීමා කරවීම; ඇඹිලිපිටිය නගරය කෘෂි හා වාණිජ මධ්‍යස්ථානයක් වශයෙන් ස්ථාපිත කිරීමට පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත (සිතියම් අංක 5.3).

2. *රත්නපුර දිස්ත්‍රික්කයේ අග නගරය වන රත්නපුර නගරයේ වාණිජ කේන්ද්‍රස්ථානය වශයෙන් පවතින රත්නපුර පැරණි නගරය වාර්ෂිකව ගංවතුර තර්ජනයට ලක්වුවද එහි වාණිජ කටයුතු එලෙසම ක්‍රියාත්මක වීම.*

රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථානය බවට පත්ව ඇති රත්නපුර නගරය වාර්ෂිකව ගංවතුර අවධානමට පත්වේ. එම කාලය තුළ වාණිජ ජාලය බිඳවැටීමට පත්වුවද වර්තමානය වන විටත් නගරයේ පවතින වාණිජ භාවිතයන්හි වෙනසක් සිදු නොවීම හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය ඇඹිලිපිටිය නගරය රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය වශයෙන් සංවර්ධනය කිරීමට පවතින තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත (ඇමුණුම් සිතියම් අංක 1.14).



කෘෂිකාර්මික නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන

0 1.5 3 6 9 12 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
මැයි 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 5.3 : *ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත කෘෂිකාර්මික නිෂ්පාදන එකතුකිරීමේ මධ්‍යස්ථාන*

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

අරමුණ 02


වර්ෂ 2030 වන විට වලව කලාපිය කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුකරලීම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

ශක්තීන් | අරමුණ 02

1. *ඇඹිලිපිටිය නගරය මහවැලි සංවර්ධන මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට හදුනාගෙන පැවතීම*

රටේ කෘෂි කර්මාන්තය හා බලශක්තිය නිෂ්පාදනය අරමුණු කරගනිමින් ක්‍රියාන්මක කෙරුණු කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ වලවේ ගඟ පාදක කර ගනිමින් ඉඳිකෙරෙණු උඩවලව ජලාශයෙන් පෝෂණය වන කෘෂිකාර්මික ප්‍රදේශය, වලව විශේෂ බල ප්‍රදේශය ලෙසින් නම් කර ඇත. එම බල ප්‍රදේශය තුළ ස්ථාපිත කරන ලද ගොවි ජනපද වලට සේවා සැපයීම සඳහා වන නාගරික මධ්‍යස්ථාන වශයෙන් ඇඹිලිපිටිය හා අඟුණුකොලපලැස්ස නගර සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත.

මෙම නගර දෙක අතුරින් ඇඹිලිපිටිය නගරය මෑත කාලීනව එම කෘෂිකාර්මික බල ප්‍රදේශය කේන්ද්‍රකර ගනිමින් වේගවත් සංවර්ධනයක් කරා ගමන් කරමින් පවතී .මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගොවි ජනතාව සඳහා පදිංචියට හා වගා කිරීමට අවශ්‍ය නරම් ඉඩම් කලාපය තුළින් ලබාදී ඇත. ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික ඉඩම් වලින් 50%ට වැඩි ප්‍රමාණයක් පවතිනුයේ මහවැලි අධිකාරිය සතු ඉඩම් වශයෙනි.



රූප සටහන 5.9 : *මහවැලිය සංවර්ධන වලව කලාපය*
මූලාශ්‍රය : *http://mahaweli.gov.lk/en/maps.html*

එමෙන්ම උඩවලව බහුකාර්ය යෝජනා ක්‍රමය යටතේ වර්ෂ 1961 සිට 1981 දක්වා කාලය තුළ ජනපද ව්‍යාප්තිය හා කෘෂිකාර්මික ප්‍රදේශ සංවර්ධනය සිදු වූ අතර එය ගංඟා නිම්න සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වී ඇත. එහිදී සබරගමුව පළාතේ අනෙකුත් ප්‍රදේශ තුළින් හා දකුණු පළාතේ ප්‍රදේශ තුළින් පැමිණි ජනතාව මෙහි නැවත පදිංචි කරවා ඔවුන්ට කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් ලබාදී ඇත. 1979 වර්ෂයේ දී මෙම ප්‍රදේශය වලව විශේෂ බල ප්‍රදේශය ලෙස නම්කර ඇති අතර 1982 දී වලව කලාපයේ පරිපාලනය මහවැලි අධිකාරිය සතු වී ඇත (ඇඹිලිපිටිය වෘතාන්තය). ඒ අනුව අද වනවිටද මහවැලි විශේෂ බල ප්‍රදේශයක් වශයෙන් කෘෂිකාර්මික කටයුතු ප්‍රමුඛ කරගත් වේගවත් සංවර්ධනයක් කරා ගමන් කරමින් පැවතීම කෘෂිකර්මාන්නය ප්‍රමුඛ වූ ආර්ථික සංවර්ධනයක් වෙත ළඟාවීමට පවතින ප්‍රබල ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

2. *බෝග වගාව සඳහා වඩා යෝග්‍ය සරු පසක් පැවතීම*

අනරමැද කලාපීය හා වියළි කලාපීය දේශගුණික ලක්ෂණ සහිත ඇඹිලිපිටිය නගරය කෘෂිකාර්මික බෝග වගාවන් සඳහා යෝග්‍ය සාරවත් පස් වර්ග වලින් සමන්විත වීම, දේශීය හා විදේශීය වෙළඳපොළ ඉලක්ක කර ගනහැකි බෝග වගාවන් සඳහා යොමුවීමට හා කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීමට ඇති ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත.


මෙම කලාපය තුළ බෝග වගාවට හිතකර පාංශු සංඝටක වර්ග පහකි.

- රතු කහ පොඩ්සෝලික් පස (Red yellow podosolic soils)
- රතු දුඹුරු පස් (Reddish brown earths)
- අපරිණත දුඹුරු ලෝම පස (immature brown loam)
- දියසිලු පස් (Alluvial soil)
- තෙත සහිත මැටි පස (low humid clay soils)

ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව පවතින පාංශු සංඝටක වී වගාව, එළවළු (වට්ටක්කා, බණ්ඩක්කා, මෑ කරල්, කරවිල, වම්බටු, වැටකොළු), පළතුරු (කෙසෙල්, අඹ, නාරන් වර්ග, ඩ්‍රැගන් ෆෘට්, දෙළුම් වැනි පළතුරු), රටකජු, බඩඉරිඟු, පුහුල් යනාදී බෝග වගාවන් සඳහා යෝග්‍ය වී ඇත. එමඟින් කෘෂි නිෂ්පාදන භාවිතයට ගනිමින් අගය එක්කිරීමේ නිෂ්පාදන ක්‍රියාවලියක් ඇනිකිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය කලාපය තුළින්ම ලබාගැනීමට අවස්ථාව උදාකරන අතර එය නගරයේ ආර්ථිකය සංවර්ධනයට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

3. *කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා යෝග්‍ය බෝග වගාවන්ද පැවතීම*

දැනට මෙම කලාපය තුළ සිදුකෙරෙන කෘෂි නිෂ්පාදන සඳහා අගය එකතු කරමින් නව නිෂ්පාදන ඇනි කිරීමේ ක්‍රියාවලියට යොමුකරගත හැකි අතර එවැනි බෝග ලෙස වී, කෙසෙල්, පළතුරු,එළවළු, අලවර්ග, රටකජු, බඩඉරිඟු වැනි වගාවන් හඳුනාගෙන ඇත. මෙම බෝග වගාවන් අතුරින් වැඩි ප්‍රමාණයක් එනම් 59%ක් වී වගාව සිදුකරනු ලබන අතර රට අමනරව කෙසෙල් වගාව 16%ක්ද අනිරේක බෝග වගාව 12%ක්ද හා එළවළු වගාව 8%ක්ද වශයෙන් වගා කටයුතු සිදුකරනු ලබයි. කලාපය තුළ සිදුකෙරෙන මෙම නිෂ්පාදන යොදාගනිමින් ප්‍රමිති සහගත ගුණාන්මක නිෂ්පාදන ඇනිකිරීමට, කලාපය තුළ එක්රැස්වන අස්වැන්න යොදාගත හැකිවීම නාගරික ආර්ථික වර්ධනයට පවතින ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත.



රූප සටහන 5.10 : *බෝග වගාවන්ට අනුව භූමි පරිහරණය (හෙක්)-2016*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ - ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

4. *ඇඹිලිපිටිය නගරයම ආවරණය කරමින් ඉදිකර ඇති වාරි ඇළ පද්ධතිය තුළින් කෘෂි නිෂ්පාදන කටයුතු පහසු වීම*

ඇඹිලිපිටිය කලාපයම ආවරණය කරමින් ඉදිකර ඇති 70කට අධික වාරි ඇළවල් පද්ධතිය වලවේ ගඟෙන් පෝෂණය වන උඩවලව ජලාශය හා චන්ද්‍රිකා වැව ජල පෝෂක ප්‍රදේශ මුලික කරගනිමින් ඉදිකර ඇත. කලාපයේ සියලු කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබා දීම මෙම වාරි පද්ධතිය හරහා සිදු කරනු ලබයි. 2016 වසර තුළ වාරි පද්ධති 63ක් යොදාගනිමින් අස්වද්දන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය අක්කර 6950.3 කි. ඒ අනුව මෙම වාරි පද්ධතිය තුළින් නගරය නවදුරටත් කෘෂිකාර්මික වගාකටයුතු ප්‍රමුඛ කරගත් සංවර්ධනයක් වෙත ගෙන යාමට පවතින ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත. (ඇමුණුම් සිතියම් අංක 1.9)

5. *තැනිතලා භූ ලක්ෂණ සහිත නාගරික පිහිටීම අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ප්‍රවාහනයට පහසු වීම*

මුහුදු මට්ටමේ සිට මීටර් 60 -100 න් අතර උසකින් වලව ගංඟා නිම්නයේ පිහිටි මෙම නගරයේ බොහෝ ප්‍රදේශ නැනිතලා ස්වරූපයක් පෙන්නුම් කරන අතර එය කෘෂිකාර්මික කටයුතු සඳහා මෙන්ම කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයටද, වගා කටයුතු වලට අවශ්‍ය ජල සැපයුම පහසු කරලීමටද ඇති ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත (ඇමුණුම් සිතියම් අංක 1.15).

6. *කෘෂිකාර්මික නිෂ්පාදන අභිමුඛ කර්මාන්ත ස්ථාපිත කළහැකි මට්ටමේ කර්මාන්ත කලාපයක් දැනටමත් නාගරික බල ප්‍රදේශය තුළ ස්ථාපිත වී පැවතීම.*

අක්කර 50කින් සමන්විත මෙම කර්මාන්ත කලාපය තුළ දැනට අක්කර 25ක භූමී ප්‍රදේශයක් කර්මාන්ත සඳහා යොදාගෙන ඇති අතර එහි මේවන විට ප්‍රධාන කර්මාන්ත 4ක් ක්‍රියාන්මක වේ. මීට අමතරව නගරය ආශ්‍රිතව දැනට පවතින විශාල හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත කෘෂිකාර්මික හා අනෙකුත් නිෂ්පාදන ක්ෂේත්‍රයේ උන්නතියට පවතින ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත. දැනට ක්‍රියාන්මක නොවී පවතින අක්කර 25ක භූමී ප්‍රමාණය නව අගය එක්කිරීමේ කර්මාන්ත ඇතිකිරීම සඳහා යොදාගත හැකිවීම නගරයේ සංවර්ධන ක්‍රියාදාමයට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.








රූප සටහන 5.11 : *කර්මාන්ත කලාපයේ දැනට පවතින තත්ත්වය 2017*
මූලාශ්‍රය : *https://bit.ly/2WHPvrq*

7. නාගරික භූමි භාවිතයෙන් 1/3ක භූමි ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීම ඒ ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට පහසු වීම

නාගරික ප්‍රදේශයේ පවතින භූමි ප්‍රමාණයෙන් 1/3ක භූමි ප්‍රදේශයක් කෘෂිකාර්මික භාවිතයන් සඳහා මේවන විටත් යොදාගෙන ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස සමස්ථ භූමි ප්‍රදේශයෙන් 35%කි. දැනට මෙම ප්‍රදේශය තුළ වී, කෙසෙල්, පොල්, පළතුරු, එළවළු හා හේන් වගාව මෙන්ම අතුරු බෝග වගාවන් සිදුකර ඇත. ඒ අනුව මෙම කලාපය දැනටමත් කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස ස්ථාපිතව ඇති බවට සාක්ෂාත් වේ. එමගින් නගරය තුළින්ම අගය එක්කරන කෘෂි නිෂ්පාදන ඇනිකිරීමේ ක්‍රියාවලියට අවශ්‍ය බෝග වගාවන් හා අස්වැන්න කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදන අනර්න් ලබාගැනීමට ඉඩ ප්‍රස්තාව සැලසීම නගරයේ පවතින සංවර්ධන ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

වර්ගීකරණය	***හෙක්ටයාර් (Ha)***
නේවාසික	*6682.485*
වාණිජ	*44.586*
කර්මාන්ත	*111.51*
රාජ්‍ය ආයතන	*87.54*
මාර්ග	*471.97*
ක්‍රීඩා භූමී	*10.84*
ආගමික	*4.09*
ලදු කැලෑ	*1250.48*
සුසාන භූමී	*2.28*
තුඹුරු	*4129.68*
පොල්	*374.654*
වෙනත් භෝග	*487.825*
වගුරු බිම්	*38.45*
ජල මූලාශ්‍ර	*904.89*
ගිස් ඉඩම්	*0.29*
හේන්	*128.75*
වතු වගාව	*216.75*
එකතුව	*15082.38*

වගුව 5.2 : *ඇඹිලිපිටිය නගරයේ දැනට පවතින භූමි භාවිතයන් |* ***මූලාශ්‍රය :*** *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2017*



කෘෂිකාර්මික භූමි භාවිතයන්
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
නොවැම්බර් 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 5.4 : *කෘෂිකාර්මික භාවිතයන්*

8. *බලශක්ති උත්පාදනය සඳහා දායක වන උඩවලව ජල විදුලිබලාගාරය හා හිඟුර නාප විදුලි බලාගාරය ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව ස්ථාපිතව පැවතීම.*

1969 වර්ෂයේ ආරම්භ කර ඇති උඩවලව ජල විදුලි බලාගාරය කුඩා පරිමාණයේ ජල විදුලි බලාගාරයක් වන අතර එමඟින් මෙගා වොට් 6ක විදුලියක් උත්පාදනය කෙරේ. මීට අමතරව හිඟුර ප්‍රදේශයේ ස්ථාපිතව ඇති නාප විදුලි බලාගාරය(ACE Power) ඉන්ධන භාවිතා කරමින් බලශක්තිය උත්පාදනය කරනු ලබන අතර මෙමඟින් මෙගා වොට් 100ක විදුලි උත්පාදනයක් ජාතික විදුලිබල පද්ධතියට එක්කෙරේ.

මීට අමතරව හිඟුර ප්‍රදේශයේ ගිරිසිඩියා දැව භාවිතයෙන් විදුලිය නිෂ්පාදනය කරනු ලබන බලාගාරයක් මෑත කාලීනව ක්‍රියාත්මක වන අතර එමඟින් මෙගා වොට් 3ක ධාරිතාවයක් ජාතික විදුලි බල පද්ධතියට එක් කෙරේ. මෙවැනි බල ශක්ති උත්පාදන මධ්‍යස්ථාන ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව ක්‍රියාත්මක වීම අනාගත සංවර්ධන ඉලක්ක කරා ලඟාවීම සඳහා ඇති ප්‍රබල ශක්තියක් වශයෙන් හඳුනාගෙන ඇත.



රූප සටහන 5.12 : *උඩවලව ජල විදුලි බලාගාරය*
මූලාශ්‍රය : *goo.gl/S1mwkN*



රූප සටහන 5.13 : *ACE POWER බලාගාරය*
මූලාශ්‍රය : *goo.gl/3kC6Q9*

9. *සබරගමුව පළාත් ව්‍යුහ සැලැස්ම තුළ ඇඹිලිපිටිය නාගරය කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස නම් කිරීම*

වර්ෂ 2030 සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් පිළියෙළ කර ඇති සබරගමුව පළාත් කලාපීය භෞතික සැලැස්ම තුළ ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයම කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස නාමකර පැවතීම කලාපීය සංවර්ධනයේදී ඇඹිලිපිටිය නගරය තුළ කෘෂි කර්මාන්තය ප්‍රමුඛ කරගත් සේවා විධිමත් කිරීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත (ඇමුණුම් සිතියම් අංක 1.16).

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

දුර්වලතා | අරමුණ 02

1. *කලානුරූපී දේශගුණික වෙනස්වීම් තුළින් වාර්ෂිකව ඉලක්කගත නිෂ්පාදන ලබාගත නොහැකි වීම*

කලානුරූපීව සිදුවන දේශගුණික වෙනස්වීම් වලට අනුව ගොවින් විසින් වගාකරන ලබන බෝග වර්ගය වෙනස්කිරීමට පෙළඹෙන බැවින් ඉලක්කගත නිෂ්පාදන සඳහා අවශ්‍ය කරන කෘෂි නිෂ්පාදන නොලැබී යාම කෘෂි කර්මාන්තය ප්‍රමුඛකරගත් ආර්ථිකයක් නගරයේ ඇති කිරීමට පවතින ප්‍රධාන දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.


උදාහරණයක් ලෙස වී ගොවිතැන යල හා මහ කන්න වලට සිදුකරනු ලබන අතර වගාකරන ප්‍රමාණයන් හා අස්වනු කන්න අනුව වෙනස් වේ. නවද වී ගොවිතැන් කළ නොහැකි ජලය අඩු කාලවල කෙසෙල් වගාව සඳහා යොමු වීමද ඊට අමතරව වැසි රහිත කාල තුළදී කන්න දෙකම වගාකිරීමට නොලැබෙන අවස්ථාද හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය තුළ කෘෂි නිෂ්පාදන ප්‍රමුඛ වූ නිෂ්පාදන ඇතිකිරීමට අවශ්‍ය අස්වැන්න ප්‍රමාණාත්මකව ලබාගැනීමට නොහැකි වීම දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

	මුලු බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)			*වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)*		
කන්නය	*මහා වාරිමාර්ග*	*සුළු වාරිමාර්ග*	*වර්ෂාපෝෂිත*	*මහා වාරිමාර්ග*	*සුළු වාරිමාර්ග*	*වර්ෂාපෝෂිත*
වී වගාව මහ කන්නය	4040.6	584.1	141.1	3800.8	542.2	123.1
වී වගාව යල කන්නය	4040.6	546.7	122.5	3797.6	506.6	97.5

වගුව 5.3 : *ඇඹිලිපිටිය යල මහ කන්න වල වී වගාව*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ - ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

2. *වර්තමානය වන විට නාගරික කෘෂිකාර්මික ඉඩම්වල වගා කටයුතු අත්හැරීම හා භාවිතය වෙනස් කිරීමට ලක්කිරීම කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.*

විශේෂයෙන් ඇඹිලිපිටිය නගර මධ්‍යයේ, වර්ෂ 1992 වනවිට පැවති කෘෂිකාර්මික ඉඩම් භාවිතයන් 2003 හා 2017 වනවිට බහුල වශයෙන් නේවාසික හා වාණිජ භාවිතයන් සඳහා වෙනස් වී ඇති අයුරු හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය නගරය කෘෂිකාර්මික වශයෙන් සංවර්ධනය කිරීමට පවතින දුබලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත (රූප සටහන් අංක 5.14).



රූප සටහන 5.14 : *ඇඹිලිපිටිය නගර මධ්‍යයේ ඉඩම් භාවිතය කලානුරූපිව වෙනස් වී ඇති අයුරු (1992-2017)*

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

3. *කෘෂිකාර්මික බිම් ආවරණය වන පරිදි ස්ථාපිතව ඇති මාර්ග පද්ධතියෙන් 90.6 %ක මාර්ග ප්‍රමාණයක් සංවර්ධනය කළ යුතු මට්ටමක පැවතීම කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයට පවතින දුර්වලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.*

විශේෂයෙන් නගර මධ්‍යයෙන් ඔබ්බට පිහිටි ප්‍රධාන මාර්ග වල සිට කිලෝමීටර් 2ක් 3ක් ග්‍රාමීය ප්‍රදේශ වෙත ගමන් කිරීමේදී කෘෂිකාර්මික බිම් ආශ්‍රිතව පවතින බොහෝ මාර්ග ගුරු පාරවල් ලෙසින් හා සංවර්ධිත නොවූ අයුරින් පැවතීම නගර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

මාර්ග ශ්‍රේණිය						*මුළු දුර (කි.මී.)*	*සංවර්ධනය කළ යුතු දුර (කි.මී.)*
A ශ්‍රේණිය	*B ශ්‍රේණිය*	*C ශ්‍රේණිය*	*D ශ්‍රේණිය*	*පළාත් පාලන*	*ගුරු මාර්ග*	*469*	*425 (90.6%)*
38.5	*35*	*28.3*	*12.5*	*134*	*220.7*		

වගුව 5.4 : *මාර්ග වර්ගීකරණය - ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ - ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2017*

4. *ඇඹිලිපිටිය කර්මාන්ත කලාපයේ අදියර II මෙතෙක් ක්‍රියාත්මක නොවීම.*

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ඇඹිලිපිටිය කර්මාන්ත ව්‍යාපෘතියේ පළමු අදියර තුළ කර්මාන්ත ස්ථාපිත වීම ප්‍රශස්ත මට්ටමක නොපැවතීම හා එහි දෙවන අදියර මෙතෙක් ආරම්භ වී නොනිබීම කලාපීය කෘෂි නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

අක්කර 50කින් සමන්විත ඇඹිලිපිටිය කර්මාන්ත කලාපයේ පළමු අදියර යටතේ අක්කර 25ක්ද දෙවන අදියර යටතේ අක්කර 25ක් ද වශයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවතියද, 2018 වර්ෂය වනවිටත් එහි පළමු අදියරද නිමා නොවීම හේතුවෙන් දෙවන අදියරද ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. පළමු අදියර යටතේ අක්කර 4ක භූමි ප්‍රමාණයක් මේවන විටත් (2018) ආයෝජනයකින් තොරව නිස්ව පවතින අතර කර්මාන්ත කලාපය තුළ දැනට කර්මාන්ත 4 ක් පමණක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. මේ අනුව කර්මාන්ත කලාපයේ දෙවන අදියර ක්‍රියාත්මක නොවීම දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

5. *මහා පරිමාණ නිෂ්පාදන කර්මාන්ත දෙකක් ලෙසින් ආරම්භ කර ඇති ඇඹිලිපිටිය කඩදාසි කම්හල හා මොරකැටිය වී ගබඩා සංකීර්ණය වර්තමානය වනවිට වැසිගොස් පැවතීම.*

දිනකට කඩදාසි මෙට්ට්‍රික් ටොන් 50 ක් නිපදවීමට ගන්නා පල්ප මෙට්ට්‍රික් ටොන් 35ක් නිපදවීමේ හැකියාව පැවති මෙම කම්හල 1977 වසරේ ආරම්භ කර වසර 26ක් ක්‍රියාත්මකව පැවත 2003 වර්ෂයේ එහි නිෂ්පාදන කටයුතු නතර කර දමා ඇති අතර, සේවකයන් 1500ක් පමණ මෙම කම්හලේ සේවය කර ඇත. වර්ෂ 1970 දී ආරම්භ වී ඇති මොරකැටිය වී ගබඩා සංකීර්ණය ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ඉදිකර ඇති අතර මෙය ක්‍රියාත්මක වී ඇත්තේ වසර 10ක් නරම් කෙටි කාලයකි.

දවසේ පැය 24 පුරාම වී නැම්බිම ,වේලීම , කෙවිම හා ගබඩා කිරීම යන කාර්යයන් මෙම කර්මාන්තය තුළ සිදු කර ඇති අතර සේවකයන් 1000ක් පමණ එම කර්මාන්තය වැසියන අවස්ථාව වන විට සේවයෙහි නිරත වී ඇත. මෙවැනි විශාල පරිමාණයේ නිෂ්පාදන කර්මාන්ත දෙකක් වැසියාම කලාපීය වශයෙන් සංවර්ධන අභිමනාර්ථ සාක්ෂාත් කරගැනීමට පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

අවස්ථා | අරමුණ 02

1. *යෝජිත කර්මාන්ත කලාපය තුළ කෘෂිකාර්මික නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට හැකිවීම.*

දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාන්මක කිරීමට යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව අක්කර 1500ක භූමි ප්‍රමාණයක් වෙන් කර ඇත. (ඇමුණුම් සිතියම් අංක 1.11)

මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය මඟින් ආසන්න වශයෙන් කර්මාන්ත 2400ක් පමණ ආරම්භ කිරීමට නියමිත අතර එමඟින් ඍජු හා වක්‍ර රැකියා අවස්ථා 400,000 ක් පමණ උත්පාදනය වේ. මෙම ව්‍යාපෘතිය අගය එක්කිරීමේ කෘෂිනිෂ්පාදන කර්මාන්ත ඇතිකිරීමට පවතින සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

2. *කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය නිෂ්පාදන ආනයන අපනයන කටයුතු සඳහා අවශ්‍ය ගුවන්තොටුපොළ, හා වරාය පහසුකම් ලබාගත හැකිවීම.*

ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 57ක් වැනි ආසන්න දුරකින් හම්බන්තොට වරායද කිලෝමීටර් 44 ක් වැනි දුරකින් මත්තල ගුවන්තොටුපොළද පිහිටා තිබීම තුළින් නගරයේ කෘෂි නිෂ්පාදන කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ආනයන, අපනයන කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන අවශ්‍යතා සපුරාගැනීමට පවතින අවස්ථාවක් වශයෙන් හඳුනාගෙන ඇත(ඇමුණුම් රූපසටහන් අංක3.2).

3. *දක්ෂිණ අධිවේගී මාර්ගය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය තුළින් ප්‍රධාන වාණිජ නගරය වන කොළඹ නගරය හා පහසුවෙන් සම්බන්ධ විය හැකි වීම.*

කොළඹ සිට මානර දක්වා ක්‍රියාන්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය මානර සිට මත්තල දක්වා දීර්ඝ කිරීම මඟින් ඇඹිලිපිටිය නගරයට ආසන්න අන්තර් හුවමාරු මධ්‍යස්ථානයක් බරවකුඹුක ප්‍රදේශයේ පිහිටා තිබීම(කිලෝමීටර් 14ක දුරින්). මෙම අන්තර් හුවමාරුව ඔස්සේ ප්‍රධාන වාණිජ නගරය වන කොළඹ හා සම්බන්ධ වීම හා කර්මාන්ත අමුද්‍රව්‍ය හා නිෂ්පාදන හුවමාරුව පහසුකරගත හැකි අවස්ථාවක් වීම(ඇමුණුම් රූප සටහන් අංක 3.2).

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

තර්ජන | අරමුණ 02

1. *අතරමැදි වෙළෙන්දන්ගේ මැදිහත්වීම නිසා සමස්ථ කෘෂි නිෂ්පාදනයෙන් වැඩි කොටසක් පිටතට ගලා යාම හේතුවෙන් කලාපීය නිෂ්පාදන තුළින් කලාපයට ලබාගත හැකි ඉහළ ආදායමක් අහිමිවී යාම.*

ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ආරම්භයේදී සිදු කරන ලද අධ්‍යනයේදී නිඟුර ආර, උඩගම, තුංකම හා නිඟුර ප්‍රදේශ තුළ සිදුකරන ලද සමීක්ෂණයන් මඟින් එක් වගා කන්නයකදී ලබාගත හැකි වී ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3372ක් වශයෙන්ද, කෙසෙල් මෙට්‍රික් ටොන් 1290ක් වශයෙන්ද එළවළු මෙට්‍රික් ටෝන් 1560ක් වශයෙන්ද ගණන් බලා පැවතුනද වර්තමානයේ ඉහත සඳහන් කළ ප්‍රදේශ ආශ්‍රිතව මසකට කෙසෙල් මෙට්‍රික් ටොන් 200 ක් නරම් ප්‍රමාණයක් නිපදවෙන අතර ආර්ථික මධ්‍යස්ථානයට ඉන් ලැබෙනුයේ 40%න් 50%න් අතර අඩු ප්‍රතිශතයකි. එමෙන්ම එළවළු නිෂ්පාදනය මසකට මෙට්‍රික් ටොන් 260ක් පමණ වන අන එළවළු නිෂ්පාදනයෙන් ආර්ථික මධ්‍යස්ථානයට ලැබෙනුයේ 23%- 26% න් අතර ඉතා අඩු ප්‍රතිශතයකි.

මෙම තත්ත්වයට ප්‍රධාන හේතුව අතරමැදි වෙළෙදුන් විසින් අස්වැන්න ගොවිබිම් වෙනටම ගොස් මිලදී ගැනීමයි. ඒ අනුව කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියක් ඇතිකිරීම සදහා නගරයේ කෘෂි බෝග මිලදී ගැනීමට පැමිණෙන අතරමැදි වෙළෙන්දන් තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත.

කෙසෙල්	*මෙ.ටො. 80-100*
එළවළු	*මෙ.ටො. 60-70*
පළතුරු	*මෙ.ටො. 10-15*

වගුව 5.5 : *ආර්ථික මධ්‍යස්ථානයට මාසිකව එකතුවන කෘෂි නිෂ්පාදන ප්‍රමාණයන්*
මූලාශ්‍රය : *ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය , 2016*

2. *වියළි කාලගුණික තත්ත්වයන් හේතුවෙන් නියං සහිත දේශගුණික තත්ත්වයක් ඇතිවිය හැකි වීම.*

සෘතූන් අනුව සිදුවන දේශගුණික වෙනස්වීම් හේතුවෙන් ජුනි මස අග සිට නොවැම්බර් මස මුල දක්වා කාලය තුළ කලාපයේ ජලපෝෂක ප්‍රදේශ වලට ලැබෙන වර්ෂාපතනය අඩුවී යාමක් සිදුවේ. එම හේතුවෙන් කලාපීය වාරි පද්ධතිය සුපෝෂණය කරනු ලබන උඩවලව ජලාශයේ ජල පරිමාව අඩුවී යයි. උඩවලව ජලාශයේ සාමාන්‍ය ජල මට්ටම අක්කර අඩි 217,000ක ධාරිතාවයක් වන අතර එය දිර්ඝකාලින වියළි කාලගුණික තත්ත්වයන් තුළදී අක්කර අඩි 35,000ක ප්‍රමාණය දක්වා අඩුවීමක් හඳුනාගෙන ඇත. වියළි කාලගුණික තත්ත්වයන් තුළ ප්‍රධාන ජල මූලාශ්‍රවල ජල මට්ටම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීම හා දීර්ඝකාලිනව නියං සහිත තත්ත්වය ඇතිවීමෙන් ප්‍රධාන ජල මූලාශ්‍ර වල ජල මට්ටම අඩුවී ගොස් ජලය භාවිනයට ගත නොහැකි තත්ත්වයට පත්වීමටද හැකියාව පවතින අතර මෙය නගරයේ කෘෂි ආර්ථිකයට එල්ලවිය හැකි තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත.

අරමුණ 03

වර්ෂ 2030 වනවිට පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් වාසයට හා සංචාරයට හිතකර ආකර්ෂණීය නගරයක් බිහිකිරීම.

ශක්තීන් | අරමුණ 03

1. *නීල හරිත පරිසර පද්ධතියකින් සමන්විත ආකර්ශණීය වටපිටාව.*

ඇඹිලිපිටිය නගරය වලවේ ගඟට මායිමිව පිහිටා නිබීමත් උඩවලව ජලාශයේ සිට ජලය රැගෙන යන ඇළ මාර්ග පද්ධතිය හා එයින් පෝෂණය වන චන්ද්‍රිකා වැවද ඇතුළු කුඩා වැව් පද්ධතියක් නගරය පුරාවට විසිර පැවතීම හේතුවෙන් නගරයට සෞන්දර්යාත්මක මෙන්ම සෞම්‍ය වටපිටාවක් නිමි වී ඇත. විශේෂයෙන් උඩවලව ජලාශයත්, චන්ද්‍රිකා වැවත් නගරයේ ආකර්ෂණය වැඩි කර ඇති අතර නගරය අභ්‍යන්තරයේ පවතින කාවන්නිස්ස වැව, හිඟුර ආර වැව ආදී කුඩා වැව්ද නගරයේ ස්වභාව සෞන්දර්යය ඉහළ නැංවීමට දායක වී ඇත.

මෙම කලාපයේ සමස්ථ භූමී ප්‍රදේශයෙන් 1/3 ක්ම කෘෂිකාර්මික බෝග වගාවන් සඳහා භාවිතයට ගෙන ඇති අතර භූමී ප්‍රමාණයෙන් 6%ක් ජල මූලාශ්‍ර වශයෙන් පවති (ඇමුණුම් සිතියම් අංක 1.9). එමෙන්ම විශාල පරිමාණයේ ගොඩනැගිලි නුළින් නගරයේ සුළං කපොලු ආවරණය වී නොමැති බැවින් නගරය හරහා හමායන සුළඟින්ද පරිසරයේ පවතින උෂ්ණත්වය පාලනය වීමක් සිදුවේ.

වියළි දේශගුණික නත්න්වයක් තුළදිද පවතින වාරි ඇළ වලින් සැකසී ඇති පරිසරයක් නගරයට උරුමවී පැවතීම ඇඹිලිපිටිය නගරයේ සංවර්ධන අභිමනාර්ථ සාක්ෂාත් කරගැනීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

2. *භෞතික සංවර්ධනයට පහසු තැනිතලාගත පිහිටීම.*

මුහුදු මට්ටමේ සිට මීටර් 60 -100න් අතර උස පරාසයක වලවේ ගංඟා නිම්නයේ පිහිටි මෙම නගරයේ බොහෝ ප්‍රදේශ තැනිතලා ස්වරූපයක් පෙන්නුම් කිරීම (ඇමුණුම් සිතියම් අංක 1.15). භූමියේ තැනිතලා සහිත පිහිටීම නගරයේ භෞතික සංවර්ධනය සිදුකිරීමට පවතින විශේෂී ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

3. *සබරගමුව පළාත් ව්‍යුහ සැලැස්ම තුළ ඇඹිලිපිටිය නගරය පරිසර හිතකාමී සංචාරක කලාපයක් ලෙස නම් කිරීම.*

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 2030 සඳහා පිළියෙළ කර ඇති සංචාරක සංවර්ධන ප්‍රදේශ සැලැස්ම තුළ ඇඹිලිපිටිය නගරය පරිසර හිතකාමී සංචාරක කලාපයක් (eco tourism) ලෙස නම් කර ඇත (ඇමුණුම් සිතියම් අංක 1.17).


05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT විශ්ලේෂණය


ජාතික භෞතික සැලැස්ම තුළින් ලබාදී ඇති සුවිශේෂීතාවය තුළ කලාපයේ පවතින ස්වභාවික පරිසරය ආරක්ෂා කරගනිමින් නගර සංවර්ධනය සිදුකිරීමට අවස්ථාව හඳුනාගෙන පැවතීම සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමට පවතින ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

4. *උඩවලව හා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව දේශීය හා විදේශීය සංචාරකයින්ට සේවා සැපයීමේ සංචාරක හෝටල් හා ලැගුම් හල් ස්ථාපිතවීමේ ඉහළ ප්‍රවණතාවයක් පැවතීම.*

මේවන විට උඩවලව සංචාරක කලාපයට පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය ආහාර,නවාතැන්, සත්‍යාරි ආදී බොහොමයක් පහසුකම් සැලසීම සඳහා සේවා සැපයුම් මධ්‍යස්ථාන වශයෙන් උඩවලව හා ඇඹිලිපිටිය නගර ස්ථාපිනව ඇත (සිනියම් අංක 5.5). එම සේවාවන් විධිමත් කරමින් නගරයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන්; අපේක්ෂිත අරමුණු වෙත රැගෙන යාම තුළින් ආකර්ශණීය හා ජීවන්වීමට හිතකර නගරයක් බිහිකිරීමට ඇති හැකියාව ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.



රූප සටහන 5.15 : *සංචාරක නවාතැන් පහසුකම් 2016*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ - ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*



සංචාරක හෝටල් ව්‍යාප්තිය
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
ජූනි 2017

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 5.5 : දැනට ව්‍යාප්තව පවතින සංචාරක හෝටල් ව්‍යාප්තිය

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය

5. *රත්නපුර දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ හා සැසඳීමේදී ස්වභාවික ආපදාවන් අවම ප්‍රදේශයක් ලෙස පිහිටා තිබීම.*

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රධාන නගර අතුරින් ස්වභාවික ආපදා අඩුම නගරය ඇඹිලිපිටිය නගරය ලෙස වාර්තා වී ඇත. මෙම තත්ත්වය හේතුවෙන් ජනතාවට ආරක්ෂාකාරීව නම වාසස්ථාන ඉදිකර ගැනීමට අවස්ථාව සැලසී ඇත. (ඇමුණුම් සිනියම් අංක 1.13)

දුර්වලතා | අරමුණ 03

1. *සෘතූන් අනුව සිදුවන දේශගුණික වෙනස්වීම් මත ජුනි -නොවැම්බර් දක්වා කාලය තුළ ජල පෝෂක හිඳියාම හේතුවෙන් පරිසර උෂ්ණත්වය ඉහළ යාම.*

ඇඹිලිපිටිය නගරය තුළ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 26ක් පමණ වන අතර දේශගුණික වෙනස්වීම් මත නරමක වැඩි උෂ්ණත්වයක් පවතී. මෙම තත්ත්වය නගරය තුළ ජීවත්වන හා නගරයට පැමිණෙන ජනතාව වෙහෙසකර තත්ත්වයකට පත්වීමට හේතුවක් වශයෙන් හඳුනාගෙන ඇත. ඒ අනුව නගර සංවර්ධන සැලැස්මේ නෙවන අරමුණ වෙත ළඟාවීමට පවතින දුබලතාවයක් ලෙස මෙම පරිසර උෂ්ණත්වය ඉහළ යාම හඳුනාගෙන ඇත.

2. *මහවැලි බලපත්‍රලාභි ඉඩම් බහුල වීමෙන් ඉඩම් හිමිකම ආශ්‍රිත ගැටළු පැවතීම.*

ඉඩම් හිමිකම් නිරවුල් නොවීම කලාපීය ජනතාවට මුහුණ දීමට සිදුව පවතින ගැටළුවක් වශයෙන් හඳුනාගෙන ඇති අතර එම ගැටළුවට ප්‍රධාන හේතුව කලාපයේ 70%කට ආසන්න ඉඩම් ප්‍රමාණයක් මහවැලි අධිකාරිය සතුවීමයි. මහවැලි අධිකාරිය විසින් ලබාදෙන ලද වාර්ෂික බලපත්‍ර මඟින් බොහොමයක් ඉඩම් වල අයිනිය ජනතාව වෙත පවරා නිබුනද එම ඉඩම් අයිනිය නැවත පවුලේ වෙනත් සාමාජිකයෙකුට පැවරීමේදී මෙන්ම වාණිජ අවශ්‍යතා සඳහා විකිණීමේදී ගැටළු ඇතිවන අතර ඉඩම්වල අයිනිය නිරවුල් ඔප්පු මඟින් ලබාදී ඇත්තේ 20%ක නරම් අඩු ප්‍රමාණයකි. ඉඩම්වල අයිනිය අහිමි සංඛ්‍යාව 56.4%ක් දක්වා වර්ධනය වී ඇත.

පෞද්ගලික ඉඩම් අයිතිය සතු පදිංචිකරුවන් සංඛ්‍යාව	*18,654*
ඉඩම් හිමිකම් නිරවුල් නොවූ සංඛ්‍යාව	*24,112*


වගුව 5.6 : *ඉඩම් හිමිකම*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

3. *වැව් හා ඇළ මාර්ග ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශවල අනවසර ඉදිකිරීම් පැවතීම.*

නගරයේ ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන චන්ද්‍රිකා වැව රක්ෂිත ප්‍රදේශය ආශ්‍රිනවද අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඇත. මෙහිදී නාගරික අලංකරණය ලබාදෙන ස්වභාවික සම්පත් විනාශ වී යාම තුළින් නගරයේ පවතින ආකර්ශණීය බිඳවැටීම මෙන්ම පානීය ජල අවශ්‍යතා වලට ගැටළු ඇතිවීමද සිදුවිය හැකි බැවින් මෙම තත්ත්වය නගර සංවර්ධනයට පවතින දුබලතාවයක් වශයෙන් හඳුනාගෙන ඇත.

4. *ප්‍රධාන මාර්ග ආශ්‍රිතව සිදුවන රේඛීය සංවර්ධනය.*

ඇඹිලිපිටිය නගරයේ නෝනගම මාර්ගය, මොරකැවිය, මිද්දෙණිය හා පනාමුර යන ප්‍රධාන මාර්ගය දෙපස රේඛිය සංවර්ධනයක් (සිතියම් අංක 5.6) සිදු වී ඇති අතර වාණිජ භාවිතයන්ට අමතරව නේවාසික භාවිතයන්ද මෙම ප්‍රධාන මාර්ග ආශ්‍රිනව ගොඩ නැඟී ඇත. මෙම තත්ත්වය තුළ නගර මධ්‍යය ප්‍රදේශයෙන් ඔබ්බට ග්‍රාමීය ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය විධිමත් නොවීම ජනාවාසයට හිතකර නගරයක් ඇතිකිරීමට පවතින දුබලතාවයක් ලෙස හඳුනාගෙන ඇත.



සිතියම 5.6 : *ප්‍රධාන මාර්ග ආශ්‍රිතව සිදුවන රේඛීය සංවර්ධනය*

අවස්ථා | අරමුණ 03

1. *ඇඹිලිපිටිය නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 44ක් වැනි දුරකින් මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ පිහිටා තිබීම.*

මෙම පහසුකම නුළින් ඇඹිලිපිටිය නගරවාසින්ට අමතරව නගරයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින් සඳහා පහසුවෙන් මෙම නගරයට පැමිණීමට පවතින සුවිශේෂී අවස්ථාවක් ලෙස මෙම පහසුකම හඳුනාගෙන ඇත (ඇමුණුම් රූපසටහන් අංක 3.2).

2. *කොළඹ සිට මාතර දක්වා ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය මත්තල දක්වා දීර්ඝ කිරීම නුළින් ඇඹිලිපිටිය නගරයට ආසන්නතම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය බරවකුඹුක ප්‍රදේශය ආශ්‍රිතව ස්ථාපිතව පැවතීම. (ඇමුණුම් රූපසටහන් අංක 3.2).*

දක්ෂිණ අධිවේගී මාර්ගය ඇඹිලිපිටිය නගරයට ආසන්නයෙන් ගමන් කරන අතර ආසන්නතම අන්තර් හුවමාරු මධ්‍යස්ථානය වන බරවකුඹුක නගර මධ්‍යයේ සිට කි.මී. 14ක වැනි ආසන්න දුරකින් පිහිටා නිබේ. මෙය නගරවාසින්ට පහසුවෙන් දිවයිනේ අගනගරය හා දකුණු පළාත වෙත සම්බන්ධ වීමට පවතින අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

3. *සංචාරක ආකර්ෂණය අතින් සුවිශේෂිතාවයක් හිමි වී ඇති සබරගමුව පළාත නුළ පළාත් සංචාරක අමාත්‍යාංශය නම්කර ඇති ප්‍රධාන සංචාරක කලාප හතක් පවතින අතර එම සංචාරක කලාප අතුරින් උඩවලව සංචාරක කලාපයට ඇඹිලිපිටිය නගරය අයත් වීම (ඇමුණුම් සිතියම් අංක 1.12).*

උඩවලව සංචාරක කලාපය නුළ උඩවලව ජාතික වනෝද්‍යානය, ඇන් අතුරු සෙවණ, සංඛපාල විහාරය, මඩුවන්වෙල වලව්ව ආදී සංචාරකමය ආකර්ෂණීය ස්ථාන බොහොමයක් පිහිටා ඇති අතර දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ෂණයද දිනාගෙන ඇත (රූප සටහන් අංක 5.16). සංචාරක කර්මාන්තය අතින් සුවිශේෂීත්වයක් නිර්මාණය කරගෙන ඇති සබරගමුව පළාතට අයත් උඩවලව සංචාරක කලාපයට වාර්ෂිකව දේශීය හා විදේශීය සංචාරකයින් පැමිණෙන අතර උඩවලව ප්‍රදේශයේ පවතින සංචාරක ආකර්ශණය නාගරික ආකර්ෂණය වැඩි දියුණු කිරීමට පවතින අවස්ථාවක් ලෙස හඳුනාගෙන ඇත.

05 වන පරිච්ඡේදය
SWOT විශ්ලේෂණය

විස්තරාත්මක SWOT
විශ්ලේෂණය



රූප සටහන 5.16 : *ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත සංචාරක ආකර්ෂණීය ස්ථාන, 2020*

4. *දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව අක්කර 1500ක භූමී ප්‍රමාණයක් වෙන් කර පැවතීම නිසින් බිහිවන සෘජු හා වක්‍ර රැකියා අවස්ථා.*

දක්ෂිණ ප්‍රදේශ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාන්මක කිරීමට යෝජිත අක්කර 15,000කින් සමන්විත කර්මාන්ත කලාපය සඳහා ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව අක්කර 1500ක භූමී ප්‍රමාණයක් වෙන් කර පැවතීමත් එම කර්මාන්ත ව්‍යාපෘතිය තුළ කර්මාන්ත 2400ක් පමණ ප්‍රමාණයක් ස්ථාපිත කිරීමට යෝජිතය. එමඟින් සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 400,000 ක් පමණ උත්පාදනය කිරීමට හඳුනාගෙන ඇත. ඒ අනුව සමස්ත භූමී ප්‍රමාණයෙන් 1/10 ක භූමී ප්‍රමාණයක් ඇඹිලිපිටිය නගරය ආසන්නයෙන් වෙන්කර ඇති බැවින් එම ප්‍රදේශය සඳහා කර්මාන්ත 100කට වැඩි ප්‍රමාණයක්ද, සෘජු හා වක්‍ර රැකියා අවස්ථා 30,000කට ආසන්න සංඛ්‍යාවක් ලබාගැනීමට හැකිවීමද කලාපීය ජනනාවට ලැබෙනා වටිනා අවස්ථාවක් ලෙසින් හඳුනාගෙන ඇත.

තර්ජන | අරමුණ 03

1. ***ඍතූන් අනුව සිදුවන දේශගුණික වෙනස්වීම් හේතුවෙන් ජුනි මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලය තුළ ජල පෝෂක ප්‍රදේශ හිඳීයාම හේතුවෙන් පරිසර උෂ්ණත්වය ඉහළගොස් නියං සහිත කාලගුණික තත්ත්වයක් ඇතිවිය හැකිවීම.***

ඇඹිලිපිටිය නගරය තුළ පවතින ගැටළුවක් වශයෙන් උෂ්ණත්වය අධික කාල වන ජුනි මාසයේ අග සිට නොවැම්බර් මාසයේ මුල දක්වා කාලය තුළ ජල මූලාශ්‍ර වල ජල මට්ටම අඩු වීමක් සිදුවේ. සාමාන්‍යයෙන් උඩවලව ජලාශය තුළ අක්කර අඩි 217,000 ක ජල ධාරිතාවයක් පවතින අතර එය වියළි කාලවලදී අක්කර අඩි 35,000 ක ප්‍රමාණය දක්වා අඩුවීමක් සිදුවේ.

කලාපීය වාරි පද්ධතිය සුපෝෂණය කරනු ලබන උඩවලව ජලාශයේ ජල පරිමාව ඉහත සඳහන් කළ කාලය තුළ අඩුවීමක් සිදුවන අතර නාගරික ආකර්ෂණයද අඩු වී යාම නගරයේ පවතින ජීවී භාවයට තර්ජනයක් ලෙස හඳුනාගෙන ඇත.

පරිච්ඡේදය 06



සංවර්ධන සැලැස්ම

6.1. හැදින්වීම

කෘෂිකාර්මික නගරයක් වන ඇඹිලිපිටිය නගරය වර්ෂ 2030 වන විට "වලව නිම්නයේ කෘෂි ආර්ථික නිපැයුම් කේන්ද්‍රය" බවට පත් කිරීම සඳහා ප්‍රධාන අරමුණු තුනක් හඳුනාගෙන ඇත. එකී හඳුනාගත් අරමුණු වෙත ලඟාවීම සඳහා පරමාර්ථ ගොඩනගාගෙන ඇත. එම අරමුණු හා පරමාර්ථ වෙත ලඟාවීමට පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන විශ්ලේෂණය කරමින් නගරයේ සංවර්ධනය පිළිබඳ සංකල්පිත සැලැස්ම ගොඩනගා ඇත.

ඇඹිලිපිටිය නගරයේ සංවර්ධනය සිදුකිරීම සඳහා යෝජිත සංකල්පිත සැලැස්ම මත පදනම්ව යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම සකස් කර ඇත. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම තුළින් වර්ෂ 2030 වනවිට නගරය තුළින් අපේක්ෂිත භෞතික සංවර්ධනය පිළිබිඹු කර ඇත. එකී අපේක්ෂිත භෞතික සංවර්ධනය මෙන්ම ආර්ථික හා පාරිසරික සංවර්ධනය වෙත ලඟාවීම සඳහා ප්‍රධාන උපායමාර්ග හයක් හඳුනාගෙන ඇත අතර ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග යටතේ උපායමාර්ගික ව්‍යාපෘති දක්වා ප්‍රධාන උපායමාර්ග පහක් මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගත කර ඇත.


6.2. සංකල්පිත සැලැස්ම

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම තුළ අන්තර්ගත සංකල්පිත සැලැස්ම තුළින් නගරයේ අනාගත සංවර්ධනය සිදුවන ආකාරය පිළිබිඹු වේ. මෙහිදී වාණිජ, කෘෂිකාර්මික, කර්මාන්ත හා සංචාරක ලෙසින් හඳුනාගෙන ඇති ප්‍රධාන සංවර්ධන මධ්‍යස්ථාන හතරක් අතර අන්තර් සම්බන්ධතාවය ඇති කරමින් රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය වශයෙන් ඇඹිලිපිටිය නගරය සංවර්ධනය කිරීමේ ඉලක්කය ඇතිව සංකල්පිත සැලැස්ම පිළියෙළ කර ඇත.

සංකල්පිත සැලැස්ම ගොඩනැගීමේදී, නාගරික බල ප්‍රදේශය තුළින් හඳුනා ගනු ලැබූ නාගරික සංවර්ධන ප්‍රවණතාවයන් මෙන්ම අනාගතයේදී ඒ සඳහා ඇති අවස්ථාවන්ද සැලකිල්ලට ගනිමින් එක් එක් කාර්යයට විශේෂිත වූ ප්‍රදේශ සංවර්ධන මධ්‍යස්ථාන වශයෙන් ගෙන ඒවායේ සංවර්ධන කටයුතු විධිමත් හා කාර්යක්ෂම කිරීම මෙන්ම එම මධ්‍යස්ථාන අතර, අන්තර් සම්බන්ධතාවයක් ඇති කිරීම පිළිබඳ අවධානය යොමුකර ඇත.

ඒ අනුව, ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයේ උතුරු දෙසින් පිහිටි උඩවලව නගරය ආශ්‍රිත ප්‍රදේශයෙහි සංචාරක කටයුතු ප්‍රවර්ධනය වන පරිදි ඒ සඳහා අවශ්‍ය සේවා පහසුකම් සපයමින් සංචාරක සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

මෙම සංවර්ධන කාර්යයන් තුළින් ඇත් අතුරු සෙවණ හා උඩවලව ජානික වනෝද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සඳහා නවාතැන්, ආහාරපාන, සතාර් පහසුකම් යනාදී සේවා සැපයීමට මෙන්ම ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන ගුණාත්මකව හා ප්‍රමිති සහගතව මිලදී ගැනීම සඳහා අවශ්‍යය අවස්ථාව සලසාදීමටද අපේක්ෂා කර ඇත. චන්ද්‍රිකා වැව හා නගරය අවට ආකර්ශණීය ස්ථාන රැසක් සංවර්ධනය කිරීම තුළින් සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමටද හඳුනාගෙන ඇත.



රූප සටහන 6.1 : *සංකල්පිත සැලැස්ම*
මූලාශ්‍රය : *නා.සං.අධි./සබරගමුව පළාත් කාර්යාලය, 2020*

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

සංකල්පිත සැලැස්ම

නවද පැල්මඩුල්ල – නෝනගම (A 18) මාර්ගයත් ඇඹිලිපිටිය – මිද්දෙණිය, ඇඹිලිපිටිය – පනාමුර හා ඇඹිලිපිටිය – මොරකැවිය යන ප්‍රධාන මාර්ග ජාලයක් මූලික කරගනිමින් ස්ථාපිත වී ඇති ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශය වාණිජ කේන්ද්‍රස්ථානය වශයෙන් මේ වන විටත් වේගවත් සංවර්ධනයක් කරා ගමන් කරමින් පවති. එබැවින්, එම ප්‍රදේශය ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානය වශයෙන් සංවර්ධනය කිරීම සඳහා මෙම සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන ඇත.

නාගරික බල ප්‍රදේශයේ දකුණු දෙසට වන්නට පිහිටි තුංකම, කුට්ටිගල හා පදලංගල යන කුඩා නාගරික ප්‍රදේශ පැල්මඩුල්ල –නෝනගම (A 18) මාර්ගය ප්‍රධාන කර ගනිමින් ස්ථාපිත වී ඇති අතර, විශාල ප්‍රමාණයේ කෘෂිකාර්මික ප්‍රදේශයකට සේවා සපයන කුඩා නාගරික කේන්ද්‍ර වශයෙන් ඒවා ක්‍රියාත්මක වේ. ඒ අනුව නාගරික ආර්ථිකයේ කොදුනාරටිය වශයෙන් සැලකෙන කෘෂි කර්මාන්තය ආශ්‍රිත සේවා පහසුකම් වැඩිදියුණු කරමින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා මෙම කුඩා නගර කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

නගරයේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම උදෙසා කර්මාන්ත අංශය ශක්තිමත් කිරීම ප්‍රධානතම ආර්ථික සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් හඳුනාගෙන ඇත. නවද ඒ උදෙසා නාගරික බල ප්‍රදේශය තුළ කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීමට මෙන්ම කලාපයේ කෘෂි නිෂ්පාදන උපයෝගී කරගනිමින් ක්‍රියාත්මක වන කෘෂි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත වැඩි ප්‍රමාණයක් එම කර්මාන්ත කලාපය තුළ ස්ථාපිත කිරීමටද හඳුනාගෙන ඇත.

ඒ අනුව, හිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශය ආශ්‍රිතව නව කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීමට යෝජිත අතර, එම කර්මාන්ත කලාපය තුළට දැනට කර්මාන්ත අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක අක්කර 50කින් යුතු කර්මාන්ත කලාපයද ඇතුළත් වේ.

මෙම යෝජිත කර්මාන්ත කලාපයද ඇතුළුව ඉහතින් සඳහන් කරන ලද කෘෂි, වාණිජ හා සංචාරක යන නාගරික මධ්‍යස්ථාන අතර, අන්තර් සම්බන්ධතාවයක් ඇති වන පරිදි උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම තුළින් සමස්ථ නාගරික ප්‍රදේශය තුළ වර්ෂ 2030 වන විට ආර්ථික, සමාජීය,භෞතික හා පාරිසරික සංවර්ධනයක් ඇති කිරීම උදෙසා මෙම සංවර්ධන සංකල්පය ගොඩ නගා ඇත.

6.3. යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම

ඇඹිලිපිටිය නගරය, මහවැලි වලව විශේෂ බල ප්‍රදේශයට අයත් කෘෂිකාර්මික නගරයක් වන අතර වර්තමානය වනවිට විශේෂ සංවර්ධනමය මැදිහත්වීමකින් තොරව සංවර්ධනය වීමේ ප්‍රවණතා පෙන්නුම් කරන නගරයක් ලෙස හඳුනාගෙන ඇත. ඇඹිලිපිටිය නගරය පළාත් තුනකට මායිම්ව පිහිටීම හේතුවෙන් කලාපීය වශයෙන් අන්තර් සබඳතා ඇතිකර ගැනීමට මෙන්ම කලාපීයව සිදුවන මහා පරිමාණ සංවර්ධන අවස්ථා තුළින් ප්‍රතිලාභ ලැබීමේ අවස්ථාවද උදාකරගෙන ඇත. ඒ අනුව නගරයේ පවතින සංවර්ධන ප්‍රවණතාවයන් ඔප්නැංවීම තුළින් අනාගත සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම උදෙසා නාගරික කෘෂිකාර්මික අනන්‍යතාවය හා ඒ ආශ්‍රිත සංවේදී පරිසර පද්ධතිය ආරක්ෂා කරමින් පවතින සම්පත් හා භූමිය ප්‍රශස්ථ මට්ටමින් භාවිතයට ගැනීමට වර්ෂ 2030 සඳහා යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම පිළියෙළ කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුළ හඳුන්වාදෙනු ලබන සමස්ථ නාගරික ආකෘතිය තුළින් සිත් ඇද ගන්නා මනස්කාන්ත පරිසරයක පිහිටි උද්‍යාන, කුඹුරු හා කෙසෙල් වගාබිම් වැනි කෘෂිකාර්මික වගාබිම් වලින් සැදී හරිත පැහැනි පසුබිමත්; ගංඟා, වැව් , ඇළ මාර්ග ආදියෙන් පිළිබිඹු වන නීලවර්ණ පසුබිමක් තුළින් නිර්මාණය වූ නීලහරිත පරිසරයකින් සමන්විත නගරයක් දැකගත හැකිවේ. නවද එකි පරිසරය තුළ පවතින දර්ශනීය දෘෂ්ටි කෝණයන් (scenic points) හා ප්‍රධාන සුළං කපොළු වලට අවතිරයක් ඇති නොවන පරිදි ඒ ඒ ප්‍රදේශය සඳහා ආවේණික සංවර්ධන විභාවනාවයන්ට ගැළපෙන උස මට්ටම් සහිත ගොඩනැගිලි ප්‍රධාන මාර්ග ඔස්සේ සිව් දිශාවට විහිදෙන පරිදි ඉදිකර ඇති අයුරු දැකගත හැකිවේ. එමෙන්ම මෙම ප්‍රධාන පිවිසුම් හතර අතර්න් ඕනෑම පිවිසුමකින් නගරයට පිවිසෙන පුද්ගලයෙකුට නිහඬ නිස්කලංක පරිසරයකින් වටවී කඩිසරව ක්‍රියාන්මක වන ආකර්ෂණීය නගරයක පහස විඳීමේ භාග්‍ය උදාවේ.

නගරයේ උතුරු පිවිසුමෙන් නගරයට ඇතුළු වීමත් සමඟ උඩවලව ජලාශය ආශ්‍රිත මනස්කාන්ත පරිසරයේ සිරි විඳීමට මෙන්ම නිදහසේ ගහකිරීමට අවශ්‍ය වන උද්‍යාන පහසුකම්ද, නණමල්විල මාර්ගය ඔස්සේ උඩවලව දෙසට ගමන් කිරීමේදී ජලාශ්‍රිත ක්‍රියාකාරකම් සහිත විනෝදාස්වාදයන් ලබාගැනීමේ පහසුකම් සහිත උද්‍යානයක්ද ඇතුළුව ස්වභාවික පරිසරය ආශ්‍රය කරගනිමින් ඉදිවූ විවිධ වර්ගයේ සංචාරක හෝටල් ලැගුම්හල් හා සහාර පහසුකම් සහිත සංචාරක සේවා වලින් සමන්විත භූමියක් දර්ශනය වේ. නගරයේ උතුරු පිවිසුම් මාර්ගයේ ලැබූ ආකර්ෂණීයත්වය නවදුරටත් විඳිමින් නගර අභ්‍යන්තරයට ගමන් කිරීම සඳහා මංහරුර හතරකින් සමන්විත නෝනගම මාර්ගයට වම්පසින් පිහිටි උඩවලව දකුණු ඇළ ආශ්‍රිත මාර්ගය ආකර්ෂණීය ගමන් පථයක් ලෙස භාවිත කළහැකි වේ.

උඩවලව දකුණු ඇළ මාර්ගය දිගේ ගමන් කිරීමේදී නගරයට ආවේණික කෘෂිකාර්මික බිම්, කෙසෙල් හා වී වගාවන් ආදිය දැක බලා ගැනීමටත් එකී පරිසරය තුළ එම ආවේණිකත්වය සමඟ නිදිමින් ප්‍රදේශයට ආවේණික ප්‍රණීත ආහාර පාන රස විඳීමේ හැකියාව; නගර මධ්‍ය ප්‍රදේශයට ආසන්නව ඉදිකර ඇති කාවන්නිස්ස වැව නාගරික උද්‍යානය ආශ්‍රයෙන්ද අන්විඳීමට ලැබියහි.




රූප සටහන 6.2 : *උඩවලව ජලාශයේ සිට කාවන්තිස්ස නාගරික උද්‍යානය දක්වා දළ හරස් පැතිකඩ*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම


එමෙන්ම නැගෙනහිර දෙසින් මෙම නගරයට පිවිසීමේ සීමාව වලව ගඟ සීමාවෙන් ඇරඹෙන අතර මොරකැටිය මාර්ගය ප්‍රධාන පිවිසුම් මාර්ගය ලෙස පවතී. මොරකැටිය මාර්ගය ඔස්සේ නගරයට ඇතුළු වීමේදී නගරය ආශ්‍රිත කෘෂිකාර්මික බිම් දර්ශනයවීම මෙන්ම මාර්ගයට වම්පසින් ප්‍රධාන මාර්ගය හා වාරි ඇළ අතර පිහිටි සුවිසල් නුග ගස් කිහිපය, සහිත රේඛීය උද්‍යානය දැකබලා ගැනීමට ලැබෙන අතර ඒ ආශ්‍රිත ප්‍රදේශයට ආවේණික ආහාරපාන රසවිඳිමින් විවේකීව ගතකිරීමට හැකියාව සැලසේ. එම උද්‍යානය පසුකරමින් නගරය දෙසට ගමන් ගන්නා විට මාර්ගය දෙපස පවතින ගොඩනැගිලි වල උස මට්ටම් ක්‍රමයෙන් වැඩිවන බවක් හඳුනාගත හැකිය.



රූප සටහන 6.3 : *මොරකැටියේ සිට ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශය දක්වා වන ඉරස් පැතිකඩ*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

දකුණු පිවිසුමෙන් ඇඹිලිපිටිය නගරයට ඇතුළු වීමේදී නෝනගම මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගය සම්බන්ධවන බරවකුඹුක අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හමුවන අතර එම දක්ෂිණ අධිවේගී මාර්ගය පදලංගල ප්‍රදේශය හරහා ගමන් ගැනීම දැකගත හැකි වේ. එමෙන්ම වැටිය අන්තර් හුවමාරුව තුළින් පිටවන වාහන වලින් වාහන ප්‍රමාණයක් නෝනගම මාර්ගය ඔස්සේ ඇඹිලිපිටිය නගරයට ඇතුළු වීම සිදුවේ. එම මාර්ගය ඔස්සේ නගරය අභ්‍යන්තරයට ගමන් කිරීමේදී මාර්ගයට දෙපසින් කුඹුරු යායවල්, කෙසෙල් වතු ඉනා මනස්කාන්තව දර්ශනය වේ. පදලංගල, කුට්ටිගල, තුංකම ප්‍රදේශ ආශ්‍රිතව අඩු උස මට්ටම් සහිත ගොඩනැගිලි දර්ශනය වේ.

එම ප්‍රදේශ පසුකරමින් ඉදිරියට ගමන් කිරීමේදී කෘෂිකාර්මික අනන්‍යතාවයක් සහිත නාගරික ලක්ෂණ දැකගත හැකිවන අතර හල්මිල්ලකැටිය පසුකර පල්ලේගම ප්‍රදේශයට ඇතුළුවන්ම ක්‍රමයෙන් ගොඩනැගිලි වල උස මට්ටම් වැඩි වීමක් හා ගොඩනැගිලි ඝණත්වයේ වැඩිවීමක් හඳුනාගත හැකි වේ. නවදුරටත් නෝනගම මාර්ගය ඔස්සේ ඉදිරියට ගමන් ගැනීමේදී මහවැලි ක්‍රීඩාංගණය, සුපොපභෝගී සාප්පු සංකීර්ණ, බැංකු, මුල්‍ය ආයතන ඇතුළු අධි උපවාණිජ ගොඩනැගිලි මෙන්ම ඇඹිලිපිටිය ප්‍රධාන බස්නැවතුම්පොළද දැකගැනීමට හැකිවේ.



රූප සටහන 6.4 : *පදලංගල සිට ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශය දක්වා වන ඉරස් පැතිකඩ*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

ඇඹිලිපිටිය නගරයට බටහිර දෙසින් ඇතුළු වන ප්‍රධාන පිවිසුම වන මිද්දෙණිය මාර්ගය ඔස්සේ නගරයට ඇතුළු වීමේදී හමුවන ප්‍රධාන මංසන්ධියක් වශයෙන් කුඹුගොඩ ආර මංසන්ධිය දැකගත හැකිය. ඇඹිලිපිටිය කර්මාන්ත කලාපය හා හම්බන්නොට වරාය දෙසින් කොළඹ දෙසට ගමන් කරන බර වාහන විකල්ප මාර්ගය ඔස්සේ පැමිණ එම මංසන්ධියේදී මිද්දෙණිය මාර්ගය හා එක්වේ. එම මංසන්ධියේ සිට ප්‍රධාන මාර්ගය මංතීරු හතරක් ලෙසින් පිහිටා ඇති අතර එම ප්‍රදේශය පසුකරන්ම කෙසෙල්, පොල් වගාවන් හා , නේවාසික, වාණිජ ඇතුළු මිශ්‍ර සංවර්ධනයක් සහිත ගොඩනැගිලිද මග දෙපස දැකගත හැකිවේ.

කුඹුගොඩ ආර ප්‍රදේශය පසුකර නගරය වෙත ගමන් ගැනීමේදී මිද්දෙණිය මාර්ගයේ වම්පසින් පිහිටි මෝදරවාන හංදිය හමුවන අතර මෝදරවාන දෙසට ගමන් ගන්නා විකල්ප මාර්ගය ඔස්සේ කුඹුගොඩ ආර හංදිය දෙසින් එන බර වාහන කොළඹ දෙසට ගමන් ගන්නා ආකාරය දැකගත හැකිය.

මිද්දෙණිය ප්‍රධාන මාර්ගය ඔස්සේ නවදුරටත් නගර මධ්‍යය දෙසට ගමන් කිරීමේදී ඇඹිලිපිටිය නවනගර සීමාව හඳුනාගත හැකිවන අතර එම ප්‍රදේශය පරිපාලන සංකීර්ණ හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් සමන්විත වේ. එම ප්‍රදේශයේම මාර්ගයට දකුණු දෙසින් ඇඹිලිපිටිය ප්‍රධාන ආර්ථික මෙහෙයුම් මධ්‍යස්ථානය හා ඇඹිලිපිටිය මහජන පොළ මුලික කරගත් ක්‍රියාකාරකම් හඳුනාගත හැකි වේ. එමෙන්ම එම ප්‍රදේශය හරහා ගමන් ගන්නෙකුට කාබනික කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාවද සැලසී යයි. මිද්දෙණිය මාර්ගය ඔස්සේ ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය පසුකර නගර මධ්‍යයට ගමන් කිරීමේදී ක්‍රමයෙන් නැවතත් ගොඩනැගිලි උස හා ඝණත්වය වැඩිවීමක් හඳුනාගත හැකිවේ.


මිද්දෙණිය ප්‍රධාන මාර්ගය ආශ්‍රිතව ක්‍රියාකාරකම් බොහොමයක් පැවතියද අවතීරනාවය අඩුවන පරිදි සැකසුනු වාහන නැවතුම් ස්ථාන, පදික වේදිකා හා ක්‍රමවත්ව සැකසූ කාණු පද්ධති මෙන්ම උද්‍යාන අලංකරණ වලින් යුතු ප්‍රියමනාප නගරයක් දැකගත හැකිවේ.



රූප සටහන 6.5 : *කුඹුගොඩ ආර හන්දියේ සිට ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශය දක්වා වන හරස් පැහිකඩ*
මූලාශ්‍රය : *සබරගමුව පළාත් කාර්යාලය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

මෙම සිවිදිශාවන් තුළින් නගරයට පිවිසීමේදී ප්‍රධාන මාර්ග දෙපස සදාහරිත පසුබිමකින් සමන්විත වීම තුළින් වලව ප්‍රදේශයේ ආවේණිකත්වය හා කෘෂිකාර්මික බිමක් යන හැඟීම දනවන අතර ක්‍රමයෙන් නගර මධ්‍යයට ඇතුළු වීමේදී නගරය අභ්‍යන්තරයේ සිදුවන ක්‍රියාකාරකම්වල විවිධාංගීකරණ ලක්ෂණ හා නාගරික ආකෘතියේ වෙනස්වීම හඳුනාගත හැකිවනවා මෙන්ම කෘෂිකාර්මික බිමක් වටකරගත් වාණිජමය වශයෙන් සක්‍රිය වූ යාන්ත්‍රණයක් සහිත නගරයක් ලෙස දැනෙනු නොවනුමානය. මෙම නගරයේ ආකෘතිය කුඹුගොඩආර හා හීඟුර ප්‍රදේශය ආශ්‍රිතව වෙනස් මුහුණුවරක් ගන්නා අතර එකී ප්‍රදේශය ආශ්‍රිතව විශාල පරිමාණයේ ගොඩනැගීලි සහිත කර්මාන්ත හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් දැකගත හැකිවේ.


ඒ අනුව ඉහතින් සිදුකල සියලු විස්තර කිරීම් වලින් පැවසෙනුයේ ඇඹිලිපිටිය නගරයේ සංවර්ධනය තුළින් බලාපොරොත්තු වන වලව නිම්නයේ කෘෂි ආර්ථික නිපැයුම් කේන්ද්‍රය නමැති නාගරික දැක්ම දර්ශනය කරන නාගරික ආකෘතියක් විදීමේ හැකියාව වර්ෂ 2030 වනවිට යෝජිත ඉඩම් භාවිත සැලැස්ම තුළින් උදාවන බවයි.



සිතියම 6.1 : යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම 2030

6.4. භෞතික හා සාමාජීය අපරවූහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

වර්ෂ 2030 වනවිට පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් ජනාවාසයට හිතකර සංචාරයට ආකර්ෂණීය නගරයක් බිහිකිරීම යන අරමුණ ඉටුකරගැනීම මුලික කරගනිමින් ඇඹිලිපිටිය නගරවාසීන්ගේ එදිනෙදා අවශ්‍යතා පහසුවෙන් සපුරා ගැනීමට හැකිවන පරිදි නගර මධ්‍යය ප්‍රදේශයේ සිට උඩවලව, තුංකම, කුට්ටිගල, පදලංගල යන කුඩා නගර දක්වා භෞතික හා, සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත. එමෙන්ම නාගරික සංවර්ධනය සඳහා අපේක්ෂිත නාගරික දැක්ම හා ඉලක්ක සපුරාගනිමින් නාගරික ආර්ථිකය ඉහළ නැංවීම සඳහා උපායමාර්ගික සැලසුම් තුළින් නාගරික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග හඳුනාගෙන ඇත.



රූප සටහන 6.6 : *නාගරික යටිතල පහසුකම් සැලසුම්*

6.4.1. සාමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

සමාජීය යටිතල පහසුකම් සංවර්ධනය යටතේ නේවාසික, සෞඛ්‍ය හා අධ්‍යාපන යන ප්‍රධාන සමාජීය යටිතල පහසුකම් අංශ කිහිපය තුළ පවතින අවශ්‍යතා හා වර්ෂ 2030දී අපේක්ෂිත නේවාසික ජනගහනයට පවතින යටිතල පහසුකම් ප්‍රමාණවත් අවශ්‍යතා පිළිබඳ අධ්‍යනය කරමින් යෝජිත සේවා සැපයුම් සැලැස්ම පිළියෙළ කර ඇත.

6.4.1.1 නේවාසික පහසුකම්

වර්ෂ 2030 සඳහා යෝජිත සේවා සැපයුම් සැලැස්ම තුළින් නගරයේ පවතින ප්‍රධාන සේවා ලෙස හඳුනාගෙන ඇති නේවාසික පහසුකම්, සෞඛ්‍ය හා අධ්‍යාපනික සේවාවන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ යෝජනා ඇතුළත් කර ඇත.

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ වර්තමාන ජනගහනය 99,138(2017)ක් වන අතර වර්ෂ 2030 සඳහා පුරෝකථනය කර ඇති ජනගහනය 125,045කි. ඒ අනුව වර්තමාන ජනගහනයට අමතරව වර්ෂ 2030 වනවිට වැඩිවේ යැයි අපේක්ෂිත ජනගහනය 25,907කි. ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ දැනට ජීවත්වන පවුල් සංඛ්‍යාව 24,784ක් වන අතර පුරෝකථන ජනගහනයට අනුව අපේක්ෂිත පවුල් සංඛ්‍යාව 31,261ක් වේ. ඒ අනුව වර්ෂ 2030 වනවිට පවතින පවුල් සංඛ්‍යාවට අමතරව වැඩිවන පවුල් සංඛ්‍යාව 6477කි.

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ පවතින භූමි භාවිතයන්ට අනුව නේවාසික කටයුතු සඳහා වෙන්ව පවතින නේවාසික භූමි ප්‍රමාණය හෙක්ටයාර් 6666කි. වර්තමානය වනවිට පවතින නේවාසික ඒකකයන් සඳහා භාවිතයට ගෙන ඇති භූමි ප්‍රමාණය (එක් පවුල් ඒකකයක් සඳහා පර්චස් 40ක අවම බිම් ප්‍රමාණයක් ලෙස සලකා ගණන් බැලීමේදී) හෙක්ටයාර් 2507ක් පමණ ප්‍රමාණයකි. එම භූමි ප්‍රමාණය දැනට පවතින නේවාසික භූමි ප්‍රමාණයෙන් 37.6% ක් නරමි අඩු ප්‍රමාණයක් වේ. ඒ අනුව වර්ෂ 2030 සඳහා වැඩිවන පවුල් ඒකක සංඛ්‍යාව සඳහා අවශ්‍ය නේවාසික භූමි ප්‍රමාණය අනිවර්ණයක් ලෙස හඳුනාගෙන ඇත.

වර්ෂය	*ජනගහනය*	*පවුල් සංඛ්‍යාව*	*නේවාසික ඝණත්වය*	
			දළ නේවාසික ඝණත්වය (ව.කි.මී.ට නිවාස ඒකක)	*ශුද්ධ නේවාසික ඝණත්වය (ව.කි.මී.ට නිවාස ඒකක)*
2011	*78,150*	*22,293*	*148*	*318*
2017	*99,138*	*24,784*	*165*	*354*
2030	*125,045*	*31,261*	*208*	*446*

වගුව 6.1 : *නේවාසික ඒකක ඝණත්වය*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

වර්ෂ 2030 සඳහා යෝජිත භූමි භාවිත සැලැස්ම තුළින් සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනික සේවාවන් මෙන්ම විවේක විනෝදාස්වාද කටයුතු සපුරාගත හැකි ස්ථාන පිළිබඳ සලකා බලා මිශ්‍ර නේවාසික කලාප, හා නේවාසික කලාප හඳුන්වාදීම සිදුකර ඇති අතර එමඟින් නේවාසික අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් පරිදි භූමි පහසුකම් සලසා දී ඇත.

6.4.1.2. සෞඛ්‍ය පහසුකම්

නගරයේ පවතින සෞඛ්‍ය පහසුකම් පිළිබඳ සලකා බැලීමේදී ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහලට අමතරව පදලංගල හා උඩවලව දිසා රෝහල මෙන්ම නව නගරයේ පිහිටි ආයුර්වේද රෝහල තුළින් සෞඛ්‍ය පහසුකම් සැපයීම සිදුකරනු ලබන අතර නගරයේ ක්‍රියාන්මක පෞද්ගලික රෝහල් 3ක් ඇතුළු වෛද්‍ය මධ්‍යස්ථාන තුළින්ද එම පහසුකම් සැපයීම සිදුකරනු ලබයි.

අනු අංකය	***රෝහලේ නම***	***වර්ගීකරණය***	***ඇඳන් සංඛ්‍යාව***
01	*දිස්ත්‍රික් මහ රෝහල - ඇඹිලිපිටිය*	*දිස්ත්‍රික් මහ රෝහල*	*433*
02	*ආයුර්වේද රෝහල - ඇඹිලිපිටිය*	*ඒ කාණ්ඩය*	*58*
03	*විජේනායක වෙද මැදුර(පෞද්ගලික)*	*-*	*30*
04	*ග්‍රීන් මෙඩිකෙයා පෞද්ගලික රෝහල*	*ඒ කාණ්ඩය*	*08*
05	*චන්ද්‍රිකා වැව දිසා රෝහල*	*බී කාණ්ඩය*	*65*
06	*පොලි ක්ලිනික් පෞද්ගලික රෝහල*	*ඒ කාණ්ඩය*	*85*
07	*නවෝද්‍යා පෞද්ගලික රෝහල*	*ඒ කාණ්ඩය*	*05*
08	*ප්‍රාදේශීය රෝහල -උඩවලව*	*බී කාණ්ඩය*	*24*
09	*විතානාරච්චි සහ ශක්ති ආයුර්වේද රෝහල*	*ආයුර්වේද*	*30*
එකතුව			*738*

වගුව 6.2 : *ඇඹිලිපිටිය නගරයේ පවතින සෞඛ්‍ය පහසුකම්*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

ඉහත වගු අංක 6.2හි සඳහන් කර ඇති පරිදි ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය ආවරණය කරමින් ඇති ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල, චන්ද්‍රිකා වැව දිසා රෝහල, උඩවලව දිසා රෝහල, ආයුර්වේද හා පෞද්ගලික රෝහල් 9ට අමතරව නුංකම හා මොරකැටිය ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රාදේශීය වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක්ද පිහිටා ඇත. විශේෂයෙන්ම ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල තුළ නේවාසික හා බාහිර රෝගී අංශවල පවතින නදබදය අවම කිරීම සඳහා උඩවලව හා පදලංගල දිසා රෝහල් වැඩිදියුණු කිරීම කළ යුතුව ඇත. දැනට පවතින රෝහල් වල පෝෂක ප්‍රදේශ අධ්‍යයනය තුළින් ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයම ආවරණය වන පරිදි සෞඛ්‍යය පහසුකම් වැඩිදියුණු කිරීමට හඳුනාගෙන ඇත (ඇමුණුම් සිනියම් අංක 1.6).

6.4.1.3. අධ්‍යාපනික පහසුකම්


අධ්‍යාපන පහසුකම් වෙනුවෙන් නාගරික බල ප්‍රදේශයේ දැනට පවතින පාසල් 20 ක ප්‍රමාණය වර්තමාන ශිෂ්‍ය සංඛ්‍යාවට මුලික අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රමාණවත් වන අතර වර්ෂ 2030 වනවිට වර්ධනය වන සිසු ජනගහනයට අවශ්‍ය පරිදි 1 AB, 1C මට්ටමේ පවතින පාසල් වල පහසුකම් නැංවීම තුළින් පාසල් අධ්‍යාපන කටයුතු සපුරාලීම සිදුකල හැකි අතර නව පාසල් ඉදිකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී. මීට අමතරව ඇඹිලිපිටිය කාර්මික විද්‍යාලය, වෘන්තීය පුහුණු මධ්‍යස්ථාන හා හමුදා ඉංජිනේරු පාසල තුළ පහසුකම් වැඩි දියුණු කිරීම තුළින් නෘනිය අධ්‍යාපනික කටයුතු සඳහා ප්‍රමාණාත්මක නරම් අවස්ථා සලසා දීමට හඳුනාගෙන ඇත (ඇමුණුම් සිනියම් අංක 1.7).

ග්‍රාම නිලධාරී වසම	*පාසලේ නම*	*පාසල් කාණ්ඩය*	*පන්සිය පරාසය*	*පංති සංඛ්‍යාව*	*ශිෂ්‍ය සංඛ්‍යාව*	*ගුරු සංඛ්‍යාව*	*ගුරු / ශිෂ්‍ය අනුපාතය*
ගඟේයාය	*ගඟේයාය විද්‍යාලය*	*2*	*1 - 11*	*16*	*438*	*23*	*1: 19*
යාය 02	*බෝධිමළුව විදුහල*	*2*	*1 - 11*	*29*	*1126*	*46*	*1: 24*
උඩගම	*ඇඹිලිපිටිය මහා විද්‍යාලය*	*1AB*	*1 - 13*	*42*	*1280*	*93*	*1: 14*
පල්ලේගම	*කනිෂ්ඨ ද්විතීයික විද්‍යාලය*	*2*	*1 - 11*	*54*	*2440*	*70*	*1:30*
කුඹුගොඩහාර	*කනමැදි ආර විද්‍යාලය*	*2*	*1 - 9*	*09*	*123*	*13*	*1:9*
මොරකැටිය	*මොරකැටිය මහා විද්‍යාලය*	*1AB*	*1 - 13*	*41*	*1184*	*68*	*1:19*
හිඟුරහාර	*බෝධිරාජ විද්‍යාලය*	*අර්ධ රාජ්‍ය*	*1 - 11*		*779*	*43*	*1:18*
කැටගල්හාර	*ඇඹිලිපිටිය කැටගල් ආර විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*252*	*19*	*1:13*
මෝදරවාන	*ඇඹිලිපිටිය මෝදරවාන විද්‍යාලය*	*2*	*1 - 11*	*13*	*334*	*20*	*1:17*
නව නගරය	*ජනාධිපති විද්‍යාලය*	*1AB*	*1 - 13*	*115*	*4765*	*204*	*1:22*
හිඟුර	*කව්විගල විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*180*	*16*	*1:9*
පදලංගල	*ඩී.ඒ.රාජපක්ෂ විද්‍යාලය*	*3*	*1 - 5*	*24*	*901*	*30*	*1:37*
හිඟුර	*සිරිසඟබෝ විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*200*	*21*	*1:14*
හිඟුර	*ඇඹිලිපිටිය චන්ද්‍රිකා වැව ජයන්ති මහා විද්‍යාලය*	*1AB*	*1 - 13*	*40*	*1206*	*66*	*1:19*
කුට්ටිගල	*ඇඹිලිපිටිය ඌරුපැරැක්ක විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*156*	*20*	*1:9*
ජුලංගැටේ	*වලව නදී විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*326*	*20*	*1:18*
නැංකම	*නැංකම මහා විද්‍යාලය*	*1C*	*1 - 13*	*21*	*506*	*30*	*1:15*
ඝාගල	*ථේරපුත්ත විද්‍යාලය*	*2*	*1 - 11*	*11*	*299*	*23*	*1:13*
ඝාගල	*කරවිලයාය මහා විද්‍යාලය*	*2*	*1 - 11*	*13*	*343*	*28*	*1:15*
ඝල්මිල්ලකැටිය	*ඝල්මිල්ලකැටිය මහා විද්‍යාලය*	*1C*	*1 - 13*	*30*	*1129*	*52*	*1:18*
නිබොල් කැටිය	*නිබොල්කැටිය විද්‍යාලය*	*2*	*1 - 11*	*08*	*293*	*17*	*1:14*
හිඟුරහාර	*ගුරු ආර ප්‍රාථමික විද්‍යාලය*	*1C*	*1 - 13*	*30*	*779*	*44*	*1:13*

වගුව 6.3 : *ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ පවතින අධ්‍යාපනික පහසුකම්*
මූලාශ්‍රය : *අධ්‍යාපන කලාප කාර්යාලය, 2017*

6.4.2. භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග


නේවාසික ජනතාවට හා නගරයට පැමිණෙන සංසරණ ජනතාවට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් පරිදි සපුරාලමින් ආකර්ෂණීය නගරයක් බිහිකිරීම සඳහා සමාජීය යටිතල පහසුකම් වල පවතින ප්‍රමාණාත්මකභාවය මෙන්ම භෞතික යටිතල පහසුකම් සපුරාලීම සඳහා දැනට මෙම ප්‍රදේශය තුළ පවතින ගැටළු හඳුනාගෙන ඇත. වර්ෂ 2030 සඳහා ප්‍රරෝකථනය කරන ලද නේවාසික ජනඝනත්වය හා සංසරණ ජනඝනත්වයට ප්‍රමාණවත් පරිදි භෞතික යටිතල පහසුකම් සම්පාදනය සඳහා ප්‍රධාන උපායමාර්ගික සැලසුම් හයක් හඳුනාගෙන ඇත.



රූප සටහන 6.7 : *භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධන සැලසුම්*

6.4.2.1. යෝජිත නගර මධ්‍යය සංවර්ධන සැලැස්ම

යෝජිත කලාපීකරණ සැලැස්ම තුළින් හඳුනාගත් යෝජිත වාණිජ කලාපය I, වාණිජ කලාපය II හා ආයතනික කලාපය තුළින් ආවරණීය නගර මධ්‍යය ප්‍රදේශය වාණිජ, මූල්‍ය, පරිපාලන හා ප්‍රවාහන යනාදී වශයෙන් ක්‍රියාකාරකම් රාශියකින් සමන්විතව අධි ඝණත්ව කලාපයක් ලෙස නිර්මාණය වී ඇත. මෙම සියලු අවශ්‍යතාවන් ඉටුකර ගැනීම සඳහා සේවාලාභීන් හා සේවාදායකයින් ලෙස නගර මධ්‍යයට පැමිණෙන සියලුම ජනතාවට අවශ්‍යය පහසුකම් විධිමත් ලෙස සපයාදෙමින් සියලු කාර්යයන් පහසුවෙන් හා කාර්යක්ෂම ලෙස ඉටුකර ගැනීමට හැකිවන පරිදි නගර මධ්‍යය ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා යෝජිත නගර මධ්‍යය සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් උපායමාර්ග කිහිපයකි.



රූප සටහන 6.8 : *යෝජිත නගර මධ්‍යය සංවර්ධන සැලසුම් අරමුණු*

උපායමාර්ග 01


නගර මධ්‍යයේ පවතින රාජ්‍ය ආයතන සතු වාණිජ වටිනාකමින් ඉහළ ඉඩම් වාණිජ කටයුතු සඳහා පවරාගැනීම



රූප සටහන 6.9 : *යෝජිත නගර මධ්‍ය සංවර්ධන සැලැස්මෙහි උපායමාර්ග 01ට අදාළ රූප සටහන*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 02

පරිපාලන ආයතනික සේවා ලබාගැනීම පහසු කිරීම සඳහා ප්‍රධාන පරිපාලන ආයතන එකරාශී කිරීම




රූප සටහන 6.10 : *යෝජිත ආයතනික කලාපය හා පවතින රාජ්‍යය ආයතන*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 03 : ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම

(අ). නගර මධ්‍යයේ පවතින නදබදකාරී බව අවම කරමින් සේවා අවශ්‍යතා ලබාගැනීමට පැමිණෙන ජනතාවට අවශ්‍ය සේවා පහසුකම් ලබාගැනීමට පහසු වන පරිදි ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම.


(ආ). හඳුනාගත් විශේෂ මාර්ග සංවර්ධනය තුළින් නගර මධ්‍යය ප්‍රදේශයේ රථවාහන නදබදය අවම කිරීම




රූප සටහන 6.11 : *ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීමේ අරමුණු*

උපායමාර්ග 04

නගරය ආශ්‍රිතව ජල උද්‍යාන, නාගරික වන උද්‍යාන හා රේඛීය උද්‍යාන ඇති කිරීම තුළින් නගර මධ්‍යයේ ආකර්ශණීය බව වැඩිදියුණු කිරීම හා එමඟින් නාගරික ජනතාවට ප්‍රමාණවත් පරිදි විවේක හා විනෝද කටයුතු වෙනුවෙන් අවශ්‍ය පහසුකම් ලබාදීම.



රූප සටහන 6.12 : *ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම සඳහා භදුනාගත් උපායමාර්ග*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, 2020*



සිතියම 6.2 : *යෝජිත නගර මධ්‍යය සංවර්ධන සැලැස්ම 2030*

6.4.2.2. යෝජිත ප්‍රවාහන සැලැස්ම

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම තුළ භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ එක් උපායමාර්ගයක් වශයෙන් වර්ෂ 2030 සඳහා යෝජිත ප්‍රවාහන සැලැස්ම පිළියෙළ කර ඇත. ඇඹිලිපිටිය නගරයේ වර්ෂ 2030දී අපේක්ෂිත නේවාසික ජනගහනය වන 125,045ක ජනගහනයට අමතරව වර්ෂ 2030දී නගරයට දෛනිකව පැමිණේයැයි අපේක්ෂිත පුරෝකථනය කරන ලද 301,100ක සංසරණ ජනගහනයට අවශ්‍ය ප්‍රවාහන සේවා බාධාවකින් තොරව සපුරාලීම සඳහා මෙම ප්‍රවාහන සැලැස්ම තුළින් කටයුතු කර ඇත.

2017 වර්ෂයේ ඇඹිලිපිටිය නගරය තුළ සිදුකරන ලද දෛනික රථවාහන සමීක්ෂණයට අනුව රථවාහන නදබදය වැඩි වශයෙන් පවතින උදැසන, මධ්‍යහන හා සන්ධ්‍යා කාලයන් වල පැය භාගයක් තුළ නගරයට පැමිණෙන සාමාන්‍ය රථවාහන ගමන්වාර සංඛ්‍යාව 1220ක් පමණ වන අතර නගරයෙන් පිටතට ගමන් ගන්නා ගමන්වාර සංඛ්‍යාව 1040 ක් පමණ වේ. ඒ අනුව වර්ෂ 2030 වනවිට වැඩිවන සංසරණ ජනගහනයට අනුව දිනකට පැය භාගයක් තුළ නගරයට ඇතුළුවන සාමාන්‍ය රථවාහන ගමන්වාර සංඛ්‍යාව 1525ක් හා නගරයෙන් පිටවන සාමාන්‍ය රථවාහන ගමන්වාර සංඛ්‍යාව 1300ක් ලෙස උපකල්පනය කර ඇත.

මෙම උපකල්පනය කරන ලද රථවාහන ගලනය, නගරයේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සමඟ ක්‍රියාත්මක වීමට යෝජිත කර්මාන්ත කලාපය ආශ්‍රිත ක්‍රියාකාරකම්, උඩවලව සංචාරක කලාපය ආශ්‍රිත ක්‍රියාකාරකම්, කෘෂිකර්මාන්ත කටයුතු හා නගර මධ්‍යයේ වාණිජ සේවා වැඩිදියුණු වීමත් සමඟ ඇති වන සංවර්ධනය තුළින් මෙන්ම නගරය තුළ නේවාසික කටයුතු සඳහා හඳුනාගෙන ඇති මිශ්‍ර නේවාසික හා නේවාසික කලාප තුළින් ජනනය වේ යැයි උපකල්පනය කර ඇත.


මේ ආකාරයට රථවාහන සංඛ්‍යාව වර්ධනය වීමත් සමඟ රථවාහන නදබදයකින් තොරව ගමන් කිරීමට ප්‍රමාණවත් පරිදි විකල්ප මාර්ග ඉඳිකිරීම, අතුරු මාර්ග ඉඳිකිරීම, සේවා මාර්ග ඉඳිකිරීම හා පවතින මාර්ග පුළුල් කිරීම මෙන්ම පොදු ප්‍රවාහන අවශ්‍යතා සඳහා බස්නැවතුම්පොළ හා රථගාල් පහසුකම් සංවර්ධනය අත්‍යාවශ්‍ය වී ඇත. ඒ අනුව එකී අවශ්‍යතාවලට ගැළපෙන පරිදි නගරයේ මාර්ග සංවර්ධනය සිදුකිරීම සඳහා හඳුනාගෙන ඇති ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.

උපායමාර්ග 01 : විකල්ප මාර්ග සංවර්ධනය

(අ). නෝනගම මාර්ගය ඔස්සේ පදලංගල දෙසින් හම්බන්නොට වරායේ සිට කොළඹ හා වෙනත් ප්‍රදේශ වලට ගමන් කරන මෝටර් රථ ප්‍රවාහනය කරන දිගු ලොරිරථ, බහාලුම් ප්‍රවාහනය කරන කන්ටේනර් රථ හා නගරයට ඇතුළු වන බර වාහන තුළින් සිදුවන රථවාහන නදබදය අවම කිරීම හා හිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශයේ ස්ථාපිත කිරීමට යෝජිත කර්මාන්ත කලාපය වෙත ගමන් ගන්නා බර වාහන නගර මධ්‍ය ප්‍රදේශයෙන් බැහැරව නෝනගම, ඕද්දෙණිය හා පනාමුර මාර්ග වෙත සම්බන්ධ කර ගමන් කිරීම සඳහා විකල් මාර්ග සංවර්ධනය හඳුනාගෙන ඇත.

(කොළඹ පාර 100 කණුව (බෝසිරිගම මාර්ගය ආසන්නයෙන්) සිට පනාමුර මාර්ගය හරහා මෝදරවාන මාර්ගය ඕද්දෙණිය මාර්ගය නෙක්ද, කුඹුගොඩ ආර හංදියේ සිට කඩදාසි කම්හල මාර්ගය, කදුරුගස් ආර හරහා කරවිල යාය මාර්ගය ඔස්සේ නෝනගම මාර්ගය දක්වා මංතීරු දෙකකින් යුතුව විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම)


(ආ). මොණරාගල දෙසින් මොරකැවිය මාර්ගය ඔස්සේ පැමිණෙන බර වාහන නගර මධ්‍යය ප්‍රදේශය මග හරිමින් දක්ෂිණ අධිවේගී මාර්ගය වෙත සම්බන්ධ කිරීම හා මොණරාගල දිස්ත්‍රික්කයේ යෝජිත කර්මාන්ත කලාප හා සම්බන්ධ වීමට මෙන්ම ඒ ආශ්‍රිත අමුද්‍රව්‍ය ඇඹිලිපිටිය කර්මාන්ත කලාපය හා පහසුවෙන් අන්තර් හුවමාරු කරගැනීම සඳහා ඇඹිලිපිටිය හල්මිල්ලකැවිය පාසල් මාර්ගය, හතර ඇළ මාර්ගය දක්වා සම්බන්ධ කරමින් වෙහෙරගම මාර්ගය ඔස්සේ මොරකැවිය මාර්ගය දක්වා මංතීරු දෙකකින් යුතු විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.



රූප සටහන 6.13 : *යෝජිත විකල්ප මාර්ග*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 02 : අතුරු මාර්ග සංවර්ධනය


නගර මධ්‍යයේ ප්‍රධාන සේවා ස්ථාන ලෙස ජනගහනය වැඩි වශයෙන් ගැවසෙන ප්‍රධාන බස් නැවතුම්පොළ, මහජනපොළ, ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල හා ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත සේවාවන් රථවාහන නදබදයකින් තොරව සැපසීම සඳහා උඩගම හංදියේ සිට රෝහල් මාර්ගය ජනාධිපති විද්‍යාලය අසල දක්වා මාර්ගයද, එනැන් සිට ජනාධිපති විද්‍යාලය අසල කොන්ක්‍රීට් යාඩ් මාර්ගය ඔස්සේ නෝනගම මාර්ගය දක්වා මාර්ගයන් මහවැලි ක්‍රීඩාංගණය අසළින් ආරම්භ වන ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය මොරකැටිය මාර්ගය දක්වා සම්බන්ධ වන මංතීරු දෙකකින් යුතුව අතුරු මාර්ග ලෙස සංවර්ධනය කිරීම.



රූප සටහන 6.14 : *යෝජිත අතුරු මාර්ග සංවර්ධනය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 03 : සේවා මාර්ග සංවර්ධනය


දැනට භාවිතය වැඩි වශයෙන් සිදුවන අවධිමත් නන්ත්වයේ පවතින රෝහල් වටරවුම් මාර්ගය, මෝදරවාන වටරවුම් මාර්ගය, ආර්ථික මධ්‍යස්ථානය අසළ සිට පොළ පිටුපසින් ඇති මාර්ගය කොන්ක්‍රීට් යාඩ් මාර්ගය දක්වාද ,අක්කර පන්සිය මාර්ගය හා අක්කර පන්සිය මාර්ගයේ සිට ඇඹිලිපිටිය රාජකීය විද්‍යාලය පිටුපසින් මොරකැටිය මාර්ගයේ ලියනෑගම මාර්ගය දක්වා නව මාර්ගයක් වශයෙන් මෙම මාර්ග පහ ප්‍රධාන සේවා මාර්ග ලෙස සංවර්ධනය කරමින් නගර මධ්‍යයේ පවතින රථවාහන නදබදය අවම කිරීම.



රූප සටහන 6.15 : *යෝජිත සේවා මාර්ග*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 04 : සංචාරක සේවා මාර්ග සංවර්ධනය

උඩවලව නගරයේ සංචාරක හෝටල් හා සත්‍යාරී පහසුකම් පවතින යෝජිත සංචාරක සේවා කලාපය සඳහා හඳුනාගෙන ඇති උඩවලව හන්දිය, රන්කරව්ව ප්‍රදේශ ආශ්‍රිතව පවතින සෝ මිල් මාර්ගය, ධර්මපාල මාවත, හා මුදුන්මන්කඩ මාර්ගය මංනීරු දෙකකින් යුතුව සංවර්ධනය කිරීම මෙන්ම උඩවලව දකුණු ඇළ ඉවුර සමඟ පවතින මාර්ගය විශේෂ සංචාරක ගමන් පථයක් වශයෙන් සංවර්ධනය කරමින් උඩවලව නගරයට පැමිණෙන සංචාරකයින් ඇඹිලිපිටිය නගරය වෙත ආකර්ෂණය කරගැනීම.




රූප සටහන 6.16 : *යෝජිත සංචාරක සේවා මාර්ග*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 05 : රථවාහන නැවතුම් හා හැසිරවීම් ස්ථාන සංවර්ධනය

(අ). නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොළ තුළ බස්රථ හැසිරවීම සඳහා අවශ්‍ය ඉඩ ඇතුළු අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීමත්, කෙවිදුර බස්රථ සේවා සඳහා ඇඹිලිපිටිය නව නගරයේ නව බස් නැවතුම් ස්ථානයක් ඉදිකිරීමට අමතරව නව බස් රථ නම ගමන් වාරය පැමිණෙන තෙක් නතර කර නැබීම සඳහා බස්රථ ගාල් කරන ස්ථානයක් ප්‍රධාන බස් නැවතුම්පොළට ආසන්නයේ ස්ථාපිත කිරීම හා බස් නැවතුම්පොළ අසළින් මොරකැවිය මාර්ගය දක්වා ගමන් ගන්නා මාර්ගය පුළුල්කර සංවර්ධනය කිරීම තුළින් නාගරික ප්‍රවාහන සේවය විධිමත් කිරීම.

(ආ). ඇඹිලිපිටිය මහජන පොළ හා ආර්ථික මධ්‍යස්ථානය වෙත පැමිණෙන සේවාලාභීන්ගේ රථවාහන වලට හා නව නගරයට අවශ්‍ය රථවාහන නතර කිරීමේ ඉඩපහසුකම් වැඩි කිරීම සඳහා ආර්ථික මධ්‍යස්ථානයට ආසන්නයේ රථවාහන පහසුකම් සැලසීම හා ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආසන්නයේ මාර්ග නදබදය අවම කිරීම සඳහා පාසල් භූමිය තුළ පිහිටි හිස් ඉඩම් ප්‍රමාණය තුළ පාසල් බස්රථ හා වැන් රථ ගාල්කර නැබීමට හැකි රථ ගාලක් ඉදිකිරීම මෙන්ම පාසලට පිටුපසින් පිහිටි මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීම තුළින් පාසලට විකල්ප ප්‍රවේශ මාර්ගයක් ඇතිකිරීම.

(ඇ). නගර මධ්‍යයේ රථවාහන නැවතුම් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නගර සභාවට අයත් භූමිය තුළ හා දැනට ලංකා විදුලි බල මණ්ඩලය සතුව පවතින භූමිය (යෝජිත රථගාල හා සාප්පු සංකීර්ණය අයත් ඉඩම) තුළ රථවාහන නැවතුම් ස්ථාන පහසුකම් සැපයීම.



රූප සටහන 6.17 : *නගර මධ්‍යය රථවාහන නැවතුම් හා ඇසිරවීම් ස්ථාන සංවර්ධනය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*


උපායමාර්ග 06 : රථවාහන ගමනාගමනය ක්‍රමවත් කිරීම

ප්‍රධාන මාර්ග දෙපස රථවාහන නතරකර නැබීම වැළක්වීම සඳහා වන ක්‍රමවේද අනුගමනය කිරීම හා රථවාහන තදබදය අවමවන ආකාරයට වාහන ගලනයේ ගමන් මාර්ග වෙනස් කිරීමේ රථවාහන සැලැස්මක් නගර මධ්‍යය ප්‍රදේශය තුළ ක්‍රියාවට නැංවීම.


06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

භෞතික හා සාමාජීය
අපරවයුහ පහසුකම්
සංවර්ධන උපායමාර්ග

භෞතික අපරවයුහ පහසුකම්
සංවර්ධන උපායමාර්ග




රූප සටහන 6.18 : *යෝජිත බස්රථ ධාවන ගමන් පථය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, 2020*




රූප සටහන 6.19 : *යෝජිත සැහැල්ලු වාහන ධාවන ගමන් පථය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 7 :


නගර මධ්‍යය ප්‍රදේශයේ යෝජිත මාර්ග පුළුල් කර හරින ආවරණ ඇතුළත් කිරීම තුළින් නගරය ආශ්‍රිත පවතින උෂ්ණත්වය අවම කිරීම හා පදිකයින්ට ගමන් කිරීමේ පහසුව උදාකරදීම.




රූප සටහන 6.20 : *මංතීරු හතරේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*



රූප සටහන 6.21 : *මංතීරු දෙකේ මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*



රූප සටහන 6.22 : *ප්‍රාදේශීය මාර්ග සඳහා යෝජිත හරස්කඩ*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*



යෝජිත ප්‍රවාහන සැලැස්ම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
ජූලි 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.3 : යෝජිත ප්‍රවාහන සැලැස්ම 2030

6.4.2.3. යෝජිත ජල සැපයුම් සැලැස්ම

ඇඹිලිපිටිය නගරවාසීන්ගේ පානීය හා ගෘහස්ථ කටයුතු සඳහා වන ජල අවශ්‍යතාවය ප්‍රධාන ජල මූලාශ්‍ර කිහිපයක් යටතේ සපුරාගනු ලබන අතර පානීය ජල අවශ්‍යතාවයෙන් 55% කට ආසන්න වැඩි ප්‍රතිශතයක් සපුරා දෙනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟිනි. වර්තමානය වනවිට පානීය ජල අවශ්‍යතාවයට අමතරව වාණිජ, ආයතනික, කර්මාන්ත හා වෙනත් අවශ්‍යතා සඳහා ද ජල අවශ්‍යතාවය සපුරාදෙනු ලබන්නේ ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය මඟිනි. (වගු අංක 6.4 හා සිනියම් අංක 6.4).

	ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය	*ප්‍රජා ජල ව්‍යාපෘතිය*	*නළ ළිං*	*ආරක්ෂිත ළිඳ*	*අනාරක්ෂිත ළිඳ*	*වෙනත්*
නාගරික බල ප්‍රදේශය	*12,153*	*5,409*	*339*	*2671*	*468*	*881*
ප්‍රතිශතය	*55.4%*	*24.6%*	*1.5%*	*12.1%*	*2.1%*	*4%*

වගුව 6.4 : *ඇඹිලිපිටිය නාගරික ප්‍රදේශය තුළ පානීය ජල සැපයුම (ආවරණීත පවුල් සංඛ්‍යාව)*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ ජල අවශ්‍යතාවය සපුරාදීම සඳහා උඩවලව හා ඇඹිලිපිටිය නගරය තුළ ප්‍රධාන ජල රැඳවුම් ටැංකි දෙකක් භාවිතා වන අතර ඇඹිලිපිටිය ජල රැඳවුම් ටැංකියේ ධාරිතාවය ඝණ මීටර් 18,000 ක්ද උඩවලව ජල රැඳවුම් ටැංකියේ ධාරිතාවය ඝණ මීටර් 7500ක් පමණ වේ.

සමස්ථ ජල පරිභෝජනය සඳහා ඇඹිලිපිටිය ජල රැඳවුම් ටැංකිය තුළින් දිනකට ඝණ මීටර් 11,000 ක් පමණ භාවිතා කරනු ලබන අතර උඩවලව ජල රැඳවුම් ටැංකියෙන් දිනකට ඝණ මීටර් 6500 ක් පමණ භාවිනයට ගැනේ. ඒ අනුව වර්තමාන භාවිනයට අනුව මෙම ජල රැඳවුම් ටැංකි දෙක තුළම එකතුවක් ලෙස ඝණ මීටර් 8,000ක ජල අනිරික්නයක් පවතී.

2030 වර්ෂය වනවිට වැඩිවන නේවාසික ජනගහනය 25,907 ක් වන අතර ඒ සඳහා පානීය ජල අවශ්‍යතාවය දිනකට ඝණ මීටර් 3108කි. මීට අමතරව වාණිජ, ආයතනික,සංචාරක හා ප්‍රවාහන ආදී විවිධ සේවාවන් සපුරා ගැනීම සඳහා පැමිණෙන පුරෝකථනය කරන ලද 301,100ක සංසරණ ජනගහනය සඳහා දිනකට අවශ්‍ය ජල පරිමාණය ඝණ මීටර් 6022කි. ඒ අනුව වැඩිවන නේවාසික හා සංසරණ ජනගහනය සඳහාද ප්‍රමාණවත් නරම් ජලය සපයා ගැනීමට පවතින අනිරික්න ජලය ඝණ මීටර් 8,000 ප්‍රමාණවත් නොවේ.


එසේම වර්ෂ 2030 වනවිට ස්ථාපිත කිරීමට යෝජිත කර්මාන්ත කලාපය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජිත විශාල, මධ්‍ය හා කුඩා ප්‍රමාණයේ කර්මාන්ත 116ක් සඳහා දෛනික ජල අවශ්‍යතාවය වන ඝණ මීටර් 13,764ක ජල ධාරිතාවය සපුරාලීමට පවතින ජල රැඳවුම් ටැංකි හා පිරිපහදු මධ්‍යස්ථානය ප්‍රමාණවත් නොවන බැවින් ඉහත ගණනය කිරීම් වලට අනුව වර්ෂ 2030දී ඇතිවේයැයි අපේක්ෂිත ජල හිඟය ඝණ මීටර් 14,894ක් වේ.

ඒ අනුව වර්ෂ 2030 වනවිට ඇතිවේයැයි අපේක්ෂිත ජල හිඟය සපුරාලීම සඳහා හඳුනාගෙන ඇති උපායමාර්ග කිහිපයකි.

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

භෞතික හා සාමාජීය අපරවූහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

භෞතික අපරවූහ පහසුකම් සංවර්ධන උපායමාර්ග




රූප සටහන 6.23 : *යෝජිත ජල සැපයුම් සැලසුම් අරමුණු*

උපායමාර්ග 01 :

ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත තුංකම, පදලංගල හා කුට්ටිගල ප්‍රදේශ ආවරණය කෙරෙන පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය සෞඛ්‍ය ආරක්ෂිත පිරිපහදු ක්‍රියාවලියක් තුළින් ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

උපායමාර්ග 02 :


වර්ෂ 2030දී අපේක්ෂිත සමස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා පවතින ජල රැඳවුම් ටැංකි වලට අමතරව ඝණමීටර් 15,000ක පමණ ධාරිතාවයෙන් යුතු නව ජල රැඳවුම් ටැංකියක් හා පවතින ජල පිරිපහදු මධ්‍යස්ථානය අවශ්‍ය ධාරිතාවයන්ගෙන් යුතුව වැඩිදියුණු කිරීම.



රූප සටහන 6.24 : *පානීය ජල සැපයුම් ක්‍රමවේදය*
මූලාශ්‍රය : *https://rb.gy/oz3pov*

උපායමාර්ග 03 :

ඇඹිලිපිටිය කලාපයට වාර්ෂිකව ඇතිවිය හැකි නියඟය සහිත නන්න්වයන් හමුවේ වුවද ජල සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රධානතම ජල මූලාශ්‍රය වන චන්ද්‍රිකා වැව තුළ ප්‍රමාණවත් ජල ධාරිතාවයක් රඳවා තබාගැනීමට විධිමත් ජල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාවට නැංවීම.



යෝජිත පානීය ජල සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
ජූලි 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.4 : යෝජිත පානීය ජල සැලැස්ම 2030

6.4.2.4. යෝජිත විදුලි සැපයුම් සැලැස්ම


වර්තමානය වනවිට ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයම ආවරණය කරමින් විදුලි බල සැපයුම සිදුකර ඇති අතර කදුරුගස් ආර ප්‍රදේශයේ පිහිටි ප්‍රධාන කොටුමා උපපොළ මඟින් විදුලිය බෙදා හැරීම සිදුකරනු ලබයි. එහි පවතින උපරිම විදුලි ධාරිනාවය මෙගාවොට් ඇම්පියර් 63කි. 2017 වර්ෂය තුළ නේවාසික, කර්මාන්ත, ආයතනික, වාණිජ යනාදී අංශ තුළ සිදුව ඇති විදුලි පරිභෝජනය මෙගාවොට් ඇම්පියර් 31.5ක් වන අතර පවතින විදුලි බල පද්ධතිය තුළ මෙගාවොට් ඇම්පියර් 31.5ක අනිරික්නයක් පෙන්නුම් කරයි.

ඒ අනුව වර්ෂ 2030 සඳහා පුරෝකථන ජනගහනයට අනුව වර්තමාන නේවාසික ඒකක ප්‍රමාණයට අමතරව වැඩිවේ යැයි අපේක්ෂිත නේවාසික ඒකක 6476ක් ද ඇතුළුව පුරෝකථනය කරන ලද වාණිජ, ආයතනික, කර්මාන්ත යන අංශ වල වර්ෂ 2030 වනවිට වැඩිවේ යැයි අපේක්ෂිත විදුලි ධාරිනාවය මෙගාවොට් ඇම්පියර් 49.3ක් වන අතර දැනට පවතින අනිරික්නය තුළින් එම අවශ්‍යතාවය සපුරාගැනීමට නොහැකි වේ. ඒ අනුව වර්ෂ 2030 වනවිට පුරෝකථනය කර ඇති ඉල්ලුම සපුරාලීමට අවශ්‍යවේ යැයි හඳුනාගෙන ඇති විදුලි ධාරිනාවය මෙගාවොට් ඇම්පියර් 18කි.


වර්ෂ 2030 සඳහා යෝජිත නගර සංවර්ධන සැලැස්මේ අරමුණු වෙත ලඟාවීමේදී නවීන තාක්ෂණය තුළින් අනාගත සන්නිවේදන අවශ්‍යතා අන්තර් දන්න හුවමාරු කිරීම් මෙන්ම ගෝලීය සබඳතා ඉහළ නංවා ගැනීම සඳහා සමස්ථ නාගරික බල ප්‍රදේශයම ආවරණය වන පරිදි දන්න රැහැන් පහසුකම ලබාදීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. ඒ අනුව වර්ෂ 2030 වනවිට අවශ්‍ය විදුලිබල පරිභෝජන අවශ්‍යතාවය හා දන්න භාවිතය සඳහා වන අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා යෝජිත විදුලි හා දන්න රැහැන් සැලැසුම් තුළින් හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.

උපායමාර්ග 01:

වර්ෂ 2030 වනවිට අපේක්ෂිත විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා සූර්යකෝෂ බලශක්තිය භාවිතයෙන් විදුලිය උත්පාදනය කිරීම.



රූප සටහන 6.25 : *සූර්ය බලශක්ති උත්පාදනය සඳහා භාවිතයෙන ඇති ක්‍රම*



යෝජිත විදුලි සැපයුම් සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.5 : යෝජිත විදුලි සැපයුම් සැලැසුම 2030

උපායමාර්ග 02:


උඩවලව සංචාරක සේවා මධ්‍යස්ථානය, ඇඹිලිපිටිය වාණිජ මධ්‍යස්ථාන, තුංකම, පදලංගල කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන හා යෝජිත කර්මාන්ත කලාපය ඇතුළු සමස්ථ නාගරික බල ප්‍රදේශයම ආවරණය වන පරිදි නව දන්න රැහැන් පද්ධතියක් ව්‍යාප්ත කිරීම.



රූප සටහන 6.26 : *Wi Fi ආවරණයන් සඳහා ඔදුනාගෙන ඇති නගර මධ්‍යස්ථාන*

6.4.2.5. යෝජිත අප ජලය හා මළාප්‍රවාහ කළමනාකරණ සැලැස්ම

ඇඹිලිපිටිය නගරය තුළ මේවන විට මළාප්‍රවාහය හා අප ජලය බැහැර කිරීම සඳහා ක්‍රමවත් ක්‍රමවේදයක් නොමැති අතර නිවාස, වාණිජ ගොඩනැගිලි හා ආයතනික ගොඩනැගිලි ආදී සියලු ස්ථාන වල මළාප්‍රවාහන හා අප ජලය බැහැර කිරීම සඳහා පුනික ටැංකි හා උරාගැනීමේ වලවල් භාවිතයට ගැනේ. නමුත් මෙම ක්‍රම භාවිතා කිරීම ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති අධි සඟන්ව වාණිජ භාවිතය හේතුවෙන් ගැටළුවක් බවට පත්ව ඇත. එමෙන්ම භූමියේ පිහිටීම හා භූගෝලීය කරුණු මත භූගත ජල මට්ටම ඉහළින් පිහිටා තිබීම හේතුවෙන් (රූප සටහන 6.27) පුනික ටැංකි ඉක්මණින් උතුරා යන තත්ත්වයක් මතුවී ඇති අතර උරා ගැනීමේ වලවල් වලින් ජලය නිසි පරිදි උරා නොගැනීමත් යන ගැටළු මෙහිදී හඳුනාගෙන ඇත.



රූප සටහන 6.27 : *භූමියක ඖරස්කඩ*
මූලාශ්‍රය : *https://bit.ly/2J16dIG*

වර්තමානය වනවිට ප්‍රධාන නගර මධ්‍යය ප්‍රදේශයේ වාණිජ ගොඩනැගිලිවල ඉදිකර ඇති අප ජල පද්ධති නිසියාකාරව ක්‍රියා නොකිරීම නිසා ඇතැම් පුද්ගලයන් විසින් වැසි සහිත දිනවලදී හා රාත්‍රී කාලයන් තුළදී වැසි ජලය බැසයාමේ කාණු පද්ධතියට මළාපද්‍රව්‍ය හා අපජලය මුදාහැරීම හේතුවෙන් එම අපජලය කාවන්නිස්ස රජමහා විහාරය අසළින් ගලායන ඩි26 ඇළට එක්වී කුඹුරුවලට එක්වීම නිසා ඩි26 ඇළ ආශ්‍රයෙන් ගොවිනැන් කරන ගොවි ජනතාවද මහත් අපහසුතාවයට පත්වන අවස්ථා ඇත.

ඒ අනුව වර්ෂ 2030 වනවිට පවතින ගැටලුවලට විසඳුම් සෙවීම පිණිස යෝජිත අප ජලය හා මළාප්‍රවාහන සැලැස්ම සඳහා හඳුනාගෙන ඇති උපායමාර්ග කිහිපයකි.


උපායමාර්ග 01 : පරිසරයට මුදාහැරෙන අපජලය පිරිපහදුවකින් පසුව පරිසරයට මුදා හැරීම

(අ). පවතින කාණු පද්ධතිය විධිමත් කිරීම හා කාණු පද්ධතියෙන් බැහැරවන අපජලය පිරිපහදුවක් තුළින් පරිසරයට මුදාහැරීම


(ආ). D 26 ඇළ ප්‍රතිසංස්කරණ කරමින් එම ඇළට අපජලය හා අපද්‍රව්‍ය දැමීම වැළැක්වීම.

උපායමාර්ග 02 :

වර්ෂ 2030 සඳහා යෝජිත වාණිජ කලාපය I ආවරණය වන පරිදි ගුරුත්වය අනුව ක්‍රියාකරන මළාප්‍රවාහන පද්ධතියක් ඉදිකර එක් ස්ථානයකට රැස්කරගන්නා මළ අපද්‍රව්‍ය ගලි මඟින් එක්රැස් කර ප්‍රතිචක්‍රීකරණය කිරීම.



රූප සටහන 6.28 : *මළ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ක්‍රමවේදය*
මූලාශ්‍රය : *https://bit.ly/2x7C8S5*



යෝජිත අප ජල හා මලාප්‍රවාහ සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.2 0.4 0.8 1.2 1.6 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.6 : *යෝජිත අප ජල හා මලාප්‍රවාහ කළමනාකරණ සැලැස්ම 2030*

6.4.2.6. යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම.

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය ඇඹිලිපිටිය නගර සභාව හා ප්‍රාදේශීය සභාව යන ප්‍රධාන පළාත් පාලන ආයතන දෙකක් යටතේ ක්‍රියාත්මක කෙරේ. ඇඹිලිපිටිය නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ජනනය වන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 24ක් පමණ වන අතර නගර සභාව විසින් දෛනිකව එකතු කරනු ලබන්නේ ඉන් ටොන් 6ක ප්‍රමාණයකි. නාගරික බල ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දිනකට ජනනය වන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 16ක් පමණ වන අතර ප්‍රාදේශීය සභාව විසින් දෛනිකව එකතු කරනු ලබන්නේ ඉන් ටොන් 4 ක ප්‍රමාණයකි.

මේ අනුව ඇඹිලිපිටිය සමස්ථ නාගරික බල ප්‍රදේශයෙන් දිනකට ජනනය වන මුළු ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 40ක් වන අතර ඉන් දිනකට ඝණ අපද්‍රව්‍ය ටොන් 10ක් පමණ එකතු කරනු ලබයි. එමෙන්ම වර්ෂ 2030 වනවිට වැඩිවේයැයි අපේක්ෂිත නේවාසික ජනගහනයට අනුව ඔවුන් විසින් දෛනිකව බැහැර කරනු ලබන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 9.9ක් වශයෙන්ද වර්ෂ 2030 සඳහා පුරෝකථනය කරන ලද සංසරණ ජනගහනය මඟින් දිනකට ජනනය කරනු ලබන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 6.7 ක් ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව වර්ෂ 2030 වනවිට ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයෙන් ජනනය වේයැයි අපේක්ෂිත සම්පූර්ණ ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 56.6 කි.

ඇඹිලිපිටිය නගර සභාව විසින් දෛනිකව එකතු කරනු ලබන ටොන් 6ක කසල වලින් ටොන් 2.25ක ප්‍රමාණයක් කාබනික පොහොර නිපදවීමටද, ටොන් 1 ක් ප්‍රතිචක්‍රීකරණය සඳහා පෞද්ගලික ගැණුම් කරුවන් වෙනද ලබාදෙන අතර ඉතිරි ටොන් 2.75ක ප්‍රමාණය කදුරුගස් ආර ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටි ඉඩමේ කපන ලද වලවල් වලට බැහැර කර පස් දමා වැසීමක් කරනු ලැබේ. එසේ වුවද එවැනි බැහැර කිරීම් ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අවස්ථාවල දින ගණන් කසල විවෘත භූමිය තුළ නැබීමට සිදුවන අවස්ථාද හඳුනාගෙන ඇත.

ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාවට අයත් නාගරික බල ප්‍රදේශය තුළ එකතුකරනු ලබන ටොන් 4ක් පමණ වන ඝණ අපද්‍රව්‍ය ඇන්හොඬගල නින්දගම නමැති ඉඩමට බැහැර කරනු ලැබේ. එම ස්ථානය චන්ද්‍රිකා වැවට ඉතා ආසන්න ස්ථානයක් වන බැවින් එවැනි විවෘත බැහැර කිරීමක් සිදුකිරීම සුදුසු නොවන අතර එමඟින් පාරිසරික ගැටළු රාශියක්ද මතු වී ඇත.

වර්තමානය වනවිට නාගරික බල ප්‍රදේශය තුළ ජනනය වන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් නොමැති බැවින් වර්ෂ 2030 වනවිට වර්ධනය වන ජනගහනයට සාපේක්ෂව උත්පාදනය වන ඝණ අපද්‍රව්‍ය ප්‍රමාණයද ඇතුළත් වන පරිදි විධිමත් කසල කලමණාකරන වැඩපිළිවෙලක් සඳහා හඳුනාගත් උපායමාර්ග ඇතුළත් කරමින් ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය සඳහා වර්ෂ 2030 දක්වා වන ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම පිළියෙළ කර ඇත

හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග

උපායමාර්ග 01 : ක්‍රමවත් ක්‍රමවේදයකට අනුකූලව කසළ එක්රැස් කිරීම හා බැහැර කිරීම

(අ). වෙන්කරන ලද කසළ එක්රැස් කිරීම

සමස්ථ නාගරික බල ප්‍රදේශයම ආවරණය වන පරිදි ක්‍රමවත් ක්‍රමවේදයකට අනුව දිරන, නොදිරන, ඉලෙක්ට්‍රෝනික (E-waste) හා ආදී වර්ගීකරණයන් කිහිපයක් යටතේ වෙන් කිරීමක් සහිතව පවතින කසළ නේවාසික, වාණිජ, ආයතනික හා සියලු ස්ථාන තුළින් එක්රැස් කිරීම.

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

භෞතික හා සාමාජීය අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

භෞතික අපරවයුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග

දිනපතා බැහැර කරනු ලබන කසළ බැහැර කිරීම අඩුකිරීම(Reduse), නැවත නැවත භාවිතය (Reuse) හා ප්‍රනිචක්‍රීකරණ (Recycle) ආදී කසළ කළමනාකරණ ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ආ). GPS නාක්ෂණය භාවිතය


නගර සභා ප්‍රදේශය තුළ GPS ඇතුළු නව නාක්ෂණය භාවිතා කරමින් දැනට සිදුකරනු ලබන සණ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේදය නගර සභාවේ සියලු ප්‍රදේශ හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළද ක්‍රියාවට නැංවීම.



රූප සටහන 6.29 : *ඇඹිලිපිටිය නගර සභාව විසින් නවීන GPS නාක්ෂණය හා විශේෂිත APP භාවිතයෙන් කසළ එකතුකිරීම*
මූලාශ්‍රය : *ඇඹිලිපිටිය නගර සභාව*

(ඇ). වෙන්කරන ලද කසළ එක්රැස් කිරීම

දැනට ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් සණ අපද්‍රව්‍ය නැන්පත් කිරීම සඳහා භාවිනයට ගැනෙන ඇන්හොඬගල නින්දගම ඉඩම පිහිටා ඇත්තේ, ප්‍රදේශයේ ප්‍රධාන පානීය ජල මූලාශ්‍රය වන චන්ද්‍රිකා වැවට මීටර් 500ක් වැනි ආසන්න දුරකින් වන අතර ඒ තුළින් ඉදිරියේදී ජල මූලාශ්‍රයට වන හානිය වැළක්වීම සඳහා නගරසභාව විසින් සණ අපද්‍රව්‍ය බැහැර කිරීමට යෝජිත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා ලබාදීම්.



රූප සටහන 6.30 : *ඇඹිලිපිටිය නගර සභාව ක්‍රියාත්මක කිරීමට යෝජිත සනීපාරක්ෂක බිම් පිරවුම |* ***මූලාශ්‍රය :*** *shorturl.at/ckGX3*


ඇඹිලිපිටිය නගර සභාවෙන් එකතු කරනු ලබන මිශ්‍ර කසළ අතුරින් වෙන්කළ හැකි මට්ටමේ පවනිනුයේ 30% ක් පමණ වන අතර මිශ්‍ර කසළ සනීපාරක්ෂක බිම් පිරවුමකට යොමු කිරීමට හදුනා-ගෙන ඇත. මෙලෙස සකස් කරන ලද සනීපාරක්ෂක බිම් පිරවුම පරිසරයට හානියක් නොවන පරිදි විද්‍යාත්මක ක්‍රමවේදයකට සිදු-කිරීමට හදුනාගෙන ඇත. ඒ සදහා හාරන ලද පාංශු ස්තරය, භූගත ජල මට්ටමේ සිට මීටර් 4ක් වන විට ස්ථාවර පස් නට්ටුවක් දමා එය හොදින් තලා පරීක්ෂා කර ඊට ඉහතින් ක්‍රමානුකූලව කළුගල් නට්ටුවක් අතුරා, අනතුරුව පිලිවෙලින් ජියෝ ටෙක්ස්ටයිල් ආස්තරණයක් යොදා ඉන්පසුව පෙට්‍රොලයිට් ආස්තරණයක්, HDPE ආස්තරණයක්, නැවතත් ජියෝ ටෙක්ස්ටයිල් ආස්තරණයක්, කළුගල් ආස්තරණයක් සහ අවසාන වශයෙන් නැවතත් ජියෝ ටෙක්ටයිල් ආස්තරණයක් යන ආකාරයට සකස් කිරීමට හදුනාගෙන ඇත.

උපායමාර්ග 02 : නගරයේ කසළ නගරයටම ආයෝජනයක් කරගැනීම



රූප සටහන 6.31 : *යෝජිත කදුරුගස්ආර මිහිසාර කාබනික පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය |* ***මූලාශ්‍රය :*** *ඇඹිලිපිටිය නගර සභාව*

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශ-යෙන් බැහැර කරන සණ අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකට ලක්-කිරීම සඳහා නවීන තාක්ෂණික ක්‍රමෝපායන් සහිත කසල ප්‍රති-චක්‍රීකරණ පද්ධතියක් ඇඹිලිපිටිය කර්මාන්ත කලාපය හා ඇඹිලිපිටිය නගර සභාව විසින් යෝජිත ආදර්ශ හරිත ගම්මානය ආශ්‍රිතව ස්ථාපිත කිරීම.



යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.225 0.45 0.9 1.35 1.8
කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
ජනවාරි 2019

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය


සිතියම 6.7 : *යෝජිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම 2030*

ආර්ථික සංවර්ධන උපායමාර්ග

යෝජිත කෘෂි ආර්ථික සැලැස්ම

6.5. ආර්ථික සංවර්ධන උපායමාර්ග

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා නගරයේ ආර්ථික සංවර්ධනය පාදක කරගත් ප්‍රධාන අරමුණු වශයෙන් වර්ෂ 2030 වනවිට රන්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රධානතම වාණිජ හා කෘෂි සේවා මධ්‍යස්ථානය බවට ඇඹිලිපිටිය නගරය පත්කිරීම හා වලව කලාපීය කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අගය එක්කරන නිෂ්පාදන ක්‍රියාවලියකට යොමුකරලිම තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීම යන අරමුණු හඳුනාගෙන ඇත. ඒ අනුව ඇඹිලිපිටිය නගරයේ ආර්ථික සංවර්ධනය තුළින් වර්ෂ 2030 දී අපේක්ෂිත නගර සංවර්ධන දැක්ම වෙත ළඟාවීම සඳහා කෘෂි ආර්ථික, කර්මාන්ත හා සංචාරක ප්‍රවර්ධනය වශයෙන් උපායමාර්ගික සැලසුම් තුනක් හඳුනාගෙන ඇත.



රූප සටහන 6.32 : *ආර්ථික සංවර්ධන සැලසුම්*

6.5.1. යෝජිත කෘෂි ආර්ථික සැලැස්ම

සබරගමුව පළාතේ නාගරික ධුරාවලියට අනුව රන්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි ඇඹිලිපිටිය නගරය දෙවන පෙළ නගරයක් ලෙස හඳුනාගෙන ඇති අතර ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනයන්ට අනුව (වර්ෂ 2012) ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයේ සම්පූර්ණ ශ්‍රම බලකායෙන් 52% ක් ආර්ථිකමය වශයෙන් සක්‍රිය ක්‍රියාකරයි. මෙම සක්‍රිය ජනගහනයෙන් 92%ක නරමී වැඩි ප්‍රතිශතයක් සේවා නියුක්තිකයන් වන අතර ඉතිරි 8% ක් නරමීවන අඩු ප්‍රතිශතය සේවා වියුක්තිකයන් ලෙස හඳුනාගෙන ඇත.

නාගරික ආර්ථික පදනමේ ප්‍රධානතම මූල්‍ය ප්‍රභවය වන කෘෂිකාර්මික කටයුතු සඳහා නාගරික භූමී භාවිනයෙන් 1/3 ක් එනම් 35%ක භූමී ප්‍රදේශයක් කෘෂිකාර්මික භාවිනයන් සඳහා යොදා ගෙන ඇති අතර එම භූමී ප්‍රමාණයෙන් 59%ක් වැනි වැඩි භූමී ප්‍රතිශතයක් වී වගා කටයුතු සඳහා යොදාගෙන ඇත. රටේ සමස්ථ වී නිෂ්පාදනයට දක්වන දායකත්වය මන ශ්‍රී ලංකාව තුළ වී නිෂ්පාදනය සිදුකරන ප්‍රධාන කලාප 27 අතරින් උඩවලව කලාපය 15වන ස්ථානය හිමිකරගෙන ඇත. වලව කලාපයේ වී නිෂ්පාදනය තුළට ඇඹිලිපිටිය නගරයේ වී නිෂ්පාදනය ද එක්වීම නගරයේ ආර්ථිකයට ශක්තියක් වී ඇත.

මෙම කලාපය තුළ පසුගිය 2016 වර්ෂයේදී වී නිෂ්පාදනය යල කන්නය තුළ මෙට්‍රික් ටොන් 11,378ක්ද මහා කන්නය තුළ මෙට්‍රික් ටොන් 9,935ක් ලෙස වාර්තා වී ඇත.

නාගරික බල ප්‍රදේශයේ භූමී භාවිනයන් අනුව වී වගාව වැඩිවශයෙන් පැවතුනද ඇඹිලිපිටිය නගරය වැඩි ප්‍රසිද්ධියක් ලබාගෙන ඇත්තේ කෙසෙල් වගාව සඳහාය. වර්තමානය වන විට ඇඹිලිපිටිය නගරයේ කෙසෙල් නිෂ්පාදනය ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි බෙදාහරිනු ලැබේ. නිෂ්පාදන අලෙවිය සඳහා කෙසෙල් වෙළඳපොළවල් සනියකට දින හතරක් ඇඹිලිපිටිය, තුංකම, හා මොරකැටිය ප්‍රදේශය තුළ ක්‍රියාන්මක වන අතර එම කෙසෙල් පොළවල් තුළ සනියකට කෙසෙල් කැන් 13,750ක් පමණ අලෙවි කෙරේ (හෙක්ටර් කොබ්බැකඩුව කෘෂි පර්යේෂණ හා පුහුණු ආයතනය 2011)

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ආර්ථික සංවර්ධන උපායමාර්ග

යෝජිත කෘෂි ආර්ථික සැලැස්ම

ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව පවතින සාරවත් පස බෝග වගාවන් බොහොමයක් සඳහා හිතකර බැවින් කෙසෙල් වගාවට අමතරව එළවළු, පළතුරු හා අනිරේක බෝග වගාවන් සඳහාද කෘෂිකාර්මික බිම් වලින් 21% ක භූමි ප්‍රදේශයක් භාවිතයට ගෙන ඇත. එමෙන්ම නගරයේ රැකියා ව්‍යාප්තියට අනුව වැඩිම ප්‍රතිශතයක් එනම් 27%ක ප්‍රමාණයක් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැලී සිටී.

ඇඹිලිපිටිය නගරයේ ප්‍රධානතම ආර්ථික පදනම කෘෂි කර්මාන්තය මත ගොඩනැගී ඇත. නගරය තුළ ක්‍රියාන්මක කර්මාන්ත, සංචරක, තොග හා සිල්ලර වෙළෙඳාම, ඛණිජ සම්පත්, බැංකු හා මූල්‍ය ආයතන ජාලය තුළින් සමස්ථ ආර්ථිකය පිළිබිඹු කෙරේ.

විශේෂයෙන් නගරයේ පිහිටීම හා කෘෂිකාර්මික ලක්ෂණ මත අවට පවතින කුඩා නගර සඳහා සේවා සපයන වාණිජ සේවා මධ්‍යස්ථානයක් බවට ඇඹිලිපිටිය නගරය පත්ව ඇත. නාගරික බල ප්‍රදේශය තුළ මේවන විටත් විවිධ පරිමාණයේ ව්‍යාපාර 152ක් ස්ථාපිතව ඇති අතර විවිධ වර්ගයේ සංචාරක හෝටල් 64ක් ස්ථාපිතව ඇත.

ඇඹිලිපිටිය නගරය අවට ජනතාව නගරයට පැමිණෙන විශේෂ හේතුවක් ලෙස නගරය තුළ ස්ථාපිතව පවතින මූල්‍ය ආයතන පද්ධතියේ සේවා ලබාගැනීම සඳහා බව හඳුනාගෙන ඇත. නගරයේ ප්‍රධාන මාර්ග වන නෝනගම, මොරකැවිය හා මිද්දෙණිය මාර්ගය ආශ්‍රිතව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ බැංකු 17කුත්, මූල්‍ය ආයතන 25කුත් ස්ථාපිතව පැවතීම නගරයේ ආර්ථිකයට ශක්තියක් වී ඇත.

නගරයේ ආර්ථිකය ඉහත සඳහන් කළ පරිදි විවිධ අංශ යටතේ ව්‍යාප්තව පැවතියත් එම බෝහෝමයක් අංශ එකිනෙක අතර ඇති අන්තර් සබඳතාවන් මත ක්‍රියාන්මක වේ. මෙම ආර්ථික ධාමයේ ප්‍රධාන පුරුක කෘෂි කර්මාන්තය වන අතර ඒ තුළ සිදුකෙරෙන ප්‍රවර්ධනයන් තුළින් නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට හැකියාව ඇත.

කෘෂිකර්මාන්ත කටයුතු ශක්තිමත්ව ක්‍රියාන්මක කිරීමට නොහැකි ප්‍රධාන ගැටළුවක් ලෙස වගාකිරීමට ප්‍රමාණවත් ජලය වාර්ෂිකව නොලැබියාම හඳුනාගෙන ඇත. එහිදී කාලගුණික හා දේශගුණික තත්ත්වයන් මත ඇතිවන වියළි කාලගුණික තත්ත්වයන් හමුවේ වර්ෂයකට කන්න දෙකක් වගා කළ නොහැකි තත්ත්වයකට පත්වන අතර එක් කන්නයක් වගා නොකර අතහැර දැමීම හෝ වගාකරන සම්පූර්ණ භූමි ප්‍රදේශයෙන් අඩක් පමණ වගා කිරීමට සිදුවේ. මේ තත්ත්වය තුළ කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය උදෙසා අත්‍යාවශ්‍ය සාධකය වන ජලය වියළි කාලගුණික තත්වයන් තුළදීද කළමනාකරණය කරගනිමින් කන්න දෙකම වගාකිරීම සඳහා ප්‍රමාණාත්මකව සපයා අස්වනු වැඩිකර ගැනීම කළ යුතු වේ. එමඟින් කලාපීය කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමටත් හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.

උපායමාර්ග 01 : උපරිම නිෂ්පාදනයකට අවශ්‍ය පහසුකම් සැපයීම

(අ). වගාවට අවශ්‍ය ජලය ප්‍රමාණවත්ව ලබාගැනීම

උඩවලව ජලාශයේ සිට චන්ද්‍රිකා වැව ඇතුළුව කෘෂිකාර්මික බිම් සඳහා ජලය සැපයෙන උඩවලව දකුණු ඇළ ආශ්‍රිත වාර් ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම.

(ආ). ජල ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි ජලය රදවා නබා ගැනීම

කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන වාර්ෂික ජල ඉල්ලුමට ප්‍රමාණවත් ජල ධාරිතාවයක් රඳවාගැනීමට හැකි පරිදි ඇඹිලිපිටිය ප්‍රදේශයේ පවතින හෙක්ටයාර් 3ත් 15ත් අතර හඳුනාගත් වැව් නවයක් තුළ ජල රැඳවුම් ධාරිතාවය වැඩිකිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම.

(ඇ). ජල ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි ජලය රදවා තබා ගැනීම

වාර්ෂික ජල ඉල්ලුම අඛණ්ඩව සැපයීම සඳහා ජල කළමනාකරණ සැලැස්මක් සමස්ථ කලාපයම ආවරණය වන පරිදි ක්‍රියාවට නැංවීම. (කෝටා ක්‍රමයට ජලය ලබාදීම)

උපායමාර්ග 02 : වගාබිම ආසන්නයෙන්ම නිෂ්පාදන එක්රැස් කිරීම

තුංකම, කුවිවිගල හා මොරකැවිය ප්‍රදේශ තුළ කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන ස්ථාපිත කරමින් එම මධ්‍යස්ථාන ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ කිරීම හා ආර්ථික මධ්‍යස්ථානය කෘෂිකාර්මික ද්‍රව්‍ය අලෙවියේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පත්කරමින් කලාපීය ගොවියාගේ නිෂ්පාදන සාධාරණ මිල ගණන් යටතේ ලබාගැනීම හා අනරමැදි වෙළෙන්දන් මඟින් පිටනට යන කෘෂි නිෂ්පාදන ප්‍රමාණය අවමකර නගරයේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම.

උපායමාර්ග 03 : ගුණාත්මක නිෂ්පාදන ඉහළ නැංවීම

(අ). කලාපයේ දේශගුණික තත්ත්වයන්ට ගැළපෙන හා වැඩි අස්වනු සහිත බීජ වර්ග හඳුන්වාදීම හා නවීන නාක්ෂණය ගොවීන්ට හඳුන්වාදීම සඳහා ගොවි පුහුණු මධ්‍යස්ථානයක් කෘෂිකර්මික සේවා මධ්‍යස්ථානය ආශ්‍රිතව ස්ථාපිත කරමින් කලාපීය කෘෂි නිෂ්පාදනය හා එහි ගුණාත්මකභාවය ඉහළ නංවා ගැනීම.




රූප සටහන 6.33 : *යෝජිත බීජ අබිජනන නිෂ්පාදනය*

(ආ). කෘෂි රසායන හා රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික පොහොර ආශ්‍රිත වගා කටයුතු සඳහා ගොවීන් නැඹුරු කරවීමට කලාපය තුළ මහා පරිමාණ හා කුඩා පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදනාගාර ඇති කිරීම.

උපායමාර්ග 04 : වගාබිම් සුරක්ෂිත කිරීම

පවතින කුඹුරු ඉඩම් සංවේදී පරිසර පද්ධතියක් ලෙස හඳුනාගනිමින් සංරක්ෂණය කිරීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් යෙදවීම.



යෝජිත කෘෂි ආර්ථික සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.8 : *යෝජිත කෘෂි ආර්ථික සැලැස්ම 2030*

6.5.2. යෝජිත කර්මාන්ත සැලැස්ම

ඇඹිලිපිටිය නගරය තුළ පවතින ප්‍රධාන ආර්ථික ප්‍රභවය කෘෂි කර්මාන්තය වන අතර රට අමතරව විවිධ පරිමාණයේ කර්මාන්ත ගණනාවක් නාගරික බල ප්‍රදේශය තුළ ක්‍රියාන්මක වේ. මේවන විට ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ කුඩා, මධ්‍යය හා මහා පරිමාණයේ කර්මාන්ත මෙන්ම සාම්ප්‍රදායික කර්මාන්ත ඇතුළු කර්මාන්ත 287ක් ක්‍රියාන්මක වෙමින් පවතී. එමෙන්ම ස්වයං රැකියා වශයෙන් පවත්වාගෙන යන ඉතා කුඩා පරිමාණයේ කර්මාන්ත 630ක් මෙම ප්‍රදේශය තුළ ක්‍රියාන්මකව පවතී (වගු අංක 6.5).

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ මේවන විට ක්‍රියාන්මකව පවතින අක්කර 50කින් සමන්විත කර්මාන්ත කලාපය තුළ අක්කර 25ක භූමී ප්‍රමාණයක් කර්මාන්ත සඳහා යොදාගෙන ඇති අතර ඉතිරී අක්කර 25ක භූමී ප්‍රදේශය එහි දෙවන අදියර යටතේ කරමාන්ත ඇතිකිරීම සඳහා වෙන්ව පවතී.

වර්ගීකරණය	*ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය*
කුඩා පරිමාණයේ කර්මාන්ත *සේවකයන් 1-10* *සේවකයන් 10-50*	 *191* *18*
මධ්‍යම පරිමාණයේ *කර්මාන්ත සේවකයන් 50-200*	 *32*
මහා පරිමාණයේ කර්මාන්ත *සේවකයන් 650*	 *01*
සාම්ප්‍රධායික කර්මාන්ත	*45*
එකතුව	***287***

වගුව 6.5 : *ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ පවතින කර්මාන්ත*
මූලාශ්‍රය : *සම්පත් පැතිකඩ, ඇඹිලිපිටිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2016*

වර්ෂ 2030 සඳහා යෝජිත භූමී භාවිත සැලැස්ම තුළින් හඳුනාගෙන ඇති කර්මාන්ත කලාපය තුළ නව කර්මාන්ත ඇති කිරීමට පවතින ප්‍රවණතා හදුනාගනිමින් එම ප්‍රදේශය කර්මාන්ත ආශ්‍රිත සංවර්ධන ක්‍රියාදාමයන් සඳහා යොදාගෙන ඇත. මෙම කර්මාන්ත කලාපය තුළ මුළු භූමී ප්‍රමාණය අක්කර 1200කි. එම භූමී ප්‍රමාණයෙන් සංවර්ධන කටයුතු සඳහා යොදාගත හැකි භූමී ප්‍රමාණය (Developable area) අක්කර 823.8 ක ප්‍රමාණයකි. එම භූමී ප්‍රමාණයෙන් 20% ක භූමී ප්‍රමාණයක් එළිමහන් ප්‍රදේශ හා මාර්ග සඳහා වෙන්කරමින් ඉතිරී අක්කර 633.8ක භූමී ප්‍රමාණයක් යෝජිත නව කර්මාන්ත ඇතිකිරීම සඳහා වෙන්කර ඇත.

වර්ෂ 2030 වනවිට ක්‍රියාන්මක කිරීමට යෝජිත කර්මාන්ත කලාපය පියවර දෙකක් යටතේ ක්‍රියාන්මක කර ඒ තුළ කුඩා, මධ්‍යය හා මහා පරිමාණ කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා හඳුනාගෙන ඇත. ප්‍රදේශයේ කෘෂිකර්මාන්ත කටයුතු හා සමගාම්ව ඒ ආශ්‍රිත නිෂ්පාදනද යොදාගනිමින් මෙම කර්මාන්ත ක්‍රියාන්මක කිරීමට යෝජිත අතර මෙම කර්මාන්ත කලාපය ඇතිකිරීම සඳහා හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.

උපායමාර්ග 01 : කලාපීය නිෂ්පාදන අමුද්‍රව්‍ය වශයෙන් භාවිතා කරන නිෂ්පාදන කර්මාන්ත කලාපයක් ස්ථාපනය

(අ). වර්ෂ 2030 සඳහා යෝජිත භූමි භාවිත සැලැස්ම තුළින් හඳුනාගත් කර්මාන්ත කලාපය තුළ අගය එක්කරන කෘෂි නිෂ්පාදන ඇතුළු පර්සර හානිය අවමව ක්‍රියාත්මක කළ හැකි කර්මාන්ත කුඩා, මධ්‍යය හා මහා පරිමාණයේ කර්මාන්ත වශයෙන් කර්මාන්ත 100 කට අධික ප්‍රමාණයක් ස්ථාපනය කිරීම.

(ආ). ඇඹිලිපිටිය නිඟුර ප්‍රදේශයේ දැනට ක්‍රියාත්මකව පවතින කර්මාන්ත උද්‍යානය හා එහි දෙවන අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රදේශය හා පැරණි කඩදාසි කම්හල ආශ්‍රිත භූමි ප්‍රදේශයද ඇතුළත්ව පළමු අදියර යටතේ කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා අක්කර 280ක භූමි ප්‍රදේශයක් තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

කර්මාන්ත කලාපයේ දෙවන අදියර වශයෙන්, පළමු අදියර යටතේ යෝජිත කර්මාන්ත කලාපයට යාබදව පිහිටි අක්කර 580කට ආසන්න භූමි ප්‍රදේශයක යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

(ඇ). යෝජිත කර්මාන්ත උද්‍යානය තුළ ජීවත්වන ජනතාව යටිතල පහසුකම් සහිත, ජීවත්වීමට හිතකර වෙනත් ප්‍රදේශයක නැවත පදිංචි කිරීම.

(ඈ). යෝජිත කර්මාන්ත තුළින් කලාපීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් අගය එක්කරන නිෂ්පාදන ඇති කිරීම






රූප සටහන 6.34 : *කෙසෙල් වලින් නිපදවිය හැකි අතුරු නිෂ්පාදන*
මූලාශ්‍රය : *https://bit.ly/2Y2Iu*

උපායමාර්ග 02 : කලාපීය කෘෂි නිෂ්පාදන පහසු ක්‍රමවේදයකට එක්රැස් කිරීම හා ප්‍රවාහනය

(අ). ඉනා පහසුවෙන් නාගරික අමුද්‍රව්‍ය නිෂ්පාදන මධ්‍යස්ථාන හා සම්බන්ධ වීම


නගරයේ දැනට ක්‍රියාත්මකව පවතින කෙසෙල් හා අනෙකුත් කෘෂි නිෂ්පාදන ආශ්‍රිත වෙළඳ පොළවල් වන නුංකම, මොරකැවිය, කුවිවිගල හා උඩවලව යන මහජන වෙළඳ පොළවල්, ප්‍රධාන කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කරමින් අගය එක්කරන නිෂ්පාදන සහිත කර්මාන්ත ඇති කිරීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කලාපය තුළින් පහසුවෙන් එක්රැස් කර ගැනීම.




රූප සටහන 6.35 : *ඇඹිලිපිටිය කෘෂි නිෂ්පාදන එකතුකිරීම් මධ්‍යස්ථාන ජාලය*

(ආ). නිෂ්පාදන හා අමුද්‍රව්‍ය ප්‍රවාහන වියදම හා නාස්තිය පිරිමැසීම

නිෂ්පාදන හා අමුද්‍රව්‍ය ප්‍රවාහනයේදී දැරීමට සිදුවන පිරිවැය අවමකර ගැනීම සඳහා මන්නල ගුවන්තොටුපොළ හා හම්බන්තොට වරාය මෙන්ම දක්ෂිණ අධිවේගී මාර්ගය වෙත පහසුවෙන් සම්බන්ධ වීම සඳහා කඩදාසි කම්හල මාර්ගයේ සිට කදුරුගස් ආර හරහා කරවිල යාය මාර්ගය නෝනගම මාර්ගය දක්වා මංතීරු දෙකකින් යුතුව විකල්ප මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.



රූප සටහන 6.36 : *ඇඹිලිපිටිය යෝජිත කර්මාන්ත කලාප අමුද්‍රව්‍යය හා නිෂ්පාදන බෙදාහැරුම් ජාලය*
මූලාශ්‍රය : *නා.සං.අධි./ සබරගමුව පළාත් කාර්යාලය, 2020*



යෝජිත කර්මාන්ත සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.9 : *යෝජිත කර්මාන්ත සැලැස්ම*

6.5.3. යෝජිත සංචාරක සේවා සැලැස්ම

සබරගමුව පළාතේ ප්‍රධාන සංචාරක කලාප හත අතරින් උඩවලව සංචාරක කලාපයට ඇඹිලිපිටිය නගරය අයත් වේ. මෙම සංචාරක කලාපය තුළ දේශීය හා විදේශීය සංචාරක ආකර්ෂණය වැඩිවශයෙන් දිනාගත් ස්ථාන අතරට උඩවලව ඇත් අතුරු සෙවණ, උඩවලව ජාතික වනෝද්‍යානය, සංඛපාල රජ මහා විහාරය, පනාමුර ඇත්ශාල, උඩවලව ජලාශය, චන්ද්‍රිකා වැව, ලියන්ගස්තොට වේල්ල හා මඩුවන්වෙල වලව්ව යන ස්ථාන සඳහන් කළ හැක. මෙම බොහොමයක් ස්ථාන ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයට අයත් නොවුනත් ඉහත සංචාරක ප්‍රදේශ වෙත පැමිණෙන සංචාරකයින්ගේ සේවා අවශ්‍යතා සපුරාගැනීම සඳහා ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයට පැමිණීම හඳුනාගෙන ඇත.

විශේෂයෙන් උඩවලව සංචාරක කලාපය ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ අලි ඇතුන් නැරඹීම සඳහාය. 2015 වර්ෂයේ ජනවාරි – ජුලි අතර කාලය තුළ උඩවලව ඇත් අතුරු සෙවණ හා උඩවලව ජාතික වනෝද්‍යානයට පැමිණි දේශීය සංචාරකයින් ප්‍රමාණය 134,116ක්ද විදේශීය සංචාරකයින්ගේ ප්‍රමාණය 62,145ක්ද වශයෙන් වාර්තා වේ. එමෙන්ම ජනවාරි– ජුලි හා අගෝස්තු – සැප්තැම්බර් කාල අතරතුර උඩවලව සංචාරක කලාපයට පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය 100,000කට පමණ ආසන්න බව සංචාරක ප්‍රවේශ පත්‍ර ගණනය කිරීම තුළින් හඳුනාගෙන ඇත.

උඩවලව ජාතික වනෝද්‍යානය නැරඹීමට පැමිණෙන සංචාරකයින්ගෙන් 50%කට ආසන්න ප්‍රමාණයක් උඩවලව හා ඇඹිලිපිටිය නගරයට පැමිණෙනුයේ සත්‍යාර්, නවාතැන් හා අහාර යානාදී අවශ්‍යතා සපුරාගැනීම සඳහාය. උඩවලවට පැමිණෙන සංචාරකයින් නාගරික බල ප්‍රදේශයේ රන්කරව්ව, උඩවලව යාය දෙක ප්‍රදේශ වල පමණක් ගතකර වෙනත් ප්‍රදේශ වෙත ගමන් කිරීම; හේතුවෙන් නගර මධ්‍යයේ හා නගරය හරහා ගොස් දැකබලා ගැනීමට නිබෙන ආකර්ශණීය ප්‍රදේශ බොහොමයක් සංචාරක ආකර්ෂණයෙන් ගිලිනි යාමට හේතුවක් වශයෙන් හඳුනාගෙන ඇත.






රූප සටහන 6.37 : *ඇත් අතුරු සෙවණ හා චන්ද්‍රිකා වැව*
මූලාශ්‍රය : *goo.gl/c1pqrE*





රූප සටහන 6.38 : *ලියන්ගස්තොට වේල්ල හා සංඛපාල විහාරය*
මූලාශ්‍රය : *goo.gl/jDL1iY*





රූප සටහන 6.39 : *උඩවලව ජලාශය හා මඩුවන්වල වලව්ව*
මූලාශ්‍රය : *https://rb.gy/kctbve/ , goo.gl/fzpLdy*

මීට අමතරව මේ වනවිටත් උඩවලව සංචාරක කලාපයේ නවාතැන් හා ආහාර පහසුකම් සඳහා කබානා කොටේජ්, ලොජ්, රෙස්ටුරන්ට්, විලා, හෝටල්, රිසෝර්ට් ආදී වශයෙන් විවිධ වර්ගීකරණයන් යටතේ පහසුකම් ව්‍යාප්තව ඇති අතර මෙවැනි පහසුකම් සහිත ස්ථාන 80ක් ඇඹිලිපිටිය නගරය තුළ පිහිටා ඇති අතර ඉන් 64ක්ම ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ පිහිටා ඇත. නවද උඩවලව ප්‍රදේශය තුළ පවතින නේවාසික ඒකකයන් සංචාරක අවශ්‍යතා සඳහා පරිවර්තනය වීමක් හඳුනාගෙන ඇත.

මේ අනුව උඩවලව සංචාරක කලාපයේ පවතින සම්පත් වැඩිදියුණු කරමින් ඇඹිලිපිටිය නගරයේ ප්‍රධාන ආර්ථික ප්‍රභවයක් ලෙස සංචාරක කර්මාන්තය සංවර්ධනය ඇතිකිරීම සඳහා හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.


උපායමාර්ග 01 : උඩවලව සංචාරක කලාපයේ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම

(අ). සංචාරක ආකර්ශණීයත්වයක් පවතින උඩවලව ආශ්‍රිත ප්‍රදේශය සංචාරක කටයුතු ප්‍රමුඛ කරගත් ප්‍රදේශයක් ලෙස සංචාරක සේවා කලාපය ලෙස නම් කිරීම

(ආ). සංචාරක ආකර්ශණය පවත්වාගනිමින් ඒ සඳහා පවතින ඉල්ලුම ඉහළ ඉඩම් සංචාරක කටයුතු සඳහා යොදා ගැනීම .

(ඇ). උඩවලව සංචාරක ප්‍රදේශය ආශ්‍රිත සෝ මිල් මාර්ගය , ධර්මපාල මාර්ගය හා මුදුන්මන්කඩ මාර්ග සංවර්ධනය කරමින් සංචාරක සේවා ලබාගැනීම සඳහා පැමිණෙන්නන්ගේ ගමනා ගමන පහසුකම් විධිමත් කිරීම.

(ඈ). උඩවලව සිට ඇඹිලිපිටිය නගර මධ්‍යය ප්‍රදේශය දක්වා ගමන් ගන්නා උඩවලව දකුණු ඇළ මාර්ගය සංවර්ධනය කරමින් නගරයේ සංචාරක ආකර්ශණීය ප්‍රදේශ වෙත සංචාරකයින් ආකර්ශණය කරගැනීම.




රූප සටහන 6.40 : *යෝජිත උඩවලව සංචාරක කලාපය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය,සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 02 : සංචාරකයින් ආකර්ෂණය වන නව අත්දැකීම් ලබාදීම

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ පවතින සංචාරක ආකර්ෂණීය ස්ථාන ආශ්‍රිතව සංචාරක බංගලා හා සංචාරක ක්‍රියාදාම උද්‍යාන (Adventure Park) ආදී අවස්ථාවන් ලබාදීම තුළින්ද දේශීය හා විදේශීය සංචාරකයින් නගරය තුළට ආකර්ෂණය කර ගැනීම.



රූප සටහන 6.41 : *ක්‍රියාදාම උද්‍යාන*
මූලාශ්‍රය : *https://rb.gy/hnocky/ , https://rb.gy/qqticx*



යෝජිත සංචාරක සැලැස්ම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර

නාගරික සංවර්ධන අධිකාරිය
ඔක්තෝම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.10 : *යෝජිත සංචාරක සැලැස්ම 2030*


තිරසර පරිසර
සංවර්ධන උපායමාර්ග

යෝජිත පරිසර
සංරක්ෂණ සැලැස්ම

6.6. තිරසර පරිසර සංවර්ධන උපායමාර්ග

වර්ෂ 2030 සඳහා යෝජිත ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගෙන ඇති ප්‍රධාන සංවර්ධන අරමුණක් වන පරිසර හිතකාමී සංවර්ධනයක් තුළින් ජනාවාසයට හිතකර සංචාරයට ආකර්ශණීය නගරයක් ඇති කිරීම සඳහා තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ග යටතේ ප්‍රධාන උපායමාර්ග ලෙස යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම, විවෘත භූමි සැලැස්ම හඳුනාගෙන ඇත.

තවද මෙම හඳුනාගත් උපායමාර්ගික සැලසුම් තුළින් ඇඹිලිපිටිය නගරය තුළ පවතින චන්ද්‍රිකා වැව, වලවේ ගඟ ආදී ජල මූලාශ්‍ර, කුඹුරු හා අනෙකුත් තෙත් බිම් ඇතුළු පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කරමින් සෑමට සොදුරු පරිසරයක් සහිත නගරයක් ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කර ඇත.



රූප සටහන 6.42 : *තිරසාර පරිසර සංවර්ධන සැලසුම්*

6.6.1. යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ සම්පූර්ණ භූමි ප්‍රදේශයෙන් 27%ක භූමි ප්‍රතිශතයක් කුඹුරු වන අතර 6%ක් ජල මූලාශ්‍ර වේ. ඒ අනුව කුඹුරු හා වැව්, වාරි ඇළ, ගංඟා යන ජල මූලාශ්‍ර වලින් හා 0.25% ක තෙත් බිම් වලින් සමන්විත සංවේදී පරිසර පද්ධතියක් සහිත ප්‍රදේශයක් ලෙස මෙම නගරය හඳුනාගෙන ඇත. නගරයේ සංවර්ධන කාර්යයන් තුළ අහිතකර මිනිස් ක්‍රියාකාරකම් මඟින් පවතින පරිසර පද්ධතියට හානි පැමිණවී ඇත. විශේෂයෙන් නගරයේ ප්‍රධාන පානීය ජල සැපයුම වන චන්ද්‍රිකා වැව සංරක්ෂිත ප්‍රදේශය ලෙස සැලකෙන මීටර් 100ක වැව රක්ෂිත ප්‍රදේශය තුළද ගොඩනැගිලි ඉදිකර ඇත. ඊට අමතරව නගරය මැදින් ගලා යන ඩි 23 ඇළ මාර්ගයට අපද්‍රව්‍ය මුදාහැරීම නුළින් කුඹුරු ඉඩම් වෙත අපජලය ගලා යාමත්, වලවේ ගඟ ආශ්‍රිතව ගොඩ වැලි හැරීම හා නැවත ඒ සඳහා පිළියම් නොකිරීම තුළින් පවතින පරිසර පද්ධතියේ සමබරතාවය බිඳවැටීමට හේතු වී ඇත.


මෙම ප්‍රදේශය තුළ දරුණු වශයෙන් බලපෑ ස්වභාවික ආපදා නොමැති අතර පසුගිය වසර 5ක කාලය තුළ නියඟය නිසා පවුල් 1710ක ප්‍රමාණයක් පිඩාවට පත්ව ඇත. මේ අනුව පවතින පරිසර පද්ධතිය සුරක්ෂිත කරමින් නගරයේ සංවර්ධන කාර්යයන් සිදුකිරීම සඳහා හඳුනාගත් ප්‍රධාන උපායමාර්ග කිහිපයකි.

උපායමාර්ග 01 : භූදුනාගත් සුවිශේෂී ජල මූලාශ්‍ර හා සංවේදී පරිසර කලාප ආරක්ෂා කිරීම සඳහා නියමයන් පැනවීම

(අ). චන්ද්‍රිකා වැව සඳහා පවතින මීටර් 100ක වැව් රක්ෂිත ප්‍රදේශය ආශ්‍රිත පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම

(ආ). වලවේ ගංඟාව සඳහා මීටර් 40ක ගංඟා රක්ෂිත ප්‍රදේශයක් ඇතිකිරීම තුළින් ගංඟාව ආශ්‍රිත පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම

(ඇ). චන්ද්‍රිකා වැව ප්‍රදේශය අඩු සඟන්ව කලාපයක් ලෙස සංවර්ධනය කරමින් වැව ආශ්‍රිත පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම.



රූප සටහන 6.43 : *චන්ද්‍රිකා වැව ආශ්‍රිත සංරක්ෂිත ප්‍රදේශය හා හරිත සංරක්ෂණ කලාපය*
මූලාශ්‍රය : *නාගරික සංවර්ධන අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, 2020*

උපායමාර්ග 02 : පවතින ජල මූලාශ්‍ර ප්‍රතිසංස්කරණය


උඩවලව ජලාශයේ සිට චන්ද්‍රිකා වැව ඇතුළුව කෘෂිකාර්මික බිම් සඳහා ජලය සැපයෙන උඩවලව දකුණු ඇළ ආශ්‍රිත වාරි ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම.

උපායමාර්ග 03 : ගුණාත්මක නිෂ්පාදනය ඉහළ නැංවීම හා කලාපය තුළ ප්‍රවලිත කිරීම

කෘමිනාශක හා රසායනික පොහොර භාවිතය අවම කරමින් කාබනික පොහොර ආශ්‍රිත වගා කටයුතු සඳහා ගොවීන් නැඹුරු කරවීම හා මෙම කලාපය තුළ මහා පරිමාණ හා කුඩා පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදනාගාර ඇති කිරීම.

උපායමාර්ග 04 : පවතින තෙත්බිම් සංරක්ෂණය

නගරයේ පවතින තෙත් බිම් සංරක්ෂණය සඳහා විශේෂ නියමනා පැනවීම



යෝජිත පරිසර සංරක්ෂණ සැලසුම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
අගෝස්තු 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලසුම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.11 : *යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම 2030*

6.6.2. පොදු එළිමහන් විනෝද කටයුතු අවකාශීය සැලැස්ම

ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය තුළ මේවන විට (2016) 99,138ක ජනගහනයක් ජීවත්වන අතර දළ ජන ඝණත්වය වර්ග කිලෝමීටරයකට 660කි. වර්ෂ 2030 සඳහා අපේක්ෂිත ජනගහනය 125,045ක් වශයෙන් ප්‍රරෝකථනය කර ඇත. නගරය තුළ පවතින ජනගහනයට අවශ්‍ය ඍජු විනෝද පහසුකම් සපුරාගැනීම සඳහා මේවන විට වෙන්ව පවතින ඉඩකඩ හෙක්ටයාර් 24.28කි (ඇමුණුම් වගු අංක 2.5, වගු අංක 6.6). මීට අමතරව වක්‍ර විනෝද පහසුකම් සපුරා ගැනීම සඳහා මහජන පුස්තකාල 2ක්, සිනමාශාලා 01ක් හා ප්‍රජා ශාලා 68ක් පමණක් මෙම ප්‍රදේශයේ ස්ථාපිතව ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම් වලට අනුව ජනගහනය 1000කට හෙක්ටයාර් 1.4 ක භූමි ප්‍රදේශයක් ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් සඳහා පැවතිය යුතුය. ඇඹිලිපිටිය නගරය තුළ පවතින කෘෂිකාර්මික භූමි භාවිතයන් සහ නේවාසික ඒකක සඳහා වන වැඩි බිම් ඉඩකඩක් පැවතීම නිසා ඍජු විනෝද පහසුකම් සඳහා භූමිය හිඟ නොවීම යන කරුණු මත එම නත්න්වය ඉස්මතු වුවද වැඩිවන ජනගහනයට හා නගරයේ සංවර්ධනය සමඟ නගරයට පැමිණෙන සේවාලාභීන්ට අවශ්‍ය සේවා මෙන්ම නගරය විඳීමට අවශ්‍ය ඉඩකඩ සපුරාදීම අත්‍යවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇත.

අනු අංකය	*උද්‍යාන වර්ගය*	*ප්‍රමාණය (ha)*
1.	*ඉතා කුඩා උද්‍යාන* *Pocket Parks (EPP)*	*0.72*
2.	*කුඩා උද්‍යාන* *Mini Park (EMP)*	*10.47*
3.	*මධ්‍යම උද්‍යාන පහළ මට්ටම* *Local Parks (ELP)*	*4.17*
4.	*මධ්‍යම උද්‍යාන ඉහළ මට්ටම* *Community Parks (ECP)*	*8.92*
	එකතුව	*24.28*

වගුව 6.6 : *ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශයේ ඍජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන*
මූලාශ්‍රය : *භූ දර්ශන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය, 2017*

මෙහිදී වර්ෂ 2030 සඳහා ප්‍රරෝකථනය කරන ලද ජනගහනය සඳහා අවශ්‍ය ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් සඳහා ඉඩම් හෙක්ටයාර් 175ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. මේ අනුව නාගරික ජනතාවට හිතකර නගරයක් බිහිකිරීමට මෙන්ම ජනතාවට අවශ්‍ය ප්‍රධාන යටිතල පහසුකමක් ලෙස නගරය තුළ ඍජු සහ වක්‍ර විනෝද පහසුකම් සපුරාලීම සඳහා හඳුනාගෙන ඇති උපායමාර්ග කිහිපයකි (ඇමුණුම් වගු අංක 2.6).

උපායමාර්ග 01 : අපේක්ෂිත ජනගහනයට ප්‍රමාණවත් පරිදි සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් සැපයීම

(අ). වර්ෂ 2030 සඳහා ප්‍රරෝකථනය කරන ලද ජනගහනයට අවශ්‍ය පරිදි සෘජු විනෝද පහසුකම් සැලසීම සඳහා නාගරික ප්‍රදේශයම ආවරණය වන පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන කුඩා, මධ්‍යම හා රේඛීය උද්‍යාන ඇති කිරීම සඳහා ඉඩකඩ වෙන්කිරීම.

අනු අංකය	*උද්‍යාන වර්ගය*	*ප්‍රමාණය (ha)*
1.	*යෝජිත කුඩා උද්‍යාන* *Proposed Mini Park (PMP)*	*4.95*
2.	*යෝජිත මධ්‍යම උද්‍යාන පහළ මට්ටම* *Proposed Local Parks (PLP)*	*19.7*
3.	*යෝජිත රේඛීය උද්‍යාන* *Proposed Linear Park (PLiP)*	*209.2*
	එකතුව	*233.9*
4.	*මධ්‍යම උද්‍යාන ඉහළ මට්ටම* *Community Parks (ECP)*	*24.28*
	සමස්ථ එකතුව	*258.1*

වගුව 6.7 : *පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය*
මූලාශ්‍රය : *භූ දර්ශන ඒකකය, නාගරික සංවර්ධන අධිකාරිය, 2017*

(ආ). දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කලහැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට සෘජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනිම, වර්ගීකරණය කිරීම හා ප්‍රතිසංවර්ධනය කිරීම.

උපායමාර්ග 02 : විනෝද පහසුකම් තුළින් නාගරික ආර්ථිකය ප්‍රවර්ධනය

(අ). දැනට නගරයේ ප්‍රධාන ක්‍රීඩාංගණයක් වන මහවැලි ක්‍රීඩාංගණය ප්‍රතිසංවර්ධනය කරමින් ජාතික හා කලාපීය ක්‍රීඩා අවශ්‍යතා වෙන ලබාදීමෙන් නාගරික ආර්ථිකයටද දායක කර ගැනීම.

(ආ). උඩවලව දකුණු ඇළ මාර්ගය සංචාරක ගමන්පථයක් ලෙස සංවර්ධනය කරමින් පාර්සර්ක හානි අවම බෝට්ටු පැදීම, ඔරු පැදීම, පාපැදි හා ස්කූටි පැදීම සඳහා ඉඩකඩ සැපසීම තුළින් ජනතාවට විනෝදාස්වාදයක් මෙන්ම නාගරික ආර්ථිකයට දායකත්වයක් ලබා ගැනීම.

(ඇ). මොරකැටිය ප්‍රධාන මාර්ගයට සමාන්තරව ගලා බසින ප්‍රධාන මාර්ගය ආශ්‍රිත පවතින ඇළ අසල ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත්කිරීම සඳහා එම ප්‍රදේශය රේඛිය උද්‍යානයක් වශයෙන් සංවර්ධනය කිරීම.

මෙම මොරකැටිය රේඛිය උද්‍යානය ආශ්‍රිත කුඩා පරිමාණයේ හෙළ බොජුන් හල් ස්ථාපනයට අවශ්‍ය පහසුකම් සැපසීම තුළින් නාගරික ජනයාට නව රැකියා අවස්ථා සැපසීම හා නාගරික ආර්ථිකයට දායක කර ගැනීම





රූප සටහන 6.44 : *විනෝද කටයුතු ආශ්‍රිත ආර්ථික ප්‍රවර්ධන අවස්ථා*
මූලාශ්‍රය : *httpson.ny.gov2ZKoLke, https://bit.ly/2XoJSjo*

උපායමාර්ග 03 : නාගරික උෂ්ණත්වය අවම ක්‍රම භාවිතයෙන් නාගරික ආකර්ෂණය වැඩි සුවදායි පරිසරයක් ඇති කිරීම


(අ). සියළුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ගොඩනැගිලි නිල හරින ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි හරිතකරණය අනුව සිදු කිරීම.

(ආ). සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරින පියසි ඉඳිකිරීම සහ හරින පියසි තුළ ජල විහිදුම් ක්‍රම (Water sprinkler) භාවිතයට යොමු කිරීම.

(ඇ). ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.

(ඈ). බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොලවට උරාගන්නා ක්‍රම වේදයන්ට පමණක් සීමා කිරීම (interlocking) සහ එවා ද ලා වර්ණයන්ට පමණක් සීමාකිරීම.

(ඉ). පවනින ක්‍රීඩාභූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරින සංකල්පයන් මුලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.



සිතියම 6.12 : *පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම*

6.6.3 භූ දර්ශන කළමනාකරණ සැලැස්ම

කෘෂිකාර්මික අනන්‍යතාවයක් සහිත ඇඹිලිපිටිය නගරයේ පවතින වැව් අමුණු, ඇළ මාර්ග හා කුඹුරු බිම් සහිත නීල හරිත වටපිටාව, මෙම නගරයේ සෞන්දර්යාත්මක අගය වැඩිදියුණු කිරීමට හේතු සාධක වී ඇත. වැඩි වශයෙන් වියළි කාලගුණික ලක්ෂණයන් පෙන්නුම් කෙරෙන මෙම ප්‍රදේශයේ, භූ දර්ශන කළමනාකරණයේදී එකී කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමුකර ඇත. මෙම සැලැස්ම මඟින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූ දර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ නීවර කිරීම ප්‍රධානම අරමුණ වේ. එමඟින් නගරයට පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගත හැකිවේ.

එයට අමතරව පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මඟින් විවිධ පරිසර පද්ධති මං මාවත් ආදිය නිරසාර ලෙස භූ දර්ශන සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම මඟින් අපේක්ෂිතය. ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට භූ දර්ශන සැලැස්ම පහත සඳහන් අරමුණු අනුව සකස්කර ඇත.

(අ). නාගරික උෂ්ණත්ව වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා නත්ත්වයන් අවම කිරීමට නාගරික වන ගහනය වැඩි කිරීම.

(ආ). නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විවිධත්වයක් සහිතව එක් කිරීම.

(ඇ). අවිදින්නන් නවත් දිරිමත් කිරීමට සහ පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු සෙවන හා ආසන සහිතව ලබාදීම.

(ඈ). සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥානාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් නිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනීම.

(ඉ). නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරවයුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශ ජනනාව වෙනුවෙන් නිර්මාණය.

(ඊ). විවිධ උද්‍යාන, මං තීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මඟින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

ඉහත සඳහන් අරමුණු අනුව වෙන ළඟාවෙමින් ඇඹිලිපිටිය නගරයේ භූ දර්ශන කළමනාකරණ සැලැස්ම තුළ පහත සඳහන් උපායමාර්ග හඳුනාගෙන ඇත.

උපායමාර්ග 01:

නාගරික උෂ්ණත්ව වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම, වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා නත්ත්වයන් අවම කිරීමට ඇඹිලිපිටිය නගරයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත නාගරික උද්‍යාන තුළ මෙම ප්‍රදේශයේ දේශගුණික නත්ත්වයන්ට ගැළපෙන ශාක ගහනය වැඩි කිරීම

උපායමාර්ග 02:

අවිදින්නන් ප්‍රමාණය දිරිමත් කිරීමට හා පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු හා ආසන ඇතුළත් වන පරිදි ඇඹිලිපිටිය නගරයට ඇතුල් වන ප්‍රධාන ප්‍රවේශ මාර්ග ආශ්‍රිත උද්‍යාන සංවර්ධනය කිරීම

උපායමාර්ග 03:

ඇඹිලිපිටිය නගරයේ පවතින වැව් හා ඇළ මාර්ග ආශ්‍රිත සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥානාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් නිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනීම.

උපායමාර්ග 04:


නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි විවෘත භූමි ප්‍රදේශ අපරවයුහ පහසුකම් සහිතව මනාව සැලසුම් කර ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීම.

උපායමාර්ග 05:

විවිධ උද්‍යාන, මං නීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

උපායමාර්ග 06:

නැනිනලා භූ ලක්ෂණ බහුල ඇඹිලිපිටිය නගරයේ අපේක්ෂිත භෞතික ආකෘතිය වෙත ළඟාවෙමින් භූ දර්ශන කළමනාකරණය ක්‍රියාත්මක කිරීමට අදාළ නියමනා යෙදවීම.



යෝජිත දර්ශනීය ස්ථාන කළමනාකරණ සැලැස්ම (2030)
ඇඹිලිපිටිය නාගරික බල ප්‍රදේශය

0 0.5 1 2 3 4 කිලෝමීටර්

නාගරික සංවර්ධන අධිකාරිය
ඔක්තෝම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම (2021–2030)

සැකසුම: සැලසුම් අංශය, සබරගමුව පළාත් කාර්යාලය

සිතියම 6.13 : *භූ දර්ශන කළමනාකරණ සැලැස්ම*

6.7. ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

6.7.1. උපායමාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති

වර්ෂ 2030 සඳහා යෝජිත ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් ව්‍යාපෘති, සමාජීය, ආර්ථික හා පාරිසරික බලපෑම, ව්‍යාපෘති කාලසීමාව, ව්‍යාපෘති පිරිවැය, අපේක්ෂිත නගර සංවර්ධන සංකල්පයට අනුකූල වීමේ ප්‍රමාණාත්මකතාවය යනාදී අංශ වලට පවතින අනුකූලත්වය මත සිදුකරන ලද දත්ත විශ්ලේෂණය තුළින් ව්‍යාපෘති පෙළගැස්ම සිදුකර ඇත (ඇමුණුම් වගු අංක :2.10).

ව්‍යාපෘති පෙළගැස්ම	*ව්‍යාපෘතිය*
1	*1. ඇඹිලිපිටිය ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *2. යෝජිත පරිපාලන සංකීර්ණ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *3. ඇඹිලිපිටිය සාප්පු සංකීර්ණය හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *4. කෘෂි අස්වනු එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *a. නැංගම මහජන පොළ සංවර්ධනය කිරීම හා කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *b. කුට්ටිගල මහජන පොළ සංවර්ධනය කිරීම හා කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *c. මොරකැටිය කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *5. ඇඹිලිපිටිය මොරකැටිය මාර්ගයේ රේඛීය උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *6. යෝජිත අතුරු මාර්ග සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය* *7. ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත රථගාල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *8. උඩවලව සංචාරක උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *9. පල්ලේගම වෙළඳ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *10. යෝජිත යෝධගම නිවාස ව්‍යාපෘතිය* *a) යෝජිත මධ්‍යම ප්‍රාන්තික නිවාස ව්‍යාපෘතිය* *b) යෝජිත රාජ්‍ය නිල නිවාස ව්‍යාපෘතිය* *11. යෝජිත ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතිය*
2	*1. ඇඹිලිපිටිය නගරයේ ප්‍රධාන මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *2. ඇඹිලිපිටිය නගරයේ යෝජිත සේවා මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *3. වන්දිකා වැව ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය* *4. D26 ඇළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *5. ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *6. උඩවලව මහජන පොළ සංවර්ධනය කිරීම හා කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය*
3	*1. යෝජිත කර්මාන්ත කලාපයේ කඩදාසි කම්හලට අයත් කලුදිය පොකුණු අපජල පිරිපහදු කිරීමේ ව්‍යාපෘතිය* *2. ඇඹිලිපිටිය නාගරික වැව් පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය* *3. යෝජිත උඩවලව සංචාරක හොරතුරු මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *4. යෝජිත උඩවලව නාගරික වන උද්‍යානය හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *5. වන්දිකා වැව ආශ්‍රිත උද්‍යාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *6. ආපන ශාලා, සිනමා ශාලා ඇතුළත් වාණිජ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය*

06 වන පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග

උපායමාර්ගික ව්‍යාපෘති හා අනෙකුත් ව්‍යාපෘති

ව්‍යාපෘති පෙළගැස්ම	*ව්‍යාපෘතිය*
4	*1. යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *2. ඇඹිලිපිටිය නවනගරය කෙටි දුර සේවා බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *3. බීජ අබිජනන මධ්‍යස්ථානය හා ගොවි පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *4. ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *5. ඇඹිලිපිටිය නවනගරය ජල ටැංකිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය* *6. උඩවලව දකුණු ඇළ මාර්ගය සංචාරක ගමන් පථයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *7. උඩවලව සංචාරක සේවා මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *8. යෝධගම ක්‍රීඩාංගණය හා නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *9. ඕෆුර ප්‍රදේශයේ කර්මාන්ත කලාපය අදියර I ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය*
5	*1. උඩවලව සංචාරක සේවා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය* *2. මොරකැටිය වී ගබඩා සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *3. ඕෆුර කර්මාන්ත කලාපයේ අදියර II ට අදාළ නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය* *4. ඕෆුර කර්මාන්ත කලාපයේ අදියර II ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය* *5. මඟවැලි ක්‍රීඩාංගණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය* *6. යෝජිත ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය*

වගුව 6.8 : *ව්‍යාපෘති පෙළගැස්ම*

ව්‍යාපෘතිය 01

ව්‍යාපෘති මාතෘකාව	ඇඹිලිපිටිය ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නගරයේ ප්‍රධාන ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (නෝනගම මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	ප්‍රධාන බස් නැවතුම ලෙස භාවිතා කෙරේ			
ඉඩමේ අයිතිය	ඇඹිලිපිටිය නගර සභාව			
භූමි ප්‍රමාණය	අක්. 1.7			

ව්‍යාපෘතියේ අදාළත්වය

දැනට ඇඹිලිපිටිය නගරයේ පවතින ප්‍රධාන බස්නැවතුම්පොළ තුළ පවතින ඉඩකඩ හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය ප්‍රමාණවත්ව සපුරා නොමැත. ප්‍රධාන පළාත් තුනක් අතර කේන්ද්‍රස්ථානයක් ලෙස පිහිටා ඇති ඇඹිලිපිටිය නගරයේ සිට වෙනත් ප්‍රදේශ වෙත දුරසේවා බස් රථද ක්‍රියාන්මක වේ. දිනකට දුර හා කෙටිදුර සේවා බස්රථ ගමන්වාර 771 ක් ක්‍රියාන්මක වන අතර දැනට පවතින ඉඩකඩ තුළ දුර සේවා බස්රථ නතර කිරීමට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවේ.

ප්‍රවාහන පහසුකම් ලබාගැනීම සඳහා පැමිණෙන මඟී ජනතාවට රැඳී සිටීමට ප්‍රමාණවත් පහසුකම්ද විධිමත්ව නැත. මෙවැනි දුර්වලතා තුළ වර්ෂ 2030 සඳහා අපේක්ෂිත සංසරණ ජනගහනයට ප්‍රමාණවත් පහසුකම් ලබාදෙමින් නාගරික ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම සඳහා ප්‍රධාන බස් නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

ඇඹිලිපිටිය නගරයේ ප්‍රධාන බස්නැවතුම්පොළ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් මූලික ප්‍රවාහන සේවා ආශ්‍රිත පහසුකම් වැඩිදියුණු කිරීම හා ඒ තුළින් නාගරික ජනතාවට හා සංසරණ ජනගහනයට අවශ්‍ය පොදු පහසුකම් විධිමත් අයුරින් සපුරා දීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නගර මධ්‍යයේ ඇතිවන රථවාහන තදබදය අවම වීම.
- බස්රථ හැසිරවීම සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් ලැබීම.
- මඟී ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ඇතුළු පොදු පහසුකම් සැපයීම.
- ඇඹිලිපිටිය නගරය ආශ්‍රිත හා දුර සේවා බස් රථ සේවා පහසු වීම.

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
ඇඹිලිපිටිය ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*350*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 02

ව්‍යාපෘති මාතෘකාව	පරිපාලන සංකීර්ණ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	පරිපාලන කටයුතු ඒකරාශී කරමින් පරිපාලන සේවය විධිමත් කිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මිද්දෙණිය මාර්ගය)			
පිහිටීම් සිතියම				
	පරිපාලන ගොඩනැගිල්ල 1		පරිපාලන ගොඩනැගිල්ල 2	
දැනට පවතින භාවිතය	පැරණි තැපැල් කාර්යාලය හා හිස් ඉඩම		ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	
ඉඩමේ අයිතිය	මහවැලි අධිකාරිය, තැපැල් දෙපාර්තමේන්තුව		මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	
භූමි ප්‍රමාණය	අක්.1.8		අක්. 1	

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 සඳහා යෝජිත කලාපීකරණ සැලැස්ම තුළින් පරිපාලන සේවා සඳහා නම් කර ඇති ආයතනික කලාපය තුළ මෙම ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම තුළින් සේවා ලබාගැනීමට පැමිණෙන ජනතාවට පහසුවෙන් එක කලාපයක් තුළින් පරිපාලන කටයුතු ක්‍රියාත්මක කරගැනීමට පහසු වන පරිදි පරිපාලන සංකීර්ණ ස්ථාපනය කිරීමට හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- පරිපාලන ආයතනික සේවා ලබාගැනීම පහසු කිරීම
- පවතින භූමි භාවිතයන් විධිමත් කිරීම
- වාණිජ භාවිතයන් සඳහා යෝග්‍ය ප්‍රදේශ පරිපාලන කටයුතු වලින් බැහැර කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ජනතාවට නම පරිපාලන සේවා ලබා ගැනීම පහසු වීම
- අනවශ්‍ය රථවාහන තදබදයක් ඇති නොවීම
- ආයතන සඳහා ප්‍රමාණවත් පරිදි ඉඩකඩ සැලසීම
- රාජ්‍ය සේවකයන්ට පහසුකම් සම්පූර්ණ පරිසරයක සිට සේවාවන් ඉටුකිරීමේ පහසුව

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
යෝජිත පරිපාලන සංකීර්ණ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර I	*800*
යෝජිත පරිපාලන සංකීර්ණ ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර II	*500*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම අදාළ විෂයභාර අමාත්‍යාංශ විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 03

ව්‍යාපෘති මාතෘකාව	ඇඹිලිපිටිය නගරයේ සාප්පු සංකීර්ණය හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නාගරික ජනතාවට අවශ්‍ය වාණිජමය සාප්පු සවාරි අවශ්‍යතා එකම ස්ථානයකින් සපුරාලීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (නෝනගම මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	ලංකා විදුලි බල මණ්ඩල කාර්යාලය, නිළ නිවාස හා විදුලි කණු, ගබඩා කිරීම			
භූමි ප්‍රමාණය	අක්.3			

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරය තුළ පවතින වාණිජ ව්‍යාප්තිය හා සංවර්ධන ප්‍රවණතාවය තුළ නගරයේ ජනතාවට අවශ්‍ය නවීන පහසුකම් සහිත සාප්පු සවාරි අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ සපුරාදීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. වර්ෂ 2030 සඳහා යෝජිත කලාපීකරණයට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා යෝජිත භූමිය වාණිජ කලාපයට අයත්වන අතර වාණිජ භාවිතයන් සඳහා යොදා ගැනීමෙන් ඉඩම් වටිනාකම ඉහළ නන්වා ගැනීමටද අවස්ථාව සැලසේ.

නවද සංචාරක ආකර්ශණීය නගරයක් ලෙස සංවර්ධනයේදී නගරයට පැමිණෙන සංචාරකයින්ගේ අවශ්‍යතා උපරිම ආකාරයෙන් සපයා දීමටද උපකාරී වන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇත. ඇඹිලිපිටිය නගරයේ ප්‍රධාන පිවිසුම් මාර්ගයක් වන නෝනගම මාර්ගයට මුහුණලා නගර මධ්‍ය ප්‍රදේශය තුළ පවතින භාවිනයන් සමඟ මෙම ව්‍යාපෘතිය සඳහා වඩාත් සුදුසු භූමියක් ලෙස ලංකා විදුලි බල මණ්ඩලයට අයත් මෙම ඉඩම හඳුනාගෙන ඇත. ලංකා විදුලි බල මණ්ඩලයට අයත් කාර්යාල; යෝජිත පරිපාලන කලාපය තුළ ස්ථාපනය කිරීමට හඳුනාගෙන ඇත. මේ අනුව ජනතාවට අවශ්‍ය රෙදිපිළි, ගෘහ උපකරණ, විවිධ නවීන උපකරණ සහිර් වෙළඳසැල්, ඒ.ටී.එම් යන්ත්‍ර, ආපන ශාලා ආදී බොහොමයකින් සමන්විත වාණිජ පහසුකම් එක් ස්ථානයකදී සපුරාදීමට අපේක්ෂා කර ඇත. මෙම සාප්පු සංකීර්ණය සමඟ යෝජිත රථගාල තුළින් නවදුරටත් ජනතාවගේ සේවා කටයුතු පහසු කිරීමට කටයුතු කර ඇත.

ව්‍යාපෘති අරමුණු

නාගරික ජනතාවට අවශ්‍ය සියලු සාප්පු සවාරි අවශ්‍යතා එක් ස්ථානයකට ඒකරාශී කරමින් ලබාදීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික ජනතාවගේ සාප්පු සවාරි අවශ්‍යතා බොහොමයක් එක් ස්ථානයක් තුළ පහසුවෙන් සපයාගත හැකි වීම
- මූල්‍ය සේවා ලබාගැනීමේ පහසුව
- සාප්පු සවාරි සමඟ විවේකීව කාලය ගත කිරීමේ පහසුව
- නාගරික ආකර්ෂණය ඉහළ යාම
- නාගරයේ වාණිජ සංවර්ධනය වර්ධනය වීම

මූල්‍ය සැලැස්ම


අන්තර්ගතය	*රු.මිලියන*
යෝජිත සාප්පු සංකීර්ණය හා රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*550*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 04

ව්‍යාපෘති මාතෘකාව	කෘෂි අස්වනු එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	කෘෂිකාර්මික ද්‍රව්‍ය තොග වශයෙන් මිලදී ගැනීම සඳහා වගා කටයුතු සිදු කරන ප්‍රදේශ ආශ්‍රිතව කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඇතිකිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව හා ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (රත්නපුර - නෝනගම මාර්ගය, මොරකැටිය මාර්ගය , උඩවලව තණමල්විල මාර්ගය)			
පිහිටීම් සිතියම යෝජිත නැංගම මහජන පොළ හා කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය				
පිහිටීම් සිතියම යෝජිත කුට්ටිගල මහජන පොළ හා කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය				

පිහිටීම් සිතියම *යෝජිත මොරකැටිය කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය*		
පිහිටීම් සිතියම *යෝජිත උඩවලව කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය (මහජන පොළ ආශ්‍රිතව)*		
දැනට පවතින භාවිතය	*උඩවලව, තැංකම, පදලංගල මහජන පොළ ලෙස භාවිතා කෙරේ/ මොරකැටිය කෙසෙල් පොළ ලෙස භාවිතා කෙරේ.*	
ඉඩමේ අයිතිය	*ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව / මහවැලි අධිකාරිය*	
භූමි ප්‍රමාණය *(යෝජිත කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන)*	*තැංකම*	*අක්. 1.2*
	කුට්ටිගල	*අක්. 0.7*
	මොරකැටිය	*අක්. 1.2*
	උඩවලව	*අක්. 0.75*

ව්‍යාපෘතියේ අදාළත්වය

කෘෂිකාර්මික නගරයක් වන වලව විශේෂිත බල ප්‍රදේශයට අයත් ඇඹිලිපිටිය නගරයේ කෘෂිකාර්මික කටයුතු සිදුකිරීමේදී ගොවියන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු ලෙස ඔවුන්ට නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබීම හා අතරමැදියන් හරහා ඔවුන්ගේ නිෂ්පාදන අවම මිල ගණන් වලට විකිණීමට සිදුවීම ගැටළුකාරී තත්ත්වයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය තුළ කෘෂිකාර්මික කලාප ආශ්‍රිතව

දැනට ක්‍රියාකාරී තන්ත්වයේ පවතින මහජන පොළවල් පැවැත්වෙන ස්ථාන; කෘෂිකාර්මික නිෂ්පාදන එක්රැස් කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථාන ලෙස ස්ථාපිත කරමින් සාධාරණ මිල ගණන් යටතේ ගොවියාගේ නිෂ්පාදන මිලදී ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදුකිරීමට හඳුනාගෙන ඇත.

එමෙන්ම මෙම කෘෂි නිෂ්පාදන එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඇඹිලිපිටිය ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය හා ඒකාබද්ධ කරමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ව්‍යාපෘති අරමුණු

- කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථාන ඇති කරමින් එක්රැස් කරන කෘෂි නිෂ්පාදන යෝජිත කර්මාන්ත කලාපයේ කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වශයෙන් සැපයීම.
- කලාපීය කෘෂි නිෂ්පාදන මෙම කලාපයෙන් පිටනට යෑම වැළැක්වීම.
- කෘෂිකාර්මික කලාප ආශ්‍රිතව මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම තුළින් ගොවීන්ට සාධාරණ මිලක් යටතේ තම නිෂ්පාදන අලෙවි කිරීමට අවස්ථාව උදාකර දීම.
- අස්වනු ප්‍රවාහනයේදී සිදුවන හානිය අවම කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ගොවියාට කෘෂි නිෂ්පාදන ප්‍රවාහනය සඳහා දැරීමට සිදුවන පිරිවැය අවම වීම.
- අවිධිමත් ප්‍රවාහනයේදී අස්වැන්නට සිදුවන හානිය අවම වීම
- කලාපීය කෘෂි නිෂ්පාදන ආර්ථිකය ඉහළ නැඟීම
- ගොවියාට නම නිෂ්පාදන අලෙවිය පහසු වීම
- ගොවියාට නම නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලැබීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
යෝජිත නුංකම මහජන පොළ සංවර්ධනය කිරීම හා ඒ ආශ්‍රිතව කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	75
යෝජිත කුට්ටිගල මහජන පොළ සංවර්ධනය කිරීම හා ඒ ආශ්‍රිතව කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	75
යෝජිත මොරකැටිය කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	75
යෝජිත උඩවලව කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	75

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

මොරකැටිය කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය නඩත්තුව හා පවත්වාගෙන යෑම ඇඹිලිපිටිය නාගර සභාව විසින්ද නුංකම හා කුට්ටිගල හා උඩවලව කෘෂිකාර්මික ද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන ඇනිකිරීමේ ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 05

ව්‍යාපෘති මාතෘකාව	*මොරකැටිය රේඛීය උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*ඇඹිලිපිටිය මොරකැටිය මාර්ගයේ දකුණු පසින් පිහිටි හරිත බිම් තීරුව රේඛීය උද්‍යානයක් වශයෙන් සංවර්ධනය කිරීම තුළින් නාගරික ආකර්ෂණය වැඩිදියුණු කිරීම.*			
පිහිටීම	***පළාත***	***දිස්ත්‍රික්කය***	***ප්‍රා. ලේ. කොට්ඨාසය***	***පළාත් පාලන ආයතනය***
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව*
ප්‍රවේශය	*මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මොරකැටිය මාර්ගය)*			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*මොරකැටිය මාර්ගය හා වාරි ඇළ අතර පිහිටි හරිත තීරුව තැනින් තැන අනවසර ඉඳිකිරීම් වෙළඳ කටයුතු පවතී*			
ඉඩමේ අයිතිය	*මහවැලි අධිකාරිය*			
රේඛීය උද්‍යානයේ දිග	*කි.මී.2*			

ව්‍යාපෘතියේ අදාළත්වය

මොරකැටිය මාර්ගය ඇඹිලිපිටිය නගරයට ඇතුළුවන ප්‍රධාන මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති අතර මොරකැටිය මාර්ගයට යාබදව ඇති ඇළ රක්ෂිතය තුළ මේවන විට අනවසර වෙළඳ කටයුතු සිදුකරමින් පවතී. ඒ අනුව එම අනවසර ඉදිකිරීම් ඉවත් කරමින් ඇළ රක්ෂිතය ආරක්ෂා කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. මොරකැටිය ප්‍රධාන මාර්ගයට සමාන්තරව පවතින මෙම ඇළ මාර්ගය ආශ්‍රිත රේඛීය උද්‍යානය හා ඒ ආශ්‍රිත දේශීය ආහාර නිෂ්පාදන අලෙවි කුටි ඇතුළත් කරමින් නාගරික ජනතාවට ජීවනෝපායක් ලබාදීමටද හඳුනාගෙන ඇත. ඒ අනුව මොරකැටිය මාර්ගය ඔස්සේ ගමන්කරන ජනතාවට මෙම රේඛීය උද්‍යානය තුළ නතර වී විවේක ගැනීමට හා දේශීය ආහාර රසවිඳීමට අවස්ථාව සැලසේ.

මෙමඟින් දැනට පවතින අනවසර ඉදිකිරීම් ඉවත් කරමින් නාගරික ආකර්ෂණය ඉහළ නැංවීම හා ජනතාවට පහසුකම් රාශියක් සැලසෙන බැවින් මෙම ව්‍යාපෘතිය සිදුකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- නාගරික ජනතාවට හා සංසරණ ජනගහනයට අවශ්‍ය විවේක හා විනෝද කටයුතු පහසුකම් වැඩි දියුණු කිරීම
- මොරකැටිය මාර්ගය හා ඒ ආශ්‍රිත ඇළ මාර්ගයේ ඇති අනවසර ඉදිකිරීම් ඇනිවීම වැළැක්වීම
- පවතින ඇළ මාර්ග භාවිතයට ගනිමින් නාගරික ආකර්ෂණය වැඩිදියුණු කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික ආකර්ෂණය වැඩිවීම
- අනවසර ඉදිකිරීම් වැළැක්වීම
- ආර්ථිකමය ප්‍රතිලාභ අන්වීම


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
මොරකැටිය රේඛීය උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*350*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 06

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නගරයේ අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නාගරික සේවා ව්‍යාප්ත කිරීම හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා නාගරික අතුරු මාර්ග සංවර්ධනය කිරීම*			
පිහිටීම	***පළාත***	***දිස්ත්‍රික්කය***	***ප්‍රා. ලේ. කොට්ඨාසය***	***පළාත් පාලන ආයතනය***
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව*
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*අතුරු මාර්ග*			
මාර්ගයේ දිග	*උඩගම මාර්ගය හා රෝහල් මාර්ගයේ කොටසක්*	*උඩගම හංදියේ සිට රෝහල් මාර්ගය ජනාධිපති විද්‍යාලය අසල දක්වා*		*කි.මී.1.5*
	කොන්ක්‍රීට් යාඩ් මාර්ගය	*ජනධිපති විද්‍යාලය අසල සිට කොන්ක්‍රීට් යාඩ් මාර්ගය නෝනගම මාර්ගය දක්වා*		*කි.මී. 1.6*
	ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය	*මහවැලි ක්‍රීඩාංගණය අසළ මාර්ගය ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය බස්සේ මොරකැටිය මාර්ගය දක්වා*		*කි.මී.1.3*
	බිම්බදු යාය මාර්ගය			*මී.800*

ව්‍යාපෘතියේ අදාළත්වය

නගර මධ්‍යයේ ප්‍රධාන සේවා ස්ථාන ලෙස ජනගහනය වැඩි වශයෙන් ගැවසෙන ප්‍රධාන බස් නැවතුම්පොළ, මහජනපොළ, ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල, හා ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත සේවාවන් රථවාහන නදබදය අවම කිරීම සඳහා මෙම අතුරු මාර්ග සංවර්ධනය අත්‍යාවශ්‍ය වන අතර එමඟින් නගර මධ්‍යයේ පවතින මාර්ග තදබදය අවම කළ හැකිවේ

ව්‍යාපෘති අරමුණු

- නගර මධ්‍යයේ පවතින රථවාහන නදබදය මඟ හරිමින් ප්‍රධාන මාර්ග වෙත පහසුවෙන් ළඟාවීමට හැකියාව පවතින මාර්ග පද්ධතියක් ඇති කිරීම
- නගර මධ්‍යය ප්‍රදේශයේ සංවර්ධන කටයුතු නගරයෙන් ඔබ්බට ව්‍යාප්ත කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රථවාහන නදබදය අවම වීම
- නගර මධ්‍යයේ ප්‍රවාහන පහසුකම් විධිමත් වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
උඩගම හංදියේ සිට රෝහල් මාර්ගය ජනාධිපති විද්‍යාලය අසල දක්වා මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*60*
කොන්ක්‍රීට් යාඩ් මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*64*
මඟවැලි ක්‍රීඩාංගණය අසළ මාර්ගය ට්‍රාන්ස්ෆෝමර් මාර්ගය බස්සේ මොරකැටිය මාර්ගය දක්වා පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*52*
බිම්බදු යාය මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*32*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 07

ව්‍යාපෘති මාතෘකාව	*ආර්ථික මධ්‍යස්ථානය හා මහජන පොළ ඇතුළු ස්ථානවල පොදු මහජන අවශ්‍යතා සඳහා රථගාල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නාගරික සේවාවන් ලබාගැනීම සඳහා පැමිණෙන්නන්ගේ රථවාහන ගාල් කිරීමට අවශ්‍ය පහසුකම් එම සේවා ස්ථාන ආසන්නයෙන් සපුරා දීම.*			
ව්‍යාපෘති විස්තරය				
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව*
ප්‍රවේශය	*මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මිද්දෙණිය මාර්ගය)*			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*යෝජිත රථගාල 1 - ආර්ථික මධ්‍යස්ථානයේ රථගාල සඳහා යෝජිත ඕස් ඉඩම*		*යෝජිත රථගාල 2 - පැරණි නිල නිවාස*	
ඉඩමේ අයිතිය	*ඇඹිලිපිටිය නගර සභාව / මහවැලි අධිකාරිය*			
රේඛීය උද්‍යානයේ දිග	*යෝජිත රථගාල 1 - අක්.0.3 (පර්ච්.48)*		*යෝජිත රථගාල 2 - අක්. 01*	

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරයේ මහජන පොළ පැවැත්වෙන දිනයන්හි හා ආර්ථික මධ්‍යස්ථානයේ කටයුතු සඳහා පැමිණෙන්නන්ගේ රථවාහන සංඛ්‍යාව අධික වන බැවින් පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවන අතර රාජ්‍ය ආයතන ඇතුළු විවිධ සේවා ලබාගැනීම සඳහා නව නගරයට පැමිණෙන ජනතාවගේ රථවාහන නවතාලීම සඳහාද එම ප්‍රදේශ ආශ්‍රිතව ප්‍රමාණාත්මක රථවාහන නැවතුම් ස්ථාන නොමැති හේතුවෙන් නව රථශාල් ඉදිකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- ඇඹිලිපිටිය මහජන පොළ හා ආර්ථික මධ්‍යස්ථානය වෙත පැමිණෙන සේවාලාභීන්ගේ රථවාහන හා නව නගරයට පැමිණෙන ජනතාවට අවශ්‍ය රථවාහන නතර කිරීමේ ඉඩපහසුකම් වැඩිදියුණු කිරීම
- නගරය අවට වෙළඳසැල් ඇතුළු අනෙකුත් ආයතන වලට අවතිර වන පරිදි රථවාහන නතර කිරීම වැළැක්වීම
- ප්‍රවාහන පහසුකම් විධිමත්ව සැපයීම තුළින් නගරය ක්‍රමවත්ව හා ආකර්ෂණීයව පවත්වාගෙන යෑම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රථවාහන නතර කිරීමේ ඉඩ පහසුකම් සැපයීම තුළින් රථවාහන නදබදය අවම වීම
- නාගරික ආකර්ෂණය වැඩිදියුණු වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
යෝජිත රථශාල I	*10*
යෝජිත රථශාල II	*25*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 08

ව්‍යාපෘති මාතෘකාව	උඩවලව සංචාරක උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	සංචාරක සේවා පහසුකම් විධිමත් කරමින් දේශීය හා විදේශීය සංචාරකයින් ආකර්ෂණය කරගැනීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (තණමල්විල මාර්ගය)/ ප්‍රාදේශීය මාර්ග (සෝමිල් මාර්ගය, ධර්මපාල මාවත)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	නේක්ක වගාව			
ඉඩමේ අයිතිය	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව			
භූමියේ ප්‍රමාණය	අක්.100			

ව්‍යාපෘතියේ අදාළත්වය

සබරගමුව පළාත තුළ පවතින සංචාරක කලාප අතරින් උඩවලව සංචාරක කලාපය ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර දේශීය හා විදේශීය සංචාරකයන් විශාල ප්‍රමාණයක් වාර්ෂිකව මෙම කලාපයට පැමිණේ. ජනවාරි-ජුලි හා අගෝස්තු- සැප්තැම්බර් කාලයන් තුළ සංචාරකයින්ගේ පැමිණීමේ වැඩිවීමක් හඳුනාගෙන ඇත. උඩවලව ජාතික වනෝද්‍යානය නැරඹීම සඳහා සංචාරකයින් වාර්ෂිකව 100,000 ට පමණ ආසන්න හෝ ඊට නරමක් වැඩි පිරිසක් පැමිණෙන අතර ඔවුන් නණමල්විල මාර්ගය ඔස්සේ උඩවලව ජලාශය නරඹමින් උළුව හා දකුණු පළාත් සංචාරක කලාප වෙත පිවිසේ. උඩවලවට පැමිණෙන සංචාරකයින් විශාල ප්‍රමාණයක් පැමිණෙනුයේ අලි ඇතුන් නැරඹීම සඳහාය.

උඩවලව නගරය ආශ්‍රිතව සංචාරක හෝටල් රැසක් ස්ථාපිතව ඇති අතර සංචාරකයින්ට අවශ්‍ය විනෝදාස්වාද කටයුතු පහසුකම් සහිත ස්ථානයක් ස්ථාපිත වී නොමැතිවීම හඳුනාගෙන ඇත. ඒ අනුව මෙවැනි සංචාරක උද්‍යානයක් ඉදිකිරීම තුළින් ජල ක්‍රීඩා හා නොයෙකුත් විනෝදාස්වාද ක්‍රියාකාරකම් මෙන්ම කලාපයට ආවේණික ස්වභා සෞන්දර්යය විඳීමට සලස්වමින් නණමල්විල මාර්ගය හරහා ඇඹිලිපිටිය නගරය පසුකරමින් යන සංචාරකයින් රඳවා ගැනීමත්, දේශීය විදේශීය සංචාරකයින් ආකර්ෂණය කරගැනීමත් අපේක්ෂා කරයි.

ව්‍යාපෘති අරමුණු

- උඩවලව නගරයට සංචාරකයින් ආකර්ෂණය කරගැනීම
- උඩවලව සංචාරක කලාපයට පැමිණෙන සංචාරකයින් සඳහා නව විනෝදාස්වාද අවස්ථාවන් සලසා දීම
- සංචාරකයින්ට අත්‍යාවශ්‍ය සේවාවන් සැපයීම තුළින් සංචාරක කර්මාන්තය ඉහළ නංවා නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ජලාශ්‍රිත ක්‍රීඩා පහසුකම් සැපයීම
- දවස පුරා ගතකිරීමට හැකිවන විනෝදාත්මක ක්‍රියාකාරකම් වලින් සමන්විත වීම
- රථවාහන නතර කිරීමේ පහසුකම්
- අහාර ලබාගැනීමේ පහසුකම්
- නාගරික ආර්ථිකය සංවර්ධනය


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
උඩවලව සංචාරක උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*2500*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 09

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නගරයේ ප්‍රධාන මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නගරයේ ප්‍රධාන මාර්ග සංවර්ධනය තුළින් මාර්ග තදබදය අවම කිරීම හා ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම*			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව / ප්‍රාදේශීය සභාව*
පිහිටීම් සිතියම				
මාර්ගයේ දිග	*නෝනගම මාර්ගය*	*උඩවලව හංදියේ සිට දක්ෂිණ අධිවේගී මාර්ගයේ වැටිය අන්තර් ඡුවමාරුව දක්වා*		*කි.මී.26.65*
	මිද්දෙණිය මාර්ගය	*දැනට මංතීරු හතර දක්වා සංවර්ධනය කර අවසන් කර ඇති නායකත්ව පුහුණු මධ්‍යස්ථානය අසල සිට කුඹුගොඩ ආර හංදිය දක්වා*		*කි.මී. 2.5*
	මොරකැටිය මාර්ගය	*ඇඹිලිපිටිය නගරයේ සිට යෝජිත රේඛිය උද්‍යානය දක්වා*		*කි.මී.1.35*

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරයට ප්‍රවේශ වීම සඳහා පවතින ප්‍රධාන මාර්ග තුන වන නෝනගම මාර්ගය, මොරකැටිය හා මිද්දෙණිය මාර්ගය තුළින් නගරයට දෙනිකව විශාල වාහන ප්‍රමාණයක් ඇතුළු වීම හා පිටවීම සිදුවේ. ඒ අනුව වර්ෂ 2030 වනවිට අපේක්ෂිත සංවර්ධන ඉලක්කයන් සාර්ථක කරගැනීම සඳහා මෙම මාර්ග සංවර්ධනය හඳුනාගෙන ඇත.

මෙම ප්‍රධාන මාර්ග, පළාත් තුනක් අතර අන්තර් සබඳතා පවත්වා ගැනීමට වැදගත්වන අතර නගරයේ අපේක්ෂිත අනාගත සංවර්ධනයන් සමඟ වැඩිවන රථ වාහන සංඛ්‍යාවට ප්‍රමාණවත් වන පරිදි මාර්ග පුළුල් කර නගර සංවර්ධන කාර්යයන් සිදුකිරීම සඳහා මෙම ප්‍රධාන මාර්ග සංවර්ධනය අත්‍යඅවශ්‍ය වී ඇත.

ව්‍යාපෘති අරමුණු

ඇඹිලිපිටිය නගරයට පිවිසීමට වැඩි වශයෙන් භාවිතා වන ප්‍රධාන මාර්ග සංවර්ධනය තුළින් රථවාහන ගමනාගමනය පහසු කරමින් ප්‍රවාහනය සඳහා අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රථවාහන ගමනා ගමනය පහසුවීම
- රථවාහන නදබය අවම වීම
- නාගරික ආකර්ෂණය වැඩිදියුණු වීම
- නව ආයෝජන අවස්ථා ලැබීම
- ඉඩම් වටිනාකම ඉහළ නැඟීම
- නගරයේ ඉදිරි අපේක්ෂිත සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කිරීම පහසු වීම


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
නෝනගම මාර්ගය උඩවලව හංදියේ සිට පදලංගල වැටිය අන්තර් ඡුවමාරුව දක්වා පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*1350*
මිද්දෙණිය මාර්ගය දැනට මංතීරු හතර දක්වා සංවර්ධනය කර අවසන් කර ඇති, නායකන්ව පුඡුණු මධ්‍යස්ථානය අසල සිට කුඹුගොඩ ආර හංදිය දක්වා පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*125*
මොරකැටිය මාර්ගය ඇඹිලිපිටිය නගරයේ සිට යෝජිත රේඛිය උද්‍යානය දක්වා පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*75*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 10

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නගරයේ සේවා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නගරය තුළ ගමුනාගෙන ඇති ප්‍රධාන සේවා සැපයුම් ස්ථාන ආශ්‍රිත කටයුතු පහසු කිරීම හා මාර්ග තදබදය අවම කිරීම සඳහා සේවා මාර්ග සංවර්ධනය කිරීම.*			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව*
පිහිටීම් සිතියම				
මාර්ගයේ දිග	*රෝහල් වටරවුම් මාර්ගය*			*කි.මී.2.1*
	මෝදරවන වටරවුම් මාර්ගය			*කි.මී. 3.5*
	අක්කර පන්සීය මාර්ගය			*කි.මී.2*
	ආර්ථික මධ්‍යස්ථානය අසළින් පොළ පිටුපස මාර්ගය (ආර්ථික මධ්‍යස්ථානයේ සිට කොන්ක්‍රීට් යාඩ් මාර්ගය දක්වා)			*කි.මී.0.9*
	යෝජිත නව සේවා මාර්ගය (අක්කර පන්සීය මාර්ගයේ සිට ඇඹිලිපිටිය රාජකීය (ප්‍රාථමික) විද්‍යාලය පිටුපසින් මොරකැටිය මාර්ගයේ ලියනෑගම මාර්ගය දක්වා)			*කි.මී. 1.3*

ව්‍යාපෘතියේ අදාළත්වය

නගර මධ්‍යය ප්‍රදේශයට ඉනා ආසන්නව පිහිටි යෝධගම ප්‍රදේශයට ප්‍රධාන ප්‍රවේශ මාර්ගයක්ව පවතින මෝදරවාන මාර්ගය හා රෝහල් මාර්ගය නාගරික ජනතාව භාවිතා කරන ප්‍රධාන සේවා මාර්ග ලෙස හඳුනාගෙන ඇත.

නවද නිඟුර ආර සිට නෝනගම මාර්ගයෙන් ආරම්භ වන අක්කර පන්සිය මාර්ගය නගරයට ගමන් කිරීමට භාවිතා කරනු ලබන අතර එම මාර්ගයද සේවා මාර්ගයක් ලෙස සංවර්ධනය කළ යුතුව ඇත.

එමෙන්ම ඇඹිලිපිටිය නගර මධ්‍යයේ නෝනගම මාර්ගය ආශ්‍රිතව පිහිටා ඇති ඇඹිලිපිටිය රාජකීය විද්‍යාලය ආශ්‍රිතව ඇතිවන මාර්ග නදබදය අවම කිරීම සඳහා නව සේවා මාර්ගයක් මොරකැටිය මාර්ගයට සමාන්තරව ඉදිකිරීම සඳහා යෝජනා කර ඇති අතර එමඟින් පාසල් වේලාවන් වලදී ප්‍රධාන මාර්ගයේ ඇතිවන දැඩි මාර්ග නදබදය අවමකර ගැනීමේ හැකියාව ඇතිවේ.

ව්‍යාපෘති අරමුණු

- ඇඹිලිපිටිය නගරයේ ප්‍රධානතම රෝහල වන ඇඹිලිපිටිය දිස්ත්‍රික් මහ රෝහල ආශ්‍රිත සෞඛ්‍ය කටයුතු සඳහා දෛනිකව පැමිණෙන ජනතාවගේ හා උසාවිය ඇතුළු රාජ්‍ය ආයතන වෙත පරිපාලන අවශ්‍යතා සඳහා පැමිණෙන ජනතාවගේ කටයුතු පහසු කිරීම සඳහා පවතින රෝහල් මාර්ගය පුළුල්කර සංවර්ධනය කිරීම.
- ප්‍රධාන මාර්ගයට ආසන්නව මඟී ජනතාව වැඩි වශයෙන් ගැවසෙන විවිධ සේවා ස්ථාන(මහජන පොළ, ආර්ථික මධ්‍යස්ථානය, ඇඹිලිපිටිය රාජකීය විද්‍යාලය) ආශ්‍රිතව පවතින මාර්ග නදබදය අවම කිරීම සඳහා සේවා මාර්ග සංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික සේවා පහසුකම් ලබාගැනීමට පහසුවෙන් ළඟාවිය හැකිවීම
- ඉඩම් වටිනාකම ඉහළ යාම
- නාගරික යටිතල පහසුම් විධිමත් වීම


මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
රෝහල් වටරවුම් මාර්ගය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*63*
මෝදරවන වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*105*
මෝදරවන වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*60*
ආර්ථික මධ්‍යස්ථානය අසළින් පොළ පිටුපස මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*27*
අක්කර පන්සීය මාර්ගයේ සිට ඇඹිලිපිටිය ප්‍රාථමික විද්‍යාලය පිටුපසින් මොරකැටිය මාර්ගයේ ලියනෑගම මාර්ගය දක්වා නව සේවා මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*52*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 11

ව්‍යාපෘති මාතෘකාව	චන්ද්‍රිකා වැව ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නාගරික පානීය ජල හා කෘෂිකාර්මික ජල අවශ්‍යතාවය සපුරාලීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (පැල්මඩුල්ල - නොනගම මාර්ගය)			
පිහිටීම් සිතියම				
ඉඩමේ අයිතිය	මහවැලි අධිකාරිය			
රේඛීය උද්‍යානයේ දිග	අක්. 1082			

ව්‍යාපෘතියේ අදාළත්වය

නාගරික ජනතාවගේ පානීය ජලය සැපයීමේ ප්‍රධානතම මූලාශ්‍රය චන්ද්‍රිකා වැව වන අතර වර්ෂ 2030 සඳහා අපේක්ෂිත නේවාසික ජනගහනයට හා කර්මාන්ත කලාපයට අවශ්‍ය පානීය ජල ඉල්ලුම දැනට පවතින ජල ඉල්ලුමට වඩා වැඩි ඉල්ලුමක් ලෙස හඳුනාගෙන ඇති අතර ඒ සඳහා අවශ්‍ය ජලය ලබාගැනීම සඳහාද චන්ද්‍රිකා වැව ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන ඇත.

කෘෂිකාර්මික නගරයක් ලෙස ස්ථාපිට වී ඇති ඇඹිලිපිටිය නගරයේ ජනතාවගේ මූලික ජීවනෝපාය කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිතව සිදුවන අතර ඒ සඳහා අවශ්‍ය ජලය යල හා මහ කන්න දෙක සඳහා ප්‍රමාණවත් නොවීම ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත. වී හා අනෙකුත් කෘෂිකාර්මික බෝග වගාකිරීම සඳහා ජලය සැපයෙන වැව් හා වාරි ඇළ වලට උඩවලව ජලාශයෙන් හා චන්ද්‍රිකා වැව තුළින් ජලය සැපයේ. මේ අනුව නගරය තුළ පවතින ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙසින් වැසි රහිත වියළි කාලගුණික තත්ත්වයන් තුළදීද අවශ්‍ය වන ජලය රඳවා නබාගැනීම සඳහා චන්ද්‍රිකා වැව ප්‍රතිසංවර්ධනය කරමින් එහි රැඳවුම් ධාරිතාවය ඉහළ නැංවීම අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

නගරයේ ප්‍රධාන සම්පතක් ලෙස පවතින මෙම වැවේ වැව් රක්ෂිනය තුළ අනවසර ඉදිකිරීම් හඳුනාගෙන ඇත. පානීය ජලය ලබාගන්නා ප්‍රධාන ජල මූලාශ්‍රය ලෙසින් ඉදිරි අවශ්‍යතා සඳහා ආරක්ෂා කරගැනීමට නියමනා යොදා රක්ෂිත ප්‍රදේශය තුළ හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සීමා කර ඇත.

ර්ට අමතරව මෙම වැව ආශ්‍රිතව පරිසර හිතකාමී උද්‍යාන දෙකක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක් හඳුනාගෙන ඇති අතර ඒ තුළින් වැවට හානියක් නොවන පරිදි සංචාරකයින් සඳහා වැව නැරඹීමේ අවස්ථාව සලසා දීමට අපේක්ෂා කර ඇත.

ව්‍යාපෘති අරමුණු

- වර්ෂ දී නාගරික බල ප්‍රදෙශය 2030 සඳහා අපේක්ෂිත පානීය ජල ඉල්ලුම සපුරාලීම
- කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලබාදෙමින් කෘෂි නිෂ්පාදනයන් ඉහළ නැංවීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- පානීය ජල සැපයුම විධිමත් වීම
- සංචාරක ආකර්ෂණය ඉහළ නැගීම
- චන්ද්‍රිකා වැව හා ඒ ආශ්‍රිත පරිසරය ආරක්ෂා වීම


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
චන්ද්‍රිකා වැව ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*1500*
චන්ද්‍රිකා වැව ආශ්‍රිත උද්‍යාන ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*75*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මහවැලි අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 12

ව්‍යාපෘති මාතෘකාව	ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	කාබනික කෘෂිකාර්මික නිෂ්පාදන ඇතුළු සියලු කෘෂිකාර්මික බෝග එක්රැස් කිරීම හා බෙදාහැරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මිද්දෙණිය මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	ඇඹිලිපිටිය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය			
ඉඩමේ අයිතිය	ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය			
භූමි ප්‍රමාණය	අක්. 2			

ව්‍යාපෘතියේ අදාළත්වය

කෘෂිකාර්මික නිෂ්පාදන එක්රැස් කිරීමේ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ වී ඇති මෙම ආර්ථික මධ්‍යස්ථානයට අපේක්ෂිත අරමුණු අපේක්ෂිත මට්ටමින් සාර්ථක කරගත නොහැකි වී ඇත. මෙම ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත ගොඩනැගිලි විවිධ භාවිතයන් සඳහාද, කිහිපයක් වසා දමාද පවතී. ඒ අනුව නගරයේ ගොවින් කෙසෙල් හා එළවළු අස්වනු ආර්ථික මධ්‍යස්ථානයට ගෙන එනු ලබන අතර බොහොමයක් ගොවින් ආර්ථික මධ්‍යස්ථානයට නොපැමිණ අනරමැදි වෙළෙදුන් හට නම නිෂ්පාදන විකුණනු ලැබේ.

ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීමේ මූලික පරමාර්ථය බවට පත්ව ඇත්තේ කලාපීය ගොවි ජනතාවගේ කෘෂිකාර්මික නිෂ්පාදන සාධාරණ මිල ගණන් යටතේ මිලදී ගනිමින් නගරයේ ආර්ථිකයට සෘජු දායකත්වයක් සැපසීමය. මේවන විටත් ක්‍රියාකාරීත්වයේ පවතින, නගර මධ්‍යයේ ජනාකීර්ණ ප්‍රදේශයක පිහිටි මෙම ආර්ථික මධ්‍යස්ථානය සියලු දිනයන්හි ජනතාවට විවෘතව පවතින කෘෂි නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන පවතී.

දෛනිකව වැඩිවන රසකාරක හා ගුණාත්මක නත්ත්වයෙන් පහළ නිෂ්පාදන වෙනුවට කාබනික නිෂ්පාදන සඳහා මූලික තැනක් ලබාදීම තුළින් ජනතා ඉල්ලුම වැඩි නිෂ්පාදන අලෙවිසැලක් බවට පත්කිරීමට අපේක්ෂා කර ඇත. නවද තුංකම, කුට්ටිගල, උඩවලව හා මොරකැවිය කෘෂි බෝග අස්වනු එකතුකිරීමේ මධ්‍යස්ථාන හා සම්බන්ධව ක්‍රියාකරන ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් බවට පත් කරමින් කලාපීය නිෂ්පාදන විධිමත් ක්‍රමවේදයකට වෙළඳපොළට නිකුත් කිරීමට මෙම මධ්‍යස්ථානය භාවිතා කෙරේ.

මේ අනුව කෘෂි කර්මාන්තය සඳහා මුල් තැනක් ලබාදෙමින් කලාපීය ගුණාත්මක කෘෂිකාර්මික බෝග නිෂ්පාදනය ඉහළ නංවමින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අත්‍යාවශ්‍ය ව්‍යාපෘතියක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- නගරය පුරා ව්‍යාප්තව ඇති කෘෂි නිෂ්පාදන සම්බන්ධ ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය බවට පත්කිරීම.
- ප්‍රදේශයේ පවතින ප්‍රධානතම කාබනික කෘෂි නිෂ්පාදන අලෙවිසැල බවට පත්කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- කාබනික නිෂ්පාදන අළෙවිය තුළින් වැඩි ප්‍රතිලාභ අත්වීම
- නගරයට පැමිණෙනෙන සංචාරණ ජනගහනය සඳහා නගරයට ආවේණික කාබනික නිෂ්පාදන මිලදී ගැනීමේ හැකියාව
- නගරය පුරා පවතින කෘෂිබෝග නිෂ්පාදන නොරතුරු හුවමාරු කරගැනීමේ පහසුව


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*100*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 13

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නගරයේ ගඳුනාගත් කුඩා ප්‍රමාණයේ වැව් 9ක් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නගරයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ප්‍රමාණවත් පරිදි ලබාදීම සඳහා දැනට පවතින වැව් වල රැඳවුම් ධාරිතාවය වැඩිකර ප්‍රතිසංස්කරණය කිරීම.*			
පිහිටීම	***පළාත***	***දිස්ත්‍රික්කය***	***ප්‍රා. ලේ. කොට්ඨාසය***	***පළාත් පාලන ආයතනය***
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව හා ප්‍රාදේශීය සභාව*
පිහිටීම් සිතියම				

වැව	*භූමී ප්‍රමාණය*	*ඉඩම් අයිතිය*
චන්ද්‍රිකා වැව	*හෙක්.434*	*මහවැලි අධිකාරිය*
වරාකැටිය ආර වැව	*හෙක්. 11.9*	*මහවැලි අධිකාරිය*
මැදඅාර වැව	*හෙක්.3.1*	*මහවැලි අධිකාරිය*
හිඟුර ආර වැව	*හෙක්. 15.6*	*වාරිමාර්ග දෙපාර්තමේන්තුව*
අටේ ඇළ වැව	*හෙක්.3.1*	*මහවැලි අධිකාරිය*
අලුත් වැව	*හෙක්.6.1*	*මහවැලි අධිකාරිය*
එපිටගොඩ වැව	*හෙක්. 4*	*මහවැලි අධිකාරිය*
මහ වැව	*හෙක්. 8.1*	*මහවැලි අධිකාරිය*
නෙලුම් වැව	*හෙක්.6.1*	*මහවැලි අධිකාරිය*
කන්විගල වැව	*හෙක්. 3*	*මහවැලි අධිකාරිය*

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරයේ පානීය හා කෘෂිකාර්මික ජල අවශ්‍යතා සඳහා චන්ද්‍රිකා වැව තුළින් ජලය ලබාගන්නා අතරම කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වන ජලය රඳවා ගැනීමට නගරය පුරා ව්‍යාප්තව ඇති කුඩා පරිමාණයේ වැව් හා උඩවලව දකුණු ඇළ මාර්ග පද්ධතිය භාවිතා කෙරේ.

උඩවලව ජලාශයේ දකුණු ඇළ මඟින් චන්ද්‍රිකා වැව ඇතුළු ඇළ මාර්ග පද්ධතියටම ජලය සැපයෙන අතර ඒ ආශ්‍රිත පවතින කුඩා වැව් තුළ ජලය රඳවා නබාගනිමින් කෘෂිකාර්මික කටයුතු සඳහා මුදාහැරේ.

දැනට මෙම නගරය තුළ ව්‍යාප්තව පවතින හෙක්ටයාර් 3ට වැඩි බොහොමයක් වැව් ප්‍රතිසංස්කරණය කළ යුතු තත්ත්වයක පවතින අතර සමහර වැව් වල රැඳවුම් ධාරිතාවය අඩුවෙමින් ගොඩවී යාමක් හඳුනාගෙන ඇත.
මෙම තත්ත්වය තුළ නගරයේ ක්‍රියාකාරිත්වයට මූලික ශක්තිය සපයන ජල සම්පත ආරක්ෂා කිරීම සඳහා චන්ද්‍රිකා වැව ඇතුළු අනෙකුත් කුඩා වැව් පද්ධතිය ආරක්ෂා කළ යුතු වේ. එමෙන්ම ඇඹිලිපිටිය නගරයේ කෘෂිකාර්මික හා පානීය ජල අවශ්‍යතා සපුරාලනු ලබන චන්ද්‍රිකා වැවෙහි පවතින රැඳවුම් ධාරිතාවය වැඩි දියුණු කිරීම සඳහා චන්ද්‍රිකා වැව ගැඹුරු කර ප්‍රතිසංස්කරණය කළ යුතු වේ.

ව්‍යාපෘති අරමුණු

- වියළි කාලගුණික නියං සහිත කාලවලදී වගා කටයුතු වලට අවශ්‍ය ප්‍රමාණවත් නරම් ජල ධාරිතාවයක් රඳවා නබාගැනීම
- පවතින කුඩා වැව් පද්ධතිය ආරක්ෂා කරගැනීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ජලය ලැබීම
- කෘෂිකාර්මික නිෂ්පාදන කටයුතු ඉහළ නැඟීම
- නාගරික ආකර්ෂණය වැඩිවීම
- පරිසර පද්ධතිය සුරක්ෂින වීම

මූල්‍ය සැලැස්ම

වැව	*ව්‍යාපෘති කාලසීමාව*	*ව්‍යාපෘති පිරිවැය*
වරාකැටිය ආර වැව	*අවු.1*	*මිලියන 297.5*
මැදඅාර වැව	*අවු.1*	*මිලියන 77.5*
හිඟුර ආර වැව	*අවු.1*	*මිලියන 390*
අටේ ඇළ වැව	*අවු.1*	*මිලියන 77.5*
අලුත් වැව	*අවු.1*	*මිලියන 152.5*
එපිටගොඩ වැව	*අවු.1*	*මිලියන 100*
මඟ වැව	*අවු.1*	*මිලියන 202.5*
නෙලුම් වැව	*අවු.1*	*මිලියන 152.5*
කන්විගල වැව	*අවු.1*	*මිලියන 75*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මහවැලි අධිකාරියට අයත් වැව් මහවැලි අධිකාරිය විසින්ද අනෙක් වැව් වාර්මාර්ග දෙපාර්තමේන්තුව විසින් ද නඩත්තු කෙරේ.

ව්‍යාපෘතිය 14

ව්‍යාපෘති මාතෘකාව	*උඩවලව නාගරික වන උද්‍යානය හා රථගාල ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*උඩවලවට පැමිණෙන සංචාරකයින්ට අවශ්‍ය විවේකිය පහසුකම් වැඩිදියුණු කිරීම*			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව*
ප්‍රවේශය	*මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (තණමල්විල මාර්ගය)*			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*ලදුකැලෑ ප්‍රදේශය*			
භූමි ප්‍රමාණය	*අක්.10*			
ඉඩම් අයිතිය	*මහවැලි අධිකාරිය*			

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 සඳහා යෝජිත සංචාරක සේවා කලාපය යටතේ මෙම නාගරික උද්‍යානය යෝජනා කර ඇත. දැනට ලඳු කැලෑ ප්‍රදේශයක්ව පවතින මෙම ප්‍රදේශය තුළ පවතින තුරුලතා ආදිය ආරක්ෂා කරගනිමින් නාගරික උද්‍යානයක් ඇති කිරීමට අපේක්ෂිත වේ. තණමල්විල මාර්ගය හරහා උඩවලව ජලාශය නරඹා යන සංචාරකයින්ට මෙම උද්‍යානය තුළ රැඳී සිටීමට හා රථවාහන නතර කිරීමටද ඉඩ පහසුකම් සහිතව මෙම උද්‍යානය ඉදිකිරීමට අපේක්ෂා කර ඇත.

ව්‍යාපෘති අරමුණු

- නණමල්විල මාර්ගය හරහා ගමන් ගන්නා සංචාරකයින්ට උඩවලව ජලාශය ආශ්‍රිත පරිසරය විඳිමින් ගිමන් හැරීමට ප්‍රමාණවත් ඉඩකඩ සැලසීම
- පවතින පරිසර පද්ධතිය ආරක්ෂා කරගැනීම

ව්‍යාපෘතිය නැළින් සැපයෙන ප්‍රතිලාභ

- උඩවලව ජලාශය නැරඹීමට පැමිණෙන සංචාරකයින් හට ඒ ආශ්‍රිතව විවේකව ගත කිරීමේ අවස්ථාව උදාවීම
- වාහන නතර කිරීමේ පහසුකම්
- ස්වභාවික පරිසරය ආරක්ෂිත වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
උඩවලව නාගරික වන උද්‍යානය හා රථගාල ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය	*200*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව


ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදු කෙරේ.

ව්‍යාපෘතිය 15

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නගරයේ විකල්ප මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*
ව්‍යාපෘති යෝජනාව	*නගරයේ මාර්ග තදබදය අවම කරමින් නාගරික සේවා විධිමත් කිරීම සඳහා විකල්ප මාර්ග ඇති කිරීම*
ව්‍යාපෘති විස්තරය	

පිහිටීම	***පළාත***	***දිස්ත්‍රික්කය***	***ප්‍රා. ලේ. කොට්ඨාසය***	***පළාත් පාලන ආයතනය***
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව / ප්‍රාදේශීය සභාව*

පිහිටීම් සිතියම



මාර්ගයේ දිග	*යෝජිත පළමු විකල්ප මාර්ගය*	*කුඹුගොඩ ආර ඉංදියේ සිට ඇරඹෙන කඩදාසි කම්හල මාර්ගය කදුරුගස් ආර හරහා කරවිල යාය මාර්ගය ඔස්සේ නෝනගම මාර්ගය දක්වා වන විකල්ප මාර්ගය*	*කි.මී.8.9*
	යෝජිත දෙවන විකල්ප මාර්ගය	*කොළඹ පාර 100 කණුව සිට පනාමුර මාර්ගය හරහා මෝදරවාන මාර්ගය මිද්දෙණිය මාර්ගය දක්වා වන විකල්ප මාර්ගය*	*කි.මී. 5.9*
	යෝජිත තෙවන විකල්ප මාර්ගය	*ඟල්මිල්ලකැටිය පාසල් මාර්ගය ඟතර ඇළ මාර්ගය දක්වා සම්බන්ධ කරමින් වෙහෙරගම මාර්ගය ඔස්සේ මොරකැටිය මාර්ගය දක්වා වන විකල්ප මාර්ගය*	*කි.මී.3.7*

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 වනවිට නගර මධ්‍යය ප්‍රදේශය සඳහා අපේක්ෂිත සංවර්ධනය සමඟ නෝනගම, මොරකැටිය හා මිද්දෙණිය ප්‍රධාන මාර්ග ආශ්‍රිතව ඇතිවිය හැකි මාර්ග නදබදය අවම කරමින් නාගරික කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා විකල්ප මාර්ග සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

එමෙන්ම නිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශය ආශ්‍රිත යෝජිතව පවතින කර්මාන්ත කලාපයේ ක්‍රියාකාරකම් සමඟ අමුද්‍රව්‍ය හා නිෂ්පාදන ප්‍රවාහනය කෙරෙන බර වාහන ප්‍රමාණය වැඩි වන අතර එම බර වාහන ගමන් කිරීමේදී නගරයේ ඇතිවිය හැකි රථවාහන නදබදය අවම කිරීම සඳහා මෙම විකල්ප මාර්ග සංවර්ධනය අත්‍යාවශ්‍ය වේ.

මෙහිදී නගරයට ඇතුල්වීම සඳහා පවතින ප්‍රධාන පිවිසුම් මාර්ග සම්බන්ධ කරමින් විකල්ප මාර්ග හඳුනාගෙන පැවතීම තුළින් නගර මධ්‍යය ප්‍රදේශයට ගමන් ගන්නා වාහන ප්‍රමාණය අඩුකර ගැනීමට අපේක්ෂා කර ඇත.

ඉදිරි සංවර්ධන ක්‍රියාමාර්ග සමඟ මොණරාගල කර්මාන්ත කලාප ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවාහන රථ ඇඹිලිපිටිය නගරයේ කර්මාන්ත කලාපය වෙත පැමිණෙන විට නගර මධ්‍යය හරහා ගමන් නොකර මොරකැටිය මාර්ගය හා සම්බන්ධ විය හැකි විකල්ප මාර්ගය ඔස්සේ නෝනගම මාර්ගයට සම්බන්ධ විය හැකි වීම. නෝනගම මාර්ගය හරහා නැවතත් කර්මාන්ත කලාපයට සම්බන්ධ වීමට කරවිල යාය හා කඩදාසි කම්හල මාර්ගය ආශ්‍රිත විකල්ප මාර්ගය තුළින් අවස්ථාවද උදාවේ.

විකල්ප මාර්ග සඳහා හඳුනාගෙන ඇති ප්‍රධාන විකල්ප මාර්ග දැනට පවතින පටු මාර්ග හා සම්බන්ධ කරමින් එම මාර්ග පුළුල්කර සංවර්ධනය කිරීම තුළින් ඒ ආශ්‍රිත කුඩා නගර වල සංවර්ධන කටයුතුද පහසු කරගැනීමේ අවස්ථාවද උදාවේ.

ව්‍යාපෘති අරමුණු

- නෝනගම මාර්ගය ඔස්සේ පදලංගල දෙසින් හම්බන්නොට වරායේ සිට කොළඹ හා වෙනත් ප්‍රදේශ වලට ගමන් කරන බර වාහන නගර මධ්‍යය ප්‍රදේශය මගහැර ගමන් කරවීම තුළින් රථවාහන නදබදය අවම කිරීම.
- නිඟුර හා කුඹුගොඩ ආර ප්‍රදේශයේ යෝජිත කර්මාන්ත කලාපය වෙත ගමන් ගන්නා බර වාහන නගර මධ්‍යය ප්‍රදේශයෙන් බැහැරව නෝනගම, මිද්දෙණිය හා පනාමුර මාර්ග වෙත සම්බන්ධ කර ගමන්කරවීම
- නව ආයෝජන අවස්ථා ලබාගැනීම
- මොණරාගල දෙසින් මොරකැටිය මාර්ගය ඔස්සේ පැමිණෙන වාහන නගර මධ්‍යය ප්‍රදේශය මග හරිමින් කොළඹ දෙසට ගමන්කරවීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගය වෙත යොමුකරවීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රථ වාහන නදබදයකින් තොරව නිෂ්පාදන ප්‍රවාහනයට අවස්ථාව සැලසීම
- නාගරික ඉඩම් වටිනාකම ඉහළ යාම
- කලාපීය කර්මාන්ත නිෂ්පාදන කටයුතු සාර්ථක වීම

මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
කුඹුගොඩ ආර හංදියේ සිට කඩදාසි කම්හල මාර්ගය කදුරුගස් ආර හරහා කරවිල යාය මාර්ගය ඔස්සේ නෝනගම මාර්ගය දක්වා මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*311*
කොළඹ පාර 100 කණුව සිට පනාමුර මාර්ගය හරහා මෝදරවාන මාර්ගය මිද්දෙණිය මාර්ගය දක්වා මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*206*
හල්මිල්ලකැටිය පාසල් මාර්ගය හතර ඇළ මාර්ගය දක්වා සම්බන්ධ කරමින් වෙහෙරගම මාර්ගය ඔස්සේ මොරකැටිය මාර්ගය දක්වා මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*129.5*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘනිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 16

ව්‍යාපෘති මාතෘකාව	*ඇඹිලිපිටිය නව නගරයේ කෙටිදුර සේවා බස්රථ නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*නගරය අභ්‍යන්තර ප්‍රවාහන පහසුකම් විධිමත් කිරීම හා ප්‍රධාන බස්නැවතුම්පොළෙහි හදබදය අවමකිරීම සඳහා කුඩා ප්‍රමාණයේ බස්නැවතුම්පොළක් නව නගරයේ ඉදිකිරීම*			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව*
ප්‍රවේශය	*මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මිද්දෙණිය මාර්ගය)*			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*මාර්ගස්ථ හා මැටි ප්‍රවාහන අධිකාරියේ කාර්යාලය හා හිස් බිම*			
භූමි ප්‍රමාණය	*අක්. 0.6 (පර්චි.96)*			

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරය තුළ දැනට පවතින ප්‍රධාන බස්නැවතුම්පොළ තුළ පවතින සීමිත ඉඩකඩ බස්රථ හැසිරවීම හා නවතා තැබීමට ප්‍රමාණවත් නොවන අතර එමඟින් මඟින්ට සිදුවන පිඩාව අවම කරමින් නාගරික ප්‍රවාහන කටයුතු විධිමත් කිරීම සඳහා නගර මධ්‍යය ප්‍රදේශයට ආසන්නව මඟී ජනතාවට පහසුවන පරිදි ළඟ ගමන් සේවා බස්රථ නැවතුමක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- ප්‍රධාන බස් නැවතුම ආශ්‍රිත පවතින නදබදය අවම කිරීම.
- පොදු ප්‍රවාහන සේවා විධිමත් කිරීම
- නගර මධ්‍යයේ ඇතිවන රථවාහන නදබදය අවම කිරීම.
- පරිපාලන මධ්‍යස්ථානය නව නගරය සඳහා සේවා අවශ්‍යතා මත පැමිණෙන ජනතාවට හා කාර්යාල සේවකයන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- ප්‍රවාහන සේවා කටයුතු විධිමත් වීම
- පරිපාලන සේවා කටයුතු ලබාගැනීමට පැමිණෙන ජනතාවගේ ප්‍රවාහන කටයුතු පහසු වීම


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
ඇඹිලිපිටිය නව නගරයේ ළඟාසේවා බස්රථ නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*200*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 17

ව්‍යාපෘති මාතෘකාව	ගොවි පුහුණු හා බීජ අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නවීන තාක්ෂණය සඳහා ගොවීන් පුහුණු කිරීම හා නවීන බිජවර්ග හඳුන්වාදීම තුළින් කලාපීය කෘෂි නිෂ්පාදන කටයුතු ප්‍රවර්ධනය			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (රත්නපුර - නෝනගම මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	කුඹුරු හා ලඳු කැලෑ			
ඉඩමේ අයිතිය	මහවැලි අධිකාරිය බලපතුලාභී ඉඩම්			
භූමි ප්‍රමාණය	අක්. 100			

ව්‍යාපෘතියේ අදාළත්වය

කෘෂිකාර්මික ප්‍රදේශයක් වන ඇඹිලිපිටිය නගරය ආශ්‍රිතව වී, එළවළු, පළතුරු හා අනිරේක බෝග ඇතුළු බොහෝ වගාවන් සිදුකරන අතර වියළි කාලගුණික තත්ත්වයන් තුළ වගාකිරීම සඳහා ප්‍රමාණවත් නරම් ජලය නොලැබීම හා ගොවින්ගේ කෘෂි නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් නොලැබීම යනාදී ගැටළු කෘෂි කර්මාන්තය ආශ්‍රිත පවතින ගැටළු ලෙස හඳුනාගෙන ඇත.

බීජ අභිජනන මධ්‍යස්ථානයක් ඇති කිරීම තුළින් වියළි කාලගුණික තත්ත්වයන් සඳහා ඔරොත්තු දෙන බෝග වර්ග හඳුනාගැනීමත්, අඩුකාලීනව අස්වනු ලබාගත හැකි බීජ වර්ග ගොවීන්ට හඳුන්වාදීමත් අපේක්ෂා කර ඇත.

ගොවි පුහුණු මධ්‍යස්ථානයක් ඇතිකිරීම තුළින් කලාපීය ගොවි ජනතාවට නව නාක්ෂණික ඥානය ලබාදීම හා රසායනික භාවිතය අවම කරමින් ගුණාත්මක බෝග වගාවන් සඳහා කාබනික පොහොර භාවිතය ඉහළ නැංවීම ආදී ක්‍රමෝපායන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදී කාර්යයන් සිදු කිරීම අපේක්ෂා කරයි.

ව්‍යාපෘති අරමුණු

- නවීන නාක්ෂණය භාවිතය පිළිබඳ ගොවීන්ට අවශ්‍ය දැනුම ලබාදීම
- ප්‍රදේශයට ආවේණික නව බීජ වර්ග හඳුන්වාදීම
- කලාපීය කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- කලාපයට ආවේණික බීජ වර්ග ලබාගත හැකිවීම
- ගොවීන්ට කෘෂි කර්මාන්තය ආශ්‍රිත නවීන නාක්ෂණික දැනුම ලබාගත හැකිවීම
- කෘෂි කර්මාන්තය ආශ්‍රිත සේවා වැඩිදියුණු වීම
- අනෙකුත් ප්‍රදේශ තුළ ගොවි ජනතාවටද ගොවි පුහුණු වැඩසටහන් සඳහා සහභාගී විය හැකි වීම

මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
ගොවි පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*500*
බීජ අභිජනන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*1500*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ගොවිජන දෙපාර්තමේන්තුව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 18

ව්‍යාපෘති මාතෘකාව	ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත රථගාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	පාසල් වේලාවන් තුළ පාසල් ළමුන් ප්‍රවාහන බස්රථ හා වෑන් රථ මෙන්ම පාසලට පැමිණෙන අනෙකුත් වාහන ගාල්කර කැබීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	පළාත් සභා මාර්ග (කොන්ක්‍රීට් යාඩ් මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	හිස් ඉඩම			
ඉඩමේ අයිතිය	ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය			
භූමි ප්‍රමාණය	අක්.1.5			

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරය තුළ පවතින ප්‍රධාන හා ජනප්‍රිය පාසලක් වන ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය සඳහා පැමිණෙන සිසුන් රැගත් බස්රථ හා අනෙකුත් වාහන පාසලට ආසන්නයෙන් නතර කර නැබීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. මෙමඟින් අවට මාර්ගයන්හි පාසල් වේලාවන් වලදී සිදුවන දැඩි මාර්ග නදබදය අවම කිරීමක් සිදුකළ හැකිය. තවද පාසල් සිසුන්ට පාසල් භූමිය තුළදීම අදාළ රථවාහන තුළට ගොඩවීමට හා බැසීමට සැලැස්වීම තුළින් සිසුන්ගේ ආරක්ෂාවද සැලසීම සිදුකළ හැක. එබැවින් මෙම ව්‍යාපෘතිය කාලීන අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලයේ සිසුන් ප්‍රවාහන බස්රථ, වෑන් රථ හා පාසලට පැමිණෙන වාහන නතර කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ සැපයීම

කොන්ක්‍රීට් යාඩ් මාර්ගය අවට පාසල් වේලාවන් වල ඇතිවන දැඩි මාර්ග නදබදය අවම කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- පාසල් බස්රථ හා අනෙකුත් සිසු ප්‍රවාහන රථ වාහන හැසිරවීමේ පහසුව
- පාසල් කාල වේලාවන්හිදී අපහසුවකින් තොරව සිසු ප්‍රවාහන රථවාහන නතර කර නැබීමේ පහසුව


මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත රථශාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	*25*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 19

ව්‍යාපෘති මාතෘකාව	*උඩවලව දකුණු ඇළ මාර්ගය සංචාරක ගමන් පථයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*සංචාරක ගමන් පථයක් ස්ථාපිත කරමින් නගරයේ ස්වභාව සෞන්දර්යය භුක්ති විඳීමේ අවස්ථාව සලසා දීම හා නගරයට පවතින සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම*			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය නගර සභාව / ප්‍රාදේශීය සභාව*
ප්‍රවේශය	*ප්‍රාදේශීය මාර්ග (උඩවලව දකුණු ඇළ මාර්ගය)*			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	*මෙම මාර්ගය උඩවලව දකුණු ඇළේ වම් ඉවුර වන අතර එය සාමාන්‍යය ගමන් මාර්ගයක් වශයෙන් භාවිතයේ පවතී*			
ඇළ මාර්ගයේ දිග	*කි. මී. 17.3*			

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 දක්වා වන ඇඹිලිපිටිය නගර සංවර්ධන සැලැස්ම මඟින් යෝජිත සංචාරක කලාපය ආශ්‍රිතව පිහිටා ඇති උඩවලව ජලාශයේ සිට ආරම්භ වන උඩවලව දකුණු ඇළ මාර්ගය නගරයේ කෘෂිකාර්මික කටයුතු සඳහා මෙන්ම චන්ද්‍රිකා වැව පෝෂණය කිරීම සඳහාද ජලය සපයාදෙන ප්‍රධාන ජල මූලාශ්‍රයක් ලෙස පවතී. එම ඇළ මාර්ගය ඔස්සේ නගරයට ආවේණික පරිසර ලක්ෂණ නරඹමින් නගර මධ්‍යයට ප්‍රවේශ විමට මෙම මාර්ගය යෝජනාකර ඇත.

එමෙන්ම යෝජිත සංචාරක කලාපයට පැමිණෙන සංචාරකයින්ට ඒ ආශ්‍රිත සංචාරක අන්දැකීම් විඳගැනීමට අමතරව නගරයට ප්‍රවිෂ්ට වෙමින් කලාපයට ආවේණික ප්‍රණීත ආහාර රස විඳීමට හා චන්ද්‍රිකා වැව, කාවන්නිස්ස වැව නාගරික උද්‍යානය නැරඹීමේ අවස්ථාවද උදාකරදීම සඳහා මෙම ගමන් පථය සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

මෙමඟින් නගරය තුළ පවතින සංචාරක ආකර්ශණීය ප්‍රදේශ වෙත පහසුවෙන් යොමුකරවීමත්, නාගරික කෘෂි නිෂ්පාදන ජනප්‍රිය කිරීමත් ආදී ආර්ථිකමය ප්‍රතිලාභ අන්කර ගැනීමේ අපේක්ෂාව ඇතිව මෙම ව්‍යාපෘතිය සිදුකිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- උඩවලව සංචාරක කලාපයට පැමිණෙන සංචාරකයින් සඳහා නව සංචාරක අන්දැකීම් ලබාදෙමින් නගරය තුළට ආකර්ෂණය කරගැනීම
- උඩවලවට පැමිණෙන සංචාරකයින් ඇඹිලිපිටිය වෙළඳ නගරය වෙනද යොමුකරවීම තුළින් නාගරික ආර්ථිකය ශක්තිමත් කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නව සංචාරක අන්දැකීම් ලැබීම
- උඩවලව සිට නගරයේ ස්වභාවික සිරි නරඹමින් නගර මධ්‍යයට පිවිසීමේ පහසුව
- සංචාරක ආකර්ෂණය
- ඉඩම් වටිනාකම් ඉහළ යෑම
- ඇළ මාර්ගය ආරක්ෂා වීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
උඩවලව දකුණු ඇළ මාර්ගය සංචාරක ගමන් පථයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*200*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම මහවැලි අධිකාරිය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 20

ව්‍යාපෘති මාතෘකාව	යෝධගම ක්‍රීඩාංගණය හා නාගරික උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නගර මධ්‍යය ප්‍රදේශය තුළ පවතින ආකර්ෂණය වැඩිදියුණු කරමින් නාගරික ජනතාවට අවශ්‍ය ක්‍රීඩා, විවේක හා විනෝද කටයුතු පහසුකම් සැලසීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (මිද්දෙණිය මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	යෝධගම ක්‍රීඩාංගණය හා ලඳු කැලෑ ප්‍රදේශය			
ඉඩමේ අයිතිය	නිවාස සංවර්ධන අධිකාරිය			
භූමි ප්‍රමාණය	අක්.18			

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 සඳහා අපේක්ෂිත කලාපීකරණ සැලැස්මේ ආයතනික කලාපය තුළට මෙම ව්‍යාපෘතිය ඇතුළත් වේ. ආයතනික කටයුතු සඳහා පැමිණෙන ජනතාව හා මිද්දෙණිය මාර්ගය දෙසින් නගරයට ඇතුළුවන හා පිටවන ජනතාවට මෙන්ම නගරයේ ජීවන්වන ජනතාවට උෂ්ණත්වය නරමක් වැඩි වියළි කලාපීය ලක්ෂණ සහිත මෙම නගරය තුළ පවතින උණුසුම් ස්වභාවය මඟහරිමින් විවේකිව රැඳී සිටීමට අවශ්‍ය පහසුකම් සැපසීමේ අවශ්‍යතාවයක් හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සිදුකිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- නගරාශ්‍රිත ජනතාවට අවශ්‍ය ක්‍රීඩා, විවේක හා විනෝද කටයුතු පහසුකම් සපුරාලීම
- පවතින ක්‍රීඩාංගනය තුළ පහසුකම් වැඩිදියුණු කිරීම
- නගරයට ඇතුළුවන ප්‍රධාන පිවිසුම් මාර්ගයක් වන මිද්දෙණිය මාර්ගය ආශ්‍රිතව අලංකාරන්වය හා නාගරික ආකර්ෂණය වැඩිදියුණු කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික ජනතාවට ක්‍රීඩා හා විනෝද කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් පහසුවෙන් සලසාගත හැකිවීම
- නාගරික ආකර්ෂණය ඉහළ යාම
- නගරයට පරිපාලන සේවා ලබාගැනීමට හා විවිධ අවශ්‍යතා සඳහා පැමිණෙන පුද්ගලයන්ට රැඳී සිටීමට අවශ්‍ය පහසුකම් සැලසීම

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
යෝධගම ක්‍රීඩාංගණය හා නාගරික වන උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*100*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 21

ව්‍යාපෘති මාතෘකාව	*උඩවලව නගරයේ සංචාරක සේවා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*			
ව්‍යාපෘති යෝජනාව	*සංචාරක සේවා සැපයුම් ස්ථාන ආශ්‍රිත කටයුතු පහසු කිරීම සඳහා හඳුනාගත් සේවා මාර්ග සංවර්ධනය*			
පිහිටීම	***පළාත***	***දිස්ත්‍රික්කය***	***ප්‍රා. ලේ. කොට්ඨාසය***	***පළාත් පාලන ආයතනය***
	සබරගමුව	*රත්නපුර*	*ඇඹිලිපිටිය*	*ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව*
ප්‍රවේශය	*මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (මිද්දෙණිය මාර්ගය)*			
පිහිටීම් සිතියම				
මාර්ගයේ දිග	*සෝමිල් මාර්ගය*		*කි.මී.0.7*	
	ධර්මපාල මාවත		*කි.මී. 1.6*	
	මුදුන්මන්කඩ මාර්ගය		*කි.මී.3.6*	

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 සඳහා යෝජිත කලාපීයකරණ සැලැස්මට අනුව සංචාරක සේවා කලාපය ලෙස නම්කර පවතින උඩවලව නගරය ආශ්‍රිත ප්‍රදේශය තුළ මේවන විටත් සංචාරක හෝටල් ස්ථාපිතව තිබෙන අතර යෝජිත සංචාරක උද්‍යානය සඳහා ධර්මපාල මාවත හා සෝමිල් මාර්ගය අතර නේක්ක ඉඩම යෝජනා කර ඇත.

ඒ අනුව සංචාරක කටයුතු ප්‍රවර්ධනය කරමින් උඩවලව සංචාරක කලාපයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරකයින්ට අවශ්‍ය විනෝදාස්වාදයන් ඇතුළු අනෙකුත් පහසුකම් සපුරාලීම සඳහා සංචාරක උද්‍යානය හා නවාතැන් ස්ථාන වෙත පහසුවෙන් ළඟාවීමට මෙම මාර්ග සංවර්ධනය අත්‍යාවශ්‍ය වී ඇත.

ව්‍යාපෘති අරමුණු

- සෝ මිල් මාර්ගය හා ධර්මපාල මාවත යෝජිත සංචාරක උද්‍යානයට ප්‍රවේශ වීම පහසු කිරීම සඳහා සංවර්ධනය කිරීම
- සංචාරක නවාතැන් හා සේවා පහසුකම් ලබාගැනීම පහසු කිරීම සඳහා විකල්පව පවතින ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- සංචාරක ආකර්ෂණය වැඩිදියුණු වීම
- සංචාරක සේවා පහසුකම් ලබාගැනීම පහසු වීම


මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
සෝමිල් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*24.5*
ධර්මපාල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*56*
මුදුන්මන්කඩ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*126*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 22

ව්‍යාපෘති මාතෘකාව	මොරකැටිය වී ගබඩා සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	මොරකැටිය වී ගබඩාව ප්‍රතිසංස්කරණය නැළිත් කලාපීය වී නිෂ්පාදන සඳහා අවශ්‍ය ගබඩා පහසුකම් සැලසීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (මොරකැටිය මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	වසාදමන ලද මොරකැටිය වී ගබඩා සංකීර්ණය හා එහි හිස් බිම			
ඉඩමේ අයිතිය	මහවැලි අධිකාරිය			
භූමි ප්‍රමාණය	අක්. 18			

ව්‍යාපෘතියේ අදාළත්වය

මොරකැටිය වී ගබඩා සංකීර්ණය 1970 වසරේ ආරම්භ වී වසර 10ක පමණ කාලයක් ක්‍රියාන්මක වී ඇති අතර දවසේ පැය 24 පුරාම වී නැමීබීම, වේලීම හා කෙවීම මෙන්ම ගබඩා කටයුතු සඳහා භාවිතා කර ඇත. මේවන විට වී ගබඩා කිරීම සඳහා පමණක් ගොඩනැගිලි කිහිපයක් භාවිතා කරන අතර යන්ත්‍ර සුත්‍ර ඇතුළු අනෙක් ගොඩනැගිලි භාවිතයෙන් නොරව පවතී. මෙම තත්ත්වය තුළ නැවතත් මෙම භූමිය හා ගොඩනැගිලි භාවිතයට ගැනීම කලාපයේ කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනයට මෙන්ම කෘෂි ආර්ථිකය ඉහළ නැංවීමට ශක්තියක් ලෙස හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- කලාපීය වී නිෂ්පාදනයට අවශ්‍ය නවීන ගබඩා පහසුකම් ලබාදීම, ඒ ආශ්‍රිත සහල් හා සහල් පිටි නිෂ්පාදනය සිදුකිරීම.
- නාගරික කෘෂිකර්මාන්තය ආශ්‍රිත කාර්යයන් ප්‍රවර්ධනය කිරීම.
- විශාල වටිනාකමක් සහිත දේපළක් විනාශ වී යාමට නොදී නැවත භාවිතයට ගැනීම තුළින් නාගරික ආර්ථිකයට ශක්තියක් ලබාදීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික ගොවීන්ට නගරය තුළින්ම සහල් නිෂ්පාදන කටයුතු සිදුකර ගත හැකි වීම
- නාගරික නිෂ්පාදන වෙළඳපොළ වැඩිදියුණු වීම


මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
මොරකැටිය වී ගබඩා සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*200*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම වී අලෙවි මණ්ඩලය විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 23

ව්‍යාපෘති මාතෘකාව	මහවැලි ක්‍රීඩාංගණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	නාගරික ජනතාවගේ ක්‍රීඩා කෞශල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරී මාර්ගය (නෝනගම මාර්ගය)			
පිහිටීම් සිතියම				
දැනට පවතින භාවිතය	මහවැලි ක්‍රීඩාංගණය			
භූමි ප්‍රමාණය	අක්.9.9			

ව්‍යාපෘතියේ අදාළත්වය

ඇඹිලිපිටිය නගරය තුළ දැනට පවතින ප්‍රධානතම ක්‍රීඩාංගණය මහවැලි ක්‍රීඩාංගණය වන අතර දැනට පවතින අඩුපාඩු සංවර්ධනය කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- ප්‍රදේශයේ පවතින ප්‍රධානතම ක්‍රීඩාංගණය ලෙස ප්‍රතිසංවර්ධනය කරමින් ප්‍රදේශයේ ජනතාවගේ ක්‍රීඩා කටයුතු අවශ්‍යතා විධිමත් කිරීම.

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- නාගරික ජනතාවට පළාත් හා ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කිරීම් සඳහා පුහුණු වීම් කටයුතු සිදුකිරීමේ පහසුව
- ක්‍රීඩා උත්සව සංවිධානය කිරීමේ පහසුව

මූල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
මහවැලි ක්‍රීඩාංගණය ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	*2000*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසුව නඩත්තුව හා පවත්වාගෙන යාම ඇඹිලිපිටිය නගර සභාව විසින් සිදුකෙරේ.

ව්‍යාපෘතිය 24

ව්‍යාපෘති මාතෘකාව	මධ්‍යම ප්‍රාන්තික නිවාස සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය			
ව්‍යාපෘති යෝජනාව	පරිපාලන කටයුතු ඒකරාශී කරමින් පරිපාලන සේවය විධිමත් කිරීම			
පිහිටීම	**පළාත**	**දිස්ත්‍රික්කය**	**ප්‍රා. ලේ. කොට්ඨාසය**	**පළාත් පාලන ආයතනය**
	සබරගමුව	රත්නපුර	ඇඹිලිපිටිය ප්‍රා .ලේ.කො.	ඇඹිලිපිටිය නගර සභාව
ප්‍රවේශය	මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය (රෝහල් මාර්ගය)			
පිහිටීම් සිතියම				
	යෝජිත මධ්‍යම ප්‍රාන්තික නිවාස සංකීර්ණය		යෝජිත රාජ්‍ය නිල නිවාස සංකීර්ණය	
දැනට පවතින භාවිතය	හිස් ඉඩම		ජර්මන් නිල නිවාස	
භූමි ප්‍රමාණය	අක්.2.5		අක්. 2.5	
ඉඩම් අයිතිය	නිවාස සංවර්ධන අධිකාරිය		මහවැලි අධිකාරිය	

ව්‍යාපෘතියේ අදාළත්වය

වර්ෂ 2030 සඳහා යෝජිත කලාපීකරණ සැලැස්ම තුළින් පරිපාලන සේවා සඳහා නම් කර ඇති ආයතනික කලාපය තුළ මෙම ව්‍යාපෘතිය ස්ථාපනය කිරීම තුළින් රාජ්‍ය සේවකයන්ගේ නේවාසික කටයුතු විධිමත්ව සපුරාලීම සඳහා මෙම ව්‍යාපෘතිය හදුනාගෙන ඇත. නවදුරටත් විවිධ ව්‍යාපාරික හා විවිධ අවශ්‍යතා සඳහා නගර මධ්‍යයට ආසන්නව නේවාසික අවශ්‍යතා විධිමත්ව සැපයීම සඳහා මෙම නිවාස ව්‍යාපෘතිය හදුනාගෙන ඇත.

ව්‍යාපෘති අරමුණු

- රාජ්‍ය සේවකයන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීම වෙනුවෙන් ආයතනික කලාපය තුළින්ම නේවාසික අවශ්‍යතා සපුරාලීම
- ජීවත් වීමට උචිත වටපිටාවක් හා යටිතල පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් තුළ නේවාසික පහසුකම් සැපයීම
- පවතින භූමී භාවිතයන් විධිමත් කිරීම

ව්‍යාපෘතිය තුළින් සැපයෙන ප්‍රතිලාභ

- රාජ්‍ය සේවකයන්ට සේවා ස්ථානයට ලඟාවීම පහසු වීම
- නගර මධ්‍යයේ නේවාසික ඉල්ලුම සඳහා අවස්ථාව උදාවීම
- රාජ්‍ය සේවකයන්ට පහසුකම් සම්පූර්ණ පරිසරයක සිට සේවාවන් ඉටුකිරීමේ පහසුව

මුල්‍ය සැලැස්ම

අන්තර්ගතය	*රු.මිලියන*
යෝජිත මධ්‍යම ප්‍රාන්තික නිවාස සංකීර්ණය	*300*
යෝජිත රාජ්‍ය නිල නිවාස සංකීර්ණය	*300*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව

අන්තර්ගතය	*අදාළ ආයතනය*
යෝජිත මධ්‍යම ප්‍රාන්තික නිවාස සංකීර්ණය	*ජාතික නිවාස සංවර්ධන අධිකාරිය*
යෝජිත රාජ්‍ය නිල නිවාස සංකීර්ණය	*නාගරික සංවර්ධන අධිකාරිය , මහවැලි අධිකාරිය*

6.7.2. වගකිවයුතු ආයතනික රාමු

සැලැස්ම	උප සැලසුම් සහ ක්‍රියාකාරී ව්‍යාපෘති	අදාළ ආයතනය	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයෙහි වගකීම්
භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ග	**ප්‍රවාහන සැලැස්ම**		
	1. නගරයේ ප්‍රධාන මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	මාර්ග සංවර්ධන අධිකාරිය / පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය / ඇඹිලිපිටිය නගර සභාව / ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම
	2. යෝජිත විකල්ප මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය		
	3. අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය		
	4. යෝජිත සේවා මාර්ග සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය		
	5. ඇඹිලිපිටිය ප්‍රධාන බස්නැවතුම්පොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
		ඇඹිලිපිටිය නගර සභාව	ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම
	6. ඇඹිලිපිටිය නවනගරය කෙටිදුර සේවා බස්නැවතුම්පොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
		ඇඹිලිපිටිය නගර සභාව	ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම
	7. ආර්ථික මධ්‍යස්ථානය ආශ්‍රිත රථශාල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නාගරික සංවර්ධන අධිකාරිය	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
		ඇඹිලිපිටිය නගර සභාව	ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම
	8. උඩවලව සංචාරක සේවා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය	පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය / ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභාව	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම
	9. යෝජිත ඇඹිලිපිටිය ජනාධිපති විද්‍යාලය ආශ්‍රිත රථශාල ඉදිකිරීමේ ව්‍යාපෘතිය	ඇඹිලිපිටිය නගර සභාව	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘතිය පවත්වාගෙන යෑම හා නඩත්තු කිරීම
	නගර මධ්‍යය සංවර්ධන සැලැස්ම		
